දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | තිනමින

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බක් අව තුදුස්වක ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 122 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 10 සඳුදා

කොවිඩ් ව්‍යාප්තිය

ප්‍රතිකාර ලබන පිරිස 20,644



කාලතුයේ ඩිජිටල් දෙරටුව

අද පත්‍රය සමග

රෝගීන් නිවෙස්වල සැඟවී සිටීම කොවිඩ් මරණ වැඩි වීමට හේතුවයි

සෞඛ්‍ය අංශ අනාවරණය කරයි

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ශ්‍රී ලංකාව තුළ කොවිඩ් මරණ සංඛ්‍යාව ඉතා වේගයෙන් ඉහළ යෑමට ප්‍රධාන හේතුව බවට හඳුනාගෙන ඇත්තේ රෝගය වැලඳුණු රෝගීන් ඒ බැව් සඟවා නිවෙසටම වී සිටීම යැයි සෞඛ්‍ය අංශ අනාවරණය කරගෙන තිබේ. පිට 06

ශ්‍රී ලංකාවට අවශ්‍ය එන්නත් ප්‍රමාණය ඉදිරි දෙමස ඇතුළත ගේනවා

අසේල කුරුළුවංශ හා එස්.කේ. සමරනායක

ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂණයට අවශ්‍ය එන්නත් ප්‍රමාණය ඉදිරි මාස දෙක ඇතුළත මෙරටට ගෙන එන බව ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි. පිට 06

රාජ්‍ය වෙසක් උත්සවය තාවකාලිකව අත්හිටුවයි

පිට 6

සංචරණ නීති දැඩි නොකළොත් මහා ජාතික ව්‍යසනයක්

වෛද්‍ය සංගම් හතරක් ජනපතිට ලියයි පිට 6

එන්නත්කරණය යළි යාවත්කාලීනයි

සියලු එන්නත් හොඳ මට්ටමේ

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

නුවන් කොඩිකාර

කොවිඩ් 19 වයිරසයට එරෙහිව එන්නත්කරණය යළි යාවත්කාලීන වී තිබෙන බවත් දැනට ලංකාවේ භාවිත වන සියලු එන්නත් හොඳ මට්ටමේ එන්නත් බවත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පැවසීය. පිට 06

ඉන්දීය ප්‍රභේදය පැතිර යෑමේ අවදානමක් නෑ

නුවන් කොඩිකාර

ඉන්දීය කොවිඩ් ප්‍රභේදය ආසාදනය වූ පුද්ගලයාගෙන් වයිරසය සමාජයට පැතිරීමේ අවදානමක් නැතැයි කොරෝනා මර්දන රාජ්‍ය ඇමැතිනි, විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පවසයි. පිට 06

'සයිනොෆාම්' එන්නත දෙවැනි දිනටත් දෙයි පිට 6

පිට 6

කොවිඩ් ආසාදිත හෙද-හෙදියෝ 100ක් වාර්තා වෙති

බෙලිඅත්ත නගරය වසා දමයි

පසුගිය පැය 24ට කොවිඩ් මරණ 22ක්

කැස්බෑව නගර සභාවේ 33ක් නිරෝධායනයට

ඡායාරූපය - රුක්මාල් ගමගේ

රාජ්‍ය ආයතනවල සේවයට ගර්භිණී මව්වරුන් නොකැඳවයි පිට 6

දකුණු අප්‍රිකානුවාගේ බෑගයේ මිලියන 60ක කොකේන් පිට 6

පොදු රද මඬුලු රාජ්‍ය නායක සමුළුව කල් යයි

චීන රොකට්ටුවේ සුන්බුන් ඉන්දීය සාගරයට පිට 6

ශ්‍රී ලංකාවට සෞඛ්‍යාධාර දෙන්න

සජිත් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉල්ලයි පිට 6

සංවර්ධන වැඩ නවත්වා ජීවිත රැක ගන්න මුල්තැන දෙන්න

Dialog HOME Broadband

ඔෆිස් සහ ඉගෙනුම් වැඩ සඳහා ANYTIME ඩේටා පැකේජ

Zoom, Google, Microsoft, YouTube, අධ්‍යාපනික Apps සහ වෙබ් සඳහා සුවිශේෂී ගාස්තු සමග

35GB පැකේජය** රු.495/- පමණයි *බදු ඇතුළත්ව

80GB පැකේජය** රු.995/- පමණයි *බදු ඇතුළත්ව

Facebook, Instagram, TikTok, Netflix මෙන්ම අනෙකුකත් streaming, gaming සහ සමාජ ජාල වෙත පිවිසීමට මෙම පැකේජ භාවිතා කළ නොහැක

Activate කිරීම MyDialog App හෝ Dialog.lk මගින්

සුපිරි අධිවේගී Home Broadband

Dialog අනාගතය අදයි.

** දින 30ක් දක්වා වලංගු වේ TRC/DBN/PRO/20/03 කොන්දේසි සහිතයි

මෙරට කොවිඩ් ආසාදිත ගණන 123,234 දක්වා ඉහළට

සුවය ලැබූ ගණන 104,463කි

මරණ 786යි

සන්ධ්‍යා කරුණාරත්න

පසුගිය පැය 24 තුළදී කොවිඩ් ආසාදිතයන් 1914ක් වාර්තා වීමත් සමඟ මෙරට සමස්ත කොවිඩ් ආසාදිතයන්ගේ සංඛ්‍යාව 123,234ක් බවත්, කොරෝනා හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 786ක් බවත් වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

සමස්ත ආසාදිතයන්ගෙන් 104,463ක් ප්‍රතිකාර සහ නිරෝධායන කාලය අවසන් කර ඇතැයි ද එම අංශය ප්‍රකාශ කරයි.

ආසාදිතයන් 19,350ක් රෝහල් සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබමින් සිටින්නේ යැයි ද, බස්නාහිර පළාතෙන් වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ යැයි ද එම අංශය සඳහන් කරයි.

පසුගිය පැය 24 තුළදී ආසාදිතයන් 1335ක් පූර්ණ සුවය ලබා ඇතැයි ද එම අංශය පවසයි.

කොළඹ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 36,399ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 22,493ක් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 9348ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 5416ක් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 5172ක් ද ලෙස සෑම දිස්ත්‍රික්කයකින්ම ආසාදිතයන් වාර්තා වන අතර, මුලතිවු දිස්ත්‍රික්කයෙන් අඩුම ආසාදිතයන් සංඛ්‍යාවක් ලෙස 76ක් වාර්තා වී තිබේ.

සෞඛ්‍ය උපදෙස් නොසලකා පැවැත්වූ උපකාරක පන්තියකින් ආසාදිත සිසුවියන් දෙදෙනෙක් හඳුනා ගැනෙති

ගම්පහ ප්‍රධාන පාසලක ගුරුවරයකු හංසගිරි පාර නිවෙසක සෞඛ්‍ය උපදෙස් නොසලකා හරිමින් උපකාරක පන්තියක් පවත්වාගෙන ගොස් ඇති අතර, ඊට සහභාගි වූ සිසුවියන් දෙදෙනකු කොරෝනා ආසාදිතයන් බවට හඳුනාගෙන ඇතැයි සෞඛ්‍ය අංශ කියයි.

මේ අනුව ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සුභාෂ් සුභසිංහ මහතාගේ උපදෙස් මත එම උපකාරක පන්තියට සහභාගි වී ඇති සිසු සිසුවියන් 15 දෙනකු සහ පන්තිය පැවැත්වූ බව කියන ගුරුවරයා ස්වයං නිරෝධායනයට ලක් කිරීමට පියවර ගෙන ඇත.

සෞඛ්‍ය උපදෙස් නොසලකා හරිමින් මෙලෙස උපකාරක පන්තියක් පැවැත්වූ ගුරුවරයා සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට ද කටයුතු කරන බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

දඹුල්ල-මාතලේ කාර්මික විද්‍යාල පරිශ්‍රවල අතරමැදි රැඳවුම් මධ්‍යස්ථාන දෙකක්

මාතලේ දිස්ත්‍රික් සමූහ

කොවිඩ් ආසාදනයවූවන්ට අවශ්‍ය මූලික ප්‍රතිකාර දීමට ඇඳන් පන්සියයකින් සමන්විත අතරමැදි රැඳවුම් මධ්‍යස්ථාන දෙකක් දඹුල්ල සහ මාතලේ කාර්මික විද්‍යාල පරිශ්‍රවල ආරම්භ කිරීමට මේ වන විට රජය විසින් තීරණය කර ඇත.

මේ සැලැස්ම යටතේ පිරිමි රෝගීන්ට ඇඳන් දෙසීයකින් යුක්ත අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් දඹුල්ල කාර්මික විද්‍යාල පරිශ්‍රයේ ආරම්භ කිරීමට නියමිතය. මෙයට සමගාමීව මාතලේ කාර්මික විද්‍යාල පරිශ්‍රයේ ද ඇඳන් තුන්සීයකින් යුක්ත රෝගී රැඳවුම් මධ්‍යස්ථානයක් ආරම්භ කරන අතර, එයින් ඇඳන් සියයක් කාන්තා රෝගීන්ට වෙන් කෙරේ.

මෙසේ ආරම්භ කෙරෙන රෝගී රැඳවුම් මධ්‍යස්ථාන දඹුල්ල සහ මාතලේ මූලික රෝහල් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

ගම්පොළ යොවුන් සේනාංක මධ්‍යස්ථානය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වෙයි

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයන්ත මහතාගේ සංකල්පයක් සහ මැදිහත් වීම මත ගම්පොළ යොවුන් සේනාංක මධ්‍යස්ථානය කොරෝනා ආසාදිතයට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කෙරිණි.

මෙහි රෝගීන් 360කට එකවර ප්‍රතිකාර දිය හැකි අතර, සියලු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිත කරමින් පිරිසුදුකම රැක ගනිමින් ප්‍රතිකාර කටයුතු සිදු කරයි.

එම කටයුතු සාර්ථක කර ගැනීමට ත්‍රිවිධ හමුදාවත්, ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයා, ප්‍රාදේශීය ලේකම්වරිය ඇතුළු රජයේ නිලධාරීහු ද, රාජ්‍ය ඇමැතිවරයාගේ කාර්ය මණ්ඩලයේ ද පූර්ණ කැප වීම සහ දායකත්වය ලැබිණි.

බද්දේගම සමිත හිමිට කොවිඩ්

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, බද්දේගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී බද්දේගම සමිත හිමියන් කොවිඩ් ආසාදිතයකු වීම හේතුවෙන් කරාපිටිය රෝහලට ඇතුළත් කර ඇත.

උන් වහන්සේ බරපතළ නිව්මෝනියා තත්ත්වයෙන් පෙළෙන බවත්, මේ වන විට දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කර ඇති බවත් රෝහල් ආරංචි මාර්ග පවසයි.

මිය ගිය කොරෝනා රෝගියකුගේ අවමඟුල් චාරිත්‍ර සඳහා සහභාගි වීමෙන් පසු සමිත හිමියන් මේ රෝග ලක්ෂණ පෙන්නුම් කළ බව ද පැවැසේ.

ලොව පුරා කොවිඩ් ආසාදිතයන් ගණන පහළොස් කෝටි අසූ ලක්ෂය ඉක්මවයි

මහින්ද අලුත්ගෙදර

ලොව පුරා රටවලින් වාර්තා වන කොවිඩ් ආසාදිතයන් ගණන පහළොස් කෝටි අසූ ලක්ෂය ඉක්මවා ගොස් තිබේ.

ඒ අනුව ලෝකයේ රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 218කින් වාර්තා වන කොවිඩ් ආසාදනය වූවන්ගේ සංඛ්‍යාව 158,336,565 දක්වා ඉහළ ගොස් තිබෙන අතර, එම හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 3,297,085කි. කෙසේ වුවද ඒ අතරින් 135,809,859 දෙනකු පූර්ණ සුවය ලබා තිබෙන බව ද වාර්තා වේ.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර, එම සංඛ්‍යාව කෝටි තුන ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව අමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව 33,454,581ක් වන අතර, එරට මරණ සංඛ්‍යාව 590,000 ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව එරට මිය ගිය සංඛ්‍යාව 595,588කි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 22,296,414ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 15,150,628ක්, ප්‍රංශයේ ආසාදිතයන් 5,767,959ක් සහ තුර්කියේ ආසාදිතයන් 5,016,141ක් ලෙස වාර්තා වෙයි.

කොවිඩ් ආසාදනය වී මිය ගිය සංඛ්‍යාව ලක්ෂය ඉක්මවා ඇත්තේ එක්සත් ජනපදය, ඉන්දියාව, බ්‍රසීලය, ප්‍රංශය, රුසියාව, එක්සත් රාජධානිය, ඉතාලිය සහ මෙක්සිකෝව රටවල පමණි. ඊයේ (09) උදෑසනින් අවසන් වූ පැය 24 තුළ ඉන්දියාවෙන් කොරෝනා මරණ 4,092ක් වාර්තා වන අතර, එරට සමස්ත මරණ සංඛ්‍යාව 242,000 ඉක්මවා තිබේ. සතියක් තුළ පස්වන වරටත් හාරලක්ෂය ඉක්මවූ කොරෝනා ආසාදිතයන් ඉන්දියාවෙන් වාර්තා වන අතර, ඒ සමඟම එරට සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව දෙකෝටි විසි දෙලක්ෂය ඉක්මවා තිබේ.

කිලිනොච්චිය සරසවියේ සිසුන් 1432ක් නිවෙස් වෙත යැවීමට පියවර

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

කොවිඩ් හේතුවෙන් යාපනය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කිළිනොච්චිය විශ්වවිද්‍යාලයේ සිසුන් 1432ක් නේවාසිකාගාරවලින් ඉවත් කර පෙරේදා (08) ගම් බිම් වෙත යැවීමට බලධාරීන් පියවර ගෙන තිබේ.

මේ සිසුන් ඉවත් කර දැනට කිළිනොච්චිය මණ්ඩපය වසා දමා ඇතත්, විභාගවලට පෙනී සිටීමට නියමිත ප්‍රධාන පීඨ තුනක සිසුන් 470කට පමණක් විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල රැඳී සිටීමට වසර දී තිබේ.

එම සිසුන්ට එක් අයකුට එක් කාමරය බැගින් දීමටත්, විභාග කාලයේ සෞඛ්‍ය නීති රීති දැඩි ලෙස අනුගමනය කිරීමට උපදෙස් දීමටත් විශ්වවිද්‍යාල බලධාරීන් පියවර ගෙන තිබේ.

අක්මීමන මැලිබන් රෝහලේ විශේෂ ළමා කොවිඩ් ඒකකයක් ඇරඹීමට පියවර

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

ගාල්ල දිස්ත්‍රික්කයේ කොවිඩ් වැලඳී සිටින කුඩා දරුවන්ට කරාපිටිය රෝහලේ ළමා ඒකකයේ මඟපෙන්වීම යටතේ ප්‍රාදේශීය රෝහලක් වන අක්මීමන මැලිබන් රෝහලේ විශේෂ ළමා කොවිඩ් ප්‍රතිකාර ඒකකයක් ආරම්භ කිරීමට වැවිලි ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පෙරේදා (08) පියවර ගෙන ඇත.

දැනට ඒ සඳහා ඇඳන් 40ක් ස්ථාපනය කර ඇති අතර, අවශ්‍යතාව මත එම ප්‍රමාණය වැඩි කිරීමට ද අවශ්‍ය කටයුතු සංවිධාන කර තිබේ.

රුහුණු විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්ය සුජීව අමරසේන, මහාචාර්ය වසන්ත දේවසිරි මහත්වරුන් ඇතුළු ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු ද, හෙද කාර්ය මණ්ඩලය ද මේ අවස්ථාවට සහභාගී වූහ.

ලංසු කැඳවීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ලංසු අංකය : 113/T/2020

මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා මිනිත්තු 15ක බැටරි උපස්ථකයක් සහිත 30 KVA 3 PHASE UPS ඒකකයක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදුවේදැයි තහවුරු කිරීම (SUPPLY, INSTALLATION, TESTING & COMMISSIONING OF 30 KVA 3 PHASE UPS WITH 15 MINUTES BATTERY BACKUP)

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා මිනිත්තු 15ක බැටරි උපස්ථකයක් සහිත 30 kVA 3 Phase UPS ඒකකයක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදුවේදැයි තහවුරු කිරීම (Supply, Installation, Testing & Commissioning of 30 kVA 3 Phase UPS with 15 Minutes Battery Backup) සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රුපියල් තුන් දහසක (රු. 3,000.00 ක) මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 11.05.2021 වන දින සිට 14.06.2021 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ මුද්‍ර, තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් භාරදිය හැකිය.

ලංසු තැබීම 2021 ජූනි මස 15 වන අඟහරුවාදා දින ප.ව. 2.00 ට අවසන් වන අතර, අදාළ ලංසු විවෘත කිරීම ඒ සමඟම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංකාවේ ක්‍රියාත්මක, මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ඉල්ලුම මත ගෙවන සේ නිකුත් කරන ලද රුපියල් හතලිස් හතර දහසක (රු. 44,000.00 ක) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

ලංසු තැබීමට අදාළ විස්තර පැහැදිලි කිරීම 2021 ජූනි මස 01 වන දින පෙ.ව. 10.00 ට කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි නව පරිපාලන ගොඩනැගිල්ලෙහි සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබේ.

මේ පිළිබඳ වැඩි විස්තර, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264106 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,
කටුනායක.

රටටත් ජනතාවටත් සෙත් පතා ආශිර්වාද පූජා

වවුනියාව මඩුකන්ද ශ්‍රී දළදා විහාරය

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

වවුනියාව මඩුකන්ද ශ්‍රී දළදා විහාරස්ථානයේදී රටට සහ ජනතාවට සෙත් පතා උතුරු නැගෙනහිර දෙපළාතේ ප්‍රධාන සංඝනායක මුවඇටගම ආනන්ද නාහිමියන් ප්‍රධානත්වයෙන් පෙරේදා (08) දින ආශිර්වාද පූජාවක් පැවැත්විණි. ඊට වන්නි දිස්ත්‍රික්කයේ කාදර් කාදර් මස්තාන් සහ කේ. දිලීපන් මන්ත්‍රීවරු ද, වවුනියාව දිසාපති සමන් බන්ධුලසේන මහතා ද සහභාගී වූහ.

ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

බම්බලපිටිය නව කදිරේෂන් කෝවිල

කොවිඩ් වසංගතයෙන් රට සහ ජනතාව ආරක්ෂාවීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි විශේෂ හින්දු ආගමික මෙහෙය පෙරේදා (08) බම්බලපිටිය නව කදිරේෂන් කෝවිලේදී ද පැවැත්විණි.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධීකාරක ආචාර්ය බාබු ශර්මා රාමචන්ද්‍රන් කුරුක්කල්තුමා ඇතුළු හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ. උමාමහේශ්වරෙන් සහ කෝවිලේ භාරකරු රාජේන්ද්‍රන් සෙට්ටියාර් මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය : රුසෙයික් ෆාරුක්

යාපනය කිතුනු දෙව් මැඳුර

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

යාපනය නගරයේ පිහිටි කිතුනු දෙව් මැඳුරේදී කොරෝනා රෝගයෙන් ශ්‍රී ලංකාව ඇතුළු සියලු රටවල් ආරක්ෂා වේවායි ප්‍රාර්ථනය කරමින් විශේෂ දේව මෙහෙයක් සහ ආශිර්වාද පූජාවක් පෙරේදා (08) පැවැත්විණි.

මේ අවස්ථාවට සාමාන්‍ය ජනතාව කැඳවීම නතර කර තිබූ අතර, යාපනයේ කිතුනු පූජකවරුන් පමණක් ඊට සහභාගී වී දේව මෙහෙය සහ අශිර්වාද පූජාව පවත්වනු ලැබිය.

ඡායාරූපය- උතුරු පළාත් විශේෂ

කොල්ලුපිටිය ජුම්මා පල්ලිය

කොවිඩ් වසංගතයෙන් රටත්, ජනතාවත් ආරක්ෂාවීම වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම් පරිදි විශේෂ අන්තර් ආගමික ප්‍රාර්ථනා මෙහෙය දිවයින පුර සියලු පන්සල්, කෝවිල්, මුස්ලිම් දේවස්ථානය සහ කතෝලික දේවස්ථානවලදී පෙරේදා (08) පැවැත්විණි.

ඉස්ලාමීය ආගමික ප්‍රාර්ථනා මෙහෙය කොල්ලුපිටිය ජුම්මා පල්ලියේදී පැවැත්වූ අතර, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධීකාරක ආචාර්ය අෂ් සෙයිඩ් හාෆිල් හසන් මවුලාවිතුමා මේ ප්‍රාර්ථනා මෙහෙය පැවැත්විය.

ඌව පළාත් සභා ආණ්ඩුකාර ඒ. පේ. එම්. මුසම්මිල්, බුද්ධශාසන අමාත්‍යාංශයේ ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධීකරණ ලේකම් ෆර්සාන් මුන්සූර්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ. බී. එම්. අෂ්රෝෆ් සහ කොල්ලුපිටියා ජුම්මා පල්ලියේ භාරකාර මුස්ලිම් සලාහුදීන් මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූපය - රුසෙයික් ෆාරුක්

යාපනය මාවිත්තපුරම් කන්දසාමි සහ කීරිමලෙයි නගුලේස්වරන් කෝවිල්

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

කොරෝනා රෝගය දුරු වන ලෙස ඉල්ලා යාපනයේ පිහිටි ඉන්දීය කොන්සෝල් කාර්යාලය විසින් යාපනයේ හින්දු කෝවිල් දෙකක විශේෂ ආශිර්වාද පූජා පෙරේදා (08) දින ලැබිය.

ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් එස්. බාලචන්ද්‍රන් මහතාගේ ප්‍රධානත්වයෙන් යාපනයේ මාවිත්තපුරම් කන්දසාමි කෝවිලේ සහ කීරිමලෙයි නගුලේස්වරන් කෝවිලේදී මේ ආශිර්වාද පූජා පවත්වන ලදි.

ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

පලාපත්වල ඇඟලුම් කර්මාන්තශාලා දෙකකට මුදා තැබේ

මාතලේ දිස්ත්‍රික් සමූහ

කොවිඩ් ආසාදනය වුවන් 50කට අධික සංඛ්‍යාවක් වාර්තා වීමත් සමඟම මාතලේ දිස්ත්‍රික්කයට අයත් පලාපත්වල පෞද්ගලික ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තශාලා දෙකක් මුදා තැබීමට මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය බලධාරීන් විසින් පෙරේදා (08) පියවර ගෙන ඇත.

මේ කර්මාන්ත ශාල දෙකෙහිම සේවක සේවිකාවන් 2000කට ආසන්න සංඛ්‍යාවක් සේවයෙහි නිරත වන අතර, මොවුන්ගේ සිදු කරන ලද ඇන්ටිජන්ට් පරීක්ෂාවේදී මේ ආසාදිතයන් හඳුනා ගැනීමට හැකි වූ බව සෞඛ්‍ය නිලධාරීහු පවසති.

මේ ආසාදිතයන්ගේ සෘජු ආශ්‍රිතයන්ට පීසීආර් පරීක්ෂණ පැවැත්වීමට ද මේ වන විට ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් කටයුතු කරනු ලැබේ.

රත්මලාන ආරක්ෂක සරසවිය තාවකාලිකව වසා දැමේ

බොරලැස්ගමුව සමූහ
සෙනෙවිරත්න කහටපිටිය

රත්මලාන ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පසුගිය සතියේ සිදු කළ පීසීආර් පරීක්ෂණ සහ ඇන්ටිජන් පරීක්ෂණ අනුව කොරෝනා ආසාදනය වී ඇති බවට පුද්ගලයන් 68 දෙනකු හමු වීමෙන් පසු එම විශ්වවිද්‍යාලය තාවකාලිකව පෙරේදා (08) සිට වසා දැමීමට කටයුතු කළ බව සෞඛ්‍ය අංශ ප්‍රකාශකයෙක් පැවැසීය.

ඉදිරියේදී සිදු කරන පීසීආර් සහ ඇන්ටිජන් පරීක්ෂණ වාර්තාවලට අනුව තවදුරටත් විශ්වවිද්‍යාලය වසා තබනවා ද යන්න පිළිබඳ සලකා බලන බවත් එම ප්‍රකාශකයා වැඩිදුරටත් සඳහන් කළේය.

ලේක් හවුස් ආයතනයේ අපි ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් පහත පූර්වෝපායන් අනුගමනය කර ඇත්තෙමු.

කොරෝනාවෙන් දරුවන් දෙන්නා බේරා ගන්න මා බෝට්ටුවෙන් ලංකාවට ආවා

ඉන්දියාවේ සිට පැමිණි මුන්සායි රම්මුගන් රවායි කියයි

මිහිර විජේසේකර - මාරවිල සමූහ

ඔහු නමින් ප්‍රගීත්ය. වසරක පමණ කාලයක් ඔහු සමඟ ජීවත් වූ රවායි එවකට පැවති යුද වාතාවරණය හේතුවෙන් ඉන්දියාවට යෑමට තීරණය කරන්නේ ඇයගේ අදහසකට අනුවයි. එහිදී ඔවුන් බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළෙන් ඉන්දියාව බලා පිටත්ව යෑමට කටයුතු කරයි. ඔවුන් කුප්පම් නගරයේ සම්භාණ්ඩ ආශ්‍රිත කුඩා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යමින් ජීවත් විය.

මේ අතරතුර ඔවුන්ගේ කැදැල්ලට පිරිමි දරුවන් දෙදෙනෙක් එක් වේ. පසුව සම්භාණ්ඩ කර්මාන්තයේ අලෙවිය අඩුවීමත් සමඟ එය අතහැර දමා පැරණි වාහන නවීකරණය කරමින් අලෙවි කිරීමේ කර්මාන්තයක් ආරම්භ කළේය. ලොවම වනසමින් මිනිස් ජීවිත බිලි ගනිමින් ආරම්භ වූ කොරෝනා වසංගතය ඉන්දියාව ගිල ගනිද්දී සියලු ආදායම් මාර්ගවලට වැට බැඳුණි. වයිරසය ශීඝ්‍රයෙන් පැතිරි යමින් තිබියදී එයින් බේරීමට කිසිදු විටෙක ඉඩක් නොමැති බව තේරුම් ගත් ඇය තම දරුවන් සමඟ නීති විරෝධීව මුහුදු මාර්ගයෙන් නැවත ලංකාවට යමුයි කියා ප්‍රගීත්ට යෝජනා කළාය. ඒ දරුවන්ගේ අනාගතය ගැන සිතාය. එහෙත් ඇයගේ යෝජනාවට ප්‍රගීත් විරුද්ධ විය. අවසානයේ ඇය කෙසේ හෝ ලංකාවට පැමිණෙන බව තරයේ සිතා ගත්තාය. ඊට අවශ්‍ය වට වටපිට ක්‍රමයෙන් නිර්මාණය කරමින් ලද අවස්ථාවක ඇය දැන හැඳින ගත් පුද්ගලයකුගේ මාර්ගයෙන් මුහුදු මාර්ගය ඔස්සේ දරුවන් සමඟ යාත්‍රාවකින් පැමිණීමට අවස්ථාව උදා විය. ඒ අනුව ඇය සහ දරුවන් තිදෙනා රැගෙන යෑමට ඉන්දීය රුපියල් 20,000ක් තරවිකරුට දීමට සිදු විය. අවසානයේ ඉකුත් 30 වැනි දින රාත්‍රියේ ජීවිත අවදානම ද නොතකා ඇය දරුවන් සමඟ යාත්‍රාවෙන් තලෛමන්නාරම මුහුදු තීරයට පැමිණියේය. ඉන් අනතුරුව සැතපුම් තුනක් පමණ දුර ගෙවා බස් රථයක නැගී පුත්තලම සිය මවගේ නිවෙසට පැමිණීමට හැකි විය.

"දවසින් දවස ඉන්දියාවේ වයිරයිරසය ශීඝ්‍රයෙන් පැතිරෙනවා. අපි ඉන්න ප්‍රදේශයේ ගොඩක් කටිටිය අසනීප වුණා. සමහර අය මැරුණා. මට මේ තත්ත්වය බලාගෙන ඉන්න බැරි නිසා තමයි මහත්තයාට යෝජනා කළේ ලංකාවට එමු කියලා. එයා කැමති වුණේ නෑ. මම ගොඩක් දරුවන් ගැන හිතුවා. ඒ නිසා තමයි මොනවා වුණත් කමක් නෑ කියලා මම ලංකාවට එන්න තීරණය කළේ. අපි ආ බෝට්ටුවේ තව එක් කෙනෙක් ආවා. එයා කොච්චිකඩේට ගියේ. හැබැයි එයා බෝට්ටුවට කීයක් දුන්නාද කියලා මම දන්නේ නෑ. මගෙන් ඉන්දියානු රුපියල් විසිදාහක් ඉල්ලුවා. අපිව තලෛමන්නාරම් වෙරළේ පාළු තැනක දාලා ඒ බෝට්ටුව ගියා. පස්සේ අපි කිලෝ මීටර් තුනක් විතර ඇවිදගෙන ඇවිල්ලා මන්නාරමෙන් වවුනියාව බස් එකෙන් ඇවිල්ලා ඊට පස්සේ අනුරාධපුර බස් එකේ පුත්තලමට ආවා. පුත්තලමෙන් ත්‍රීවීල් එකෙන් අම්මලාගෙ ගෙදරට ආවට පස්සෙ මට ආරංචි වුණා පොලිසියෙන් අපිව හොයනවා කියලා. මම ගොඩක් බය වුණා. පස්සෙ ගේ ළඟ ත්‍රීවීල් එකට කතා කරලා හලාවතට ගිහිල්ලා බස් එකෙන් කොළඹට ගියා. මම දන්න කෙනකුගේ ගෙදරට. එහෙ ඉන්න කොට අක්කා දුර දුරකතනයෙන් කතා කරලා කිවුවා පොලිසියෙන් හොයනවා එහෙ ඉන්න එපා බය නැතුව එන්න කියලා. ඉතින් මම ඕනෑ දෙයක් වෙන්න කියලා ගෙදර ආවා. ඊට පස්සේ පොලිසියෙන් අත්අඩංගුවට අරන් අපිව අධිකරණයට ඉදිරිපත් කළා. අපට ඇප දුන්නා. නිවෙසේ නිරෝධායනය වෙන්න කියලා උසාවියෙන් නියෝග කළා. අපි ඒ අනුව කටයුතු කරනවා. මම ඉන්දියාවේ ඉඳන් ආවේ හොරකම් කරලා නෙවෙයි. මිනී මරලා නොවෙයි. කොරෝනාවෙන් මගේ දරුවෝ දෙන්න බේරාගන්න වෙන ක්‍රමයක් තිබුණේ නෑ. ඒ නිසා තමයි මම බෝට්ටුවේ ආවේ. මම එදා ප්‍රගීත් එක්ක එයාර්පෝට් එකෙන් ගියාට පස්සෙ අවුරුදු 17කට පස්සෙ තමයි ලංකාවට ආවේ." ඇය මුහුණ දුන් ත්‍රාසජනක අත්දැකීම් එසේ විස්තර කළාය.

ඡායාරූප-මාරවිල සමූහ

කේරළ ගංජා කිලෝ 235ක් ලූනු බීජ කිලෝ 522ක් නාවික හමුදා භාරයට

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

වයඹ සහ බටහිර දෙසින් වූ මුහුදු තීරවලින් පසුගිය දා (07) නීති විරෝධී ලෙස මෙරටට ගෙන ඒමට උත්සාහ කළ කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 235කට අධික ප්‍රමාණයක් සහ ලූනු බීජ කිලෝ ග්‍රෑම් 522ක් පමණ නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කර ඇත.

කොවිඩ් ව්‍යාප්ත වීමේ අවදානම මැඩ පැවැත්වීමට නාවික හමුදාව මුර සංචාර වැඩි කරමින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. එහිදී නීති විරෝධී ජාවාරම් සිදුවීමේ සහ අනවසර සංක්‍රමණිකයන් පැමිණීමේ වැඩි අවදානමක් පවතින උතුරු සහ වයඹ මුහුදු තීර ඇතුළු දිවයින වටා වූ මුහුදු තීරයේ පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩ මුර සංචාර සිදු කරමින් ආරක්ෂාව තර කිරීමට පියවර ගෙන ඇත කුදිරමලෛයි තුඩුවට ඔබ්බෙන් වූ මුහුදේ දී සිදු කළ මුර සංචාරයකදී මේ ඉන්දීය ධීවර යාත්‍රාව නිරීක්ෂණය වී ඇති අතර, එහි ඉන්දීය ජාතිකයන් 07 දෙනකු සිට ඇත. පසුව සිදු කළ සෝදිසියේදී එහි තිබී මේ කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 235කට අධික ප්‍රමාණය නාවික හමුදා භාරයට ගෙන ඇත. මේ කේරළ ගංජා තොගයේ වටිනාකම රුපියල් මිලියන 70කට අධික වෙතැයි විශ්වාස කෙරේ.

පසුව මේ කේරළ ගංජා තොගය ගිනි තබා විනාශ කිරීමටත්, යාත්‍රාවේ සිටි ඉන්දීය ජාතිකයන් 07 දෙනා ඉන්දීය මුහුදු කලාපයට පිටත් කර යැවීමටත් කටයුතු කරන ලදි. තවද, නාවික හමුදා භාරයට ගන්නා ලද ලූනු බීජ තොගය සහ සැකකරුවන් දෙදෙනා ඉදිරි නීතිමය කටයුතු සඳහා කටුනායක රේගු නිවාරණ කාර්යාලයට භාර දීමට කටයුතු කරන ලදි.

පෙරිරාර් ප්‍රදේශයේ ළමා නිවාසයක නේවාසිකාගාරය අකුණු සැර වැදී ගිනි ගනී

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

මන්නාරමේ පෙරිරාර් ප්‍රදේශයේ ළමා නිවාසයකට පෙරේදා (08) අකුණු සැර වැදීම එහි නේවාසිකාගාරය ගිනි ගෙන තිබේ.

ගින්න ඇති වන අවස්ථාවේ නේවාසිකාගාරයේ ගැහැනු දරුවන් 17 දෙනකු සහ පාලිකාවන් දෙදෙනකු සිට ඇතත් ඔවුන්ට අනතුරක් සිදුව නොමැත.

පසුව විදුලි බල මණ්ඩලයෙන් පැමිණි විදුලිය විසන්ධි කිරීමෙන් පසුව සියලු දෙනා එක්ව නේවාසිකාගාරයේ ගින්න නිවා දමා තිබේ.

ශ්‍රීකාන්තගේ ශ්‍රීදීපත

- හරීන් මේ දවස්වල කියවන්නෙ රහිල් ගැන ලියලා තියෙන පොතක්ලු බං !
- කියවනව කියමුකො සර්, සහිත්ට පොත පෙරළයි ද ?

නාට්‍යයක් රඟන කිරීමට ගිය නළු නිළි පිරිසක් නිරෝධායනයට

ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

නාට්‍යයක් රඟත කිරීමට පැමිණි නළු නිළියන් ඇතුළු දහසය දෙනකුගෙන් සමන්විත පිරිසක් හලාවතදී පීසීආර් පරීක්ෂණවලට ලක් කළ බව හලාවත මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. එම්. සී. මංචනායක මහතා පැවැසීය.

මේ පිරිස පිළියන්දල, කුලියාපිටිය, දෙහිවල ඇතුළු ප්‍රදේශවලින් පැමිණ ඇති අතර, ඔවුන් දින කිහිපයක් නවාතැන් ගෙන ඇත්තේ හලාවත බණ්ඩාරවත්ත ප්‍රදේශයේ පිහිටි ප්‍රසිද්ධ ලැඟුම්හලකය. මේ ලැඟුම්හලේ හිමිකරු සහ සේවකයකුට කොරෝනා ආසාදිත වීමත් සමඟ මේ පිරිස නිරෝධායනය කිරීමට හලාවත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තීරණය කළ අතර, පසුව පෙරේදා (08) මේ පිරිසේ කොටසක් පීසීආර් පරීක්ෂණ සඳහා ලක් කර ඇත.

කයිතඩියෙන් අල්ලා ගත් කිඹුලා පුලිකුලම් වැවට මුදා හැරේ

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

යාපනයේ කයිතඩි ප්‍රදේශයේ වාහන අමතර කොටස් අලෙවි කරන වෙළෙඳසලකට අඩි 8ක් පමණ දිග කිඹුලකු ඇතුළු වීමෙන් පසුව වනජීවී නිලධාරීන් පිරිසක් පැමිණ කිඹුලා අල්ලා කිලිනොච්චියේ පුලිකුලම් වැවට මුදා හැර තිබේ.

ගීත කාව්‍ය

සුව වූ පසුව වත් සැනසීමක්	නොදෙන
පැතිරී යන අතුරු පල දෙන ලෙඩක්	ගැන
සැලවෙයි ඉන්දියාවෙන් ඒ ගැනත්	දැන
සුරැකී සිටින්නට හැකි වෙර යොදනු	මැන

ගස්මන් නෝනා

අද නැත්ත

දිවැස්ලා බලන ඔද තෙද	ගම්බීර
ලැබගන්නා නිතර නරලොව	උපහාර
කාලි මෑණියනි! කෝවිඩ් පැණි	බාර
රැක ගනු මැනවි අර ධම්මික	බණ්ඩාර
විද්වත් කමිටුවෙන් පැණි සලකා	බැලිය
තීරණ අනුව නුසුදුසු බව	පැහැදිලිය
මොනවා වුණත් ධම්මිකගේ පැණි	හැළිය
සිහිපත් කරයි කකුළුවකුගෙ දිය	කෙළිය!

රටේමුල්ලේ මුදන්නායක

2020 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන
ශ්‍රී ලංකා ආර්ථිකය
ඉදිරි දැක්ම සහ අභියෝග

LIVE WEBINAR

zoom
Scan QR to Register or email: thanuja@cbsl.lk or dilrukshir@cbsl.lk

LIVE
facebook.com/cbsrilanka

2021 මැයි මස 11
(අඟහරුවාදා) පෙ.ව. 10.30 ට
(සිංහල මාධ්‍ය)

දේශක
ආචාර්ය සුමිල තරංගා වානගුරු
අතිරේක අධ්‍යක්ෂ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

CBS CENTRE FOR BANKING STUDIES
Guide to the future...
බැංකු විදු පියෙස
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
☎ 011-2477840, 011-2477821 🖷 011-2867384 @ directorcbs@cbsl.lk

දිනමිණ
The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මැයි 10 සඳුදා

W.H.O. ප්‍රධානියාගේ සහතිකය!

කොවිඩ් වසංගතයට අදාළ ඉතා වැදගත් සාකච්ඡාවක් පසුගිය හත්වන දා පැවැත්විණි. සූමි සන්නිවේදන තාක්ෂණය ඔස්සේ පැවැති සාකච්ඡාවට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජෙනරාල් ටඩ්රෝස් ඇඩ්නොම් මහතා ද ශ්‍රී ලංකාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ද එක් වූහ. ජනාධිපතිවරයා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් කරුණු දෙකක් ඉල්ලා සිටියේය. එනම්; චීනයේ සයිනොෆාම් එන්නතට ඉක්මනින් අනුමැතිය දෙන ලෙස හා අපට අවශ්‍ය ඇස්ට්‍රා සෙනිකා එන්නතේ ඉතිරි මාත්‍රා ලක්ෂ හය ගැනීමට උපකාර කරන ලෙසය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කරුණු දෙකක් දැක්විය. එනම්; ශ්‍රී ලංකාව පළමුවන කොවිඩ් රැල්ල සාර්ථකව මැඩ පැවැත්වූ බව හා තෙවන රැල්ල ඉක්මනින් මර්දනය කරනු ඇතැ'යි තමන් විශ්වාස කරන බවය.

ජගත් ප්‍රජාවගේ සෞඛ්‍යය සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය හැඳින්විය හැකිය. කොවිඩ් පාලනයට අවශ්‍ය මූලික උපදේශන හා එන්නත් පිළිබඳ අනුමැතිය දෙන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයයි. මේ සංවිධානය අවස්ථා කිහිපයක දීම ශ්‍රී ලංකාවේ කොවිඩ් මර්දන වැඩසටහන පැසසුමට ලක් කර තිබේ. ඒ අන්තර්ජාතික මට්ටමේ සාකච්ඡාවලදීය. මේ අනුව ඇතැම් රටවල් ශ්‍රී ලංකාව ආදර්ශයට ගනිමින් කොවිඩ් මර්දනය සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. අප කොවිඩ් වසංගතයට මුහුණ දෙන්නේ සාමූහික ප්‍රයත්නයක් ඔස්සේය. ත්‍රිවිධ හමුදාව කොවිඩ් මර්දනය සඳහා යොදා ගත් පළමු රාජ්‍යය වන්නේ ද ශ්‍රී ලංකාවය. අද වන විට සෑම රාජ්‍යයක්ම පාහේ කොවිඩ් මර්දනයට ආරක්ෂක අංශ යොදා ගනී.

අපේ කොවිඩ් මර්දන වැඩසටහනෙහි විශේෂතා කිහිපයක් තිබේ. පළමු කාරණය වන්නේ අප මුලින් සඳහන් කළ සාමූහික ක්‍රියාවලියක් ඔස්සේ ගැටලුවට මුහුණදීමය. දෙවන කාරණය වන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අකුරටම පිළිපැදීමය. සයිනොෆාම් චීන එන්නත ශ්‍රී ලංකාවට ලැබුණ ද ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලැබෙන තුරු එය ජනතාවට එන්නත් කළේ නැත. තෙවන කාරණය වන්නේ එක මධ්‍යස්ථානයක් වෙතින් වැඩසටහනට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමය. තීරණ ගැනීම එකිනෙක ක්ෂේත්‍රවල විශේෂඥයන් වෙත පවරා ඇති අතර දේශපාලකයන්ට ඒ සඳහා ඇඟිලි ගැසීමට ඉඩක් නැත. හතරවන කාරණය වන්නේ කොවිඩ් පාලනයට මෙන්ම ආර්ථිකය පවත්වා ගැනීමට ද එක හා සමාන උත්සාහයක් ගැනීමය.

කොවිඩ් පළමුවන රැල්ලේ දී රට ඉතා ඉක්මනින් වසා දැමීමට කොරෝනා මර්දන කාර්ය සාධන කමිටුව තීරණය කළේය. එහෙත් එය අසාර්ථක උපාය මාර්ගයක් බව ද ඒ ඔස්සේ ජාතික ආර්ථිකය ශීඝ්‍ර පසුබැස්මකට ලක්වී ජන ජීවිතය අවුල් වන බව ද කමිටුව පසුව වටහා ගත්තේය. කමිටුවේ දැනට පවතින තීරණය වන්නේ කොවිඩ් ශීඝ්‍රයෙන් පැතිරෙන ස්ථාන පමණක් හුදෙකලා කරමින් අනෙකුත් ප්‍රදේශවල ආර්ථික කටයුතු ඉදිරියට ගෙන යෑමය. එහිදී සෞඛ්‍ය නීති රීති කෙරෙහි උපරිම අවධානය යොමු කරන අතර සෞඛ්‍ය උපදේශන නොසලකා හරින අය අත්අඩංගුවට ගනු ලැබේ. පසුගිය දින කිහිපය තුළ පමණක් හය දහසකට වැඩි පිරිසක් අත්අඩංගුවට ගනු ලැබ සිටිති. ලෝක සෞඛ්‍ය සංවිධානය ද මේ ක්‍රමය අනුමත කරයි.

කොවිඩ් වසංගතයේ ලෝක තත්ත්වය ගත හොත් බරපතළ තත්ත්වයන් වාර්තා කරන රටවල් හැටියට සැලැකිය හැක්කේ ඉන්දියාව, බ්‍රසීලය හා අමෙරිකාවයි. මේ රටවල් තුනම වසංගතය නොසලකා හළ රාජ්‍යයන් සේ හැඳින්වීම නිවැරදිය. අමෙරිකාවේ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රසිද්ධියේ තම මුඛ ආවරණය ඉවතට විසි කරමින් මෙය සාමාන්‍ය උණ රෝගයක් යැයි සමච්චල් කළේය. බ්‍රසීලයට මෙන්ම ඉන්දියාවට ද ස්වකීය ජනතාවගේ හැසිරීම් පාලනය කර ගැනීමට නොහැකි විය. ඉන් අර්ථවත් වන්නේ එම රටවල් දෙකටම කොවිඩ් මර්දනය සඳහා ශක්තිමත් වැඩසටහන් නොතිබූ බවය. මෙයින් අසල්වැසි ඉන්දියාව බලවත්ම අසීරුතාවකට මුහුණ පා ඇති රාජ්‍යය ලෙස නම් කළ හැකිය. රටවල් ගණනාවක් ඉන්දියාවට ආධාර දීමට ඉදිරිපත් වී සිටියි.

කොවිඩ් තෙවන රැල්ලත් සමග ශ්‍රී ලාංකේය සමාජය වෙතින් මතු වූ ප්‍රබල අදහසක් වූයේ අසල්වැසි ඉන්දියාවේ තත්ත්වයට ශ්‍රී ලංකාව පත් නොවිය යුතුය යන්නය. ඉන්දියාවේ තත්ත්වයට පත් නොවීමට නම් සමාජ කණ්ඩායම් එකිනෙකාගේ වගකීම් හා යුතුකම් මනාව වටහා ගෙන ක්‍රියා කළ යුතුය. රජය මේ සම්බන්ධයෙන් මහජනයා දැනුම්වත් කිරීම දිගටම කරගෙන යන අතර අලුත් සෞඛ්‍ය නීතිරීති රැසක් හඳුන්වා දී ඇත. තෙවන කොවිඩ් රැල්ල ආරම්භ වන්නේ අලුත් අවුරුදු උත්සව සමයේ නිමාවත් සමගය.

ඉන් සනාථ වන ප්‍රධාන කාරණය නම් අවුරුදු සමය තුළ සෞඛ්‍ය පුරුදු නිසි පරිදි පවත්වා ගැනීමට සමාජය අපොහොසත් වී ඇති බවය. තව අතෙකින් බලන විට රජය දුන් නිදහස ජනතාව විසින් වැරදි ලෙස භාවිත කරනු ලැබ තිබේ.

දැන් සිදු විය යුත්තේ පවතින තත්ත්වයට මුහුණ දීම මිස විවේචන ඉදිරිපත් කිරීම නොවේ. ඒ අනුව කොවිඩ් තෙවන රැල්ල මර්දනය සඳහා කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙයි. දෛනික පී.සී.ආර්. පරීක්ෂණ ප්‍රමාණය වැඩි කර ඇත. රෝහල් පහසුකම් වැඩි කිරීමට පියවර ගෙන ඇත. ආරක්ෂක හමුදා ඇඳන් දහදාහක් හා සෞඛ්‍ය පහසුකම් සහිත තාවකාලික රෝහල් ඉදිකිරීමට ද පියවර ගෙන තිබේ. මේ මොහොතේ පවා ඊට අදාළ වැඩ කොටස් ඉටුවෙයි. දිවා රාත්‍රී නොබලා කොවිඩ් මර්දනයට යුහුසුලු වන කණ්ඩායමක් අපට සිටී. එය විශාල සහනයකි. ජනාධිපතිවරයා පෙන්වා දෙන අන්දමට කොවිඩ් මර්දනයත් එක්තරා යුද්ධයකි. ඊට රාජ්‍ය නිලධාරීන්ගේ, ආයතනවල පමණක් නොව, ජනතාවගේ ද සහයෝගය අවශ්‍ය වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානියා ශ්‍රී ලංකාවට සහතිකයක් දී ඇත. එනම්; කොවිඩ් පළමුවන රැල්ල පරාජය කළ අයුරින්ම ශ්‍රී ලංකාව තෙවන රැල්ල ද පරාජය කරනු ඇත යන්නය. එය බොරුවක් නොවීමට අප වග බලා ගත යුතුය.

දිල්රුගෙ සීවරේ

තවත් රටවල හුගක් ජීවිත අකාලේ නැසු	වයිරසේ
අලුත් හැඩ සහ නපුරු වැඩ ගෙන මෙහෙත් ඇවිදින්	බව ඇසේ
වුණොත් එක දශමයක වරදක් හදන්නේ කවුරුද	කෙසේ
පරිස්සම අප අතේමය; ඉගිළෙන්න බැහැ දැන්	නිදහසේ

වරාය නගරය
චීන කොලනියක් ද?

ශ්‍රී ලංකාවේ සිතියම වෙනස් කරමින් ගාලු මුවදොර මුහුදු ප්‍රදේශය ගොඩ කරමින් රටට එකතු වූ භූමි ප්‍රමාණයත් සමඟ අපේ රටේ වර්ග ප්‍රමාණය තවදුරටත් වර්ග කි.මී. 25610ක් නොවේ. එයට තවත් වර්ග කි.මී.2.69ක් එකතු විය යුතුය. එම හෙක්ටයාර 269ක් හෙවත් අක්කර 664ක භූමි ප්‍රදේශයේ ඉදි වන කොළඹ වරාය නගරය කොළඹ නගරයේම දිගුවක් ලෙස ගොඩනැගෙමින් පවතී. මූල්‍ය හා සේවා දියුණු කරමින් ප්‍රමුඛ වශයෙන්ම වාණිජ කලාපයක් ලෙස නිර්මාණය වන වරාය නගරය 'චීන කොලනියක්' බව පවසමින් රටේ ස්වෛරීභාවයට තර්ජනයක් එල්ල වී ඇති බවට දේශපාලන අඩෝවැඩියාවක්' පසුගිය දිනවල ඇසිණි.

මෙරට දේශපාලන සංස්කෘතියට අරක් ගත් පටු අවස්ථාවාදී හා කුහක දේශපාලනයේ පැතිකඩක් වරාය නගරයට එරෙහිව එල්ල වූ එම විරෝධයත් සමඟ දිස් වේ. ඇත්තටම වරාය නගරය චීන කොලනියක් ද? මේ ප්‍රශ්නයට දිය හැකි පිළිතුර පැහැදිලිය. සරලය. ඒ 'නැත' යන්නය. එසේ නම්, ඊට එරෙහිව මිථ්‍යාව පතුර වන විපක්ෂ කණ්ඩායම් එවැනි හඬක් නගන්නේ එය නොදැන ද? යන්න තවත් ප්‍රශ්නයකි. ඊට දිය හැකි පිළිතුර ද 'නැත' යන්නය. ඒ බව දැන සිටිය ද පෙර කී දේශපාලන භාවිතයෙන් නිදහස් වීමට ඇති නොහැකියාව ඊට හේතුවය. වරාය නගරය ඉදි වන භූමිය ශ්‍රී ලංකාව සතුය. එය චීනය අල්ලා ගන්නේ නැත.

වසර දහස් ගණනක ඉතිහාසයේ චීනය ලොව කිසිදු රටක් ආක්‍රමණය කර නැත. එබැවින් චීනයේ සැබෑ මිතුරකු වන ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමේ කිසිදු වුවමනාවක් චීනයට තිබිය නොහැකිය. දෙරට අතර සබඳතා 4 වැනි සියවස පමණ සිට ඓතිහාසිකව විකාශනය වෙමින් පවතී. ෆාහියන් භික්ෂුවගේ සංචාරය එම සබඳතාවලට මුල පිරීමක් බඳුය. එවක් පටන් බුදුදහම මුල්කොට ගනිමින් ද, සංස්කෘතික, වෙළෙඳ ආදි සබඳතා ගොඩනඟා ගනිමින් ද එම සබඳතා සමීපව හා ශක්තිමත්ව ගොඩනැගිණි. එදා ද ශ්‍රී ලංකාව සේද මාවතේ වැදගත් රාජ්‍යයකි. නව සමුදුරු සේද මාවත දිගහැරෙන්නේ ද භූ දේශපාලනික වශයෙන් අතිශය වැදගත් එම මිතුරු රාජ්‍ය ද සම්බන්ධ කර ගනිමිනි. අමෙරිකාව ඇතුළු රටවල් නොරිස්සන ඔවුන්ට රිදුම් දෙන කාරණය ඇත්තේ මෙකී භූ දේශපාලන සාධක සමඟය. ලොව රටවල් ගණනාවක අමෙරිකානු යුද කඳවුරු පිහිටා ඇතත් කිසිදු රටක චීන යුද කඳවුරු පිහිටා නැත. ශ්‍රී ලංකා චීන සබඳතාවන්ගේ නව පරිච්ඡේදයක් පෙරළෙන්නේ 1950 දශකයේය. 1952 දී ශ්‍රී ලංකාව හා චීනය අතර රබර්, සහල් ගිවිසුමට අස්සන් තබන විට දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවා ඇතිවී නොතිබිණි. මේ ගිවිසුම දෙරටටම වාසිදායක විය. චීනයට අත්‍යවශ්‍යව තිබූ රබර් සැපයීමට ශ්‍රී ලංකාව එකඟ වීම එරට ඉහළින් අගය කළේ මෙරටට වාසිදායක පසුබිමක් නිර්මාණය කරමිනි.

පැරණි සබඳතා

1956 දී එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක අගමැතිවරයා බලයට පත් වීමත් සමඟ 1957 දී දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇරඹිණි. එවක් පටන් ද්විපාර්ශ්වික සබඳතා වඩාත් ශක්තිමත් විය. සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ පාලන යුගවලදී එය තවත් පෙරට ගෙන යෑම සිදු විය. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලයට පත් වූ සෑම රජයක්ම පාහේ චීනය සමඟ හොඳ සබඳතාවන් පවත්වා ඇත. ඒ අතුරින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වමේ ආණ්ඩු බලයට පත් වූ විට ද්විපාර්ශ්වික සබඳතා වඩාත් ශක්තිමත් වූ අයුරු පැහැදිලිය. බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාව (BMICH) එම මිත්‍රත්වයේ සංකේතයකි. ක්‍රමයෙන් දෙරට අතර වෙළෙඳ හා ආර්ථික සබඳතා පුළුල් වූ අතර මෙරට යටිතල පහසුකම් නැංවීම සඳහා චීනය විශාල ලෙස උපකාරී වී තිබේ.

තිස් අවුරුද්දක් තිස්සේ ඇදෙමින් ගිය බෙදුම්වාදී යුද්ධය නිමාවට පත් කරමින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය තීරණාත්මකව පරාජය කිරීම සඳහා චීනය ශ්‍රී ලංකාවේ සැබෑ මිතුරකු ලෙස දුන් සහාය හා ආධාර බෙහෙවින් වැදගත්ය. ඉන් නොනැවතී බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජය කිරීම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඇතුළු අන්තර්ජාතික වේදිකාවලදී ශ්‍රී ලංකාවට එල්ල වූ අභූත චෝදනා හමුවේ චීනය ශ්‍රී ලංකාවත් සමඟ සිට ගන්නේ දැවැන්ත ශක්තියක් ලබා දෙමිනි.

2005 වසරේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත්වීමෙන් පසුව ශ්‍රී ලංකා චීන සබඳතාවන්ගේ තවත් වැදගත් පරිච්ඡේදයක් ඇරඹි බව පැහැදිලිය. පෙර කී සහායට අමතරව යටිතල පහසුකම් නැංවීමේ හා මෙරට සංවර්ධන ව්‍යාපෘති සඳහා වරාය බලශක්ති, ප්‍රවාහන ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ චීනය සහාය දෙමින් සිටී. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය ඇරඹෙන්නේ ද මේ අවධියේය.

වරාය නගරය ඉදි වීමත් සමඟ ශ්‍රී ලංකාව චීන කොලනියක් වීමේ කතාවට සම්බන්ධ කරමින් එය මෙරට නීතිය ක්‍රියාත්මක නොවන බව, මෙරට ආයෝජනයන්ට ඉඩ ප්‍රස්තා නැති බව, ශ්‍රී ලාංකිකයන්ට රැකියා නොලැබෙන බව, එම භූමියට ශ්‍රී ලාංකිකයන්ට ඇතුළු විය නොහැකි බවට ආදි වශයෙන් තවත් ප්‍රචාර ගණනාවක්ම පතුරුවා හැර ඇත. එම ප්‍රචාරවල සත්‍ය, අසත්‍යතාව සැබෑ තතු විමසා බැලීමෙන් දැන ගත හැකිය.

කොළඹ වරාය නගරයේ බලපැවැත්වෙන්නේ ද අපට බලපවත්වන නීතියමය. වරාය නගර කොමිෂන් පනත රැගෙන ඒමෙන් ආයෝජකයන් සඳහා වඩාත් පහසු හා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කෙරේ. එය අපේ රටේ ස්වෛරීභාවයට, නීති පද්ධතියට බලපෑම් කරන කාරණයක් නොවේ. කෙසේ වුවද එමපමණට සංශෝධන සිදුකිරීම අවශ්‍ය ද යන්න ඒ පිළිබඳ අධිකරණ තීන්දුව මඟින් දැන ගත හැකිය. වරාය නගරයේ පළමුවන ආයෝජනය සිදු කර ඇත්තේ ශ්‍රී ලාංකික සමාගමකි. මෙරට ආයෝජකයන් සඳහා එහි ඉඩ ප්‍රස්තා තිබේ. එසේම එහි ආයෝජන සිදු කරන්නේ චීනය පමණක්මත් නොවේ. සෙසු රටවල ආයෝජකයන් සඳහා ද එය විවෘතය. ඒ බව ලෝකයේ වෙනත් මෙවැනි කලාප පිළිබඳ විමසන විට පැහැදිලි කර ගත හැකිය. දැනට ප්‍රකාශ වී ඇති පරිදි, වරාය නගරය මඟින් උත්පාදනය වනු ඇති සෘජු රැකියා අවස්ථා ප්‍රමාණය 80,000ක් පමණය වේ. වක්‍ර රැකියා ගෙන ඒමෙන් තුන් හතර ගුණයක් වන එම සෘජු රැකියා අවස්ථා ද ශ්‍රී ලාංකිකයන් සඳහා විවෘතය. රැකියා උත්පාදනය කර ගැනීමට අප සමත් විය යුතුය. දේශපාලන කුහකයන් ලෙස ක්‍රියා කිරීම වෙනුවට සිදු විය යුත්තේ එම රැකියා කිරීමට අවශ්‍ය දක්ෂතා සුදුසුකම් - නිපුණතාව සහිත අයට ඊට ඉඩ ප්‍රස්තා ඇති බව පෙන්වා දීමය. වරාය නගර භූමියට ශ්‍රී ලාංකිකයන්ට ඇතුළු වීමටවත් නොහැකි බවට ගෙන යන ප්‍රචාරවලට තවත් මාස කිහිපයකින් ශ්‍රී ලාංකිකයන් විසින්ම පිළිතුරු දෙනු ඇත. ඒ එහි ගොස් සැබෑ තතු දැක බලා ගැනීමෙන් අනතුරුවයි.

> වසර දහස් ගණනක ඉතිහාසයේ චීනය ලොව කිසිදු රටක් ආක්‍රමණය කර නැත. එබැවින් චීනයේ සැබෑ මිතුරකු වන ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමේ කිසිදු වුවමනාවක් චීනයට තිබිය නොහැකිය. දෙරට අතර සබඳතා 4 වැනි සියවස පමණ සිට ඓතිහාසිකව විකාශනය වෙමින් පවතී. ෆාහියන් භික්ෂුවගේ සංචාරය ඒ සබඳතාවලට මුල පිරීමක් බඳුය.

පොදු පහසුකම්

දැනටමත් යාත්‍රා අංගණය වැනි ස්ථානවල මංගල උත්සව සඳහා පෙර රූගත කිරීම්, සාද ආදිය පැවත්වී තිබේ. එවැනි අවස්ථා සඳහා ඉහළ ඉල්ලුමක් ද ඇත. වරාය නගරයට අයත් සමස්ත භූමි ප්‍රමාණයෙන් 1/3ක් පමණ වෙන් කෙරෙනු ඇත්තේද හරිත උද්‍යාන ආදී පොදු පහසුකම් වෙනුවෙනි. ඒ සියල්ල ශ්‍රී ලාංකිකයන් සඳහා ද විවෘතය. තවමත් ලෝක බලවතා වන්නේ අමෙරිකාව වුවද නැඟී එන ලෝක ආර්ථික බලවතා ලෙස චීනය අමෙරිකාව ඉක්මවා යනු ඇති බව ඉතා පැහැදිලිය. මිල දී ගැනීමේ හැකියාව අනුව දැනටමත් ඉදිරියෙන් සිටින්නේ චීනයයි. කොවිඩ් - 19 වසංගතය සාර්ථක පාලනය කිරීමෙන් පසුව නැවතත් චීනය ඉදිරියට ගමන් කිරීමට පටන්ගෙන ඇත. චීන ප්‍රතිවාදීන් අග්නිදිග ආසියාතික රටවල චීන ආයෝජන සම්බන්ධයෙන් මවා ඇති චිත්‍රය නිවැරදි නොවන බව සංඛ්‍යා දත්ත මඟින්ම පැහැදිලි කර ගත හැකිය.

ශ්‍රී ලංකාව චීන ණය උගුලක සිරව ඇතැයි නඟන ප්‍රවාදය ද ඒ ඔස්සේ පැහැදිලි කර ගත හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව වඩාත් උනන්දු වෙමින් සිටින්නේ චීනයෙන් ණය ගැනීමට වඩා ආයෝජන ආකර්ෂණය කර ගැනීම වෙනුවෙනි. එසේ වුවද දෙරට අතර වෙළෙඳ හිඟයේ පරතරය විශාලය. මෙරට අපනයන සඳහා චීනයේ සුවිසල් වෙළෙඳපොළ අවස්ථා සපයා ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුය. එම වෙළෙඳ සබඳතා ගොඩනඟා ගැනීම කෙරෙහි මෙරට නිෂ්පාදකයන් දිරිගැන්විය යුතුය.

වරාය නගරය සම්පූර්ණයෙන් ගොඩනැඟී තිබෙනු ඇත්තේ තවත් දශක දෙකක්වත් ගත වීමත් සමඟය. ඒ වන විට, චීනය ලෝක ආර්ථික බලවතා ලෙස නැඟී සිටින්නට ද බොහෝ ඉඩ තිබේ. චීනයේ උපාය මාර්ගික හා දේශපාලනික අභිලාෂ පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව මෙම සමීප බලවතා මිතුරා සමඟ සබඳතා වර්ධනය කර ගැනීම ශ්‍රී ලංකාවට වාසිදායක වනු ඇති අතර කලාපයේ අවංක මිතුරකු ලෙස අපගේ මිත්‍රත්වය හා සහයෝගය චීනය ද අගය කරනු ඇත.

ධම්මික සෙනෙවිරත්න

විකල්ප ක්‍රම මඟින් පාරිභෝගිකයන්ට සහන රැසක් දෙනවා

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති, පොදුජන ඉංජිනේරු පෙරමුණේ සභාපති, ඉංජිනේරු විජිත හේරත්

ලංකා විදුලිබල මණ්ඩලයේ පවතින ගැටලු සම්බන්ධව සහ විදුලි පාරිභෝගිකයන්ට පුනර්ජනනීය විදුලි බලය මඟින් අඩු පිරිවැයකින් වාසි අත්පත් කර දීම වැනි කරුණු රැසක් පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති, පොදුජන ඉංජිනේරු පෙරමුණේ සභාපති, ඉංජිනේරු විජිත හේරත් මහතා සමඟ කරන ලද සාකච්ඡාවකි.

● ඔබ ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගන්නා විට මේ ආයතනයේ පැවැති තත්ත්වය ගැන සඳහන් කළොත් ?

මේ ආණ්ඩුව පිහිටුවන්න පෙර පොදුජන ඉංජිනේරු පෙරමුණේ සභාපතිවරයා ලෙස මමත් අපේ කණ්ඩායමත් ඉංජිනේරු තාක්ෂණයට සම්බන්ධ ආයතන දියුණු කරන්නේ කොහොමද කියන දේ අධ්‍යයනය කරලා ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබුණා. විදුලිබල මණ්ඩලය ලාභ නොලබන ආයතනයක් විදිහට තමයි සඳහන් වෙලා තිබුණේ. ඒකට හේතු රාශියක් අපට හඳුනා ගන්නට හැකි වුණා. විදුලිය නිෂ්පාදනය කිරීමට යන පිරිවැය මේ විශාල අලාභයක් ලැබීමට හේතුව. 2019 වසරේදී අපේ අලාභය රුපියල් බිලියන 92ක්. විදුලිබල මණ්ඩලය වසරකට විදුලිය කිලෝවොට් පැය බිලියන 16ක් පමණ උත්පාදනය කරනවා. රුපියල් 23ක් විතර එක ඒකකයක් නිෂ්පාදනය කිරීමට වැය වෙනවා. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු.17ක් පමණ වෙනවා. ඒ අනුව රුපියල් 6.50ක් විතර එක ඒකකයකට පාඩු වෙනවා.

විදුලිය අලෙවි කරන්නේ විදුලිය නිෂ්පාදනය කරන පිරිවැයට වඩා අඩු මුදලකට. ඒකක 30ට වඩා අඩුවෙන් භාවිත කරන පාරිභෝගිකයන්ගෙන් විදුලි ඒකකයකට අය කරන්නේ රුපියල් 3.50කට පමණ. එවැනි පාරිභෝගිකයන් ලක්ෂ 12 ට වැඩියි. ඒකක 30ත් 60ත් අතර පරිභෝජනය කරන පිරිසගෙන් අය කරන්නේ රුපියල් 5.85යි. එවැනි පාරිභෝගිකයන් ලක්ෂ 13ක් පමණ වෙනවා. 2014 වසරේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා නොරොච්චෝලේ බලාගාරය ඉදි කරල විදුලි බිල සියයට 25කින් අඩු කළා. ඒ අනුව 2015 වසරේ කෝටි 2000ක් ලාභ ලැබුවා.

විදුලිය ක්‍රම කිහිපයකින් නිෂ්පාදනය කරනවා. මුළු විදුලියෙන් ජල විදුලිය සියයට 25ක්, ජලවිදුලි නිෂ්පාදන පිරිවැය අඩුයි. ගල් අඟුරුවලින් සියයට 30ත් 35ත් අතර විදුලිය එකතු වෙනවා. සියයට 30ක් විතර ඩීසල්වලින් නිපදවන විදුලිය මිලට ගන්නවා. මේ විදුලිය තමයි මිල වැඩිම. විදුලිබල මණ්ඩලය පාඩු වෙන්න හේතුව ඩීසල් කීවොත් හරි. හදිසි මිලදී ගැනීම්වලදී ඩීසල්වලින් නිෂ්පාදිත විදුලි ඒකකයක් රුපියල් 30ක් පමණ වෙනවා. ඒකක බිලියන 5ක් පමණ ඩීසල්වලින් නිපදවන විදුලිය. රුපියල් 20ක විතර පාඩුවකට තමයි එම විදුලි ඒකකයක් අලෙවි කරන්නෙ.

ඊට අමතරව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති එනම්, මිනි හයිඩ්‍රොලික, සූර්ය බලශක්තිය සහ සුළං බලය යොදාගෙන විදුලිය සියයට 10ක් ප්‍රධාන විදුලි ධාරාවට එකතු කර ගන්නවා.

● විදුලි පිරිවැය අඩුකර ගත හැකි ක්‍රම වේද හඳුනාගෙන තිබෙනවාද?

ඩීසල් වෙනුවට අඩු වියදම් බලාගාර පිහිටුවමින් විදුලිය නිෂ්පාදනය කරන එක තමයි විදුලි පිරිවැය අඩු කර ගත හැකි ප්‍රධානම ක්‍රමය වන්නේ. අඩු වියදම් බලාගාර ලෙස ජලවිදුලි බලාගාරවලින් උමා ඔය, බෝඩිලන්ඩ් හා මොරගොල්ල බලාගාර සාදා නිම කළේ නෑ පහුගිය ආණ්ඩුව. උමා ඔය අවුරුදු පහක් පමණක් මොරගොල්ල බලාගාරය අවුරුදු තුනක් පමණක් සාදා නිම කිරීමට ප්‍රමාදයි. මේ ප්‍රමාදය නිසා ජාතික විදුලිබල පද්ධතිය අලුතින් විදුලිය එකතු කර ගැනීම ප්‍රමාද වෙලා. එය විශාල පාඩුවක් විදුලිබල මණ්ඩලයට.

අඩු වියදම් බලාගාර ලෙස සාම්පූර්වල අඩු ගල් අඟුරු බලාගාරයක් හැදීමට නියමිතව තිබුණා. යහපාලන ආණ්ඩුව ඒ ව්‍යාපෘතිය නැවැත්වුවා. එතන මෙගාවොට් 500ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු වීම වැළකුණා. ප්‍රතිපත්ති තීන්දු ගැනීමේ දුර්වලතාවය නිසා සිදු වුණේ විශාල පාඩුවක්.

විදුලි ඉල්ලුම් වාර්ෂිකව 6% පමණ වැඩි වෙනවා. ඉල්ලුම වැඩි වීමට සාපේක්ෂව නව විදුලි බලාගාර ස්ථාපනය කළ යුතු වෙනවා. එසේ නොකළොත් හදිසි මිලදී ගැනීම් කළ යුතු වෙනවා. පසුගිය ආණ්ඩුව නව විදුලි බලාගාර ස්ථාපනය නොකර ඩීසල් බලාගාර ගෙනාවේ. ඒ අනුව විශාල වියදමක් වැය වෙනවා ඩීසල්වලින් නිෂ්පාදනය කරන විදුලිය මිල දී ගන්න. ඒ නිසා තමයි බිලියන කෝටි 200 ලාභ ලබපු ආයතනයක් කෝටි 9200ක් පාඩු ලබන ආයතනයක් වුණේ. ඒ අනුව අපේ ප්‍රධාන ඉලක්කය ඩීසල් බලාගාර භාවිතය නැවැත්වීම. ඩීසල්වලින් විදුලිය නිපදවල කවදාවත් විදුලිබල මණ්ඩලයට ලාභ ලබන්න බෑ.

● LNG විදුලි සැපයුම ගැන නව කතා මාතෘකාවක් කරළියට ඇවිත් තිබෙනවා නේ ද?

පාඩුව අවම කර ගන්න ඊළඟ හොඳම විකල්පය ද්‍රව ස්වභාවික වායුවලින් (LNG) විදුලිය නිපදවීම. LNG පිළිබඳ පසුගිය අවුරුදු 10 පුරාවට සාකච්ඡා කරල තියනවා. නමුත් ඒ කතාව විතරයි. වැඩ නෑ. මේ ආණ්ඩුව පත් වුණාට පසුව LNG සැපයුමට පළමු ටෙන්ඩරය ගිය මාසේ කැඳෙව්වා. අපි බලාපොරොත්තු වෙනවා තව මාස 06 කින් පමණ ඉදිකිරීම් ආරම්භ කරන්න. ඒවගේම 2024 LNG සැපයුම ලබා දෙන්නට.

● ගල්අඟුරු බලාගාරයක් සමඟ පරිසර දූෂණයක් සිදු වෙනවා කියලා සමාජයේ කතිකාවතක් තිබුණා නේ ද?

පරිසරයට අපි ආදරෙයි. නමුත් ඔය කතිකාවත පිටුපස ඉන්නේ ඩීසල් විදුලි බලාගාරවලින් ආදායම් උපයන අය වෙන්න පුළුවන්. ගල් අඟුරුවලින් වගේම තමයි ඩීසල්වලිනුත් ඒ පරිසර හානිය වෙන්නේ. හැබැයි ඩීසල්වල පිරිවැය වැඩියි ගල් අඟුරුවලට සාපේක්ෂව. අපට වෙන විකල්පයක් මේ මොහොතේ නෑ. ගල් අඟුරුවලින් එක ඒකකයක් නිෂ්පාදනයට රු. 11ක් පමණ වැයවෙනවා. ඩීසල් වලට සාපේක්ෂව රුපියල් 26ක වෙනසක්.

ගල් අඟුරු බලාගාරය නොතිබුණා නම් මේ වන විට දවසකට පැය 8ක් විදුලිය විසන්ධි කරන්න වෙනවා. ඒ වගේම විදුලිබල මණ්ඩලයේ පාඩුව කෝටි 20 000ක් පමණ වෙන්න තිබුණා.

● පුනර්ජනනීය බලශක්තිය සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාවෙන් සඳහන් වෙලා තිබුණා?

අපේ ප්‍රධාන ඉලක්කය වෙලා තියෙන්නේ පුනර්ජනනීය බලශක්තිය. ජනාධිපතිතුමා නිරන්තරයෙන් කියන්නේ පුනර්ජනනීය බලශක්තියට යා යුතුයි කියලා. පුනර්ජනනීය බලශක්තියේ ප්‍රධාන ගැටලු දෙකක් තියනවා. සූර්ය බලශක්තියෙන් විදුලිය නිපදවිය හැකි වන්නේ නිශ්චිත කාලයකදී පමණයි. රාත්‍රියට මෙන්ම දහවල් කාලයේ වලාකුළකින් ආවරණය වුණොත් විදුලිය නිපදවා ගැනීම සීමා වෙනවා. ඉල්ලුමට අනුව විදුලිය හැම මොහොතකම නිපදවිය යුතු නිසා ඒ සඳහා සූදානමින් සිටිය යුතුයි.

විදුලිය ගබඩාකරණය සහ තාක්ෂණය ජය ගැනීමයි අපේ අරමුණ. ඒ සඳහා සාධනීය පියවර කිහිපයක් තබා අවසන්. ඒ අතර තම්බපවනී සුළං බලාගාරය ස්ථාපනය කළා. කොරෝනා සමයෙත් එහි වැඩකටයුතු කළා. ඒ සඳහා මූලිකත්වය ගත්තේ බැසිල් රාජපක්ෂ මහතා. මන්නාරම් දූපත, පූනරින් ආදී සුළං කලාපවල විදුලි බලාගාර ස්ථාපනය කිරීමට කටයුතු සූදානම්. ගමට බලාගාරයක් ව්‍යාපෘතිය යටතේ කිලෝවොට් 75ක බලාගාර 7000ක් පිහිටුවීමට නියමිතයි. පළමුවැනි බලාගාර 800 සඳහා ටෙන්ඩරය කැඳවලා තියෙන්නේ. උමා ඔය බලාගාරය මේ වසරේ විවෘත කිරීමට නියමිතයි. මෙගාවොට් 300ක ගෑස් පවර් බලාගාරක් පිහිටුවීමටත් සූදානම්. බ්‍රෝඩ්ලන්ඩ් බලාගාරය මේ වසරේ අගෝස්තුවල විවෘත කරනවා.

● ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරික්ත සේවකයින් සිටිනවා කියල විශාල චෝදනාවක් තිබෙනවා නේ ද?

පසුගිය ආණ්ඩු කාලයේ අසාමාන්‍ය විදියට සේවකයින් බඳවාගෙන තිබුණා. 7000ක් පමණ බඳවා ගෙන තිබුණා. නමුත් වර්තමාන ඇමැතිවරයා ඒක සේවකයකුවත් බඳවා ගෙන නෑ. දේශපාලන දැක්මක් ඇති නායකත්වය පරිපාලන ලේකම්වරයාගේ දායකත්වය මෙන්ම ආයතනයේ නිලධාරීන්ගේ දැක්මක්.

කොරෝනා සමයේ බිලියන 7ක විදුලිය සහනයක් දුන්නා. තෙල් මිල අඩු වීමේ සහනය හිමි වීම, හොඳ වර්ෂාවක් ලැබීම, හදිසි මිලදී ගැනීම් නොකිරීම, නොරොච්චෝලේ වැඩි උත්පාදනයක් කිරීම වැනි කාරණ නිසා ගිය වසරේ සියයට 40න් විදුලිබල මණ්ඩලයේ අලාභය අඩු වුණා. ඒකට හේතු ගණනාවක් තියෙනවා. බිලියන 92ක්ව තිබූ අලාභය බිලියන 62 කට අඩුවුණා. ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරය, මේ ව්‍යාපෘති ඉක්මන් කිරීම

LED බල්බ් බෙදා දීම, CEB CARE APP, ඒකට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අතර ඇති ඇප්වලින් හොඳම ඇප් එකට හිමි සම්මානය හිමි වුණා.

● රටේ සැමට විදුලිය ලබා දීම වෙනුවෙන් ගෙන ඇති පියවර මොනවාද?

අපේ රටේ තවම විදුලිය නැති 100 000කට ආසන්න පිරිසක් සිටිනවා. ඔවුන්ට විදුලිය දී අවසන් කිරීම මේ වසරේ අපේ ඉලක්කය වන්නේ. ඒ යටතේ "දැයට එළිය" ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභීන් 60 000 ට නොමිලේ විදුලිය දීම පළමු වැනි පියවර වන්නේ. සමෘද්ධිලාභී නිවෙස්වලට විදුලිය දීම සඳහා මේ වන විටත් විදුලිබල මණ්ඩලයේ කාර්මික නිලධාරීන් විසින් පවා එම නිවෙස් වයරින් කරපු අවස්ථා තිබෙනවා. තව තවත් සමෘද්ධිලාභී පවුල් සඳහා විදුලිය ලබා ගැනීමට ණය පහසුකම් දී තිබෙනවා. මේ වන විට "දැයට එළිය" වැඩසටහන යටතේ පවුල් 15000 පමණ නොමිලේ විදුලිය ලබා දී තිබෙනවා.

රසිකා හේමමාලි

විදුලිය අලෙවි කරන්නේ විදුලිය නිෂ්පාදනය කරන පිරිවැයට වඩා අඩු මුදලකට

තවම විදුලිය නැති 100,000කට ආසන්න පිරිසක් සිටිනවා

සමෘද්ධිලාභී පවුල් සඳහා විදුලිය ගැනීමට ණය පහසුකම් දී තිබෙනවා

කොරෝනා සමයේ බිලියන 7ක විදුලි සහනයක් දුන්නා

හැම දවසක්ම අම්මලාගේය

(ඊයේ දිනයට යෙදුණු ලෝක මවුවරුන්ගේ දිනය නිමිත්තෙනි)

'ලෝකයේ පැවැත්ම රඳා පවතින්නේ හිරුගේ කිරණත් මවගේ කිරිත් නිසාය' යන්න ප්‍රකට කියමනකි. මවගේ කිරි බර පියොවුරු තුඩු මත දෙතොල් තබා ගන්නා කිරිකැටියන් ජීවිතයේ පළමු සංතෘප්තිය ලබන විට එයට කිසිසේත්ම සම කරන්නට නොහැකි තරම් ඉහළ තෘප්තියක් විඳින්නට අම්මාවරුන්ට හැකිය. දරුවකුගේ පළමු හැඬීමේදී පිට වන ශබ්දයේ සිට ඔහුගේ ජීවිතයේ සියලු හඬ නැගීම් ද ඔහු දක්වන සෑම චලනයකින්ම ද අම්මලාගේ හදවත් දරුවන් කෙරෙහි තව තවත් තදින් බැඳ තබන්නට සමත් වෙයි. ආදරයේ උල්පත වන අම්මාට තුන්සිය හැට පහක් වූ වසරක දිනවලින් එක් දිනයක් වෙන් කළ පමණින් සියල්ල සම්පූර්ණ වන්නේ නැත. එහෙත් කැලැන්ඩරයේ සෑම දිනක්ම එක් එක් දේවල්වලට වෙන් කරද්දී අම්මාවරුන් වෙනුවෙන් ද දිනයක් වෙන් කර තිබේ. එය පැහැදිලි අරමුණකින් සහ සැබෑ දයාවකින් කළ කටයුත්තකි. සාමාන්‍යයෙන් ගත් කල විවිධ රටවල් සෑම වසරකම මාර්තු සහ මැයි අතර කාලසීමාවේ දිනයක් මවුවරුන්ගේ දිනය ලෙස යොදා ගන්නා නමුත් ඇතැම් රටවල් මෙයින් පරිබාහිර මාසයක දිනයක් මේ සඳහා වෙන් කර ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ අප අම්මාවරුන්ගේ දවස සමරන්නේ සෑම වසරකම මැයි මාසයේ දෙවනුව යෙදෙන ඉරු දිනයේය. මෙවර අප එය සැමරුවේ ඊයේ (10) දවසේ වීම මේ සටහනට හේතු පාදක වෙයි.

1864 වසරේ එක්සත් ජනපදයේදී උපත ලද ඇනා මරියා ජාවිස් මවුවරුන්ගේ දිනයේ නිර්මාතෘවරියයි. ඇගේ මව නිරන්තරයෙන්ම එබඳු දිනයක් ආරම්භ කිරීම පිළිබඳව කැමැත්තෙන් පසු වූ අතර මවගේ අභාවයෙන් පසු සිය මව සිහිපත් කරමින් ලොව සියලු මවුවරුන් වෙනුවෙන්, දිනයක් වෙන් කිරීම සඳහා පුරෝගාමී වී ඇත්තේ ජාවිස්ය. මවට ඉතා දැඩිව ආදරය කළ ඇනා ජාවිස්, මව ජීවත්ව සිටින තුරු නිරන්තරයෙන්ම ඇය පිළිබඳව සොයා බලමින් ඇය සමඟ සිය අදහස් හුවමාරු කර ගනිමින් පසු වූ ආදරණීය දියණියක් බව ඇය පිළිබඳව වන සටහන් කියැවීමේදී පෙනී යයි.

මවුවරුන් වෙනුවෙන් නිවාඩු දිනයක් ලෙස නම් කරන්නට සූදානමින් වෙන් කළ මවුවරුන්ගේ දිනය ටිකෙන් ටික වාණිජකරණය වීම එහි නිර්මාතෘ ජාවිස්ට හෝ වළක්වන්නට හැකි වූයේ නැත. මවුවරුන්ට සුබ පැතීම සඳහා නිර්මාණය වන ඉහළ වටිනාකමකින් යුත් සුබපැතුම්පත් සහ මල් වර්ග ද විවිධ ත්‍යාග ආදිය ද ඉහළ මිලකට අලෙවි වීම තුළ එහි සැබෑ අරුත ගිලිහෙමින් පවතින බව දක්නට ලැබුණු පසු, නිර්මාතෘ ජාවිස් විසින්ම එම දිනය අවලංගු කර දැමීමට පවා උත්සාහ දරා තිබේ.

එක්සත් රාජධානියෙහි මවුවරුන්ගේ දිනය ජාතික නිවාඩු දිනයක් ලෙස නම් කිරීමේ වෑයම ජාවිස් විසින් ආරම්භ කර තිබෙන්නේ 1905 වසරේදීය. කෙසේ වෙතත් මෙම අරමුණ ඉදිරියට ඇදුනේ විවිධ බලපෑම් සහ බාධක රැසක් මැදිනි. සෑම වසරකම මැයි මාසයේ දෙවැනි සතියේ එළැඹෙන ඉරිදාව මවුවරුන් වෙනුවෙන් වෙන් කරන නිවාඩු දිනයක් බවට එවකට එක්සත් රාජධානියෙහි ජනපති වූ වුඩ්රෝව් විලීසන් විසින් 1914දී තබන ලද අත්සනකින් තහවුරු වී ජාවිස්ගේ වෑයම ජයග්‍රහණය කළේය.

හින්දු සම්ප්‍රදායට අනුව මවුවරුන්ගේ දිනය අප්‍රේල් සහ මැයි මාස දෙකෙහි දින කිහිපයක් තුළ පවත්වන අතර එය කිසිවිටකත් එක් දිනයකට පමණක් සීමා නොවේ. "මාතා තීර්තා අවුන්ම්" නොඑසේ නම් "මව් වන්දනා දෙසතිය" ලෙස මේ කාලය හඳුන්වනු ලබයි. හින්දු ජනගහනය වැඩිපුර වෙසෙන නේපාලය වැනි රටවල මවුවරුන්ගේ දිනවලදී මව්වරුන් වෙත විශේෂ ආහාරපාන පිරිනැමීම ආදිය සිදුවේ. එය ආගමික පසුබිමක් මත සිදුවන අතර එක්සත් ජනපදයෙන් මවුවරුන්ගේ දිනය බිහි වීමට පෙර සිටම ඔවුන් සම්ප්‍රදායක් වශයෙන් මේ සැමරුම සිදු කර ගෙන පැමිණි බව ද සඳහන් වෙයි.

අරාබි රටවල මවුවරුන්ගේ දිනය යෙදෙන්නේ මාර්තු මස විසි එක් වනදාටය.

බෙලාරුස්, ආජන්ටිනා වැනි රටවල් මේ දිනය ඔක්තෝම්බර් මාසයෙහි සමරන අතර බ්‍රසීලයේ ද 1932 වර්ෂයේදී එවක එහි ජනපති ගෙටලියෝ වර්ගාස් විසින් මැයි මස දෙවන සතියේ ඉරිදා මවුවරුන්ගේ දිනය ලෙස නිල වශයෙන් නම් කරන ලදී.

චීන මවුවරුන්ගේ දින සැමරුමේදී වැඩි වශයෙන්ම අලෙවි වන්නේ කානේෂන් මල්ය. එක්සත් ජනපදයේදී ආරම්භ වුවත් චීනය නොමැළිව මවුවරුන්ගේ දිනය පිළිගැනීම පිළිබඳව ඔවුන් සඳහන් කරන්නේ වැඩිහිටියන්ට සැලකීම රටෙහි සාම්ප්‍රදායික ආචාර ධර්මයක් වීම එයට හේතුව බවය.

මෙසේ ලෝකයේ විවිධ රටවල් විවිධාකාරයෙන් සමරනු ලබන මවුවරුන්ගේ දිනය කිසිදු රටක් ප්‍රතික්ෂේප නොකර දිගින් දිගටම පවත්වාගෙන යන්නේ මවුවරුන්ට ගරු කිරීම සහ ඔවුන් වෙත සැලකිල්ල දැක්වීම සඳහා දිනයක් වෙන් කර ගැනීම ඉහළ මානව ගුණාංගයක් බැවින් විය යුතුය. ඇතැම් රටවල කුඩා දරුවන් මේ දිනයේදී සිය මව වෙත ත්‍යාගයක් පිරිනැමීම අනිවාර්යයෙන් සිදු කරන අතර බොහෝ විට එය තමා විසින් නිර්මාණය කර ගත් කාඩ් පතක් හෝ යම්කිසි නිර්මාණයක් වීම ද විශේෂත්වයකි. නිර්මාතෘ ජාවිස්ගේ අරමුණ වූයේ ද වාණිජකරණයෙන් තොරව සෑම දරුවකුගේම හදවතේ නැගෙන සැබෑ ආදරය තමා විසින් තමාට හැකි පමණින් මව වෙත ප්‍රදානය කිරීමය. එසේම ජීවිත කාලය පුරා මොහොතක ඉසිඹුවක් නොලබන මව්වරුන්ට මඳ විවේකයක් දීමය.

අප තවත් වසරක තවත් මවුවරුන්ගේ දිනයක් පසුකර යන අතර මඳක් නැවතී සිතන්නට හැකි කාරණාවක් විමසා බලමු. රස මසවුළු ද දහසින් බැඳි පියලි සහ නෙත සිත පිනවන ත්‍යාග රැසකට වඩා සෑම උදෑසනකම අම්මාට ආදරණීය හසරැල්ලක් සමඟ එක හාදුවක් පිරිනමන්නට ඔබට හැකි නම් ඇය වෙනුවෙන් දවසක් තියා මොහොතක්වත් වෙන් නොකළත් සෑම දවසක්ම තමාගේ කරගන්නට අම්මලා දෙවරක් නොසිතනු ඇත. ඒ අම්මලාගේ හැටිය. ඇය අම්මා වන්නේ එබැවිනි.

දිල්රූ ජයසේකර

සංචරණ නීති දැඩි නොකළොත් මහා ජාතික ව්‍යසනයක්

වෛද්‍ය සංගම් හතරක් ජනපතිට ලියයි

කොවිඩ් ව්‍යාප්තිය අනුව දැඩි සංචරණ සීමා පැනවීමට කටයුතු නොකළහොත් ඉදිරියේදී මහා ජාතික ව්‍යසනයක් මතුවනු ඇතැයි වෛද්‍ය සංගම් හතරක් එක්ව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියකින් දැනුම් දී තිබේ.

මේ වන විටත් ආසාදිතයන්ට රෝහල් ඇඳන් සහ ප්‍රතිකාර ලබාදීමේ සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවන බැවින් ඉදිරි සති තුනේ දී සහ ඉන් පසු මරණ සංඛ්‍යාවේ ඉහළ යාම් සිදුවිය හැකි බවද එම ලිපියේ සඳහන් කර ඇත.

රෝගය පැතිර යාම ක්ෂණිකව පාලනය නොකළහොත් ඒ සඳහා වියදම් ද ඉදිරියේදී බරපතළ ලෙස ඉහළ යනු ඇතැයි වෛද්‍ය සංගම් විසින් ජනාධිපතිවරයාට යොමුකළ ලිපියේ සඳහන්කර තිබේ.

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය පද්මා ගුණරත්න, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය, විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ අන්තර්විද්‍යාල කමිටුවේ මහාචාර්ය තමසි මකුළොලුව මහත්ම මහත්මීන්ගේ අත්සනින් යුතුව එම ලිපිය යොමුකර ඇත.

දකුණු අප්‍රිකානුවාගේ බෑගයේ මිලියන 60ක කොකේන්

සුභාෂිණී සේනානායක

කටාර් ගුවන් සේවයේ QR664 දරන ගුවන් යානයෙන් කටාර් රාජ්‍යයේ දෝහා නගරය හරහා කෙන්යාවේ නයිරෝබි නුවර සිට ශ්‍රී ලංකාවට පැමිණි දකුණු අප්‍රිකානු ජාතිකයකු ශ්‍රී ලංකා රේගුවේ මත් ද්‍රව්‍ය පාලන ඒකකයේ නිලධාරීන් විසින් රුපියල් මිලියන 60කට අධික වටිනාකමකින් යුත් කොකේන් නමැති මත් ද්‍රව්‍යය කිලෝ 2යි ග්‍රෑම් 29ක් සමඟ ඊයේ(09) පෙරවරුවේ අත්අඩංගුවට ගෙන තිබේ.

ඔහුගේ පෞද්ගලික භාණ්ඩ පරීක්ෂා කිරීමේදී එම මගියාගේ ගමන් බෑගයක් තුළ තිබූ ෂැම්පු බෝතල දෙකක් තුළ සූක්ෂ්ම ලෙස සඟවා තිබූ පාර්සල් තුනක කොකේන් නමැති මත් ද්‍රව්‍යය කිලෝ 2යි ග්‍රෑම් 29ක් සොයා ගැනීමට හැකි වී ඇති අතර මෙම කොකේන් මත් ද්‍රව්‍ය ප්‍රමාණයේ වෙළෙඳපොළ වටිනාකම රුපියල් මිලියන 60කට ආසන්න බව රේගු මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ සුදත්ත සිල්වා මහතා පැවැසීය.

සිද්ධියට අදාළ මූලික පරීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා රේගුවේ මත් ද්‍රව්‍ය පාලන ඒකකය විසින් සිදු කිරීමෙන් අනතුරුව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ශ්‍රී ලංකා පොලිසියේ මත් ද්‍රව්‍ය කාර්යාංශය වෙත ලබා දීමට නියමිත බව රේගු මාධ්‍ය ප්‍රකාශකවරයා පැවැසීය.

ලෝකය පුරා පවතින වසංගත තත්වය හමුවේ වුවද ශ්‍රී ලංකා රේගුවේ මත් ද්‍රව්‍ය පාලන අංශයේ නිලධාරීන් විසින් දැඩි කැපවීමකින් ශ්‍රී ලංකාවට පැමිණෙන මගින් පිළිබඳ අවධානයෙන් සිටීමේ ප්‍රතිඵලයක් ලෙස මම අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවද ඒ මහතා කියා සිටියේය.

පසුගිය පැය 24ට කොවිඩ් මරණ 22ක්

සන්ධ්‍යා කරුණාරත්න

දිනක් තුළදී වැඩිම කොවිඩ් - 19 මරණ සංඛ්‍යාව 22ක් ලෙස පසුගිය පැය 24 තුළදී වාර්තා වී තිබේ.

ඒ අනුව පසුගිය දින අටක කාලය තුළදී කොවිඩ් මරණ 108ක් වාර්තා වී ඇති බවත්

වයස අවුරුදු 61ත් 75ත් අතර වයස් කාණ්ඩයන්හි පුද්ගලයන් වැඩිපුරම එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 42.15ක් මරණයට පත්ව ඇතැයි ද වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

මේ වන විට කොවිඩ් මරණ 786ක් සිදුව ඇති බවත් ඉන් 492ක් පිරිමි පුද්ගලයන් වන අතර 294ක් කාන්තාවන් බවත් එම අංශය සඳහන් කරයි.

පසුගිය දින 7 ක කාලය තුළදී පමණක් ආසාදිතයන් 13,192ක් වාර්තා වී ඇතැයි ද එම අංශය පවසයි.

රාජ්‍ය වෙසක් උත්සවය තාවකාලිකව අත්හිටුවයි

නුවන් කොඩිකාර

යාපනය නාගදීප රජමහා විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන පැවැත්වීමට නියමිතව තිබූ රාජ්‍ය වෙසක් උත්සවය තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර තිබේ.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් මත එම තීරණය ගත් බවත් ඒ අනුව රාජ්‍ය වෙසක් උත්සවය වෙනත් ස්ථානයක පැවැත්වීමට ඉදිරියේදී සැලසුම් කරන බවත් බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා සඳහන් කළේය.

සංවර්ධන වැඩ නවත්වා ජීවිත රැක ගන්න මුල්තැන දෙන්න

වජිර අබේවර්ධන

ශිරෝමි අබයසිංහ

රට පුරා පැතිර යන කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා ජාතික සැලැස්මක් සහ විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය බව එක්සත් ජාතික පක්ෂ සභාපති හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා පැවසීය.

සියලු සංවර්ධන වැඩ නවත්වා හෝ ප්‍රමුඛත්වය දිය යුත්තේ මනුෂ්‍ය ජීවිත ආරක්ෂාව සඳහා යැයි පැවැසූ අබේවර්ධන මහතා නියමිත වේලාවට අවශ්‍ය කරන එන්නත් ලබා ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කිසි සේත්ම වෙන් කළ බවක් හෝ නියමිත වේලාවට අදාළ රටවලින් අවශ්‍ය එන්නත් ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර රජය නොගත් බවත් හෙතෙම කීවේය.

ලංකාව සති කීපයකට හෝ ලොක්ඩවුන් කිරීම වඩාත් යෝග්‍යයි යැයි ලෝක සෞඛ්‍ය සංවිධානයත් ප්‍රකාශ කර තිබෙන බවත් එවැනි ලොක්ඩවුන් කිරීමකට රට නොගියත් මේ අවස්ථාව වන විට රටේ අධිකරණ පද්ධතිය, රටේ පරිපාලන පද්ධතිය සම්පූර්ණයෙන්ම අකර්මන්‍ය වෙලා ක්‍රියා විරහිත විය හැකි බවත් එක්සත් ජාතික පක්ෂ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේදී පෙරේදා (08) මාධ්‍යයට අදහස් දක්වමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

අවම වශයෙන් එන්නත් මාත්‍රා ලක්ෂ 150 ක් වත් රට තුළට ගෙනැවිත් රටේ ජනතාවට එන්නත් ලබා දීම සිදු කළා නම් රට ලොක් ඩවුන් නොකර ඉදිරියට ගෙනියන්න තිබුණා. රටට අවශ්‍ය එන්නත් මාත්‍රා ප්‍රමාණයත් රට තුළ නැහැ, මහජනතාවට අවශ්‍ය කරන එන්නත් ලබා දීමට රජයට ක්‍රමවේදයකුත් නැහැ. එතකොට රටත් නියමිත වෙලාවට දින කිහිපයක්, සති කිහිපයක් ලොක් ඩවුන් කරලා ඒ ලොක් ඩවුන් එකේදි ජනතාව බලාගන්න අවශ්‍ය ආධාර උපකාර ලබා දීමට රජයට ශක්තියකුත් නැතිනම්, ඒ කියන්නේ සම්පූර්ණයෙන්ම රටේ ආර්ථික පරිපාලනය කඩා වැටිලා තිබෙනවා යැයි හෙතෙම කීවේය.

කොවිඩ් ආසාදිත හෙද-හෙදියන් 100ක් වාර්තා වෙති

රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ්-19 වයිරසය ආසාදිත හෙද හෙදියන් 100ක් පමණ වාර්තා වනු ඇතැයි රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියෝ 'දිනමිණ'ට ඊයේ (09) පැවසූහ.

කොවිඩ් ප්‍රතිකාර සඳහා අලුතින් ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ රෝහල්වල වාට්ටු ඉදි කළ ද ඒවාට යොමු කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පුහුණු හෙද හෙදියන් නොමැති වීම ගැටලුවක් බව ද උන්වහන්සේ කියා සිටියහ.

මෙම ගැටලුවට සුදුසුම විසඳුමක් වනුයේ විශ්‍රාම ලත් පුහුණු හෙද හෙදියන් නැවත සේවයේ පිහිටුවා ඔවුන්ගෙන් අවශ්‍ය සේවාව ලබා ගැනීම බවත් ඒ සම්බන්ධයෙන් වන යෝජනාව ලිඛිතව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට දැනුම් දුන් බවත් උන්වහන්සේ පැවසූහ.

ISBN අංක නිකුත් කිරීම අන්තර්ජාලය මඟින්

පොත්පත් ප්‍රකාශනයේදී භාවිතයට ගැනෙන අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) නිකුත් කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සිදුකෙරේ. පවතින කොවිඩ්-19 වසංගත රෝග තත්ත්වය හමුවේ පොත් ප්‍රකාශකයන්ට මෙන්ම ලේඛකයන්ගේ පහසුව පිණිස ISBN අංකය අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි අතර ඒ සඳහා www.isbn.lk වෙබ් අඩවියට පිවිසීම මඟින් අංක ඉල්ලුම් කළ හැකිය.

මීට අමතරව වාර ප්‍රකාශන සඳහා නිකුත් කරනු ලබන ISSN අංකය හා සංගීත ප්‍රකාශන සඳහා නිකුත් කරනු ලබන ISMN අංකය ද මේ වෙබ් අඩවියට පිවිසීම මඟින් ලබා ගත හැකිය. වැඩිදුර තොරතුරු සඳහා 011-2687583 හෝ 011-3610773 යන දුරකතන අංකවලින් විමසීම් කළ හැකිය.

බෙලිඅත්ත නගරය වසා දමයි

ටී.කේ මහින්ද වැලිගම සමූහ

බෙලිඅත්ත නගරයේ අවමඟුල් නිවෙසකින් කොවිඩ් රෝගීන් 6 දෙනකු හමු වී ඇති අතර එම අවමඟුලට ප්‍රදේශයේ විශාල පිරිසක් සහභාගිවී ඇතැයි තොරතුරු හෙළි වීම නිසා ආරක්ෂක පියවරක් ලෙස නගරයේ සියලු වෙළඳසැල්, ආයතන හා පොදු වෙළෙඳපොළ (12) මධ්‍යම රාත්‍රී 12 දක්වා වසා දැමීමට තීරණය කළ බව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති සිරිල් මුණසිංහ මහතා පවසයි.

මෙම අවමඟුලට සහභාගී වූ දික්වැල්ල ප්‍රදේශයේ පුද්ගලයකු ද කොවිඩ් ආසාදනය වීමෙන් මිය ගොස් ඇතැයි සභාපතිවරයා කීය.

මේ පිළිබඳ තොරතුරු හෙළි වීමෙන් පසු ප්‍රදේශයේ පිරිසක් පී.සී.ආර් පරීක්ෂණවලට යොමු කර ඇතැයි සෞඛ්‍ය නිලධාරීහු පවසති.

මේ අතර පවතින තත්වය යටතේ බෙලිඅත්තේ ප්‍රදේශ කිහිපයක් වසා දැමීමට කටයුතු කරන්නැයි ප්‍රාදේශීය සභා ප්‍රධානීන් සෞඛ්‍ය අංශවලින් ඉල්ලීමක් කර ඇත.

රාජ්‍ය ආයතනවල සේවයට ගර්භිණී මව්වරුන් නොකැඳවයි

රාජ්‍ය ආයතනවල ගර්භනී සේවිකාවන් සේවයට කැඳවීම සඳහා අවසර ලබාදීමක් සිදුනොකරන බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පවසයි. පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ, රාජ්‍ය සේවයේ අත්‍යාවශ්‍ය සේවා අවම සේවක සංඛ්‍යාවක් යටතේ පවත්වාගෙන යෑමට අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට අවසර ලබා දී තිබේ.

පොදු රද මඬුලු රාජ්‍ය නායක සමුළුව කල්යයි

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව කල් දැමීමට තීරණය කර තිබේ.

ඒ අනුව මේ වසරේ ජූනි මාසයේ 21දා ආරම්භ වීමට නියමිතව තිබූ එම රාජ්‍ය නායක සමුළුව ලොව පුරා රටවල පවතින වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන කල් දැමීමට තීරණය කළ බවට රුවන්ඩා ජනාධිපති පෝල් කගමේ මහතා සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් පැට්‍රිෂියා ස්කොට්ලන්ඩ් මහත්මිය නිවේදනය කර ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානය ලබා දී තිබෙන සෞඛ්‍ය නිර්දේශ සැලකිල්ලට ගෙන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලය සහ සාමාජික රටවල් අතර සාකච්ඡාවකින් අනතුරුව මේ තීරණය ගෙන තිබෙන අතර ඒ අනුව දෙවැනි වරටත් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව කල්දැමීමට සිදුව තිබෙන බව වාර්තා වෙයි.

චීන රොකට්ටුවේ සුන්බුන් ඉන්දීය සාගරයට

මහින්ද අලුත්ගෙදර

චීනය විසින් අභ්‍යවකාශ ගතකළ 'ලෝන්ග් මාච් 5B' රොකට්ටුවේ සුන්බුන් ඉන්දීය සාගරයට පතිත වී තිබේ.

ඒ අනුව මාලදිවයිනට බටහිරින් ඉන්දියානු සාගරයට එම සුන්බුන් කොටස් ඇඳ වැටී තිබෙන අතර චීනය විසින් සිය අභ්‍යවකාශ මධ්‍යස්ථානයට පියාසර කරවූ රොකට්ටුවක් පසුව ඔවුන්ගේ පාලනයෙන් ගිලිහී තිබූ අතර පෙරේදා (08) එහි කොටසක් පෘථිවියට වැටීමක් සිදුවිය හැකි බවට කොළඹ විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යා අභ්‍යවකාශ විද්‍යා ඒකකයේ අධ්‍යක්ෂ මහාචාර්ය චන්දන ජයරත්න මහතා ප්‍රකාශ කළේය.

'සයිනොෆාම්' එන්නත දෙවැනි දිනටත් දෙයි

සන්ධ්‍යා කරුණාරත්න

මෙරට හදිසි භාවිතය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය හිමි වූ කොවිඩ් මර්දන 'සයිනොෆාම්' එන්නත දෙවැනි දිනයටත් ජනතාවට ලබාදීම ඊයේ (09) සිදු කළ බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

චීනයේ නිෂ්පාදිත සයිනොෆාම් එන්නතට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය හිමිවීමත් සමඟ එම එන්නත මෙරට ජනතාවට ලබාදීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත.

සයිනොෆාම් එන්නත් මාත්‍රා 5000ක සංඛ්‍යාවක් ලබාදීමට සැලසුම් කර ඇති බවත් පසුගිය දින දෙක තුළදී පමණක් පුද්ගලයන් 1000කට ආසන්න සංඛ්‍යාවක් එන්නත්කරණයට ලක් කළ බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවට සෞඛ්‍යාධාර දෙන්න

සජිත් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉල්ලයි

පහන් විජේසේකර

මේ ව්‍යසනකාරී අවස්ථාවේ ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සහයෝගය සහ ආධාර උපකාර දෙන ලෙස විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ බලන ශ්‍රී ලංකා නියෝජිතවරිය වන වෛද්‍ය ඔලිවියා නීවේරාස් මහත්මියගෙන් ඉල්ලා සිටියේය.

විපක්ෂ නායකවරයා මේ බව ඉල්ලා සිටියේ ඔලිවියා නීවේරාස් මහත්මිය සමග පැවැති විශේෂ හමුවකදීය.

වඩාත්ම අභියෝගාත්මක පරිච්ඡේදය ඉදිරියට ඇති බවත් පැවසූ ඔලිවියා නීවේරාස් මහත්මිය, ජීවිත බේරා ගැනීමට සහ වෛරසය පැතිරීම පාලනය කිරීමට හැකි ඕනෑම ආකාරයකින් ශ්‍රී ලංකාවට සහාය දීමට ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන් සූදානම් බවද ප්‍රකාශ කළාය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකය මුහුණ දී ඇති වඩාත්ම අභියෝගාත්මක අර්බුදය සහ වසංගතය වන කොරෝනා ව්‍යසනය පිළිබඳව මෙහිදි දීර්ඝ වශයෙන් අදහස් හුවමාරු කර ගෙන ඇත .

කැස්බෑව නගර සභාවේ 33ක් නිරෝධායනයට

මහින්ද අලුත්ගෙදර සහ සුභාෂිණී සේනානායක

කැස්බෑව නගර සභාවේ මන්ත්‍රීවරයකුට කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරුන් 33ක් නිරෝධායනයට යොමු කර තිබේ.

ඉකුත් 04 වනදා පැවැති සභාවාරයට එක්ව සිටි මෙම පිරිස මෙලෙස නිරෝධායනයට යොමු කර ඇති අතර ඔවුන්ගේ ආශ්‍රිතයන්ට ද මෙම දැනුම් දීම සිදු කර ඇති බව සෞඛ්‍ය අංශ පවසයි.

පිලියන්දල පොදු වෙළෙඳ පොළේ වෙළෙඳුන් සහ නගරය ආශ්‍රිතව පදිංචි පුද්ගලයන් 101 දෙනකුට කොරෝනා ආසාදනය වී ඇති බවට වාර්තා වීමත් සමඟ පිළියන්දල පොදු වෙළෙඳපොළ තාවකාලිකව වසා දැමීමට තීරණය කර තිබේ.

01 වැනි පිටුවෙන්

ශ්‍රී ලංකාවට අවශ්‍ය එන්නත් ...

ඒ අනුව එන්නත් මාත්‍රා මිලියන තුනක් කඩිනමින් මෙරටට ලැබීමට නියමිත බවත් එම එන්නත් ලබා දීමේදී මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා ප්‍රමුඛතාවක් හිමි වන බවත් ඒ මහතා කීය.

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඊයේ (09) පැවැති කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වන විශේෂ රැස්වීමෙන් අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් අමාත්‍යවරයා මේ බව සඳහන් කළේය.

එන්නත් ලබා ගැනීම සඳහා රජයට මුදල් නැතැයි ඇතැම් පාර්ශ්ව නඟන චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන බවත් ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයට සරිලන පරිදි එන්නත් ලබාදීමට මැදිහත්වන බව ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව ප්‍රකාශ කර තිබෙන බවත් හෙතෙම පැවසුවේය. එන්නත් මිල දී ගැනීම සඳහා අවශ්‍ය මුදල් රජය සතු බවත් එන්නත් වෙනුවෙන් අත්තිකාරම් මුදල් ගෙවීමේ අවශ්‍යතාවක් මෙතක පැන නැගී නොමැති බවත් කී ඒ මහතා එන්නත් තොග කඩිනමින් ලබාදෙන බව අදාළ ආයතන මෙරටට දැනුම් දී ඇති බව ද අවධාරණය කළේය. දිවයින පුරා විසිරි සිටින 7000ක් පමණ වන මාධ්‍යවේදීන්ට ද මෙම එන්නත ලබා දීමට තීරණය වී ඇතැයිද රටේ සියලු ජනතාවට එන්නත ලබාදීම ජනාධිපතිවරයාගේ අපේක්ෂාව යැයි රඹුක්වැල්ල මහතා පැවසුවේය.

කොරෝනා වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම රට වසා දැමීම රජයේ අපේක්ෂාව නොවන බව කී ඒ මහතා වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අංශවල නිර්දේශ මත අවශ්‍ය පරිදි හුදලකා සහ සංචරණ සීමා පැනවීම් කරන බව ද ප්‍රකාශ කළේය.

ඉන්දියාවේ සිට මෙරටට කිසිදු අයෙකු ඇතුළු කර නොගන්නා බවත් මුහුදු ආශ්‍රිතව සිදුවන සංක්‍රමණ වැලැක්වීමට අවශ්‍යය වැටලීම් සඳහා නාවික හමුදාව විශේෂ මෙහෙයුම් සිදුකරන බවත් අමාත්‍යවරයා කීවේය. මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාද මෙහිදී කතා කළේය

රෝගීන් නිවෙස්වල ...

තමන්ට රෝගය වැලඳී ඇති බව දැනගැනීමෙන් පසු බොහෝ රෝගීන් රෝහල්ගත නොවන බවත් රෝගය උත්සන්න වී මාරාන්තික තත්ත්වයට පැමිණි අවස්ථාවේ රෝහල්ගත වීම නිසා එම රෝගීන් මරණයෙන් බේරාගැනීම ඉතා අපහසු කාර්යයක් බවත් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සභාපතිනි වෛද්‍ය පද්මා ගුණරත්න මහත්මිය ඊයේ (09) පැවසුවාය.

මෙම රෝගය වැලඳීමෙන් පසු දින ගණනක් යාමේදී පෙණහලු ආශ්‍රිතව කොරෝනා වයිරසය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වන බවත් හුස්ම ගැනීමේ අපහසුතාව මෙන්ම නිව්මෝනියාව තත්ත්වය නිසා රෝගීන් මිය යන බව පෙන්වා දෙන වෛද්‍යවරු ජීවිත අවදානමෙන් බේරාගැනීමට නම් රෝගය උත්සන්නවීමට පෙර රෝගීන් රෝහල් ගත විය යුතු බව පෙන්වා දෙති. ඉකුත් සතිය තුළ පමණක් මෙරටින් කොරෝනා රෝගී මරණ 100කට වැඩි සංඛ්‍යාවක් සිදුවී ඇති බවත් ඉන් වැඩි ප්‍රමාණයක් සිදුව ඇත්තේ නිවෙස්වලදී හෝ රෝහල්වලින් පිටත බව සෞඛ්‍ය අංශ අවධාරණය කරයි. ඉකුත් සතියේ මියගිය රෝගීන්ගෙන් ඉතා සුළු පිරිසක් පමණක් රෝහල්වලදී මිය ගිය බව පවසන සෞඛ්‍ය අංශ රෝගයට ගොදුරු වූවන් ඉතා ඉක්මනින් වෛද්‍ය උපදෙස් ලබා ගන්නේ නම් ජීවිත අවදානම අඩුකර ගත හැකි බව අවධාරණය කරයි.

තවත් ගැටලුවක් බවට සෞඛ්‍ය අංශ හඳුනාගෙන ඇත්තේ රෝගීන් බව හඳුනා ගත් පුද්ගලයන් සැඟව සිටීමයි.

පී.සී.ආර්. ලබා දුන් පුද්ගලයන්ට කොරෝනා රෝගය වැලඳී ඇති බව වෛද්‍ය අංශ විසින් දැනුම් දීමෙන් පසුව එම රෝගීන් සිය ජංගම දුරකතන ක්‍රියාවිරහිත කර පදිංචි ප්‍රදේශවලින් වෙනත් ප්‍රදේශවලට පැන යන බවත් තවත් පිරිසක් සැඟවී සිටීම ගැටලු සහගත තත්ත්වයක් බව වෛද්‍ය පද්මා ගුණරත්න මහත්මිය කීවාය.

මෙම හේතුව කොරෝනා රෝගය සෘජුව ව්‍යාප්තවීමට සාධකයක් වී ඇති බවත් ජනතාව රෝගයට බිය නොවී රෝහල් වෙත පැමිණ අවශ්‍ය ප්‍රතිකාර ලබාගැනීම මඟින් මෙම මාරාන්තික උවදුරෙන් මිදී තව කෙනෙකු ද බේරා ගත හැකි බව වෛද්‍යවරිය පෙන්වා දෙයි.

ඉන්දීය ප්‍රභේධය ...

මෙම ආසාදිතයා රෝහලක සති දෙකක් ප්‍රතිකාර ලබා පසුව දින හතක් නිරෝධායනයට ලක් වූ පුද්ගලයකු යයි ද ඇය සඳහන් කරයි. මේ තැනැත්තා පිටරට සිට පැමිණි අයකු බවත් සෞඛ්‍ය අංශ විමසිල්ලෙන් සිටි නිසා ඔහු හඳුනා ගැනීමට හැකි වූ බවත් රාජ්‍ය ඇමැතිවරිය කියයි. මොහු දින විසි එකක්ම වෙන්ව සිටි අයකු හෙයින් ඔහුගෙන් සමාජයට පැතිරීමේ හැකියාවක් නැතැයි පැවසූ ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් තවදුරටත් විමසිල්ලෙන් සිටින බවද ප්‍රකාශ කළාය.

එන්නත්කරණය ...

හැකිතරම් කාර්ය මණ්ඩල යොදවා සියලු ප්‍රදේශවලට එන්නත් ලබා දීම සිදු කළ යුතු බව එම සංගමයේ විධායක සභික වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ මහතා ඊයේ (09) පැවසීය.

මෙවර වයිරස ප්‍රභේදය පැතිර යාමේ ශීඝ්‍රතාව වැඩි නිසා නිසි ලෙස මුව ආවරණය පැලඳිය යුතු බව හෙතෙම කීවේය.

යම් කෙනෙකුට බෝ වී ඇති විටෙක රෝග ලක්ෂණ මතු වීමට දින 05ක් පමණ ගත වන බවත් එම කාලය තුළත් රෝගය අන් අයට බෝ විය හැකි හෙයින් සෞඛ්‍ය උපදෙස් අනුගමනය කිරීම වැදගත් බව ඒ මහතා පෙන්වා දුන්නේය.

දැනට තිබෙන තත්ත්වය පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය ඇතුළු සංගම් විසින් ඒකාබද්ධ ලිපියක් ජනාධිපතිවරයා වෙත භාරදුන් බව ද ප්‍රසාද් කොළඹගේ මහතා පැවසීය.

සංචරණ සීමා පැනවීමේ වැදගත්කම එහිදී පෙන්වාදී තිබෙනවා දී ඇති බවත්. එය ජනගනත්වය සහ විද්‍යාත්මක පදනමක් මත සිදුවිය යුතු ආකාරය ගැනදැනුවත් කර ඇති බවත් ඒ මහතා කියා සිටියේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

මෙම වයිරසය බරපතළ ලෙස පෙනහළුවලට හානි කරනවා. අනෙක් දේ තමයි නිව්මෝනියා තත්ත්වය. සාමාන්‍ය නිව්මෝනියාවට වඩා මෙය බරපතළයි.

රුධිරය කැටිගැසීමක් එක්ක මේ නිව්මෝනියා තත්ත්වය එන්න පුළුවන්. එවිට වෛද්‍යවරුන්ට ප්‍රතිකාර කිරීම හරිම අපහසුයි. ඔක්සිජන් අවශ්‍යතාව මෙන්ම දැඩි සත්කාර අවශ්‍යතාවය මතුවෙන්නේ එවිට.

ඊමේ නිසා හැම පුරවැසියෙක්ම මේ තත්ත්වය තේරුම් ගන්න අවශ්‍යයි. මෙය සුළුවට තකන්න එපා. මෙය පළමු රැල්ල නොවෙයි.

ජනපති මහින්ද රාජපක්ෂ යුගයේ ශ්‍රී ලංකාවත් උගන්ඩාවත් අතර ද්වීපාර්ශ්වික සබඳතා නව මානයකට යොමු වුණා

ජනපති කගුටා මුසවේනි කියයි

මහින්ද අලුත්ගෙදර

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පාලන සමයේ දී ශ්‍රී ලංකාව සහ උගන්ඩාව අතර ද්වීපාර්ශ්වික සබඳතා නව මානයකට යොමු වූ බව උගන්ඩා ජනාධිපති යොවේරි කගුටා මුසවේනි මහතා ප්‍රකාශ කළේය.

එම ද්වීපාර්ශ්වික සබඳතා ඉහළ නැංවීම වෙනුවෙන් පියවර කිහිපයක් ගෙන තිබෙන බව පෙන්වා දුන් ඒ මහතා ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා පුළුල් කිරීම සඳහා එම සියලු පියවර අනුගමනය කළ යුතු බවද කියා සිටී.

උගන්ඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා වශයෙන් පත් කළ වේලුප්පිල්ලෙයි කනනාදන් මහතා එරට ජනාධිපති යොවේරි කගුටා මුසවේනි මහතා වෙත අක්ත පත්‍ර පිළිගැන්වීමෙන් පසුව පැවැති විශේෂ සාකච්ඡාවේ දී ඒ මහතා මේ බව සඳහන්කර තිබේ.

මහ කොමසාරිස්වරයා කෙන්යාවේ සිටින උගන්ඩාව සඳහා ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා ලෙස අක්ත ගැන්වීමේ ලිපිය උගන්ඩාවේ එන්ටෙබේහි පිහිටි රාජ්‍ය මන්දිරයේ දී උගන්ඩාවේ ජනාධිපති යොවේරි කගුටා මුසවේනි මහතා වෙත පිළිගන්වා තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

එම නිල උත්සවයෙන් පසුව පැවති පෞද්ගලික රැස්වීම අතරතුර දී, ජනාධිපතිවරයා සහ මහ කොමසාරිස්වරයා දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවල තත්ත්වය පිළිබඳ අදහස් හුවමාරු ගෙන තිබෙන අතර, මෑත වසරවල දී ශ්‍රී ලංකාව සහ උගන්ඩාව අතර සබඳතාවල සැලකිය යුතු වර්ධනයක් පවතින බව පිළිගෙන තිබේ. ද්විපාර්ශ්වික සබඳතා එහි සැබෑ විභවයන් කරා ළඟාවීම සඳහා විශේෂයෙන් වෙළඳ, ආයෝජන සහ වෙනත් ආර්ථික ක්‍රියාකාරකම්වල සහයෝගීතාවයේ නව ක්ෂේත්‍ර ගණනාවකට පුළුල් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ද ඔවුහු අදහස් හුවමාරු කරගෙන ඇත.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාලය තුළ දී උගන්ඩාව ශ්‍රී ලංකාව සමඟ පැවති සමීප සබඳතා සිහිපත් කර තිබෙන ජනාධිපති මුසවේනි මහතා, ද්විපාර්ශ්වික සබඳතා නව මානයක් කරා නැංවීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇති බව සඳහන් කළේය. ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා පුළුල් කිරීම සඳහා එම සියලු පියවරයන් අනුගමනය කළ යුතු බවද ජනාධිපතිවරයා වැඩි දුරටත් පවසා තිබේ.

අන්‍යෝන්‍ය ආර්ථික ප්‍රතිලාභ සඳහා අප්‍රිකාව සමඟ සබඳතා ප්‍රවර්ධනය කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් වත්මන් රජය උනන්දු වන බව මහ කොමසාරිස් කනනාදන් මහතා ජනාධිපති මුසවේනි මහතාට පැහැදිලි කර තිබෙන අතර, අප්‍රිකානු සංගමයේ නිරීක්ෂකයකු ලෙස ශ්‍රී ලංකාව, වාසිදායක සහයෝගීතාවක් ඇති කිරීම සඳහා අප්‍රිකානු ලෝකය වෙත ළඟාවීමේ අදහසින් යුතුව, අප්‍රිකානු රටවල් සමඟ මෙන්ම නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව සඳහා පොදු වෙළෙඳපොළ (COMESA), බටහිර අප්‍රිකානු රාජ්‍යයන්ගේ ආර්ථික ප්‍රජාව (ECOWAS), දකුණු අප්‍රිකානු සංවර්ධන ප්‍රජාව (SADC), මධ්‍යම අප්‍රිකානු රාජ්‍යයන්ගේ ආර්ථික ප්‍රජාව (ECCAS) වැනි උප කලාපීය සංවිධාන සමඟ අන්තර් ක්‍රියාකාරකම් සඳහා වේදිකාවක් ලෙස එම තත්ත්වය භාවිත කිරීමට පියවර ගනිමින් සිටින බවද පෙන්වා දී ඇත.

ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සම්බන්ධයෙන්, මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් ගුවන් සේවය 2021 අප්‍රේල් 22 වන දින නයිරෝබි වෙත පළමු වරට සෘජු ගුවන් ගමන් ආරම්භ කළ බව ජනාධිපතිවරයාට දැනුම් දුන් අතර, උගන්ඩාවේ සිට ශ්‍රී ලංකාව වෙත පැමිණෙන සහ අනෙක් දෙසට යන සංචාරකයින්ට සෘජු ප්‍රතිලාභයක් ලබාදෙන අන්තර් ගුවන් සේවා ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකා ගුවන් සේවය සහ උගන්ඩා ගුවන් සේවය අතර සාකච්ඡා පැවැත්වෙමින් පවතින බවද පවසා ඇත. මෑතදී යොදන ලද මෙම ගුවන් ගමන් විධිවිධාන ඉතා හොඳ ප්‍රවෘත්තියක් බව පැවසූ ජනාධිපතිවරයා, ශ්‍රී ලංකාව සහ නැගෙනහිර අප්‍රිකාවේ රටවල් මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන මෙම පහසුකමෙන් ප්‍රයෝජන ගත යුතු බවත්, ජයග්‍රාහී තත්වයක් නිර්මාණය කළ යුතු බවත් පවසා තිබේ. ශ්‍රී ලංකාව සහ උගන්ඩාව අතර සංචාරක ප්‍රවර්ධනය සඳහා රටවල් දෙකම ගුවන් සම්බන්ධතාව භාවිතා කළ යුතු බවට ද ඔවුහු එකඟ වී තිබෙන අතර, උගන්ඩාවේ කුඩා ජල විදුලිබල ව්‍යාපෘතිවල පුරෝගාමීන් වෙමින් මෙම අංශයේ ඒකාධිකාරය භුක්ති විඳින, ශ්‍රී ලංකා ආයෝජකයන්ගේ ආයෝජන අගය කළ ජනාධිපති මුසවේනි මහතා, උගන්ඩාවේ විදේශීය සෘජු ආයෝජන සඳහා ඉදිරිපත් කර ඇති ලාභදායී නියමයන් සහ කොන්දේසිවලින් ප්‍රතිලාභ ලබමින් ශ්‍රී ලංකා ආයෝජකයන්ට කෘෂිකර්මාන්තය, නිෂ්පාදන සහ වෙනත් ක්ෂේත්‍ර වැනි විවිධ ක්ෂේත්‍රවල ද ආයෝජනය කිරීම සඳහා ආරාධනා කර ඇත. රැස්වීම සමාප්ත කරමින්, ශ්‍රී ලංකාව සහ උගන්ඩාව අතර ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ දී සියලු කටයුතු සාර්ථක වන ලෙස මහ කොමසාරිස්වරයාට ප්‍රාර්ථනා කරමින් ජනාධිපතිවරයා උගන්ඩාවේ රජයේ පූර්ණ සහයෝගය සහ ඒ සඳහා සහයෝගය දෙන බවට සහතික විය. මහ කොමසාරිස් කනනාදන් මහතා 2013-2015 කාලය තුළ දී උගන්ඩාවේ ශ්‍රී ලංකාවේ නේවාසික මහ කොමසාරිස් ලෙස සේවය කොට ඇති අතර, මෙය එතුමා කම්පාලාහි දී ජනාධිපති මුසවේනි මහතා වෙත සිය අක්තපත්‍ර පිළිගන්වන ලද දෙවැනි අවස්ථාවයි. 2020 දී උගන්ඩාව ඇතුළු අසල්වැසි රටවල් 8 ක් සඳහා සමගාමී අක්තගැන්වීම් සහිතව කෙන්යාවේ මහ කොමසාරිස්වරයා ලෙස පත් කරන තෙක් මහ කොමසාරිස් කනනාදන් මහතා උගන්ඩාව සඳහා ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරයා ලෙස කටයුතු කළේය. මහ කොමසාරිස් කනනාදන් මහතාගේ අප්‍රිකානු කලාපය පිළිබඳ විශාල දැනුම හා පළපුරුද්ද සැලකිල්ලට ගනිමින්, 2020 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා අගමැතිවරයාගේ අප්‍රිකාවේ විශේෂ නියෝජිතයා ලෙස පත් කෙරිණි. මහ කොමසාරිස් කනනාදන් මහතා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICMA) වෘත්තීය සුදුසුකම් ලබා ඇති අතර, ගාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

බේරා නොගත් උකස් රන් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

සී/ස වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ උකස් නියෝජිතයින් වන සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිතියේ

අඹකඳවිල / වැල්ල / මයික්කුලම/ වැලිහේන / දිනපොල / ජයබිම / මුගුනුවටවන / මුන්නේශ්වරම / කුමාරකට්ටුව / බංගදෙනිය / හලාවත / මානුවන්ගම

ශාඛාවන්හි 2019-12-31 දිනද ඇතුළත්ව එදින දක්වා උකස් තබන ලද එහෙත් 2021-05-21 දක්වා බේරා නොගත් රන් භාණ්ඩ 2021 මැයි 22 සෙනසුරාද දින පෙ.ව. 9.00 යේ සිට සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිති ප්‍රධාන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබයි.

මෙයට, සමුපකාරික,
සාමාන්‍යාධිකාරී,
සී/ස හලාවත විවිධ සේවා සමුපකාර සමිතිය,
අංක 41, කොළඹ පාර, හලාවත.
දු.අ. 032-2222364

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

නෂ්ය වන භාණ්ඩ විකිණීම

වෙන්දේසි පවත්වන දිනය 2021-05-10

නිවැරදි කිරීමයි

මගේ අංකය : LD/S/SLPA/2021/04/PC-03, LD/S/SLPA/2021/05/PC-01, LD/S/SLPA/2021/05/PC-02

2021-05-08 වන දින මෙම පුවත්පතෙහි ඉහත වෙන්දේසිය සඳහා පළ කරන ලද දැන්වීමේ **අයිතම වල නාමය "ලුණු"** ලෙස සඳහන්ව ඇතත් එය **"අර්තාපල්" ලෙස නිවැරදි විය යුතු බව** කාරුණිකව දැනුම් දෙමි.

වැඩි විස්තර සඳහා (www.slpa.lk) වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්),
2021/05/09
සේවා සැපයුම් කොට්ඨාසය,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය.

සියපත ෆිනෑන්ස් சியபத பினான்ஸ் Siyapatha Finance

(Finance Company of Sampath Bank Group)

බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

2021 ජනවාරි 31වෙනි දින දක්වා පහත සඳහන් සියපත ෆිනෑන්ස් පී.එල්.සී ශාඛාවන්හි දී උකස් කර, සිවිපයත් දිනට පෙර බේරා නොගත් රන් භාණ්ඩ පහත සඳහන් දිනයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය 2021 මැයි 21 වෙනි දින පෙරවරු 9.30 ට ආරම්භ වේ.

ශාඛාවේ නම / උකස් මධ්‍යස්ථානය	ආදායම් කාලය සීමාව	වෙන්දේසි ස්ථානය
කුරුණෑගල-නගර, කුරුවිට-සදුරුන්පොර, මීගමුව, කුරුණෑගල, පන්විලගොඩ, කුලියාපිටිය, මල්ලවපිටිය, කඳලන්ද, කොස්වත්ත, පිලියන්දල, පන්නල, බිබිලේ, පිටිපන කලුවාන, කොහුවල, මිරිහාන, මාවතගම, කිරිබත්ගොඩ, මහරගම, වත්තල, හලෙන්, පිලියන්දල, කලුවාන, මොරටුව, පිටකොටුව, ගාතන, කොහුවල, කිරිබත්ගොඩ, මාලබේ, මාවතගම සහ දුම්රිය	2021 ජනවාරි 31 වෙනි දිනට පෙර බේරා නොගත් රන් භාණ්ඩ	සියපත ෆිනෑන්ස්, කුරුණෑගල නගර ශාඛාව, නො. 36, මීගමුව පාර, කුරුණෑගල

වෙන්දේසිය අවලංගු කිරීම, කල් දැමීම හෝ පවත් ශාඛාවක් සමඟ එක්වීමේ අවශ්‍යතා සියපත ෆිනෑන්ස් පී.එල්.සී සතුවේ.

ප්‍රධාන මෙහෙයුම් නිලධාරි
සියපත ෆිනෑන්ස් පී.එල්.සී
අංක 46/12, තලුවතු පෙදෙස,
හෙවම් මාවත, කොළඹ 2.

බලපත්‍රලාභී අංකය: PB 917PQ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

2021 මැයි 11 වැනි දින රුපියල් මිලියන 47,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ වෙන්දේසිය භාණ්ඩාගාර බිල්පත් නිකුතුව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

පරිණත කාලය	දින 91	දින 182	දින 364	එකතුව
සු.හ.ජා.අංකය (ISIN)*	LKA09121H131	LKA18221K124	LKA36422E137***	
වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ මුදල (රු. මිලි.)	12,000	16,000	19,000	47,000
පිළිගනු ලබන උපරිම එලද අනුපාතිකය (%)**			5.18	

වෙන්දේසි කරන දිනය	:	2021 මැයි 11 වැනි දින
ගෙවීම් කළ යුතු දිනය	:	2021 මැයි 13 වැනි දින
නිකුතුවේ දිනය	:	2021 මැයි 14 වැනි දින
ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව	:	2021 මැයි 11 වැනි අඟහරුවාද පෙ.ව. 11.00
ලංසුවක් සඳහා අවම මුදල	:	රුපියල් මිලියන පහක් (5,000,000/-) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000/-) ගුණිතයන්ගෙනි.

රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. වෙළෙඳපොළ තත්ත්වයන් මත මෙම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රමාණය ඉක්මවා නොයන පරිදි, එක් එක් පරිණත කාලයන්ට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලැබිය හැකිය.

පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

ඇක්සියුට් සෙකියුරිටීස් ලිමිටඩ්	2206297	මහජන බැංකුව	2206783
ලංකා බැංකුව	2541938	සම්පත් බැන්ක් පී.එල්.සී.	2305842
කැපිටල් එලයන්ස් ලිමිටඩ්	2317777	සෙලාන් බැන්ක් පී.එල්.සී.	2456340
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී	2332319	වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්	2675096
එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	2425010	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී.	2639883

* **සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය**

** වෙන්දේසියේදී දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා තීරණය වනු ලබන එලද අනුපාතිකයන්, දින 364 පරිණත කාලයට අනුරූපව පවත්වා ගනු ඇත.

*** නිවාඩු දිනයන්හි දී සිදුවන භාණ්ඩාගාර බිල්පත් පරිණතයන් සඳහා අදාළ නව ක්‍රමවේදයට යටත් වේ. ඒ අනුව 2022 වසරේ සිට කිසියම් භාණ්ඩාගාර බිල්පතක් පරිණත වන දිනය බැංකු නිවාඩු දිනයක් වුවහොත් එම පරිණතයට අදාළ ගෙවීම් එළඹෙන පළමු රාජකාරි දිනයේදී සිදු කරනු ලැබේ.

නිකුත් කරන කාර්යාලය
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : +94 11 2477011, ෆැක්ස් : +94 11 2477687
www.cbsl.gov.lk

එම්. ඉසෙඩ්.එම්.ආසිම්
රාජ්‍ය ණය අධිකාරී / ලේඛකාධිකාරී.

www.nlb.lk

දිනය 2021.05.08 සෙනසුරාදා නිල ප්‍රතිඵල

මහජන සම්පත
දිනුම් වාරය : 4475
දිනා ඇති මුළු මුදල 8,932,400.00
ජයග්‍රාහී අක්ෂරය F ජයග්‍රාහී අංක 8 7 0 5 8 1
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 17,739,636.60

ගොවි සෙත කොවිසෙත Govisetha
දිනුම් වාරය : 2770
දිනා ඇති මුළු මුදල රු. 4,966,560.00
ඉංග්‍රීසි අක්ෂරය V ජයග්‍රාහී අංක 05 08 19 33
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 71,370,465.20

මිලියන් පවර් මෙගා පවර් මෙකා පවර් කෝටි 10
දිනුම් වාරය : 832
දිනා ඇති මුළු මුදල රු. 2,209,840.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 132,762,231.60
ඉංග්‍රීසි අකුර J සුපිරි අංකය 23 ජයග්‍රාහී අංක 04 13 44 75
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ධන නිධානය
දිනුම් වාරය : 512
දිනා ඇති මුළු මුදල රු. 3,659,320.00
ඉංග්‍රීසි අක්ෂරය U ජයග්‍රාහී අංක 14 18 61 63
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 96,621,814.40

ජාතික ලබ සම්පත JATHIKA SAMPATHA
දිනුම් වාරය : 1118
දිනා ඇති මුළු මුදල රු. 3,187,420.00
ජයග්‍රාහී ලග්නය වෘෂභ ජයග්‍රාහී අංක 5 8 9 5 7 1
විශේෂිත අංකය 16642
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 16,051,597.94

2021.05.08 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 507,513
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 22,955,540.00
රු. 2,000,000.00 ත්‍යාග: 01 රු. 1,000,000.00 ත්‍යාග: 02 රු. 100,000.00 ත්‍යාග: 22

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475

www.nlb.lk

දිනය 2021.05.07 සිකුරාදා නිල ප්‍රතිඵල

මහජන සම්පත
දිනුම් වාරය : 4474
දිනා ඇති මුළු මුදල 9,502,190.00
ජයග්‍රාහී අක්ෂරය R ජයග්‍රාහී අංක 1 4 1 4 9 9
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 17,146,390.60

ගොවි සෙත කොවිසෙත Govisetha
දිනුම් වාරය : 2769
දිනා ඇති මුළු මුදල රු. 5,027,620.00
ඉංග්‍රීසි අක්ෂරය S ජයග්‍රාහී අංක 01 23 51 71
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.71,088,253.60

මිලියන් පවර් මෙගා පවර් මෙකා පවර් කෝටි 10
දිනුම් වාරය : 831
දිනා ඇති මුළු මුදල රු. 2,569,740.00
මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 132,502,382.00
ඉංග්‍රීසි අකුර L සුපිරි අංකය 25 ජයග්‍රාහී අංක 01 05 19 62
මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ධන නිධානය
දිනුම් වාරය : 511
දිනා ඇති මුළු මුදල රු. 2,717,380.00
ඉංග්‍රීසි අක්ෂරය S ජයග්‍රාහී අංක 23 24 52 60
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 96,621,814.40

සුපිරි වාසනා
දිනුම් වාරය 1596
දිනා ඇති මුළු මුදල රු. 2,768,380.00
සුපිරි අංකය 03 ජයග්‍රාහී අංක 25 38 45 48
මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,335,443.60

2021.05.07 ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකළ මුළු ත්‍යාගලාභීන් සංඛ්‍යාව 565,036
ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල රු. 22,585,310.00
රු. 2,000,000.00 ත්‍යාග: 01 රු. 500,000.00 ත්‍යාග: 01 රු. 100,000.00 ත්‍යාග: 20

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011 - 4607001 - 2 ෆැක්ස් : 011-4669475

සියලු ග්‍රාම නිලධාරීන්ට කොවිඩ් එන්නත දෙන්න

ග්‍රාම නිලධාරීන්ගේ සංගමය රජයට කියයි

නුවන් කොඩිකාර

ජනතාව සමඟ ගැටෙමින් රාජකාරියේ නියැළෙන සිය සාමාජිකයන්ට කොවිඩ් එන්නත කඩිනමින් ලබාදීමට කටයුතු කරන්නැයි ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරීන්ගේ සංගමය රජයෙන් ඉල්ලා සිටී.

මේ වන විට සිය සාමාජිකයන් සියයකට වැඩි පිරිසක් ආසාදිතයන් බවට පත්ව ඇති හෙයින් එම අවදානම සැලකිල්ලට ගෙන ග්‍රාම නිලධාරීන්ට ප්‍රමුඛත්වය දීමට පියවර ගන්නැයි එම සංගමයේ උප සභාපති සංජීව අතුකෝරළ මහතා ඉල්ලා සිටියි.

කොරෝනා වයිරසය මෙරට ව්‍යාප්ත වීම පටන් ගත් දින සිට ග්‍රාම නිලධාරීන් මේ දක්වා දිවා රෑ නොබලා රාජකාරිවලට එහා ගිය කාර්ය භාරයක නියැළී සිටින බව පවසන ඒ මහතා, එය තව දුරටත් එලෙසම පවත්වා ගෙන යෑමට නම් සිය සාමාජිකයන් සහ ඔවුන්ගේ නිවෙස්වල පිරිස් ආරක්ෂා විය යුතු බව කියා සිටියේය.

යම් අයුරකින් එක් ග්‍රාම නිලධාරියකු ආසාදිතයකු බවට පත් වුවහොත් එම වසමේ වැඩකටයුතු අඩපණ වන බවත්, තවත් වසමක නිලධාරියකු එහි වැඩ ආවරණය කිරීමට යෙදවීමෙන් ඔහුට හෝ ඇයට සිය වසමේ ද රාජකාරි නිසිලෙස කිරීමට නොහැකි වන බවත් අතුකෝරළ මහතා කීවේය.

සංජීව අතුකොරළ මහතා වැඩි දුරටත් මෙසේද කියා සිටියේය. පළමුවන කොවිඩ් රැල්ල ආරම්භ කළ අවස්ථාවේ සිට අද වන තුරු අප අපේ සියලුම වීර්ය හා ශක්තිය යොදා වසම්වල ජනතාව ආරක්ෂා කරගන්න හැකි උපරිමයෙන් කටයුතු කර තිබෙනවා. අපේ වසමක යම් කෙනෙක් හෝ කණ්ඩායමක් ආසාදිතයන් බවට පත්වුණොත් ඔවුන් නැවත යථාතත්වයට පත් වන තුරු සියලු දේ සොයා බලන්න වන්නේ අපටයි. එම නිසා අපට දෛනිකවම ජීවිතාව එක්ක ගැටෙන්න වෙනවා. ඒ නිසා තමයි අප රජයෙන් ඉල්ලා සිටින්නේ කොවිඩ් එන්නත් ලබාදීමේදී අපටත් ප්‍රමුඛත්වය දී කටයුතු කරන්න කියා. අප මේ පිළිබඳ වගකිව යුතු බලධාරීන්ට ලිඛිතව පවා දන්වා තිබෙනවා. එහෙත් තාම ඊට කිසිම නිසි පිළිතුරක් ලැබී නැහැ. ඒ වගේම අපේ ආරක්ෂාවට මුහුණු ආවරණයක්, අත සොදන දියරයක් හෝ ආරක්ෂිත කාබාසයක්වත් ලැබී නැහැ. රජයෙන් දෙන බඩු මල්ල පවා ගෙවල්වලට ගෙනයන ප්‍රවාහන පහසුකම් සඳහා යන මුදල් පවා අපේ අතින් තමයි ගෙවන්න වී තිබෙන්නේ. එම නිසා මේ පිළිබඳ රජයේ අවදානය යොමුකර ග්‍රම නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් දෙන්නයි ඉල්ලා සිටිනවා.

සාමාජික උයන්වත්ත ග්‍රාම නිලධාරී බුද්ධික රංගන මහතා - අපේ වසමේ ඉන්න ජනතාවගේ සියලුම විස්තර දන්නේ එම වසම බාර ග්‍රාම නිලධාරිවරය හෝ නිලධාරිවරිය. එම නිසා කුමන ප්‍රශ්නය ආවත් මුලින්ම ජනතාව ළඟට යන්න වන්නේ අපටයි. කොවිඩ් රැල්ල ආව වෙලාවේ සිට මේ වන තෙක් අප අපේ ජීවත අවදානමට ලක් කරගෙනයි වැඩ කරන්නේ. මොකද අපට අපේ ජනතාව අසරණ කර පැනලා යන්න බැහැ. අද වන විට අපේ වසම් තුළ ශීඝ්‍රයෙන් ආසාදියන් වාර්තා වෙමින් තිබෙනවා. අප ඒ සෑම තැනකටම යනවා. ඔවුන්ට අවශ්‍ය උපදෙස් දෙන්න වගේම, පහසුකම් දෙන්නත් කටයුතු කරමින් සිටිනවා. එම නිසා අප රජයෙන් ඉල්ලන්නේ අපටත් බියක්, සැකක් නැතුව වැඩ කරන්න එන්නත් දෙන්න කටයුතු කරන්න කියායි.

ගාල්ල නව දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ මහතා වැඩ භාර ගැනීමෙන් අනතුරුව දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේ මහතා ගාල්ල ආණ්ඩුකාර කාර්යාලයේදී පෙරේදා (8) හමුවී සාකච්ඡා කළ අයුරු. *ඡායාරූපය- දික්වැල්ලේ නිලකරත්න*

ආගමික නිදහස කප්පාදු කරන බවට ශ්‍රී ලංකාවට කරන චෝදනා සාධාරණ නෑ

එක්සත් රාජධානියේ මහ කොමසාරිස් සරෝජා සිරිසේන

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ ඇති ආගමික සිද්ධස්ථානවලින් හරි අඩක් පමණම අන්‍ය ආගමික සිද්ධස්ථාන බව එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් සරෝජා සිරිසේන මහත්මිය ප්‍රකාශ කරයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ බොහෝ අය කතාබහ කළද ශ්‍රී ලංකාවේ ගොඩනඟා ඇති පූජනීය ස්ථාන 20,000කට ආසන්න සංඛ්‍යාවෙන් බෞද්ධ විහාර 10,089ක්, හින්දු කෝවිල් 7,630ක්, ක්‍රිස්තියානි දේවස්ථාන 2,066ක් සහ මුස්ලිම් දේවස්ථාන 2,452ක් ඇති බව හැමෝම අමතක කර දමා ඇතැයි ද ඒ මහත්මිය පෙන්වා දෙයි. ආගමික සිද්ධස්ථාන ගොඩනඟා ගෙන ඇති ආකාරය අනුව ශ්‍රී ලංකාව ආගමික නිදහස කප්පාදු කරන බවට කරන චෝදනා සාධාරණ දැයි ඇය ප්‍රශ්න කරයි.

එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, නිදහසින් පසු අනුප්‍රාප්තික ශ්‍රී ලංකා රජයන් සැපයූ පොදු පහසුකම් හා දශක ගණනාවක් පුරා එහි ජනතාව වෙනුවෙන් කළ ශක්තිමත් ආයෝජනයන්ට ස්තූතිවන්ත වන්නට විශිෂ්ට දක්ෂතා දැක්වූ ශ්‍රී ලාංකිකයන් ඇගයීම සඳහා ඉකුත් දා පැවැති උත්සවයකදී මහ කොමසාරිස්වරිය මේ බව සඳහන් කර තිබේ. එහි දී ඇය පෙනවා දුන්නේ ශ්‍රී ලංකාවේ යථාර්ථය පිළිබිඹු කිරීමට, ශ්‍රී ලංකාව පිළිබඳ පවත්නා බටහිර හැඟීම් අසමත් වන බවත්, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති තරුණ තරුණියන්ගේ මනස වෙනස් කිරීම සඳහා දරන දරුණු ප්‍රයත්න තැතිගන්වන සුලු වන අතර, ඒ පිළිබඳ අප සැලකිලිමත් විය යුතු බවත්ය.

අවම සම්පත් තිබිය දී ද ශ්‍රී ලංකාව සිය සිත් ඇද ගන්නා සුලු සමාජ සංවර්ධන දර්ශක ළඟා කරගැනීමට සමත් වී ඇත. එක්සත් රාජධානියේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10කට වඩා අඩු වුවද, ශ්‍රී ලංකාව රෝගීන් 1000කට එක් වෛද්‍යවරයකුගේ අනුපාතය සහ ගුරු ශිෂ්‍ය අනුපාතය 16.5ක් ලෙස පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් 10,000කට අධික සංඛ්‍යාවක් අතුරින් 6,925ක් සිංහල මාධ්‍ය පාසල් වන අතර 3,240ක් දෙමළ පාසල් බවද මහ කොමසාරිස්වරිය පෙන්වා දී තිබේ. ශ්‍රී ලංකා රජයන් සපයන පොදු පහසුකම් හා දශක ගණනාවක් තිස්සේ එහි ජනතාව වෙනුවෙන් කළ ශක්තිමත් ආයෝජනයන්ට ස්තූති වන්නට විශිෂ්ට දක්ෂතා දැක්වූ ශ්‍රී ලාංකිකයන් ප්‍රදර්ශනය කිරීම සඳහා වේදිකාවක් ආරම්භ කර තිබෙන අතර, මෙම කටයුත්ත ආරම්භ කරමින්, මහ කොමසාරිස් කාර්යාලයේ උපදේශක අබ්දුල් හලීම් මහතාගේ ජීවිතයේ සන්ධිස්ථාන දැක්වෙන කෙටි වීඩියෝවක් මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපත් කර ඇත.

මෙහිදී අදහස් දැක්වූ මහ කොමසාරිස් කාර්යාලයේ උපදේශක අබ්දුල් හලීම් මහතා පෙන්වා දී තිබෙන්නේ තමා ආඩම්බර ශ්‍රී ලාංකිකයකු වන අතර, නිදහස් අධ්‍යාපනයේ සහ නිදහස් සෞඛ්‍යයේ නිෂ්පාදනයක් වන බැවින්, තමා සිය මව්බිමට ස්තූතිවන්ත වන බවයි. 2009 දී අවසන් වූ ත්‍රස්තවාදී ගැටුම හේතුවෙන් ඔහුගේ ජීවිතය එතරම් පහසු නොවූ අතර, ඔහුගේ උපන් ගම ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශයක පිහිටා තිබුණි. එසේ වුවද, ත්‍රස්තවාදී ගැටුම නොතකා ඔහුට පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අඛණ්ඩව ප්‍රවේශ වීමට හැකි විය.

තමා ග්‍රාමීයව හැදී වැඩීම හෝ සුළුතර ප්‍රජාවකට අයත් වීම, 2009 දී ශ්‍රී ලංකා විදේශ සේවයට බැඳීම සඳහා බාධාවක් නොවූ බව හලීම් මහතා විස්තර කර තිබෙන අතර, ඔහු එම වසරේදී විවෘත තරග විභාගයකින් ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා තෝරාගත් නිලධාරීන් එකොළොස් දෙනාගෙන් එක් අයකු විය. ඔවුන්ගෙන් පස් දෙනෙක් දෙමළ භාෂාව කථා කරන අය වූ අතර, එයින් තිදෙනෙක් මුස්ලිම්වරු වූහ. වෙනත් ආකාරයකින් පෙන්වීමට විරුද්ධවාදීන් දරන උත්සාහයන්ට ප්‍රතිවිරුද්ධ ලෙස, අධිෂ්ඨානය හා නොපසුබට උත්සාහය තිබේ නම්, යමෙකුගේ ජනවාර්ගිකත්වය හෝ සමාජ පසුබිම ඕනෑම ශ්‍රී ලාංකිකයකුට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බාධාවක් නොවේ.

සවුදි අරාබියාවේ 'සවුදි හරිත' වැඩසටහනට ශ්‍රී ලංකාව සුබ පතයි

මහින්ද අලුත්ගෙදර

සවුදි අරාබි රාජධානියේ 'සවුදි හරිත' හා 'මැද පෙරදිග හරිත වැඩසටහනේ' සමාරම්භක අවස්ථාවට ශ්‍රී ලංකාව සුබ පතන බව විදේශ අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

සවුදි අරාබිය ඇතුළු කලාපය මුහුණ දෙන පාරිසරික අභියෝගයන්ට මුහුණ දීම සඳහා කලාපීය සහයෝගය ලබාදීම යුතුකමක් බව එම අමාත්‍යාංශය කියා සිටී.

කලාපයේ කාබන් විමෝචනය සියයට 60කින් අඩු කිරීමේ අභිලාෂයෙන් යුත් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව ඉතා උනන්දුවෙන් අනුගමනය කරනු ඇති අතර, මෙම වැඩසටහන්වල අරමුණ වන සමුද්‍රීය හා වෙරළබඩ පරිසරය ආරක්ෂා කිරීම දූපත් ජාතියක් වශයෙන් අපගේ හදවතට වඩාත් සමීප බවද, වර්තමානයේ ගෝලීය දේශගුණික විපර්යාසයේ නැඟී එන කටුක යථාර්ථයන් ශ්‍රී ලංකාවද අත්විඳිමින් සිටින බවද විදේශ අමාත්‍යාංශය පෙන්වා දෙයි.

සියලු මනුෂ්‍ය වර්ගයාට බලපාන දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම සඳහා මූලිකත්වය ගන්නා රටක් ලෙස සවුදි අරාබි රාජධානිය බිහිවෙමින් පවතින බව දැකීම සතුටට කරුණක් බව සඳහන් කරන විදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකාව සවුදි අරාබි රාජධානිය සඳහා සිය සහයෝගය ප්‍රකාශ කරන අතර දේශගුණික විපර්යාස සමඟ කටයුතු කිරීම සඳහා අපගේ පොදු ප්‍රවේශය තුළ රාජධානිය සමඟ කටයුතු කිරීමට අපේක්ෂා කරන බවද සඳහන් කරයි.

සංවර්ධන වැඩට රුසියාවේ අතහිත

මහින්ද අලුත්ගෙදර

රුසියාවේ ශ්‍රී ලංකා තානාපති මහාචාර්ය එම්.ඩී. ළමාවංශ හා විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහත්වරුන් අතර විශේෂ හමුවක් විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්විණි.

රුසියාව, ආර්මේනියාව, බෙලරුස්, මෝල්ටෝවා හා උස්බෙකිස්තානය යන රටවල් හා ශ්‍රී ලංකාව අතර පවතින ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික යනාදී දෙරටටම වැදගත් වන අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් විදේශ ඇමැති ගුණවර්ධන මහතා තානාපතිවරයාගේ අවධානය යොමු කළේය.

කොවිඩ්-19 වසංගතයත් සමඟ අඩපණ වී ඇති ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි පණ ගැන්වීම සඳහා විදෙස් රටවල ආයෝජන සහයෝගීතාව නංවා ගැනීමට විදෙස් රටවල සිටින ශ්‍රී ලංකා රජය නියෝජනය කරන තානාපතිවරුන් සියලු දෙනා ඒ ඒ රටවල් සමඟ සුහඳව හා සහයෝගයෙන් කටයුතු කළ යුතු බවද ඇමැතිවරයා අවධාරණය කළේය.

මෙහිදී කරුණු දැක්වූ රුසියාවේ ශ්‍රී ලංකා තානාපති මහචාර්ය එම්.ඩී. ළමාවංශ මහතා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය නිසා රුසියාව ඇතුළු බොහෝ රටවල් ශ්‍රී ලංකාව සමඟ අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීමට කැමත්තක් දක්වන බවයි. ඉදිරියේ දී ශ්‍රී ලංකාවේ බොහෝ සංවර්ධන හා සේවා කටයුතු සඳහා රුසියාව ඇතුළු ඊට සම්බන්ධ රටවල සහයෝගය දීමට එකඟතා ඇති වී තිබෙන බවද තානපතිවරයා සඳහන් කළේය.

ප්‍රමිතියෙන් තොර නැව් හඳුනා ගන්න වරාය තත්ත්ව පාලනය ශක්තිමත් කළ යුතුයි

ඉන්දීය සාගරයේ වටද්දර රටවල සංගමය කියයි

මහින්ද අලුත්ගෙදර

ප්‍රමිතියෙන් තොර නැව් හඳුනා ගැනීම සඳහා වරාය තත්ත්ව පාලනය ශක්තිමත් කළ යුතු බව ඉන්දීය සාගරයේ වටද්දර රටවල සංගමය (IORA) අවධාරණය කරයි.

එමඟින් ප්‍රමතියෙන් තොර නැව් හඳුනා ගැනීමට "ආරක්ෂිත දැලක්" සැපයෙන බවද එම සංගමය පෙන්වා දෙයි. "ඉන්දීය සාගර කලාපයේ වරාය තත්ත්ව පාලනය (PSC) සහ සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය (MSS)" යන තේමාව යටතේ විදේශ අමාත්‍යාංශය සංවිධාන කළ වෙබිනාර් සාකච්ඡාවේ දී මේ කරුණු අනාවරණය වී තිබේ.

ප්‍රවීණ අන්තර්ජාතික නීති සම්පාදකයන් වන මැක්ස් ප්ලැන්ක් පදනමේ මොරොක්කෝව සහ සුඩානය සඳහා කළමනාකාර අධ්‍යක්ෂ සහ ව්‍යාපෘති ප්‍රධානී මහාචාර්ය රුඩිගර් වුල්ෆ්රම් සහ නෝර්වේ රටේට්‍රොම්සෝ හි, යූඅයිටී ආක්ටික් විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පිහිටි සාගර නීතිය පිළිබඳ නෝර්වීජියානු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, මහාචාර්ය ටෝර් හෙන්රික්සන් මහත්වරු මෙම සාකච්ඡාවට සම්පත් දායකයන් ලෙස සහභාගි වී සිටියහ.

ප්‍රමිතියෙන් තොර නැවිගත කිරීම්වලට එරෙහි දෙවැනි ආරක්ෂක පියවරක් ලෙස සහ ධජ රාජ්‍යය මඟින් කෙරෙන ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී වැඩසටහනක් ලෙස වරාය තත්ත්ව පාලන පරීක්ෂණ යොදවා ගැනීමට අපේක්ෂා කෙරෙන අතර, අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO), නැව් සහ විසර්ජන පාලනය කිරීමේ දී කලාපීය සහයෝගීතාව පිළිබඳ A.682 (17) යෝජනාව සම්මත කළ අතර, කලාපීය ගිවිසුම්වලට එළඹීම ප්‍රවර්ධනය කරයි. එක් රටක වරායකට යන නැවක් සාමාන්‍යයෙන් කලාපයේ වෙනත් රටවලට යන අතර, ප්‍රමිතියෙන් තොර නැව් කෙරෙහි අවධානය යොමු කිරීම සහ බහුවිධ පරීක්ෂාවන් වළක්වා ගැනීම සඳහා පරීක්ෂණ සමීපව සම්බන්ධීකරණය කළ හැකි නම් එය වඩාත් කාර්යක්ෂම විය හැකි අතර මෙමඟින් හැකි තරම් නැව් පරීක්ෂා කරන බවට සහතික වන නමුත්, ඒ සමඟම අනවශ්‍ය පරීක්ෂණ මඟින් නැව් ප්‍රමාද වීම වළක්වයි. නැව්වල ප්‍රමිතීන් සඳහා වන මූලික වගකීම ධජ රාජ්‍යය සතුවේ.

වරාය තත්ත්ව පාලනය පිළිබඳ පුළුල් විෂය පථය අනුව, මෙම වෙබිනාර් සාකච්ඡාව කොටස් දෙකකට බෙදුණු අතර, එහි පළමුවැනි සැසියේ දී, වරාය තත්ත්ව පාලනය, සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහ සමුද්‍ර නීතිය පිළිබඳව සාකච්ඡා කර තිබේ. මෙම කොටස වඩාත් න්‍යායාත්මක ස්වභාවයක් ගත් අතර, එහිදී වරාය තත්ත්ව පාලනයෙහි අර්ථය සහ විෂයය පථය; සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සහ වරාය තත්ත්ව පාලනය අතර පවතින සම්බන්ධතාව, එක්සත් ජාතීන්ගේ සමුද්‍ර නීතියපිළිබඳ සම්මුතිය (UNCLOS) සහ වෙනත් අන්තර්ජාතික නෛතික ලේඛන යටතේ වරාය තත්ත්ව පාලනය නියාමනය කරන නෛතික තන්ත්‍රය සාකච්ඡාවට බඳුන් කෙරිණි. නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින්, වරාය තත්ත්ව පාලනය සහ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය අතර අන්තර් සම්බන්ධතාව පිළිබඳ ඉදිරිපත් කිරීම් මෙන්ම, වරාය තත්ත්ව පාලනය සඳහා ක්‍රියාමාර්ග සපයමින් අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO) සහ අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) පනවන අන්තර්ජාතික නීති පිළිබඳ කෙටි සාකච්ඡාවක් ද මෙයට ඇතුළත් විය.

දෙවන සැසියේ දී ඉන්දියානු සාගර කලාපයේ (IOR) වරාය තත්ත්ව පාලනය - කලාපීය පිළිවෙත් සමපාත කිරීම හා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇති අතර, මෙම කොටසේ දී, ඉන්දීය සාගර කලාපයේ වරාය තත්ත්ව පාලනය සහ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සම්බන්ධ තාක්ෂණික හා කලාපීය ගැටලු සාකච්ඡා කෙරිණි.

ඉන්දියානු සාගර කලාපයේ වරාය තත්ත්ව පාලනය වැඩි දියුණු කළ හැකි අභියෝග, අවස්ථා සහ විශිෂ්ට පරිචයන් හඳුනා ගැනීමේ අරමුණින් ඉන්දියානු සාගර අවබෝධතා ගිවිසුම අනෙකුත් වරාය තත්ත්ව පාලන තන්ත්‍රයන්ට සාපේක්ෂව සංසන්දනාත්මක විශ්ලේෂණයක් මෙම කොටසට ඇතුළත් විය. දෙවනුව, නැව්වලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතිය (MARPOL) යටතේ යටතේ කෙරෙන පරීක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින්, සමුද්‍ර යෝග්‍යතාව හා වරාය තත්ත්ව පාලනය, සමුද්‍රීය ජීවිත ආරක්ෂාව පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (SOLAS) සහ මුහුදේ ඝට්ටන වැළැක්වීම සඳහා වූ අන්තර්ජාතික රෙගුලාසි පිළිබඳ සම්මුතිය (COLREGs), මේ සම්බන්ධ ප්‍රායෝගික ගැටලු සහ විශිෂ්ට පරිචයන් පිළිබඳ සාකච්ඡාවක් සැසිවාරයට ඇතුළත් විය.

තෙවනුව, දේශසීමා ඉක්මවමින් සිදු කෙරෙන සමුද්‍රීය අපරාධ සහ ත්‍රස්තවාදයට ප්‍රතිචාර දැක්වීම සඳහා වරාය තත්ත්ව පාලනය පිළිබඳ ක්‍රියාපටිපාටි ප්‍රශස්ත කිරීම සහ මේ සම්බන්ධයෙන් ඇති විය හැකි අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ සාකච්ඡා කෙරිණි.

සමාප්තියට වරාය තත්ත්ව පාලනය පිළිබඳ නෛතික පදනම සහ වරාය තත්ත්ව පාලනය සහ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය අතර අන්තර් සම්බන්ධතාව ඇතුළුව වරාය තත්ත්ව පාලනය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් අවශ්‍ය වන බවට මණ්ඩලය එකඟ විය. දේශීය වරාය තත්ත්ව පාලන තන්ත්‍රයන් ශක්තිමත් කිරීමට පියවර ගත යුතු අතර, එමඟින් ඉන්දීය සාගර කලාපය තුළ සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ආශ්‍රිත අරමුණු තවදුරටත් වර්ධනය වනු ඇත. වරාය තත්ත්ව පාලනය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සහ දැනුවත්භාවය ඇති කිරීම, ජකාර්තා ගිවිසුමෙහි අරමුණු, අයෝරාහි ක්‍රියාකාරී සැලැස්ම (2017-2021) සහ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වැඩ සැලැස්ම පලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අතර, ඉන්දීය සාගර කලාපයේ හවුල් අනන්‍යතාව ශක්තිමත් කිරීමට සහ සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ආශ්‍රිත ගැටලු සඳහා කලාපීය සාමූහික ප්‍රතිචාර දිරිමත් කිරීමට උපකාරී වනු ඇත.

සාගර සම්පත්වලින් තිරසර ලෙස ප්‍රතිලාභ ගැනීම සඳහා අයෝරා සාමාජික රටවල් සඳහා වන වරාය තත්ත්ව පාලන ක්‍රියාමාර්ගවල අදාළත්වය ද අවධාරණය කෙරිණි. ශ්‍රී ලංකාව සඳහා, වරාය තත්ත්ව පාලන ක්‍රියාමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මෙන්ම සාගර පාලනයට සම්බන්ධ අනෙකුත් සහායක කලාපීය සහ අන්තර්ජාතික නෛතික ලේඛනවලට අත්සන් කිරීම මඟින් සමුද්‍රීය හා සැපයුම් සේවා කේන්ද්‍රස්ථානයක් ලෙස රට ඵලදායී ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා එහි ප්‍රයත්නයන් සමඟ හොඳින් වැඩිදියුණු වන අතර එහි භූ-උපාය මාර්ගික පිහිටීම සඳහා උත්තෝලන බලයක් සපයයි.

ප්‍රවීණ වෙළෙඳ නාවික ප්‍රධානියකු වූ, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ කපිතාන් උපුල් පීරිස්, ලංකා නැව් සංස්ථාවේ හිටපු විධායක අධ්‍යක්ෂ ආචාර්ය ඩෑන් මාලිකා ගුණසේකර, සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විකුම් ආබෲ මහත්වරු අනෙක් කථිකයන් අතර වූහ. මෙම වෙබිනාර් සාකච්ඡාව විදේශ අමාත්‍යාංශයේ සාගර කටයුතු, පරිසර හා දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් හසන්ති දිසානායක මහත්මිය මෙහෙයවූ අතර, ඉන්දීය සාගරයේ වටද්දර රටවල සංගමයේ (IORA) සාමාජික රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විද්වතුන්, වෘත්තිකයින් සහ සංවාද හවුල්කරුවන් ඇතුළු 50 දෙනෙක් මෙම වෙබිනාර් සාකච්ඡාවට සහභාගී වූහ.

දරුවන්ගේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීමට ගුරුවරුන් මෙන්ම විදුහල්පතිවරුනුත් කැප විය යුතුයි

● අගමැති මහින්ද රාජපක්ෂ

මහින්ද අලුත්ගෙදර

ගුරුවරුන් මෙන්ම විදුහල්පතිවරුන් ද දරුවන්ගේ විභාග ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒමට කැපවිය යුතු බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

දරුවන් ඉහළ ප්‍රතිඵල පෙන්වන පාසල්වලට යොමු වීමේ ප්‍රවණතාවක් පවතින නිසා රටේ සියලු පාසල්වල ගුරුවරුන් මෙන්ම විදුහල්පතිවරු තම විදුහලේ විභාග ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒමට කැප වී කටයුතු කළ යුතු බවද ඒ මහතා පෙන්වා දෙයි.

අරලියගහ මන්දිරයේ දී පැවැති උත්සව අවස්ථාවකට එක් වෙමින් අගමැතිවරයා මේ බව පැවසීය.

ජනප්‍රිය පාසල්වලට පමණක් යාම තවදුරටත් දරුවන්ගේ අරමුණක් නොවන බවත් ඉහළ ප්‍රතිඵල පෙන්වන විද්‍යාල වෙත දරුවන් යොමුකිරීමේ දෙමාපිය ප්‍රවණතාවක් පවතින බවත් පෙන්වා දුන් අගමැතිවරයා මෙවර උසස් පෙළ විභාගයෙන් තාක්ෂණ විෂය සඳහා ඉහළ සාමර්ථ්‍ය ලබාගත් හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ නවීනි රවිෂ්කා සිසුවිය සහ භානුක වික්‍රමසිංහ සිසුවා අරලියගහ මන්දිරයට පැමිණ ප්‍රතිඵල ප්‍රකාශ කළ අවස්ථාවේ අගමැතිවරයා මේ බව අවධාරණය කළේය.

නවීනි රවිෂ්කා සිසුවිය ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාව විෂය ධාරාවෙන් දිවයිනේ දෙවන ස්ථානය ලබාගෙන ඇති අතර භානුක වික්‍රමසිංහ සිසුවා ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් දිවයිනේ සිව්වන ස්ථානයට පත්ව තිබේ.

තාක්ෂණ විෂය සඳහා සියලු පහසුකම් සහිතව ඉදිකර ඇති හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයට තාක්ෂණවේදය විෂය හැදෑරීම සඳහා අනුරාධපුර, කිලිනොච්චිය, නිකවැරටිය සහ රත්නපුර ආදි දිවයිනේ විවිධ ප්‍රදේශවලින් මෙන්ම ජනප්‍රිය පාසල්වල දරුවන් ද පැමිණෙන බව විදුහල්පති එම්.ආර්.ඩී.කසුන් ගුණරත්න මහතා මෙහිදී සඳහන් කළේය.

තාක්ෂණ විෂය ධාරාව ඉගැන්වීම සඳහා ආරම්භ කළ දකුණු ආසියාවේ ප්‍රථම පාසල වන්නේ හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය වන අතර අද වනවිට සිසු සිසුවියන් 6800ක් එහි අධ්‍යාපනය ලබන අතර ගුරුවරු 315 දෙනෙක් සේවයේ නිරතව සිටිති.

ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ දරුවන්ගේ මව්පියෝ මේ අවස්ථාවට සහභාගී වූහ.

කොවිඩ් වසංගතය නිසා පීඩා විඳින ලෝකවාසී ජනතාවට සෙත්පතා සර්ව ආගමික පින්කමක් ගංගාරාම විහාරස්ථානයේ සීමාමාලකයේ දී පැවැත්විණි. මල්වතු පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි හිමි, ගංගාරාම විහාරවාසී කිරින්දේ අස්සජි හිමි ඇතුළු පිරිස පිරිත් සජ්ඣායනා කළ අයුරුයි මේ. **ඡායාරූපය - සුදත් මලවීර**

දුම්රිය 23ක් අවලංගු කිරීමේ වාර්තාව ප්‍රවාහන ලේකම්ට භාර දීම අද

සුභාෂිණී සේනානායක

කොවිඩ් ව්‍යාප්තිය හමුවේ ඉකුත් 07 වැනි බ්‍රහස්පතින්දා දුම්රිය 23 අවලංගු කිරීමට හේතු දක්වමින් සකස් කරන ලද වාර්තාව දුම්රිය වැඩබලන සාමාන්‍යාධිකාරිවරයා විසින් ප්‍රවාහන ලේකම්වරයා වෙත අද (10) භාර දීමට නියමිතය.

සමාජ දුරස්ථභාවය තබා ගනිමින් ගමන් කළ යුතු බවට සෞඛ්‍ය අංශ දැනුම් දී තිබියදී කිසිදු දැනුම්දීමක් නොකරමින් මෙලෙස දුම්රිය ගමන් වාර 23ක් අවලංගු කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වා වාර්තාවක් යොමු කරන ලෙස ප්‍රවාහන ලේකම්වරයා සිදු කළ දැනුම් දීමකට අනුව මේ වාර්තාව ඉදිරිපත් කෙරේ.

දුම්රිය අවලංගු කිරීම සම්බන්ධයෙන් දුම්රිය මගීන් එදින මහත් අපහසුතාවයකට පත්ව තිබූ අතර එකිනෙකා තෙරපෙමින් ගමන් කිරීමට සිදුවීම සම්බන්ධයෙන් ඔවුන් සිදු කරන ලද පැමිණිලිවලට අදාළව මේ වාර්තාව කැඳවා ඇති අතර එහිදී කොවිඩ් ව්‍යාප්ත වන අයුරින් කටයුතු කර ඇත්නම් ඔවුන්ට එරෙහිව විනය පියවර ගැනීමට නියමිත බව ප්‍රවාහන අමාත්‍යාංශය පවසයි.

සුළු පක්ෂ අගමැති සමග සාකච්ඡාවක් හෙට

සුභාෂිණී සේනානායක

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුවට සම්බන්ධ කුඩා පක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අතර විශේෂ සාකච්ඡාවක් හෙට (11) පස්වරු 6.00 පැවැත්වීමට නියමිතය.

මේ සාකච්ඡාව අරලියගහ මන්දිරයේදී පැවැත්වෙනු ඇති බව පිවිතුරු හෙළ උරුමයේ නායක, ඇමැති උදය ගම්මන්පිල මහතා පැවැසීය.

අවසන් වරට පැවති ආණ්ඩුවේ පක්ෂ නායක රැස්වීම් දෙකටම විමල් වීරවංශ මහතා ඇතුළු මේ කුඩා පක්ෂ නායකයන් සහභාගී නොවූයේ එම රැස්වීම් සඳහා පක්ෂ නායකයන් නොවන විශාල පිරිසක් කැඳවා තිබූ බවට චෝදනා කරමින් වන අතර අදාළ රැස්වීම් සඳහා 50ක පමණ පිරිසක් සහභාගී වී සිටි බවත් විමල් වීරවංශ, උදය ගම්මන්පිල ඇතුළු පිරිසගේ ඉල්ලීම වී ඇත්තේ ආණ්ඩුව නියෝජනය කරන පක්ෂ 16යේ නායකයන් පමණක් පක්ෂ නායක රැස්වීමට සහභාගී වියයුතු බවත් එම පක්ෂ 16න් 11ක් විමල්ලාගේ කුඩා පක්ෂ සන්ධානය නියෝජනය කරන බවත් ජාතික නිදහස් පෙරමුණ ප්‍රකාශකයෙක් පැවැසීය.

එම ඉල්ලීම ඉටු නොවීම නිසා මෙසේ මේ කුඩා පක්ෂ නායකයන් වෙනම අගමැතිවරයා හමුවී සාකච්ඡා කිරීමට තීරණය කර ඇති බව එම ප්‍රකාශකයා වැඩිදුරටත් කියා සිටියේය.

ඉන්දියාවේ කොවිඩ් ප්‍රභේදය මෙරටින් හඳුනා ගත්තා

● වෛද්‍ය චන්දිම ජීවන්දර

සන්ධ්‍යා කරුණාරත්න

ඉන්දියාවේ ව්‍යාප්ත වන කොවිඩ් - 19 වයිරස් ප්‍රභේදය මෙරටින් හඳුනා ගැනීමට හැකි වූ බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යා සහ සෛල ජෛව විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා 'දිනමිණ'ට ඊයේ (09) ප්‍රකාශ කළේය.

ඉන්දියානු වයිරස් ප්‍රභේදය B.1.617 නමින් හඳුන්වන බවත් විදේශයක සිට පැමිණ නිරෝධායනය වෙමින් සිටි පුද්ගලයකුගෙන් මේ ප්‍රභේදය වාර්තා වූ බවත් ඒ මහතා පැවසුවේය.

මේ ප්‍රභේදය හඳුනාගත් පළමු අවස්ථාව මෙය බවත් මේ සම්බන්ධයෙන් තොරතුරු වසංගත රෝග විද්‍යා අංශයට ලබා දී ඇති බවත් ඔහු කීය.

දකුණු අප්‍රිකානු ප්‍රභේදය, එංගලන්ත ප්‍රභේදය, බ්‍රසීල ප්‍රභේදය සහ ඉන්දීය ප්‍රභේදය ලෙස දැනට ලෝකයේ කොවිඩ් 19 වයිරස් ප්‍රභේද හතරක් පවතින බවත් ඉන්දියානු ප්‍රභේදය ලෝකයේ කොවිඩ් ප්‍රභේදයන්ගේ හතරවැනි ප්‍රභේදය ලෙස ලැයිස්තුවට එකතු වන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

ලෝකයේ තිබෙන ප්‍රභේද හතරෙන් බ්‍රසීල ප්‍රභේදය හැරෙන්නට සෙසු සියලු ප්‍රභේදයන් ශ්‍රී ලංකාවෙන් වාර්තා වන්නේ යැයි ද වෛද්‍ය ජීවන්දර මහතා පැවසුවේය.

ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම අද සිට

මහින්ද අලුත්ගෙදර

ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. ආයතනයේ සුදුසුකම්ලත් තැන්පතුකරුවන්/අදාළ තැන්පතු සඳහා වන නීත්‍යානුකූල උරුමකරුවන් වෙත ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ වැඩි කරන ලද වන්දි මුදල් ගෙවීම අද (10) සිට ආරම්භ කරන බව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරයි. ඒ අනුව, අද දින හෝ අදින් පසු දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙත නියමිත ලේඛන ඉදිරිපත් කර තමන්ට හිමි වන්දි මුදල් ලබාගන්නා ලෙස සුදුසුකම්ලත් තැන්පතුකරුවන්/එම තැන්පතු සඳහා වන නීත්‍යානුකූල උරුමකරුවන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව දැනුම් දෙයි.

එසේම මහජන බැංකු ශාඛා පරිශ්‍රයන්හි පිරිස් වශයෙන් රැස් නොවන ලෙසටත්, සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් නිසිලෙස පිළිපදින ලෙසටත් සුදුසුකම්ලත් තැන්පතුකරුවන්ගෙන්/ අදාළ තැන්පතු සඳහා වන නීත්‍යානුකූල උරුමකරුවන්ටගෙන් ඉල්ලීමක් කරයි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් වන වැඩිදුර තොරතුරු 0112 477 261 හෝ 0112 398 788 දුරකතන අංක වෙත ඇමතීමෙන් ලබාගත හැක.

කොවිඩ් ආසාදිත බිලිඳුන් 70ක් සොයිසා රෝහලේදී උපත ලබලා

● සෞඛ්‍ය අමාත්‍යාංශය

කොවිඩ් -19 ආසාදිත බිලිඳුන් 70 දෙනකු පමණ මේ වන විට සොයිසා කාන්තා රෝහලේදී උපත ලබා ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

කොවිඩ් ආසාදිත මව්වරුන්ගෙන් නව ජන්ම ළදරුවන්ට ගර්භාශය තුළදී රෝගය වැලඳීමේ ප්‍රවණතාවය වැඩි බවත් එම සියලු බිලිඳුන් වෙන් වෙන්ව ආරක්ෂා සහිතව රැකබලා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව නව ජන්ම ළදරුවන් පිළිබඳ විශේෂඥ වෛද්‍ය නලින් ගමඇතිගේ මහතා පැවසීය. කොවිඩ් ආසාදිත බිලිඳුන් රැකබලා ගැනීම සඳහා ඉදිරියේදී සෑම රෝහලකම වෙන්ව ඒකකයක් පිහිටුවීමට පියවර ගත යුතු බව කාසල් වීදිය කාන්තා රෝහලේ ළදරු රෝග විශේෂඥ වෛද්‍ය සමන් කුමාර මහතා ප්‍රකාශ කළේය.

ගැබිනි කාන්තාවන්ට කොවිඩ් -19 ආසාදනයවීම වළක්වා ගැනීම සඳහා ආරක්ෂිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බවද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

කොවිඩ් මර්දන වැඩපිළිවෙළ සම්බන්ධීකරණයට නි.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරු 9ක්

සන්ධ්‍යා කරුණාරත්න

මෙරට කොවිඩ් මර්දන වැඩපිළිවෙළ සම්බන්ධීකරණය කිරීම සඳහා පළාත් මට්ටමින් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන් 09 දෙනකු පත්කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

රට පුරා පිහිටි රෝහල්වල එක් වාට්ටුවක් කොවිඩ් ප්‍රතිකාර සේවාවන් සඳහා වෙන් කිරීමටත් එම වාට්ටු ඉදි කරමින් කොවිඩ් - 19 මර්දන වැඩපිළිවෙළ පළාත් මට්ටමින් නිරීක්ෂණයට සහ සම්බන්ධීකරණයට නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන් 09ක් පත් කළ බවත් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ප්‍රකාශ කළාය.

කොවිඩ් මර්දනය සම්බන්ධයෙන් දැනට ගෙනයන වැඩපිළිවෙළ තවදුරටත් විධිමත්ව සාර්ථකව සිදු කිරීමේ අරමුණෙන් මේ පත්කිරීම සිදු කළ බව ඇමැතිවරිය පැවසුවාය.

රට පුරා කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන 105ක් ස්ථාපිත කර ඇති අතර එම මධ්‍යස්ථානවල ගිලන් ඇඳන් 19,000කට ආසන්න ප්‍රමාණයක් ආසාදිතයන් සඳහා වෙන් කර තිබේ.

මීට අමතරව යුද හමුදාව විසින් සීදුව ප්‍රදේශයේ ඇඳන් 1500ක් සහිත ප්‍රතිකාර මධ්‍යස්ථානයක් සහ බූස්ස ප්‍රදේශයේ එවැනිම ප්‍රතිකාර මධ්‍යස්ථානයක් මේ වන විටත් සූදානම් කරමින් පවතියි.

කොවිඩ් මර්දන වැඩපිළිවෙළ සඳහා ක්‍රියාත්මක ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ පහසුකම් සෞඛ්‍ය අමාත්‍යවරියගේ නිරීක්ෂණයට පසුගියදා ලක් කෙරිණ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් අනුව සෞඛ්‍ය ඇමැතිවරිය රත්නපුර දිස්ත්‍රික්කයේ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ පහසුකම් නිරීක්ෂණය කිරීම ද සිදුකෙරිණ.

කොවිඩ් ආසාදිතයන් වාර්තා වීම හේතුවෙන් හුදෙකලා කර ඇති ඇඹිලිපිටිය පොලිස් බල ප්‍රදේශයේ නායකත්ව පුහුණු කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය (ඇඳන් 210), ඇඹිලිපිටිය රෝහල, රක්වාන රෝහල, කහවත්ත රෝහල සහ රුවන්පුර විද්‍යා පීඨය ප්‍රතිකාර මධ්‍යස්ථානයේ කොවිඩ් ආසාදිත රෝගීන්ට ඇති පහසුකම් සෞඛ්‍ය ඇමැතිවරියගේ නිරීක්ෂණයට ලක් විය.

ඇඹිලිපිටිය රෝහලේ දැඩි සත්කාර (ICU) සහ හදිසි ප්‍රතිකාර (HDU) ඇඳන් ධාරිතාවය ඉහළ දැමීමට ද ඇමැතිවරිය අදාළ බලධාරීන්ට උපදෙස් දුන්නාය.

තවත් ප්‍රදේශ කිහිපයක් හුදෙකලා කෙරේ

නුවන් කොඩිකාර සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය හේතුවෙන් ඊයේ (09) උදෑසන සිට තවත් ප්‍රදේශ කිහිපයක් හුදෙකලා කර ඇති අතර, එක් ග්‍රාම නිලධාරී වසමක හුදකලාභාවය ඉවත් කළ බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන පොලිස් බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 13ක්, රක්වාන පොලිස් බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 6ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් ග්‍රාම නිලධාරී වසමක් ද හුදකලා කළ බව යුද හමුදාපති ප්‍රකාශ කළේය.

ඊට අමතරව කළුතර දිස්ත්‍රික්කයේ, පාණදුර දකුණ පොලිස් බලප්‍රදේශයේ නාරම්පිටිය ග්‍රාම නිලධාරී වසම මේ මොහොතේ සිට හුදකලාභාවයෙන් ඉවත් කළ බව හෙතෙම කීවේය.

ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කය, රක්වාන පොලිස් බලප්‍රදේශයේ, දොළේකන්ද රඹුක,කත්ලානෙ, තණබෙල, ඉළුඹුනේද, පොතුපිටිය දකුණ ,කලවාන පොලිස් බලප්‍රදේශයේ, පානාපොළ, කුඩුම්රිය, කුඩව ,දෙල්ගොඩ නැගෙනහිර, දෙල්ගොඩ, බටහිර, දව්ගලගම, ගඟලගමුව, කොස්වත්ත,තපස්සර කන්ද, වතුරාව, වෙම්බියගොඩ ,වැද්දාගල නැගෙනහිර, වැද්දාගල බටහිර කලවාන බටහිර ග්‍රාම නිලධාරී වසමේ ප්‍රධාන නගරයේ සිට නැගෙනහිර දොළහේන මංසන්ධිය දක්වා ප්‍රධාන මාර්ගය දෙපස, නුවර එළිය දිස්ත්‍රික්කය, ළිඳුල පොලිස් බලප්‍රදේශයේ ශාන්ත කුම්බිස් වතුයාය හුදකලා කර තිබේ.

මාලදිවයින් හිටපු ජනපති නෂීඩ්ට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හෙළා දකිනවා

● ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය

මහින්ද අලුත්ගෙදර

මාලදිවයින් පාර්ලිමේන්තුවේ කථානායක සහ හිටපු ජනාධිපති මොහොමඩ් නෂීඩ් මහතාට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය හෙළා දකින බව ශ්‍රී ලංකාව ප්‍රකාශ කරයි.

මේ අතිශය තීරණාත්මක අවස්ථාවේ දී, මාලදිවයින් ජනතාව සහ රජය සමඟ සහයෝගීතාව ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ලංකා ජනතාව සහ රජය එක්වන අතර, සියලු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා දැඩිලෙස හෙළා දකින බවද විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

බෝම්බ ප්‍රහාරයකින් තුවාල ලබා රෝහල්ගත කළ මාලදිවයිනේ හිටපු ජනාධිපතිවරයකු මෙන්ම වත්මන් පාර්ලිමේන්තු කථානායකවරයා ද වන මොහොමඩ් නෂීඩ් මහතා සැත්කම් කීපයකට භාජන කර තිබෙන අතර ඔහු මාලදිවයිනේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට කටයුතු කළ ජනාධිපතිවරයකු ලෙස සැලකෙයි.

පසුගිය (6) රාත්‍රියේ සිය නිල නිවෙස ඉදිරිපිට දී, සිය මෝටර් රථයට ගොඩ වෙද්දී, ඒ අසල තිබූ යතුරු පැදියක ඇටවූ බෝම්බය පුපුරා යෑමෙන් මේ අනතුර සිදුවිය.

සංවර්ධන වැඩට විදෙස් රටවලින් ලැබුණු මුදල් වෙනත් කාර්යයන්ට යොදන්න බෑ

විපක්ෂ නායකවරයාට මේ ඇත්ත තේරුම් ගන්නත් බැහැ

● රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

ක්‍රිසන්ති විතාන

සංවර්ධන කාර්යයන් සඳහා විදෙස් රටවල් සමඟ ගිවිසුම්ගත වූ මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදා ගන්න බැහැ කියන එකවත් විපක්ෂ නායකතුමාට තේරෙන්නේ නැතැයි ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පැවසීය.

ලෝකයේ පවතින කොරෝනා වසංගතය හමුවේ වුවද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනතාවට ලබා දුන් පොරොන්දු ඉටුකරලීම සඳහා කටයුතු කරමින් සිටින බවත්, විශේෂයෙන් රටේ සංවර්ධන කාර්යයන් ඉදිරියට ගෙන යන ලෙස ජනාධිපතිවරයා අපට උපදෙස් දී තිබෙව බවත් හෙතෙම කීවේය.

අප විදෙස් රටවල් සමඟ ගිවිසුම් ගත වී තියෙන සංවර්ධන කාර්යයන් නතර කළහොත්, අදාළ කොන්ත්‍රාත් සමාගම්වලට වැඩිපුර ගෙවන්න අපට සිදු වනවා. එහෙම ගෙවන්න වෙන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්. ඒනිසා තමා පවතින තත්ත්තවය හමුවේ වුවත් ප්‍රමාදයකින් තොරව සංවර්ධන කාර්යයන් ගිවිසුම්ගත වී තියෙන විදිහට ඉදිරියට කරගෙන යන්නේ යැයි ඒ මහතා කියා සිටියේය.

රාජ්‍ය ඇමැතිවරයා මෙසේද කීවේය.

විපක්ෂනායකවරයා කියනවා සංවර්ධන කාර්යයන්ට තියෙන මුදල් කොරෝනා වසංගතයට යොදන්න කියා. එහෙම ගිවිසුම්ගත මුදල් වෙනත් කාර්යයකට යොදවන්න බැහැ කියාවත්, එතුමාට තේරෙන්නේ නැහැ. රජය මිලදී ගැනීමට යන හෙලිකොප්ටර් සඳහා වන මුදල් කොරෝනා වසංගතය වෙනුවෙන් යොදවන්න බැහැ. ගුවන් හමුදාපතිතුමා පැහැදිලිව කියනවා රුසියානු ණය ආධාර යෝජනා යටතේ ඒවා මිලදී අරගෙන එක්සත් ජාතීන්ගේ සාම හමුදාවට ඒවා එක් කරනවා කියා.

මාර්ග සංවර්ධනයට හෝ වෙනත් සංවර්ධන කාර්යයකට වෙන් කර තියෙන, විවිධ රටවල් සමඟ ගිවිසුම්ගත වෙච්ච මුදල් වෙනත් කටයුත්තකට යොදවන්න බැහැ කියන එකවත් දන්නෙ නැතිව විපක්ෂනායකතුමා කටයුතු කරනවා. මධ්‍යම අධිවේගය ගහක් නිසා අවුරුදු දෙකක් ප්‍රමාද වෙනවා කියන්නේ අපට වැඩිපුර මිලියන 4,000ක් විතර ගෙවන්න සිදු වෙනවා. මේ ජනතාවගේ සල්ලි. අපි ජනතාවගේ බදු මුදල් ආරක්ෂාකරගෙන යන්න පුළුවන් ක්‍රියාමාර්ගයකට තමා, ගමන් කරන්නේ.

කොරෝනා වසංගතය පාලනය කිරීම ගැන කතා කරන විට අපට මොන චෝදනා එල්ල කළත් පළවැනි හා දෙවැනි රැල්ල පාලනය කිරීමට කටයුතු කළා. ලෝකයේ අනෙකුත් රටවල් එක්ක බලනකොට අප හොඳ තැනක හිටියා. තෙවැනි රැල්ල අසීරු වුණත් රජයක් විදියට අප එය පාලනය කිරීමට සියලු කටයුතු සිදු කරනවා. ඒ වගේම මේ සඳහා මිලියන 22ක් වූ ජනතාවගේ සහයෝගය අවශ්‍යයි.

රසායනික පොහොරවලින් ඉවත් වීම එක්වරම ක්‍රියාත්මක කළොත් ගොවීන් ගොවිතැනින් ඈත් වේවි

● පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර

අමිල ප්‍රභාත් වනසිංහ
අනුරාධපුර අතිරේක

ශ්‍රී ලංකාව රසායනික පොහොරවලින් ඉවත්වීම රජය ගෙන ඇති ක්‍රියාමාර්ගය එක් කිරීමෙන් රටේ ගොවි ජනතාව කෘෂිකර්මාන්තයෙන් ඉවත්වීමේ අවදානමක් පවතින බව සමඟි ජන බලවේගයේ අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා පැවසීය.

රසායනික පොහොර භාවිතයෙන් එකවර ඉවත් වීම වෙනුවට එය ක්‍රමානුකූලව කරමින් බෝග වර්ගවල ආනයනික බීජවල සිට වෙනසක් ඇති කළ යුතු බවද ඒ මහතා පැවසීය.

පෙරේදා (8) මාධ්‍ය වෙත අදහස් දක්වමින් මේ බව පවසා සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා එහිදී තව දුරටත් මෙසේද කියා සිටියේය.

ගොවි ජනතාව කෘෂිකර්මාන්තයෙන් ඉවත් කර එම ගොවිබිම් ඉන්දියාවේ අදානි සමාගමට දීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම මේ රසායනික පොහොර භාවිතය වැළැක්වීම හරහා සිදුවනවාද? යන සැකය පවතිනවා.

ලෝකයම කොරෝනා වයිරසය සමඟ සටන් කරන මොහොතක වත්මන් රජය කොරෝනා මර්දනය වෙනුවට හිතවත් ව්‍යාපාරිකයන් ශක්තිමත් කරමින්, තමන්ට කොමිස් මුදල් ලබා ගැනීම සඳහා ගුවන් යානා ඇණවුම් කිරීමටත්, ව්‍යායාම මධ්‍යස්ථාන හයසීයයක් පිහිටුවීමටත් කටයුතු කරමින් සිටිනවා.

ශ්‍රී ලංකාවට දී ඇති ණයවලින් 14%ක් චීනය දී ඇති අතර, ඉතිරි සියල්ල ලෝකයේ අනෙකුත් ප්‍රබල රටවලින් මෙරට දී තිබෙනවා. කොරෝනා ව්‍යසනය හමුවේ එම ධනවත් රටවල් සමඟ සාකච්ඡා කර සහන ලබා ගැනීමට විපක්ෂනායකවරයා කටයුතු කරමින් සිටිනවා.

වර්තමානයේ පවතින ව්‍යසනය හමුවේ ඉන්දියාව මෙන්ම, ශ්‍රී ලංකා රජය ද බිඳවැටීමකට ලක්වන බව තේරුම් ගත් චීන රජය වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක කළ සැලසුම් අනුව කොළඹ වරාය නගරය ඔවුන් සතු කර ගැනීමට කටයුතු කරමින් සිටිනවා.

පරිපාලනයේ දැඩි තීන්දු නිසා රුහුණු සරසවිය තුළ අනාරක්ෂිත බවක් මතු වෙලා

● මාතර එජාප ප්‍රධාන සංවිධායක උපුල් නිශාන්ත

රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන් 20ක් පමණ කොවිඩ් ආසාදිතයන් ලෙස තහවුරු වී තිබියදී විශ්වවිද්‍යාල පරිපාලනය එහි සිසුන්ට නිවෙස් කරා යෑම තහනම් කර නේවාසිකාගාර තුළ රඳවා තැබීම නිසා අනාරක්ෂිත තත්ත්වයක් උද්ගත වෙමින් ඇතැයි මාතර හිටපු නගරාධිපති සහ මාතර එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක උපුල් නිශාන්ත සුභාවිත්‍රම මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ලිපියකින් දැනුම් දී තිබේ.

මෙම සිසුන් නොපමාව වෛද්‍ය පරීක්ෂණයට ලක් කර කොවිඩ් ආසාදනය වූවන්, ආශ්‍රිතයන් හඳුනාගෙන රජයේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව නිරෝධායනය කරන්නැයි හිටපු නගරාධිපතිවරයා ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

නේවාසිකාගාරවලින් එළියට යෑම තහනම් කර ඇති මෙම සිසුන්ට, පාලක පාලිකාවන් සකසන කොත්තමල්ලි දින පතා ලැබෙන අතර, නිසි ආහාර වේලක් නොලබෙන බවද හිටපු නගරාධිපතිවරයා සිය ලිපියේ සඳහන් කර ඇත.

සම්පූර්ණ කොරෝනා ආරක්ෂිත ඇඳුම් කට්ටලයකින් සැරසුණ උප කුලපතිවරයා සිසුන් පරීක්ෂාවට පැමිණෙන බවත්, ඇතුළත තොරතුරු කිසිවක් එළියට ප්‍රකාශ කිරීම, සමාජ මාධ්‍යවල ප්‍රකාශ දැමීම කළහොත් උපාධිය පවා අහිමි විය හැකි බවට නොනිල තර්ජන සිදු කරන බවත් එම සිසුන් හා මව්පියන් තමාට දන්වා ඇතැයිද ඔහු සඳහන් කර තිබේ.

මෙම නේවාසිකාගාර වෙත සාමාන්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඇතුළුවීම තහනම් කර ඇති බවද එම ලිපියේ දැක්වේ.

මේ පිළිබඳ උපකුලපතිවරයාගෙන් විමසීමේ දී පැමිණි සරසවි සිසුන් නැවත නිවෙස්කරා නොයැවූයේ එම මාපියන්ගේ ආරක්ෂාවට මෙන්ම, ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ පහසුව පිණිස බව පැවසූ බවද උපුල් නිශාන්ත මහතා සඳහන් කරයි.

සරසවි නේවාසිකාගාර තුළ සිටින සම්පූර්ණ සිසුන් ගණන ප්‍රකාශ කිරීම උපකුලපතිවරයා මගහැරි නමුත්, 500ක් පමණ එහි සිටින බව සෞඛ්‍ය අංශ ප්‍රකාශ කරයි. නමුත් ඊට වඩා වැඩි පිරිසක් සිටින බවත් උපුල් නිශාන්ත මහතා පවසයි.

මෙම සිසුන් සියලු දෙනාට පීසීආර් පරීක්ෂණ කිරීමේ හැකියාවක් මේ මොහොතේ නොමැති බවත්, අනවශ්‍ය ලෙස සියලු සිසුන් මෙසේ රඳවා ගැනීම අනුමත නොකරන බවත් මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසන බවද එම ලිපියේ සඳහන්ය.

චීන විරෝධී කුමන්ත්‍රණකාරීන් නිසා සයිනොපාම් එන්නත දීම ප්‍රමාද වුණා

● රාජ්‍ය ඇමැති, මහාචාර්ය චන්න ජයසුමන

චිත්‍රාරත්න කළුආරච්චි-හිඳෝගම සමූහ

චීනයේ නිෂ්පාදිත සයිනොපාම් එන්නත ලබා දෙන්න යන විට චීන විරෝධී කණ්ඩායම් කුමන්ත්‍රණකාරිව එය නතර කිරීමට උත්සාහ ගත් නිසා එම එන්නත ලංකවේ ජනතාවට දීම ප්‍රමාද වුණා යැයි රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා අනුරාධපුරයේදී පැවසීය.

අනුරාධපුරයේදී පෙරේදා (8) පැවැති මාධ්‍ය හමුවකදී වැඩි දුරටත් කරුණු පැහැදිලි කරමින් හෙතෙම මෙසේද කීවේය.

චීන විරෝධී කණ්ඩායම් චීන සයිනොපාම් එන්නත දීමට විරුද්ධව කටයුතු කළා. මාධ්‍ය ආයතන, සමහර වෛද්‍යවරුන්, සමහර ව්‍යාපාරිකයන්, එකතු වී දේශපාලන අරමුණු වෙනුවෙන් පෙනී සිටියා.

නමුත්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඉල්ලීම අනුව, ලෝක සෞඛ්‍ය සංවිධානය හදිසි ලැයිස්තු ගත කිරීම් අනුව එම එන්නත දීම අනුමත කළා. ජනාධිපතිතුමාගේ උපදෙස් කළුතර, පානදුර වැනි ප්‍රදේශවලට මෙම එන්නත පෙරේදා (8) සිට දීමට අප කටයුතු කළා.

කොවිඩ් රෝගීන් සඳහා ඇඳන් දහදාහක් සැකසීමට කටයුතු කර තිබෙනවා

ඉදිරි දින දහය තුළ ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ වැඩපිළිවෙළක් අනුව, ආරක්ෂක අංශවල සහයෝගයෙන් කොවිඩ් රෝගීන් සඳහා ඇඳන් දහදාහක් ලබා දීමට කටයුතු කර තිබෙනවා.

දැනට අපට දිනකට අවශ්‍ය වන්නේ ද්‍රව ඔක්සිජන් ලීටර් 22,000යි. ආයතන දෙකක දැනට ද්‍රව ඔක්සිජන් ලීටර් 80,000ක් නිපදවනවා. ඒ සමඟම උතුරු නැගෙනහිර රෝහල් නවයකදී ද්‍රව ඔක්සිජන් නිපදවීමට මධ්‍යම පරිමාණ යන්ත්‍ර අප සතුව පවතිනවා.

බොහෝ අයගේ දේශපාලන අරමුණු ඉෂ්ට කරගැනීමට යෑම නිසා චීනයේ නිෂ්පාදිත සයිනොපාම් එන්නත දීමට විරුද්ධව සමහර අය කටයුතු කිරීම පිළිබඳ අප කනගාටු වෙනවා. ඒ වගේම චීන තානාපතිතුමාටත්, චීන රජයටත් අප රටේ සියලු දෙනාගේම ගෞරවය පළ කළ යුතුයි. මේ වන විට එම එන්නත් මාත්‍රා ලක්ෂ හයක් අපට ප්‍රදානයක් ලෙස දී තිබෙනවා. ඉන් මාත්‍රා 5000 ක් අප ලංකාව තුළ සිටින චීන ජනතාවට ලබා දී තිබෙනවා. මේ වන විට ඒ මාත්‍රා දෙකම ඔවුන්ට ලබා දී තිබෙනවා. කිසිම අතුරු ආබාධයක් මේ වන තෙක් වාර්තා වී නැහැ. මෙම එන්නත වයස අවුරුදු 18ත් 60ත් අතර අයට ලබා දීමට කටයුතු කරමින් සිටිනවා.

ඉන්දියාවේ ඇති කොවිඩ් ප්‍රභේදය අප රට තුළ තිබෙන බව දැන ගත්තා. සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ සහ බුද්ධි අංශ එක්ව මේ පිළිබඳ දැඩි සැලකිල්ලෙන් සිටින අතර, එය පැතිරයාම වැළැක්වීමට කටයුතු කරමින් සිටිනවා.

ගැබිනි මව්වරුන් රැක ගැනීමේ විශේෂ වැඩපිළිවෙළක් මේ වන විට සෞඛ්‍ය සකස් කර තිබෙනවා. ඒ අයට ලබා දිය හැකි එන්නත පිළිබඳ සොයා බැලීමට කටයුතු කරමින් සිටිනවා.

බුද්ධි අංශ සහ ආරක්ෂක අංශ, ඒ වාගේම සෞඛ්‍ය අංශ, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විශාල කැප කිරීම් කරමින් කොවිඩ් වසංගතය පාලනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම පිළිබඳ ඔවුන්ට ප්‍රසාදය පළ කරනවා.

දේශපාලන හේතු මත බදියුදීන් මන්ත්‍රීවරයා රඳවා ගෙන සිටිනවා

● නීතිඥ රුෂ්ඩි හබීබ්

පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන්වත් අත්අඩංගුවට ගැනීමට නිර්දේශ කර නොමැති අවස්ථාවක, අධිකරණයෙන් හෝ නීතිපතිවරයාගෙන් උපදෙස් නොගෙන දේශපාලන හේතු මත රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා රඳවාගෙන සිටින්නේයි යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතාගේ නිල නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පැවසීය.

සමස්ත ලංකා මහජන කොංග්‍රසය සංවිධාන කර තිබූ මාධ්‍ය හමුවකදී නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා එම අදහස් පළ කළේය.

නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා මෙසේද කීවේය.

ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාවෙන් කර ඇති අනාවරණ සහ නිර්දේශ ක්‍රියාත්මක නොකර, ඒවා යටපත් කරමින් විවිධ කෝණවලින් සිදු කරන පරීක්ෂණ ගැන අපට ගැටලුවක් තිබෙනවා. පොලිස් මාධ්‍ය ප්‍රකාශක කියන පරිදි ව්‍යවහාරික හෝ විද්‍යාත්මක සාක්ෂි තිබේ නම් ඒවා අධිකරණයට ඉදිරිපත් කළ යුතුයි. එසේ නොකර රඳවා තබා ගැනීම මූලික මිනිස් අයිතිවාසිකම් කඩකිරීමක්.

නීතිපතිවරයාගේ උපදෙස් මත, රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගෙන ඇති බවට සඳහන් වෙන්නේ නැහැ. පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිසමේදී රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා, යුද හමුදාපතිතුමා ඇතුළු විශාල පිරිසක් සාක්කි දුන්නා. පාස්කු ප්‍රහාරයට ආධාර අනුබල දුන් බවක් හෝ, රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් විමර්ශන කළ යුතු බවට ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාවේ කිසිදු තැනක සඳහන් නැහැ. එකී වාර්තාව අනුව යුද හමුදාපතිතුමාට ලබා දුන් දුරකථන ඇමතුමක් සහ ක්ලෝසස් සමාගමට තඟ ලබාදීම පිළිබඳ කරුණුවලට අදාළව අල්ලස් දූෂණ කොමිසම යටතේ විමර්ශනය කළ යුතු බවට විමර්ශන වාර්තාවේ සඳහන් වුණා.

කෙසේ නමුත් මේ වන විට හදිසියේම රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ දක්වා අධිකරණයට කරුණු වාර්තා කිරීමක් සිදු වී නැහැ. රඳවුම් නියෝග ලබාගෙන තිබෙන්නේ ආරක්ෂක ඇමැතිවරයාගේ මැදිහත්වීමකින් කියන කාරණය අප මතු කරනවා. රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අධිකරණයකින් සැකකරුවකු හෝ චූදිතයකු ලෙස නම් කර නැහැ. ඒ නිසා එතුමාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වීමේ අවස්ථාව ලබා දිය යුතුයි. පාර්ලිමේන්තු රැස්වීමට සහභාගීවීමට රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාට කිසිදු බාධාවක් නොමැති බව නීතිපතිවරයා නිවේදනය කර තිබෙනවා. එවැනි අවස්ථාවක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු රැගෙන ඒම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කර තිබෙනවා. රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට රැගෙන ඒම විමර්ශනවලට බාධාවක් බව මහජන සාමය පිළිබඳ අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ත්‍රස්තවාදී සංවිධානයක කෙනෙක් නෙවෙයි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන නායකයෙක්.

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කරමින් කටයුතු කරන ආකාරයක් පෙනී යනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ සිද්ධියේදී ක්‍රියා කරන ආකාරය පිළිබඳ සෑහීමකට පත් වන්න බැහැ.

කොරෝනා වසංගතය පාලනයට පැහැදිලි විසඳුමක් නොදුන්නොත් රටම අවදානමේ

● හිටපු ඇමැති මංගල සමරවීර

ශිරෝමි අබයසිංහ

ශ්‍රී ලංකාවේ කොරෝනා රෝග ව්‍යාප්තිය මේ ආකාරයෙන්ම ඉදිරියට පැවතියහොත් ලබන සැප්තැම්බරය වන විට කොරෝනා මරණ 20,000කට වැඩි ප්‍රමාණයක් බලාපොරොත්තු විය හැකි යැයි අමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් විශ්ව විද්‍යාලය සඳහන් කර තිබෙන බව හිටපු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා පැවසීය.

මාධ්‍ය වෙත ඊයේ (9) අදහස් දක්වමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

වොෂින්ටන් විශ්වවිද්‍යාලය අවධාරණය කරන මෙම කරුණු ගැන ලාංකික බලධාරීන් වහාම අවධානය යොමු කළ යුතු අතර, වසංගතය පාලනය කිරීම සඳහා පැහැදිලි විසඳුමක් නොදුන්නොත් ශ්‍රී ලංකාවට මාරාන්තික තත්ත්වයකට මුහුණ පෑමට සිදුවනු ඇති බවද මංගල සමරවීර මහතා සඳහන් කළේය.

වොෂින්ටන් විශ්ව විද්‍යාලය නිකුත් කර ඇති කොරෝනා සම්බන්ධ වාර්තාව ගැන මෙන්ම ශ්‍රී ලංකාවේ වත්මන් කොරෝනා තත්ත්වයන් පිළිබඳව වැඩි දුරටත් අදහස් දක්වමින් මංගල සමරවීර මහතා මෙසේද පැවසීය.

ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් විශ්වවිද්‍යාලය විසින් කොරෝනා වර්තමාන ගෝලීය තත්ත්වය ගැන ඉතා ගැඹුරින් සොයා බලා වාර්තාවක් නිකුත් කර ඇත.

කොරෝනා වසංගතය නිසා ලෝකයේ සෑම රටක්ම මුහුණ පා ඇති තත්ත්වයන් එම වාර්තාවෙන් සොයා බලා ඇති අතර, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද එම වාර්තාව සඳහන් කර තිබෙන කරුණු ගැන රජය සහ බලධාරීන් වහාම අවධානය යොමු කළ යුතුය.

වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ අදාළ වාර්තාවෙන් කාරණා විශාල ප්‍රමාණයක් ගැන අවධානය යොමු කර ඇතත් ඔවුන් පෙන්වා දෙන වැදගත්ම කාරණය වන්නේ ශ්‍රී ලංකාවේ කොරෝනා රෝග ව්‍යාප්තිය මේ ආකාරයටම ඉදිරියට ගියහොත් ලබන සැප්තැම්බරය වන විට එනම් තවත් මාස හතරකින් කොරෝනා මරණ සංඛ්‍යාව 20,000කට වැඩි ප්‍රමාණයක් බලාපොරොත්තු විය හැකි බවයි.

එවැනි තත්ත්වයකට මුහුණ දීමට රටට කිසිම සූදානමක් නැති බව මේ වන විට පැහැදිලි වන අතර, එවැනි මාරාන්තික තත්ත්වයක් නිර්මාණය වීම නතර කිරීම සඳහා රජය තවමත් ප්‍රමාද නැති බව මගේ විශ්වාසයයි.

පසුගිය කාලයේ ලොව වැඩිම මරණ සහ රෝගීන් වාර්තා වූ අමෙරිකා එක්සත් ජනපදය සහ මහා බ්‍රිතාන්‍යය කොරෝනා රෝග පාලනය සම්බන්ධයෙන් උදාහරණ ලෙස සලකා බැලිය හැකිය. කොරෝනා එන්නත විධිමත් සහ වේගවත් කිරීම තුළින් මේ වන විටත් එම රටවල මරණ සහ රෝගීන්ගේ වේගවත් අඩුවීමක් පෙන්නුම් කර තිබේ.

එංගලන්තය වැනි රටවල් ලබන ජුනි ජූලි වන විට යථා තත්ත්වයට පත් වෙතැයි සිතිය හැකි ප්‍රගතියක් පෙන්වමින් සිටී.

එසේ නම් රජය කෙසේ හෝ ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගත් එන්නත් ජාත්‍යන්තරය සමඟ සාකච්ඡා කර ලබාගෙන රට පුරා විධිමත් එන්නත්කරණයක් ඇරඹුවහොත් මාස දෙක තුනක් ඇතුළත මේ තත්ත්වය පාලනය කර ගන්න හැකි බව මගේ විශ්වාසයයි.

පෞද්ගලික අංශයත් එන්නත ලබාදීමේ වැඩපිළිවෙළට එකතු කරගත යුතු බව මා විශ්වාස කරන අතර එහිදී කැමති අයට එන්නක් මිලදී ගැනීමට අවස්ථාවක් සලසා දෙනවා නම් ජනගහනයෙන් 70% ක ඉලක්කයට යෑමට පහසු වනු ඇත.

කොරෝනා පාලනයේ ප්‍රගතියක් අත් කර ගැනීමට නම් මිලියන 22ක ජනගහනයෙන් මිලියන 13කටවත් එන්නත ලබා දිය යුතුව තිබේ.

බොහෝ රටවල් එන්නත ලබාදීමට සූදානම්ය. ශ්‍රී ලාංකික තානාපතිවරුන් සහ රජය රටවල් තරහ කර ගන්නේ නැතිව මේ අවස්ථාවේ ලෝක සහාය ලබාගත යුතු බව පෙන්වා දෙමි.

මේ වකවානුවේ දී අපට ඇමෙරිකාව, චීනය, බ්‍රිතාන්‍යය, රුසියාව මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානය ද අවශ්‍ය ය. මෙම වසංගතය පාලනය කිරීම සඳහා පැහැදිලි විසඳුමක් නොදුන්නොත් ශ්‍රී ලංකාවට ද මාරාන්තික තත්ත්වයකට මුහුණ පෑමට සිදු වෙනවා ඇත යනුවෙන් ද මංගල සමරවීර මහතා වැඩි දුරටත් සඳහන් කළේය.

අනවශ්‍ය විවේචන සිදු නොකොට කොවිඩ් මර්දනයට ආණ්ඩුවට සහාය දෙන්න

ඇමැති නාමල් විපක්ෂයට කියයි

මහින්ද අලුත්ගෙදර

අනවශ්‍ය පරිදි ආණ්ඩුව විවේචනය කරමින් නොසිට කොවිඩ් වසංගතය මර්දනය වෙනුවෙන් ආණ්ඩුව ගෙනයන වැඩපිළිවෙළට සහාය දක්වන්නැයි ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා විපක්ෂයෙන් ඉල්ලීමක් කරයි.

කොවිඩ් පිට දමා ජනතා ප්‍රශ්න මඟ හැරීමට ආණ්ඩුව සූදානම් නොමැති බවත්, කොවිඩ් පාලනය කරන අතරතුරම රටේ සංවර්ධනය හා ජනතා ප්‍රශ්න විසඳීම ආණ්ඩුව ප්‍රමුඛතාව දී ඇති බවත් ඔහු කීවේය.

යක්කල වැරැල්ලවත්ත ප්‍රදේශයේ ඉදිකෙරෙන ඇඳන් 2,000කින් සමන්විත කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කළේය.

මෙහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ නාමල් රාජපක්ෂ මහතා - මේ වන විට පොදුජන පෙරමුණ, පොදුජන පෙරමුණේ තරුණ සංවිධානය, යෞවන සමාජ ව්‍යාපාරය, යෞවන බලමණ්ඩල මේ සියලු දෙනා වගේම ස්වේච්ඡා සංවිධාන ඒකරාශී වී කොවිඩ් මර්දන වැඩපිළිවෙළට අවශ්‍ය දායකත්වය ලබා දෙන්න සූදානම්. කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලට අදාළ පහසුකම් සපයන්නත් ශ්‍රමදායකත්වය ලබා දෙන්නත් අප මැදිහත් වී සිටිනවා. මේ යටතේ දින දහයක් තුළ ඇඳන් 10,000ක් සෞඛ්‍ය පද්ධතියට එකතු කිරීමේ ව්‍යාපෘතියක් අප ආරම්භ කළා. ඒ සඳහාත් නොයෙක් ස්වේච්ඡා සංවිධාන, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ඉන්නවා. පොදුජන පෙරමුණ කියන්නේ දේශපාලන පක්ෂයක්. දේශපාලන ව්‍යාපාරයක්. අපේ ඉංජිනේරු සංගමය, තරුණ සංගමය, කාන්තා සංවිධානය, වෛද්‍යවරුන්ගේ සංගමය, වෘත්තීය සමිති, පක්ෂයත් එක්ක බැඳුණු යෞවන සමාජ ව්‍යාපාරය ඇතුළු ලංකාවේ ස්වේච්ඡා සංවිධාන අද මේ සඳහා ඉදිරිපත් වී සිටිනවා.

මේක දේශපාලන පක්ෂයක වැඩක් නෙවෙයි. රටේ මහජනතාව වෙනුවෙන් කරන පොදු වැඩක්. ඒ නිසා සියලු දෙනාටම මේ සඳහා දායකත්වය දීමට විවෘතයි. දේශපාලන පක්ෂයක් විදිහට අප වගකීම ඉටුකරන්න මැදිහත් වුණා වගේම, මේ රටේ ජනතාව ඒකට සහයෝගය දෙයි කියා අප බලාපොරොත්තු වෙනවා. ඇඳන් දහදාහ බෙදා හැරීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරනවා. පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහ අහා ඉන්නෙ නැතුව, ප්‍රායෝගිකව ඇවිත් රටට උදව් කරන්න කියා අප විපක්ෂ නායකවරයාටත් ආරාධනා කරනවා. කොවිඩ් වසංගතය පාලනය කළ පසු, එතුමන්ලා සහ අප අතර තියෙන ගැටලු විසඳා ගන්න පුළුවන්. දැන් අපත් එක්ක එකතු වී මේ වසංගතය පාලනය කරන්න මැදිහත් වන්න.

රනිල් වික්‍රමසිංහ මහතාටත් ප්‍රශ්නයක් වුණේ ජාතික ප්‍රශ්න ජාත්‍යන්තරයට ගිහින්ලා විසඳ ගන්න ගිය එකයි. මේක ගෝලීය වසංගතයක් තමයි. හැබැයි අපේ ගම්වල අහිංසක ජනතාවයි, මේ වසංගතයට මැදිවෙලා තියෙන්නේ. සාකච්ඡා කරන එක හොඳයි. මොකද අපේ එන්නත් වැඩපිළිවෙළ පිළිබඳ හෝ ජාත්‍යන්තරය සමඟ සාකච්ඡා කළ යුතුයි. හැබැයි එතුමා සාකච්ඡා කරන කොට මේ එන්නත ලංකාවට ඇවිත් ඉවරයි. විශේෂයෙන් සාකච්ඡා කරන්න දෙයක් ඉතුරු වී නැහැ. රජයක් විදිහට අප එක පැත්තකින් මේ රට ඉදිරියට රැගෙන යන්න ඕනේ. අද කොවිඩ් වසංගතය පාලනය කරන ගමන් තමයි, රටේ අනෙකුත් වැඩ කරගෙන යන්නේ. මෙ කාලසීමාව ඇතුළත අප ලක්ෂයකට රැකියා දී තියෙනව. උපාධිධාරීන් 60,000ට රැකියා දී තියෙනවා. රුවන්පුර අධිවේගී මාර්ගයට මුල්ගල් තිබ්බා. එහි වැඩකටයුතු ආරම්භ කළා.

ක්‍රීඩාව පැත්තෙන් ගත්තත් ක්‍රීඩා පිටටනි 780ක් මේ අවුරුද්දේ ඉදිවෙනවා. රට දුවන්න ඕනේ. රට ඉදිරියට යන ගමන්ම වසංගතය පාලනය කරන්නත් මැදිහත් වෙන්න ඕනේ. ආණ්ඩුවක් විදිහට අපට ලොකු වගකීමක් තියෙනවා.

විපක්ෂයේ ඉන්නකොට මේ ප්‍රශ්නවලට ඇඟිලි දික් කරන්න ලේසියි. නමුත් කෝවිඩ් පිට දමා මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්නේ නැතුව අපට ඉන්න බැහැ, කියන එක අප විශ්වාස කරනවා. ඒ

නිසා මේ වසංගතය පාලනය කරන ගමන් ජනතාවගේ අවශ්‍යතාවන් සපුරන්න අප කටයුතු කළ යුතුයි.

දකුණු ආසියාවේ ප්‍රථම වතාවට සංචාරක බුබුළු සංකල්පය යටතේ තරගාවලියක් කළේ අපයි. ඒ පටන් ගත්තු ගමන බුබුළු සංකල්පය යටතේ අප සංචාරක ව්‍යාපාරය ආරම්භ කළා.

වර්තමානයේ තියෙන තත්ත්වය සැලකිල්ලට ගෙන එය වෙනස් කළා. කාලානුරූපව ලෝකයේ තියෙන තත්ත්වයත්, රටේ තියෙන තත්ත්වයත් සැලකිල්ලට ගනිමින් වෙනස් කළ යුතු දේ වෙනස් කළා.

පාලනය ගිලිහුණු චීන රොකට්ටුවේ සුන්බුන් ඉන්දීය සාගරයට කඩා වැටෙයි

කඩා වැටීමට හේතුව චීනයේ නොසැලකිල්ලයි

අමෙරිකාවේ ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින් චෝදනා කරයි

ලෝන් මාච් චීන රොකට්ටුවේ සුන්බුන් පාලනයකින් තොරව නැවත පෘථිවිය දෙසට පැමිණ ඉන්දීය සාගරයට කඩා වැටී ඇති බව චීනය පැවසීය.

නැවත ඇතුළු වීමේදී රොකට්ටුවෙන් වැඩි ප්‍රමාණයක් විනාශ වූ නමුත් ඉතිරි වූ කොටස් අක්ෂාංශ 72.47 ° නැඟෙනහිරට සහ 2.65 ° උතුරට ගොඩ බැස්සේ යැයි චීන රජයේ මාධ්‍ය වාර්තා කරයි. එම ස්ථානය මාලදිවයිනට බටහිර දෙසින් පිහිටා ඇත. එක්සත් ජනපද හා යුරෝපීය ලුහුබැඳීම් අඩවි ලෝන්ග් මාච් -5 බී වාහනයේ පාලනයකින් තොර වැටීම නිරීක්ෂණය කර තිබුණි. චීන රාජ්‍ය මාධ්‍ය පැවසුවේ ඉරිදා බීජිං වේලාවෙන් 10:24 ට (GMT 02:24) රොකට්ටුවේ කොටස් නැවත වායුගෝලයට ඇතුළු වූ බවයි. එක්සත් ජනපද අභ්‍යවකාශ විධානය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ, "චීන ලෝන් මාර්ච් -5 බී අරාබි අර්ධද්වීපයට නැවත ඇතුළු වූ බව සනාථ කළ හැකි" බවයි. "සුන්බුන් ගොඩබිමට හෝ ජලයට බලපා ඇත්දැයි නොදන්නා" බව ඒජන්සිය පැවසීය. රොකට්ටුව නැවත ඇතුළු වීමට පෙර ජනාවාස ප්‍රදේශයකට සුන්බුන් වැටිය හැකි බවට බියක් ඇති විය. එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින් පැවසුවේ රොකට්ටුව කක්ෂයෙන් වැටීමට හේතුව චීනයේ නොසැලකිලිමත් භාවය බවයි. කෙසේ වෙතත්, අභ්‍යවකාශ විශේෂඥයන් අනාවැකි පළ කර ඇත්තේ අභ්‍යවකාශ කුණු කැබැල්ලකට ඕනෑම කෙනෙකුට සැබවින්ම ගොදුරු වීමේ සම්භාවිතාව ඉතා කුඩා බවය. ඒ අවම වශයෙන් පෘථිවි පෘෂ්ඨයෙන් වැඩි ප්‍රමාණයක් සාගරයෙන් වැසී ඇති හෙයින් සහ විශාල භූමි ප්‍රදේශ ජනාවාස නොවන බැවිනි.

කොවිඩ්වලින් හෙම්බත් වුණු ඉන්දියානුවන්ට කළු දිලීරයක් බැට දෙයි

පෙරේදා (8) උදෑසන මුම්බායිහි අක්ෂි ශල්‍ය වෛද්‍යවරයකු වන වෛද්‍ය අක්ෂේ නයාර් සති තුනකට පෙර කොවිඩ් -19 රෝගයෙන් සුවය ලැබූ 25 හැවිරිදි කාන්තාවකට ශල්‍යකර්මයක් කිරීමට බලා සිටියේය. ශල්‍යකර්මයේදී, කන, නාසය සහ උගුර පිළිබඳ විශේෂඥයකු දැනටමත් දියවැඩියා රෝගියකු වන රෝගිය පිළිබඳ වැඩ කරමින් සිටියේය. ඔහු ඇගේ නාසයේ නළයක් ඇතුළු කර ඇති අතර, දුර්ලභ නමුත් භයානක දිලීර ආසාදනයක් වන මුකෝර්මිකෝසිස් ආසාදිත පටක ඉවත් කරමින් සිටියේය. මෙම ආක්‍රමණශීලී ආසාදනය නාසය, ඇස සහ සමහර විට මොළයට ද බලපායි. ඔහුගේ සගයා අවසන් වූ පසු, වෛද්‍ය නයාර් රෝගියාගේ ඇස ඉවත් කිරීම සඳහා පැය තුනක ක්‍රියා පටිපාටියක් සිදු කරනු ඇත. "ඇයගේ ජීවිතය බේරා ගැනීම සඳහා මා ඇගේ ඇස ඉවත් කළා. මෙම රෝගය ක්‍රියාත්මක වන්නේ එලෙසිනි," වෛද්‍ය නයාර් මාධ්‍යවේදියාට පැවසීය. කොවිඩ් -19හි මාරාන්තික දෙවන රැල්ල ලෙස ඉන්දියාව විනාශ කළත්, වෛද්‍යවරු දැන් වාර්තා කරන්නේ දුර්ලභ ආසාදනයක් සම්බන්ධ සිද්ධීන් රාශියක් වාර්තා වී ඇති බවයි. මේවා "කළු දිලීර" ලෙසද හැඳින්වේ.

සුවය ලැබූ සහ සුවය ලබමින් පවතින කොවිඩ් -19 රෝගීන් අතර මේ රෝගය පැතිරේ.

කාබුල් නුවර පාසලක් අසල කාර් බෝම්බයක් පුපුරයි

තිහක් මරුට - විශාල පිරිසකට තුවාල

ඇෆ්ගනිස්තාථාන අගනුවර වූ කාබුල්හි ද්විතීයික පාසලකට ආසන්නව ඇති වූ පිපිරීම් හේතුවෙන් පුද්ගලයන් 30 දෙනකු මියගොස් තවත් විශාල පිරිසක් තුවාල ලබා ඇතැයි බලධාරීහු පවසති.

සෙනසුරාදා සිසුන් ගොඩනැගිල්ලෙන් පිටව යමින් සිටියදී මෙම පිපිරීම් සිදු වී ඇති අතර, සමාජ මාධ්‍යවල පින්තූරවල වීථියේ අතහැර දමා ඇති පාසල් බෑග් පෙන්වයි. ඝාතනයට ලක්වූවන්ගෙන් බහුතරය ගැහැණු ළමයින් බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශකයෙක් පැවසීය. සුන්නි ඉස්ලාමීය සටන්කාමීන් බොහෝ විට පහර දෙන ප්‍රදේශයක් වන ඩැෂ්-ඊ-බාර්චිහි මෙම පිපිරීම සිදු වී ඇත.

ප්‍රහාරයේ වගකීම කිසිවකු භාරගෙන නැත. තලේබාන් සටන්කාමීන් ඊට සම්බන්ධ නැතැයි පැවැසේ. ඇෆ්ගනිස්තාන නිලධාරීන් පවසන්නේ පිපිරීම් සිදුව ඇත්තේ කාර් බෝම්බයක් නිසා බවයි. බටහිර කාබුල්හි නේවාසික ප්‍රදේශය හසාරා සුළුතර ප්‍රජාවට අයත් වන අතර මොන්ගෝලියානු හා මධ්‍යම ආසියානු සම්භවයක් ඇති සහ ප්‍රධාන වශයෙන් ෂියා මුස්ලිම් ජාතිකයෝ වෙති. හරියටම වසරකට පමණ පෙර, ප්‍රාදේශීය රෝහලේ මාතෘ ඒකකයකට ත්‍රස්තවාදීන් පහර දුන් අතර, කාන්තාවන්, ළමයින් සහ ළදරුවන් 24 දෙනෙකු මිය ගියහ. සෙනසුරාදා ලේ වැගිරීම සඳහා නිශ්චිත ඉලක්කය පැහැදිලි නැත. සැප්තැම්බර් 11 වැනි විට එක්සත් ජනපදය සිය සියලු හමුදා ඇෆ්ගනිස්තානයෙන් ඉවත් කර ගැනීමට අපේක්ෂා කරන්නේ, මෙම පිපිරීම් ඉහළ යන ප්‍රචණ්ඩත්වයේ පසුබිමකට එරෙහිව ය.

නයිජීරියාවේ රිවර්ස් ප්‍රාන්තයේදී පොලිස් නිලධාරීහු 7ක් ඝාතනය වෙති

ඝාතකයන් සොයා මෙහෙයුමක්

නයිජීරියාවේ රිවර්ස් ප්‍රාන්තයේ ඉකුත් සිකුරාදා පොලිස් නිලධාරීන් හත් දෙනකු ඝාතනය කිරීමත සමඟ ඝාතකයන් සොයා මෙහෙයුමක් ක්‍රියාත්මක කර තිබේ. තුවක්කුකරුවන් දකුණු ප්‍රාන්තයේ මුරපොළකට වෙඩි තැබූ අතර, පසුව පොලිස් ස්ථාන දෙකකට පහර දුන්හ. පොලීසිය ප්‍රහාරකයන් දෙදෙනකු ඝාතනය කළ අතර, පැන ගිය අය සොයමින් සිටී.

මෙම ඝාතන පිටුපස සිටියේ කවුරුන්ද යන්න පැහැදිලි නැත, නමුත් කලාපය තුළ පොලිසියට බෙදුම්වාදී ප්‍රහාර වැඩි වී තිබේ. ටොයොටා හිලක්ස් වෑන් රථයක් පැදවූ නාඳුනන සන්නද්ධ පිරිස්, සිකුරාදා දේශීය වේලාවෙන් 20: 30ට මුරපොළ අසලදී පොලිස් නිලධාරීන් දෙදෙනකුට වෙඩි තබා ඝාතනය කිරීමෙන් පසු ඔවුන් තවත් නිලධාරීන් දෙදෙනකු ඝාතනය කර, මුර සංචාරයේ යෙදුණු මෝටර් රථයකට ගිනි තබා ඇත.

පොලිසිය ප්‍රතිප්‍රහාර එල්ල කර පහර දුන් දෙදෙනකු ඝාතනය කළ බව ඔහු පැවසීය. ඉතිරි තුවක්කුකරුවන් එලිම්ග්බු පොලිසියේ දී තවත් නිලධාරීන් තිදෙනකු ඝාතනය කර ඇත. මෑත සතිවල කලාපයේ පොලිස් නිලධාරීන් සහ සොල්දාදුවන් ගණනාවක් ඝාතනයට ලක්ව ඇති අතර, රාත්‍රී කාලයේ ඇඳිරි නීතිය පැනවීමට එය හේතු විය.

ලන්ඩන් නගරාධිපති සටනින් ලේබර් පක්ෂයට ජය

කොන්සර්වේටිව් ප්‍රතිවාදියා වන ෂෝන් බේලි පරාජය කරමින් ලේබර් පක්ෂයේ අපේක්ෂක සාදික් ඛාන් ලන්ඩනයේ නගරාධිපති ධුරය දෙවන වරටත් ජයග්‍රහණය කර තිබේ.

පළමු වටයේ ඡන්ද විමසීමේදී බහුතරයක් ලබා ගැනීමට නොහැකි වූ විට බේලි මහතා සමඟ තරගයෙන් පසුව ඔහු ජනප්‍රිය ඡන්දයෙන් 55.2% ක් දිනා ගත්තේය. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යුරෝපා සංගම් අගනුවරක පළමු මුස්ලිම් නගරාධිපතිවරයා බවට පත්වූයේ 2016 දී ඔහු එම භූමිකාවට ප්‍රථම වරට තේරී පත් වූ අවස්ථාවේදීය. සිටි හෝල්හි දී අදහස් දක්වමින් ඔහු පොරොන්දු වූයේ ලන්ඩනයට වඩා දීප්තිමත් අනාගතයක් ගොඩනැගීම සඳහා සෑම විටම කටයුතු කරන බවයි. හරිත පක්ෂයේ සියන් බෙරි තෙවන ස්ථානයට පත් වූ අතර, ලිබරල් ඩිමොක්‍රටිකයන්ගේ ලුයිසා පෝරිට් සිව්වන ස්ථානයට පත්විය. පෝරිට් මහත්මිය 5% කට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට අපොහොසත් වීම නිසා ලිබරල් ඩිමොක්‍රටිකයන්ගේ තැන්පතුව අහිමි විය.

sports.dinamina@lakehouse.lk

දකුණු ආසියාවටම උඩින් තිවංක උස පනියි

ශ්‍රී ලංකා වාර්තාව මාසයක් තුළ අලුත් කරයි

ප්‍රින්ස් ගුණසේකර

උස පැනීමේ පිරිමි ඉසවුවේ ශ්‍රී ලංකා වාර්තාව නැවත වරක් අලුත් කරමින් දකුණු ආසියාවේ ක්‍රීඩකයකු වාර්තා කළ හොඳම දක්ෂතාව පෙන්වීමට උෂාන් තිවංක පෙරේරා සමත් වෙයි. අමෙරිකාවේ ටෙක්සාස් නගරයේ ඊයේ පැවැති මලල ක්‍රීඩා තරගාවලියකදී ඔහු එම දක්ෂතාව දැක්වීමට සමත් විය.

මීටර් 2.30ක උසක් පැන උෂාන් තිවංක මෙතෙක් දකුණු ආසියාවේ උස පැනීමේ ඉසවුවේ හොඳම දක්ෂතාව සටහන් කොට ඉන්දියාවේ තෙජාස්වින් ෂන්කර් 2018දී මීටර් 2.29කින් තබා තිබූ වාර්තාව ද මකා දැමීමට සමත් විය.

මෙයට මසකට පමණ පෙර අමෙරිකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර, වාර්ෂිකව පැවැති තරගාවලියේදී මීටර් 2.28ක දක්ෂතාවක් දැක්වූ උෂාන් තිවංක වසර 2005දී මංජුල කුමාර විජේසේකර කොරියාවේ ඉන්චියෝන්හිදී මීටර් 2.27කින් පිහිටුවා තිබූ උස පැනීමේ ශ්‍රී ලංකා වාර්තාව ද තමන් සතු කර ගත්තේය. අමෙරිකාවේ ටෙක්සාස්හි අධ්‍යාපන කටයුතුවල නිරත වෙමින් ක්‍රීඩා පුහුණුවීම් සිදු කරන උෂාන් තිවංක එරට 93 වැනි ක්ලයිඩ් ලිටල්ෆීල්ඩ් ටෙක්සාස් රිලේස් තරගාවලියේදී වසර 16ක් පැරණි උස පැනීමේ ශ්‍රී ලංකා වාර්තාව එලෙස බිඳ දැමුවේය.

මේ වසරේ පැවැත්වෙන ඔලිම්පික් ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලැබීමේ බලාපොරොත්තුවෙන් පසු වන ඔහු ඊයේ පෙරවරුවේදී අන්තර්ජාතික උස පැනීමේ ක්‍රීඩකයන් ශ්‍රේණිගත කිරීමේ 64 වැනි ස්ථානයේ පසු වූ අතර, ආසියාවේ 14 වැනි ස්ථානයට පත්ව සිටියේය. ඔලිම්පික් ක්‍රීඩා උලෙළට ලෝකයේ මුල්ම ක්‍රීඩකයින් 32ක් තෝරා ගැනීමට නියමිතය.

ඉදිරියේ පැවැත්වෙන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගි වීම උදෙසා උෂාන් තිවංක ශ්‍රී ලංකාවට පැමිණෙන අතර, එම ශූරතාවලියට සහභාගි වීමෙන් ඔහුට අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම්වලට තවත් ලකුණු 20ක් ලැබී ලෝක මට්ටමේ පියවර කිහිපයක් ඉදිරියට යෑමේ අවස්ථාව උදා වනු ඇත.මේ ජයග්‍රහණයට සුබ පැතුම් එක් කරමින් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පවසන්නේ උෂාන් තිවංක පෙරේරාට ඔලිම්පික් සුදුසුකම් ලබා ඔලිම්පික් පදක්කමක් කරා යෑමට ශක්තිය හා ධෛර්යය ලැබීමට ප්‍රාර්ථනා එක් කරන බවය. මේ ජයග්‍රහණය ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව ලැබූ ජයග්‍රහණයක් බව ද ඇමැතිවරයා සඳහන් කර සිටී.

තුන්වැනි කොටසේ පාසල් ක්‍රිකට් කල් යයි

කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් අන්තර් පාසල් අවුරුදු 19න් පහළ තුන්වැනි කොටසේ ක්‍රිකට් තරගාවලියේ අර්ධ අවසන් තරග කල් දමා තිබේ. ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මෙහෙයවනු ලබන පාසල් ක්‍රිකට් තරගාවලියේ පළමු හා දෙවැනි කොටසේ ක්‍රිකට් තරග නිමාවට පත් වූ අතර, තුන්වැනි කොටසේ තරගාවලිය මේ මස මැද භාගයේදී නිමාවට පත් වීමට නියමිතව තිබිණි.

තුන්වැනි කොටසේ අර්ධ අවසන් පූර්ව වටයේදී මොරටුව මෙතෝදිස්ත විදුහල් පිල සමඟ මතුගම සී.ඩබ්.ඩබ්. කන්නන්ගර විදුහල් පිල, ගාල්ල විද්‍යාලෝක සමඟ ඉබ්බාගමුව මැදි විදුහල, වත්තල සාන්ත ජෝසප් විදුහල සමඟ යාපනය මැදි විදුහල සහ හංවැල්ල රාජසිංහ මැදි විදුහල සමඟ මතුගම සාන්ත මරියා විදුහල තරග වැදීමට නියමිතව තිබිණි.

පෘතුගාල බැඩ්මින්ටන් පිටියේ නිලූක අවසන් හතරට

ටෝකියෝ ඔලිම්පික් සුදුසුකම් ලබාගැනීමේ අරමුණින් පෘතුගාලයේ 56 වැනි අන්තර්ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියට එක් වී සිටින සුපිරි ක්‍රීඩක නිලූක කරුණාරත්න අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබා සිටී. එම තරගය ඊයේ රාත්‍රී පැවැත්වීමට නියමිතව තිබූ අතර, ඔහුගේ ප්‍රතිවාදී ක්‍රීඩකයා වූයේ ජර්මනියේ ප්‍රබල ක්‍රීඩක මැක්ස් වෙස්කිර්චෙන්ය.

ඔලිම්පික් සුදුසුකම් හිමි වන ලැයිස්තුවේ පළමු 40 දෙනා අතරට එක්වීමේ අරමුණ ඇතිව තරග වදින නිලූකට මේ තරගාවලියට අමතරව තවත් තරගාවලියක් ඉතිරිව ඇත. ඔහු මේ වන විට එම ලැයිස්තුවේ 41 වැනි ස්ථානයේ පසුවන අතර, පෘතුගාල ශූරතාව දිනා ගනිමින් මීළඟ තරගාවලියට පෙර ටෝකියෝ ඔලිම්පික් සුදුසුකම් සපුරා ගැනීම නිලූකගේ අපේක්ෂාව වී ඇත. මීට පෙර වසර 2016දී 51 වැනි පෘතුගාල අන්තර්ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියේ පිරිමි ඒකල ජයග්‍රහණය අත් කර ගත් නිලූක මෙවර තරගාවලියේ අවසන් පූර්ව වටයට එක් වූයේ අර්ධ අවසන් පූර්ව වටයේදී එස්ටෝනියාවේ රාවුල් මස්ට් ලකුණු 21-18ක් සහ 27-25ක් ලෙස පරාජය කරමිනි.

තරගාවලියේ මූලික වටයේ පළමු තරගයට නිලූකගේ ප්‍රතිවාදි ක්‍රීඩක අයිස්ලන්ත ක්‍රීඩක කාරි ගනර්සන් සහභාගි නොවීම හේතුවෙන් නිතරග ජයක් හිමි වූ අතර, දෙවැනි තරගයේදී ඩෙන්මාර්කයේ කිම් බෘන් ලකුණු 7-21, 23-21ක් සහ 21-5ක් ලෙස පරාජය කිරීමට නිලූක සමත් විය.

මීට පෙර 2012 ලන්ඩන් සහ 2016 රියෝ ඔලිම්පික් උලෙළ නියෝජනය කළ නිලූක පසුගියදා දේශීය ක්‍රීඩාවෙන් සමුගත්තේ වසර 17ක් ජාතික ශූරතාව දිනා ගැනීමෙන් පසුවය.

ගෝමති මාරිමුත්තු

ඉන්දීය ක්‍රීඩිකාවගේ බොරුව නහවුරු වෙයි

ගයන්තිකාට ලෝකඩ පදක්කම නැපෑලෙන්ම එයි

ප්‍රින්ස් ගුණසේකර

ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ ලෝකඩ පදක්කම ශ්‍රී ලංකාවේ මැදි දුර ධාවන ශූරී ගයන්තිකා අබේරත්නට හිමි වෙයි. එම ශූරතාවලියේ රන් පදක්කම්ලාභී ඉන්දියාවේ ගෝමති මාරිමුත්තු තහනම් උත්තේජක ගත් බවට නැගුණු චෝදනාව මත නියම වූ ක්‍රීඩා තහනමට එරෙහිව ඇය විසින් ඉදිරිපත් කළ අභියාචනය ක්‍රීඩාව සම්බන්ධ බේරුම්කාර අධිකරණය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ගයන්තිකාට මේ වාසනාව හිමිව ඇත.

මීටර 800 අවසන් තරගයේදී ගයන්තිකා සිව්වැනි ස්ථානයට පත්වූ අතර, දැන් ඇය ආසියානු මලල ක්‍රීඩා සංගමයෙන් ලෝකඩ පදක්කම බලාපොරොත්තුවෙන් සිටී. නවතම තත්ත්වය අනුව රිදී පදක්කම දිනා සිටි චීනයේ චූන්යාට රන් පදක්කම හිමිවන අතර, ලෝකඩ පදක්කම දිනාගත් කසකස්තානයේ මගරිටා මුකස්හේවාට රිදී පදක්කම හිමි වේ.

කටාරයේ කලීෆා අන්තර්ජාතික ක්‍රීඩා සංකීර්ණයේ 2019දී පැවැති ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ මීටර 800 ඉසවුව ජයගත් ඉන්දියාවේ ගෝමතිට පිරිනැමුණු රන් පදක්කම ආසියානු මලල ක්‍රීඩා සංගමය විසින් අහිමි කළ අතර, සිවු අවුරුදු තහනමක් ලෝක මලල ක්‍රීඩා විනය විනිශ්චය සභාව විසින් පසුගිය වසරේ මැයි 26 නියම කළේය. එම තීන්දුව අභියෝගයට ලක් කරමින් ඇය ක්‍රීඩාව සම්බන්ධ බේරුම්කාර අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළාය.

කෙසේ වෙතත්, ලූසෑන්හි පිහිටි ක්‍රීඩාව සම්බන්ධ බේරුම්කාර අධිකරණයේ කටයුතු කරන බහරේනයේ මහාචාර්ය ජෑන් පෝල්සන් මහතා තීන්දු කළේ ගෝමති තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් වැරදිකරුවකු වන අතර, පළමු නඩු විභාග මණ්ඩලයේ නියෝගය පරිදි 2019 මැයි 17 සිට 2023 මැයි 16 දක්වා සිවු අවුරුදු තහනමට ලක්වීම අනිවාර්ය බවයි.

2019 ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියට පෙර ගෝමති සම්බන්ධයන් සිදු කළ තහනම් උත්තේජක පරීක්ෂණ 3ක් අසමත් වී තිබූ අතර, ඒ සියල්ල ඉන්දියාවේ පැවැති තරගවලදී වීම විශේෂත්වයකි.

ඇයගේ අභියාචනයේදී, කියා තිබුණේ, ඇය ඩිම්බකෝෂ සම්බන්ධ රෝගයකින් පීඩා විඳි බවත්, එය 2019 ජනවාරි මාසයේදී 'ස්වයංසිද්ධ' ගබ්සාවක් සමඟ ඒකාබද්ධ වී එවකට අනාවරණය නොවූ ගැබ් ගැනීමක් නිසා අසාමාන්‍ය ලෙස නොරොන්ඩ්‍රොස්ටෙරෝන් තහනම් උත්තේජ සංඝටකයක් නිර්මාණය වන්නට හැකි බවය. එබැවින් තහනම් උත්තේජක පරීක්ෂණයේදී නුසුදුසු හා පිළිගත නොහැකි ප්‍රතිඵලයක් ලැබී ඇති බවට ඇය තර්ක කොට තිබිණි. නමුත් ඇයගේ මේ සියලු මතභේද ක්‍රීඩාව සම්බන්ධ බේරුම්කාර මණ්ඩලය විසින් බැහැර කර ඇත.

කල්කටා පිලේ තවත් දෙදෙනකුට කොරෝනා

අයිපීඑල් තරගාවලිය නියෝජනය කළ කල්කටා නයිට්රයිඩර්ස් කණ්ඩායමේ තවත් ක්‍රීඩකයන් දෙදෙනකුට කොරෝනා ආසාදනය වී ඇත. නවසීලන්ත පිලේ කඩුලු රකින පිතිකරු ටිම් සේෆර්ට් ද ඒ අතර වේ.

මීට පෙර එම කණ්ඩායමේ වරුන් චක්‍රවර්තිට සහ සන්දීප් වොරියර්ට තරගාවලිය අතරතුර කොරෝනා වැලඳී තිබූ අතර, ප්‍රසිද් ක්‍රිෂ්ණා සහ ටිම් සේෆර්ට් ආසාදිතයන් බව තහවුරු වූයේ කොරෝනා වයිරසය අයිපීඑල් ජෛව ආරක්ෂක බුබුළු වළල්ලට කඩා වැදීම හේතුවෙන් තරගාවලිය අත්හිටුවීමෙන් පසුවය.

අයිපීඑල් තරගාවලිය අත්හිටුවීමෙන් පසු ඊට සහභාගි වූ නවසීලන්ත ක්‍රීඩකයන්, කාර්ය මණ්ඩලය සහ විස්තර විචාරකයන් රැගෙන යෑමට විශේෂ ගුවන් යානයක් යොදවා තිබූ අතර, අවසන් මොහොතේ සිදු කළ පීසීආර් පරීක්ෂණයෙන් සේෆර්ට් ආසාදිතයකු බවට තහවුරු විය.

ඔහු දැනට අහමදාබාද් නුවර ස්වයං නිරෝධායනයේ යෙදී සිටින අතර, ඉදිරියේදී වැඩි දුර ප්‍රතිකාර සඳහා චෙන්නායි නුවර පෞද්ගලික රෝහලකට ඇතුළත් වීමට නියමිතය.

ලිංග විපර්යාසයට ලක් වූ ක්‍රීඩිකාව ඔලිම්පික් යයි

ලිංගික විපර්යාසයකට භාජනය වූ නවසීලන්තයේ බර එසැවීමේ ක්‍රීඩිකාව ලොරේල් හබාඩ් ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලැබීමට සමත් වූවාය. ඒ සමඟම ඇය ඔලිම්පික් උලෙළ නියෝජනය කරන ලිංගික විපර්යාසයකට ලක්වූ පළමු වන පුද්ගලයා ලෙස වාර්තා පොතට එක් වූවාය.

මෙවර ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ දී කාන්තා සුපිරි හෙවිවේට් තරග අංශයෙන් ක්‍රීඩා කිරීමට නියමිත 43 හැවිරිදි ලොරේල් වසර 1978දී පිරිමියකු ලෙස උපත ලැබුවේ ගැවින් නමිනි. අනතුරුව බර එසැවීමේ ක්‍රීඩාවට යොමු වී කනිෂ්ඨ තරග අංශයෙන් වාර්තාවක් ද තැබූ ගැවින් පෞද්ගලික හේතු මත ක්‍රීඩාවෙන් ඉවත් විය.

වසර 35ක්ම පිරිමියකු ලෙස ජීවත් වූ ගැවින් 2017 දී කැලිෆෝනියාවේ දී ලෝක ශූරතා බර එසැවීමේ රිදී පදක්කම් දෙකක් දිනා ගනිමින් යළි ක්‍රීඩාවට එක් වූයේ කාන්තාවක ලෙසිනි. ඇය මීට පෙර අන්තර්ජාතික මට්ටමේ රන්, රිදී සහ ලෝකඩ පදක්කම් රැසක් දිනා ගැනීමට සමත් වූවාය.

අංක එකේ ක්‍රීඩිකාව සබලෙන්කාට පරදී

ස්පාඤ්ඤයේ පැවැත්වෙන මැඩ්රිඩ් විවෘත ටෙනිස් තරගාවලියේ කාන්තා කේවල ශූරතාව දිනා ගැනීමට 23 හැවිරිදි බෙලරුස් ක්‍රීඩිකා ආර්යානා සබලෙන්කා සමත් වූවාය. ඇය හමුවේ අවසන් මහා තරගයේදී ලොව අංක එකේ ටෙනිස් ක්‍රීඩිකා ඔස්ට්‍රේලියාවේ ඇෂ්ලෙයි බාර්ටි වට 2-1කින් පරාජයට පත් වූවාය. සබලෙන්කා දිනාගත් 10 වැනි ඩබ්ලිව්ටීඒ ශූරතාව මෙයයි.

ඉතා තියුණු මුහුණුවරක් ගත් මේ තරගයේ පළමු වටය 6-0ක් ලෙස ජය ගැනීමට සබලෙන්කා සමත් වූ අතර, දෙවැනි වට 6-3ක් ලෙස ජය ගත්තේ බාර්ටිය. එහෙත් තෙවැනි වටයේදී යළි ක්‍රියාත්මක වූ සබලෙන්කා 6-4ක් ලෙස ජය ගනිමින් මැඩ්රිඩ් කිරුළ තමා සතු කර ගැනීමට සමත් වූවාය.

මින් සති දෙකකට පෙර ජර්මනියේ පැවැති ස්ටුට්ගාර්ට් තරගාවලියේ අවසන් තරගයේදී බාර්ටි හමුවේ සබලෙන්කා පරාජයට පත්ව තිබිණි. මාංශ පේශි ආබාධයක් හේතුවෙන් එම තරගාවලියෙන් ඉවත් වූ සබලෙන්කා මේ තරගයෙන් අනතුරුව පැවසුවේ "ස්ටුට්ගාර්ට් අවසන් තරගයෙන් පසු මට තුවාල සිදු වුණා. එහා මෙහා යෑමට පවා නොහැකි වුණා. එම තත්ත්වයෙන් මිදීමට මට අවශ්‍ය වූ අතර, එය සිදු වුණේ කොහොමද කියලා මම දන්නේ නැහ. ඒත් සුවවීම ඇත්තෙන්ම හොඳයි. මම දැන් මේ තරගාවලියේ ශූරියයි" මේ ජය සමඟින් ඇය ලෝක ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල සිවුවැනි ස්ථානය දක්වා ඉහළ යනු ඇත.

මේ අතර, ලොව අංක එකේ ටෙනිස් ක්‍රීඩක ස්පාඤ්ඤයේ රෆායෙල් නඩාල් මේ තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයෙන් ඉවතට විසිවීම කැපී පෙනුණි. එම වටයේදී නඩාල් ජර්මනියේ ඇලෙක්සෙන්ඩර් ස්වෙරෙව් හමුවේ වට 2-0කින් (6-4 ස හ 6-4) ක් ලෙස පරාජයට පත් විය. ස්වෙරෙව්ට ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව හිමිව ඇත්තේ 5 වැනි ස්ථානයයි. අවසන් පූර්ව වටයේදී ඩොමිනික් තීම් පරාජය කළ ඔහු ඊයේ රාත්‍රියේ ඉතාලියේ මැටියෝ බෙරෙටිනි සමඟින් අවසන් තරගයට එක්වීමට නියමිතව තිබිණි.

අර්යානා සබලෙන්කා

විලියම්සන්ලාත් මාලදිවයිනට පනී

නවසීලන්ත ක්‍රිකට් කණ්ඩායමෙන් මෙවර අයිපීඑල් තරගාවලියට එක් වූ ක්‍රීඩකයන් කිහිපදෙනකු යළි සිය රට බලා යෑමට කටයුතු කරද්දී නවසීලන්ත ක්‍රිකට් ආයතනය නිවේදනය කළේ නායක කේන් විලියම්සන් ඇතුළු පිරිසක් දිල්ලි නුවර ජෛව ආරක්ෂිත බුබුළක රැඳී සිටින බවයි.

කෙසේ වෙතත් මේ වන විට විලියම්සන් සමඟ ක්සිල් ජමිසන් සහ මිචෙල් සැන්ටනර් සහ භෞත චිකිත්සකවරයා ලෙස කටයුතු කරන ටොම් සිම්සෙක් මාලදිවයින වෙත පිටත්ව ගොස් ඇතැයි වාර්තා වේ.

අයිපීඑල් තරගාවලියට එක් වූ නවසීලන්ත ක්‍රීඩකයන් පිළිබඳ එරට ක්‍රිකට් ආයතනය අනුගමනය කරන ක්‍රියා පිළිවෙත කුතුහලයක් ඇති කරන්නක් බවත්, අයිපීඑල් තරගාවලිය එක් වූ ක්‍රීඩකයන් මේ වන විට සිටින්නේ කොහේදැයි එරට ක්‍රිකට් ආයතනය හරිහැටි දන්නේ නැත්දැයි යන්න ගැටලුවක් බවත් ක්‍රිකට් ප්‍රවීණයෝ පවසා තිබේ.

විලියම්සන් ඇතුළු පිරිස දිල්ලියේ සිට මේ 11 වැනිදා එංගලන්තය බලා පිටත්ව යන බව නවසීලන්ත ක්‍රිකට් ආයතනය පසුගිය සතියේ නිවේදනය කර තිබිණි.

කෙසේ වෙතත්, එම සිව්දෙනාට ලබන 16 වැනිදා දක්වා ඉන්දියාවේ රැඳී සිටීමට සිදු වන බවට දැනුම් දීමත්, දිල්ලියේ රැඳී සිටීම අනාරක්ෂිත බවට හැඟී යෑමත් හේතුවෙන් ඔවුන් චෙන්නායි සුපර් කිංග්ස් කණ්ඩායමට සම්බන්ධ ඔස්ට්‍රේලියානු ක්‍රීඩකයන් සමඟ මාලදිවයින වෙත ගොස් තිබෙන බව වාර්තා වන අතර, මේ මේ සම්බන්ධයෙන් නවසීලන්ත ක්‍රිකට් ආයතනය නිසි පැහැදිලි කිරීමක් සිදු කර නැත.

Safty

විද්‍යා ප්‍රබන්ධය

ඔසිමැන්ඩියස්

මම බිම ඉඳගෙන සිතිවිලිමය මලපුඩුවක සිර වී දොඹ ගස්වලට පෑම්මෙන වවුලන්ගේ හඬත් ඔවුන්ගේ කලබලය හේතුවෙන් පහළ මුකලානට වැටෙන දොඹ මල් සරසරයත් අසා සිටියෙමි. ඉහළ තුරු වියනේ හිඳැස් අතුරින් තාරකා ගොන්නක් දැල්වෙයි.

නවත් ජීවීන් සහිත ග්‍රහලෝක කොතරම් නම් ඒ තරු අතර ඇති ද? මම කල්පනා කළෙමි.

"මචං, අපට ජේන, ගණන් කරන්න බැරි තරම් තාරුකා මැද කොච්චර ග්‍රහලෝක ඇති ද? ඒවායින් කිපයක් හරි තියෙන්න ඕනෑ බොහොම සුද්ධිමත් ජීවීන් ඉන්න ග්‍රහලෝක; බොහොම සාමකාමී ලෝක, මේ වගේ ග්‍රහලෝකයක් තරම් විශාල හිරගෙයක් හදල ඒක නඩත්තු කරන්න හදන්නේ නැති තැන්."

පිළිතුරක් නොදී ඉවත බලාගෙන උන් විරාන් අවසානයේ මා සමීපයට පැමිණි, මගේ පසෙකින් පොළොව මත ඉඳගත්තේ ය.

"අපට නිරීක්ෂණය කරන්න පුළුවන් විශ්වයේ ප්‍රමාණය ආලෝක වර්ෂ බිලියන අනුවක් විතර. මේ ඇතුළේ අඩුම ගානේ බිලියන සියයට වඩා චන්ද්‍රාවාට තියෙනවා, එක චන්ද්‍රාවාටයක බිලියන පන්සීයක් විතර තාරකා තියනවා, මේ තාරකා මණ්ඩලවල කොච්චර ග්‍රහලෝක ඇත් ද? ඒවායේ ජීවීන් ඉන්න ග්‍රහලෝක කීයක් තියෙන්න පුළුවන් ද? ඒත් ඇයි තවමත් අපට කිසිම පිටසක්වළයෙක් හම්බ නොවුණේ?"

"ඔව්, ෆර්මි පැරඩොක්ස් එක නේද මේ?" මම ඇසීමි.

"හරියටම හරි මචං. දැන් ඒකට අපට අලුත් උත්තරයක් තියනව. කිසිම ග්‍රහලෝකෙක අසීමිත සම්පත් නෑ. ඉතින් සීමිත සම්පත් බෙදාගන්න පිටසක්වළයන්ටත් මුදල් තියන සම්මතය හොයාගන්න වෙනවා. මුදල් සංකල්පය හොයාගත්තට පස්සේ ඉක්මනින් හරි පරක්කු වෙලා හරි පෘථිවියේ වගේම ඒ තැන්වලත් මූල්‍ය පද්ධතියක් නිර්මාණය වෙනවාමයි. ඒකෙ හැඩේ වෙනස් වෙයි, ඒත් මූලික සංකල්පය එකමයි. ඉතින් පිටසක්වලයන්ටත් අන්න ඒ මූල්‍ය පද්ධතියෙන් නිර්මාණය කරන අලුත් සොබාදහමේ නීතිවලට අනුව ජීවත් වෙන්න බල කෙරෙනවා, එතන ඉඳල මෙටපැටර්න්වලට තියෙන්නේ කෙස් ගහක දුර."

මම පුදුමයෙන් විරාන් දෙස බැලුවෙමි. හෙතෙම පස්වන්තාපය හඟවන ආකරයේ ශබ්දයක් පිට කොට ඇත අඳුර දෙස නෙත් යොමා ගත් වනම සිටියේය.

"හරි වෙලාවෙ අපි කාටවත් මෙටපැටර්න්වලින් කැඩෙන්න බැරි වුණොත් ඕනෑම ශිෂ්ටාචාරයක් ඊළඟ අදියරට යන්න කලින් තමන්ගෙ සම්පත් ඔක්කොම ඉවර කරල දාල අන්තිමට වද වෙලා යනව, තාරුකා කාන්තාර මැද තටබුන් වූ ඔසිමැන්ඩියස් පිළිම විතරක් ඉතුරු කරල සැහටම නිවිල යනව..! බුද්ධිමත් ජීවීන් ඉන්න ඕනම ග්‍රහලෝකයක පොදු ඉරණම මේක!" විරාන් පැවසීය.

"ඔසිමැන්ඩියස්" මම මටම මුමුණා ගතිමි. අප කුඩා කල පාසල් පෙළ පොතක තිබූ කවිය මගේ සිහියට නැඟිණි. වාලුකා කතරක් මැද නටබුන් ඉතිරි කොට මැකී ගිය, රජුන් ගේ රජුන් තැනූ මහා ශිෂ්ටාචාරයක්. මෙවේලේ විරාන් ඒ පැදියට විශ්වීය අරුතක් සපයමින් එය මතකයට නංවයි.

අපි සෑහෙන වේලාවක් බිම ඉඳගෙන අහස දෙස නෙත් යොමා සිටියෙමු.

"මචං, ගණකවල වයිබ්‍රේෂන් එක නැවතිලා දැන් ගොඩක් වෙලා. අපි යන්න ඕනෑ..." අවසානයේ විරාන් පැවසීය.

කිසිත් නොකී මම නැඟී සිටියෙමි; දෙපා හිරි වැටී තිබූ බැවින් වෙරිකාරයකු ලෙස දෙපා අද්දවමින් කැබ් රිය වෙත ගියෙමි.

කැබ් රියට ඇතුළු වීමට මොහොතකට කලින් මගේ දුරකතනය නාද වීමට පටන් ගත්තේය.

ඒ නොදන්නා නොම්මරයකි. මේ අවේලාවේ කතා කරන්නේ කවුදැයි සිතමින් මම ඇමතුම ගත්තෙමි.

"ලෙක්චරර් නෝට් එකක් ගැන අහගන්න ඕනෑ, පුළුවන් ද දැන්?" මඳක් ගැඹුරු කාන්තා කටහඬක් මගෙන් විමසීය. මම පුදුම වුණෙමි. ඒ සංඥාවකි. එහි හේරුම කිසිවකුට නෑසෙන ලෙස කතා කළ හැකිද යන්නය. සංඥාව මෙන්ම කටහඬ ද අතීතයට අයිති ඒවා විය. කටහඬේ අධිකාරිය නන්දිනාය. ජංගම දුරකතන සුලබ නොවූ අතීතයක පෙම්වතුන්ව සිටි අප නිවෙසේ වූ ස්ථාවර දුරකතනයෙන් පෙම්බස් දෙඩීමට හැකි දැයි දැන ගැනීම උදෙසා අපි මෙවන් ප්‍රශ්න භාවිත කළෙමු.

"ඔව්, පුළුවන්."

"කිසිම වෙනසක් පෙන්නන්න එපා. අපට කතා කරන්න තියෙනවා..." නන්දිනා පැවසුවාය. දැනටමත් රියැදුරු අසුනේ හිඳගෙන සිටි විරාන්ට අතින් සංඥාවක් දුන් මම කැබ් රිය වෙතින් ඉවතට ගියෙමි.

"මමත් රංජන් කියල කතා කරන්නද?" නන්දිනා සිනා සෙමින් ඇසුවාය. එහි නිසැක හේරුම නන්දිනා බොහෝ දේ දන්නා බවය. එයට කෙසේ පිළිතුරු දුන්නා දැයි මතකයේ නැතත් නන්දිනා ද දිගටම රංජන් නමින් මා ඇමතුවාය.

"මේ අහන්න, ඔක්කොම පැහැදිලි කරන්න වෙලාවක් නෑ, දැන් ඔයා ඉන්නෙ කාත් එක්කද?"

"යාළුවෙක් එක්ක. ඇයි ඔයා අහන්නෙ?" නන්දිනා විරාන් දැනී, එබැවින් මම හිතාමතාම විරාන්ගේ නම හෙළි කිරීමෙන් වැළකීමට උත්සාහ ගතිමි.

"කපුරු වුණත් එයාගෙන් අයින් වෙන්න දැන්ම. ඔයා ඉන්නෙ ලොකු අනතුරක, ඒ වගේම මුළාවක."

"එහෙම කොහොම ද කරන්නෙ නන්දිනා? ඔයා හරියටම කියන්නෙ මොනව ද කියලවත් මට තේරෙන්නෙ නෑ!" මම පැවසීමි.

ඇය දිගින් දිගටම ඉල්ලා සිටියේත් අවසානයේ එසේ නොහැකි වූ තැන බැගෑපත් වූයේත් මේ සියල්ල අතහැර ආපසු යන ලෙසයි.

එයට එකඟ නොවූ මම නැවත ඇයට අමතන පොරොන්දුව පිට දුරකතනය විසන්ධි කළෙමි.

මේ කිසිවක් විරාන්ට නොකීමට පරිස්සම් වූ මම ඇමතුම බිරියගෙන් බැව් පැවසීමි.

අප දෙදෙනාම නිශ්ශබ්දව ගමන් කළ අතර විරාන් අසාමාන්‍ය කලබලයකින් සිටින බැව් මට දැඟිණි. හෙතෙම නිතරම කැබ්රියේ පැති කන්නාඩිවලින් පසුපස බැලුවේය; එහෙත් කිසිවක් නොපැවසීය.

පීඩාකාරී නිහඬ බව පලවා හරිමින් මම හඬ අවදි කළෙමි: "විරාන්, සංකීර්ණ ගණිතය කොහොම ද මෙටාපැටර්න් එකට බාධා වෙන එක ඩිටෙක්ට් කරන්නෙ?"

එහි දුර්ග ක්‍රියාකාරිත්වය ඔහු නොදන්නා බව ඒ මොහොතේ පැවසුවත් මම දැන් ඒ ගැන සැක කරමි.

කෙසේ වෙතත් ඒ වෙනුවට ඉතා සරල පැහැදිලි කිරීමක් ඔහුගෙන් ලැබිණි. මෙටාපැටර්න්වලට අනුව යම් මොහොතක කිසියම් ස්ථානයක අන්තර් සබඳතා පැවැත්විය හැකි මිනිසුන් ඇතුළු සියලු වස්තූන්ගේ හෝ වඩා සරලව කියන්නේ නම් සිදු විය හැකි සිදුවීම් ගණනේ උපරිම සහ අවම අගයක් තිබිණි. ඉතින් යම් හෙයකින් එම අගයට වඩා වැඩි හෝ අඩු වන දේවල් සිදු වන්නේ නම් සංකීර්ණ ගණිතය එය හසු කර ගැනීමට සමත් විය. ඒ ප්‍රධාන ලෙසම අවට ඇති සියලු වස්තූන්ගෙන් පිට වූ ශබ්ද තරංග ග්‍රහණය කර ගැනීමෙනි. මෝටර් රථ එන්ජිමක ශබ්දයේ සිට මිනිස් හඳවතක 'ලබ් ඩබ්' නාදය දක්වා පරාසයක ශබ්ද ග්‍රහණය කොට ගත හැකි තරම් සියුම්ව සංකීර්ණ ගණිතය තනා තිබිණි.

කෙටි කතාබහකින් අතුරුව නවතත් අප නිශ්ශබ්දව ගමන් කළ අතර, ඒ අලුයමේ තවත් මොහොතකින් මගේ සහ විරාන්ගේ අනාගත ඉරණම් තීරණය වීමට නියමිත බව මම නොදැන සිටියෙමි.

මා ඔහුගෙන් ඇසූ ප්‍රශ්නයක් සහ එයට ලැබුණු පුදුම සහගත පිළිතුර විරාන් සහ මා අතර ඇති වුණු අවසාන සංවාදය විය.

"මචං උඹ කොහොම ද මේ සංවිධානයට එකතු වුණේ? කොහොම ද උඹ මේක ගැන දැන ගත්තේ?" මම ඇසීමි.

"මම සංවිධානය ගැන දැනගත්තේ නෑ මචං, සංවිධානය මාව හොයාගෙන ආව," විරාන් පැවසීය.

"ආහ් එහෙමද! ඇයි උඹව විශේෂයෙන් එහෙම හොයාගෙන ආවෙ?" මම ඇසීමි.

"මම උඹේ යාළුවෙක් නිසා..." හෙතෙම උරහිස් හකුළුවමින් සැහැල්ලු ස්වරයකින් පැවසීය.

"මොකක්!?" මම අදහාගත නොහැකිව විරාන් දෙස බැලුවෙමි. එහෙත් එයට විරාන් දුන් පිළිතුර මා අපේක්ෂා කළ විස්තරාත්මක එක නොවේ.

"ඒක වැදගත් නෑ..." හේ කෙටියෙන් කියාදැමිය.

ඒ සංවාදය එතැනින් ඔබ්බට ගෙනයෑමට නොහැකි වූයේ එක්වරම අපේ සංකීර්ණ ගණක කම්පනය වීමට ගත් බැවිනි. එය මීට පෙර නොදැනුණු අන්දමේ ප්‍රබල කම්පනයකි. මට ආසන පටි පැලඳගන්නා ලෙස උපදෙස් දුන් විරාන් කැබ් රිය වේගයෙන් ධාවනය කරන්න විය. එහෙත් වැඩි දුර යෑමට පෙර අප පසුපසින් ඇත තුරු වියනට ඉහළින් නිල් සහ රන්වන් පැහැ එළි දිස් විය. ඒවා විසින් අප ලුහුබඳිමින් තිබිණි. විරාන් කැබ් රියේ වේගය තවත් වැඩි කළේය. එහෙත් එක්වරම මගේ වම් පසින් පෙනුණු දීප්තිමත් සුදු ආලෝකයක් සමඟ මහා ශබ්දයක් ඇසුණු අතර දැඩි ගාරිරික වේදනාවක් මැද සියල්ල අන්ධකාරයෙන් වැසී ගියේය.

මතු සම්බන්ධයි

▶ රංගන ප්‍රභාද් ආරියදාස

වර්ෂ 2021ක් වූ මැයි මස 10 වැනිදා සඳුදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් පුවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

කවරයේ ග්‍රාෆික සිතුවම - තිසන් නයනක

දිනමිණ ද්වාර LOADING

වසංගතයට නව නිපැයුම්වලින් පිළිතුරු දෙන රුසිරු ප්‍රභාමත්

එකිනෙකා ගැටෙමින් සමීපව සිටි අපට මේ වන විට මීටරයක් දුරින් සිට සියලු සබඳකම් පවත්වන්න සිදුව තිබේ. ඒ කොරෝනා වසංගතය හේතුවෙනි. නන්නාඳුනන වයිරසයක් හිටි හැටියේම ලොවට කඩාපාත් වූයේ ලොව පුරා සියලු සෞඛ්‍ය අංශ අන්දමන්ද කරවමිනි. කොරෝනා වයිරසයෙන් ගැලවීමට ක්ෂණික පියවර කිසිවක් නොවුණු තැන වහ වහා ලොව පුරා වෛද්‍ය අංශ ඒ පිළිබඳ පර්යේෂණවල නියැළෙන්න වූහ. ක්ෂණික පියවර ලෙස ඔවුන් ඉදිරිපත් කළේ වයිරසය ශරීරගත වීම වළක්වා ගැනීමට කටයුතු කිරීම මෙම වයිරසයෙන් ගැලවීමට ඇති මූලිකම ක්‍රියාමාර්ගය බවයි. ඒ අනුව වහ වහා සෞඛ්‍ය මාර්ගෝපදේශ එළිදැක්විණි. එහිදී ප්‍රධාන වශයෙන් ඉදිරිපත් වූයේ අවමව මීටරයක් දුරින් සිට ශ්වසන මාර්ගය ඔස්සේ වයිරසය ශරීරගත වීම වළක්වා ගැනීමයි. එසේම නිවෙසින් පිටතට යන සෑම අවස්ථාවකදීම පිරිසුදුකාරක යොදා දෑත් පිරිසුදු කර ගැනීමට ද නියම කෙරිණි. වෙනදා නොවූ ගැටලුවක් පැමිණියේ මේ අවස්ථාවේය. එනම්: සෑම රාජකාරි ආයතනයකම, වෙළෙඳ හා සේවා ආයතනයකම අත් සෝදා ගැනීමට ජල පහසුකම් සැපයීමට සිදු වීමය. සාමාන්‍යයෙන් භාවිත කරන ජල කරාම මේ සඳහා සුදුසු නොවුණේ සෑම කෙනකුටම අතින් ක්‍රියාත්මක කර ජලය ගැනීමට සිදු වීම නිසා අතිනත තැබර වයිරසය පැතිර යෑමට එයම මහත් රුකුලක් විය හැකි බැවිනි.

ජල කරාම ගැටලුව

මේ ගැටලුකාරී අවස්ථාවේ සහායට පැමිණියේ නව නිර්මාණකරුවන්ය. ජල කරාම ගැටලුවට පමණක් නොව, කොරෝනා වසංගත අභියෝගය ජය ගැනීමට අවැසි බොහෝ සහාය නව නිර්මාණ ලෙස වහ වහා බිහි වන්න විය. බොහෝ ස්ථානවල අත් සේදීම සඳහා පාදයෙන් ක්‍රියා කරවිය හැකි ජල කරාම ඉදි විණි. ඒ ක්‍රමය එතරම් සාර්ථක නොවුණේ විවිධාකාර ගැටලු හේතුවෙනි. නිසි පරිදි ජලය නොලැබීම, පාගන පැඩලයේ ආයු කාලය අඩු වීම වැනි කාරණා මේ ක්‍රමයේ අසාර්ථක ලක්ෂණ විණි. එමෙන්ම මෙහිදී ද යම් ස්පර්ශයක් සිදු වන නිසා එමගින් කොරෝනා වයිරසය පැතිරීමේ අවදානමක් ශේෂ විය. එසේම ජල කරාමයට දෑත සමීප කළ විට ජලය ගත හැකි, ස්පර්ශයක් රහිත ජල කරාම පැවතිය ද ඒවා විශාල ප්‍රමාණයක් එක් ආයතනයක සවි කිරීම ප්‍රායෝගික ගැටලුවක් විණි. මේ සියලු ගැටලු දෙස විමර්ශනශීලීව අවධානය යොමු කළ, නව නිර්මාණ කිහිපයක්ම බිහි කළ පාසල් සිසුවකු සිය සිතේ පැලපදියම් වූ අදහසක් ක්‍රියාත්මක කරමින් සිටියේය. ඔහුගේ ඉලක්කය වූයේ වයිරසය පැතිර යන සමයේ විවිධ තැන්වලට යන පිරිසගේ දෑත් පිරිසුදු කර ගැනීමේ අවශ්‍යතා කිහිපයක් එකවර කර ගත හැකි ස්පර්ශයක් රහිත (Contactless) දෑත් පිරිසුදු කර ගැනීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමයි.

අත් පිරිසුදු කරන දියර නිකුත්කරණය (Hand SanitizerDispenser), ජල කරාමය (Water Tap), සේදුම් දියර නිකුත්කරණය (Hand Wash Dispenser), දෑත් වේළා ගැනීමේ උපකරණය (Hand Dryer) යන පහසුකම් එකම පද්ධතියක් මගින් සැපයීම ඔහුගේ අභිලාෂය විය.

ස්පර්ශයක් රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය

ගාල්ල හපුගල මහා විද්‍යාලයේ 09 ශ්‍රේණියේ සිසුවකු වන රුසිරු ප්‍රභාමත් එදිරිසූරිය සිය ඉලක්කය සාක්ෂාත් කර ගත්තේ ස්පර්ශය රහිත ජල කරාම 15ක් සහ අත් පිරිසුදු කර ගැනීමට අවශ්‍ය සෙසු පහසුකම් සපයන උපකරණ ද පාලනය කළ හැකි පාලක පද්ධතියක් (Fully Automated Contactless Hand Washing Unit) නව නිර්මාණයක් ලෙස එළි දක්වමිනි.

"ස්පර්ශය රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය (Fully Automated Contactless Hand Washing Unit) මම නිර්මාණය කළේ ඒ සඳහා පහසුකම් කිහිපයක් එක් කරමින්, අත් සේදුම් සබන් දියර නිකුත්කරණය සහ ජල කරාමය මෙහි මූලික අංග ලෙස සකසනු ලැබුවා. ඊට අමතරව අවශ්‍ය නම් විෂබීජහරණ දියර නිකුත්කරණය, දෑත් වේළනය ඇතුළු උපකරණත් පද්ධතියට එක් කළ හැකියි. අවශ්‍යතාව අනුව තවත් උපකරණ මෙයට සම්බන්ධ කරන්න පුළුවන්. මා සකස් කළ පද්ධතියට එකවර උපකරණ කිහිපයක් (ජල කරාම, අත් සේදුම් සබන් දියර නිකුත් කරනය, අත් විෂබීජහරණය කිරීමේ දියර නිකුත්කරණය සහ අත් වේළනය) පාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව තියෙනවා. වර්තමානයේ භාවිත වෙමින් තියෙන ස්පර්ශ රහිත ජල කරාම සහ අත් වේළන එකිනෙකට හෝ එකම පාලක පද්ධතියකට සම්බන්ධ නොමැතිව වෙන වෙනම සේවා සපයන ඒවායි. එහෙත් මා නිර්මාණය කළ පද්ධතියේ දී ආයතනයක තිබෙන සියලු ජල කරාම, අත් සේදුම් සබන් දියර නිකුත්කරණ, විෂබීජහරණ දියර නිකුත්කරණ සහ අත්වේළන එකිනෙකට සම්බන්ධවයි ක්‍රියාත්මක වන්නේ. සාමුදායික ස්පර්ශ රහිත ජල කරාම සඳහා භාවිත කරන තාක්ෂණයෙන් ඔබිබට ගොස් මා මේ සඳහා මයික්‍රො කන්ට්‍රෝලර්ස් (Micro Controllers) භාවිත කළා. ඒ නිසා මෙම පාලක පද්ධතියක් කුඩා පද්ධතියක් ලෙස නිර්මාණය කිරීමට මට හැකි වුණා. එසේම මේ පද්ධතිය මගින් එක් ස්ථානයක ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කළ හැකි බැවින් ද, මෙවැනි ක්‍රියාකාරකම් එකම වේලාවක ස්ථාන කිහිපයකම සිදු කළ හැකි බැවින් ද, ඒ ක්‍රියාකාරකම් මනාව කළමනාකරණය කරගනිමින් උපකරණය එකිනෙක අතර සංඥා (signal) හුවමාරු වීම නිසා ඇති විය හැකි දෝෂ මඟහරවා ගනිමින් ඉතා කාර්යක්ෂමව මහජනතාවට සේවා සැපයීමට මේ පද්ධතියට මනා හැකියාවක් තියෙනවා.

රුසිරු ප්‍රභාමත් එදිරිසූරිය

ඒ වගේම මේ පද්ධතියට ස්පර්ශයක් රහිත ජල කරාම 15ක් එකම ආයතනයක ස්ථාන කිහිපයකදී එකවර ක්‍රියාත්මක කිරීමේ හැකියාව තියෙනවා. කොරෝනා වැනි භයානක වසංගතයක් පවතින සමයක කුඩා සහ මහා පරිමාණ ආයතනයන්ට මෙවැනි පද්ධතියක් සවි කර ගැනීම මඟින් අඩාළවීමක් පහසුකම් කිහිපයක්ම එකවර සැපයීමට හැකි වනවා පමණක් නොව, වියදමද අඩු කර ගැනීමට හැකි වනවා. මොකද: මේ පද්ධතිය ස්පර්ශයක් රහිතව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන නිසා ජලය, අත් සේදුම් දියර, අත් පිරිසුදු කරන දියර ඉතිරි කර ගැනීමට හැකි වනවා. එපමණක් නොව, මේ පද්ධතිය ක්‍රියාත්මක වෙන්නේ වෝල්ට් 12 සරල ධාරා සැපයුමකින් නිසා විදුලිය පරිභෝජනයත් ඉතා අඩුයි. ඊට අමතරව මේ පද්ධතිය සූර්ය ශක්තියෙන් වුවත් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඉහත හැම වාසියක්ම මේ පද්ධතියට ලැබී තියෙන්නේ මෙය මයික්‍රො කන්ට්‍රෝලර් පදනම් කරගෙන නිර්මාණය කර ඇති නිසායි. මගේ මේ පද්ධතිය මේ වන විටත් මාතර යුනිවර්සිටි කොලේජ්ජේ (University College of Matara) ප්‍රායෝගිකව භාවිත කෙරෙනවා. ඊට අමතරව කරාපිටිය ශික්ෂණ රෝහලේ දන්ත ශල්‍ය ඒකකය සඳහාත් මෙම පද්ධතියක් සවි කිරීමට කටයුතු කරගෙන යනවා. ඒ වගේම මෙම පද්ධතිය අවශ්‍ය ආයතනයකට දීමටත් මම කැමැතියි," යැයි මේ සුවිශේෂ නව නිර්මාණය සිදු කළ රුසිරු ප්‍රභාමත් පවසයි.

රුසිරුගේ මේ ස්පර්ශයක් රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය 2020 වසරේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් පැවැත්වූ 'සහසක් නිමැවුම් 2020' ජාතික නව නිර්මාණ තරගාවලියට ද ඉදිරිපත් කෙරිණි. එහිදී මේ නව නිර්මාණය පාසල් අංශයේ 'මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව' යන තරග කාණ්ඩය යටතේ රන් පදක්කම දිනා ගැනීමට සමත් විණි. ඊට අමතරව සහසක් නිමැවුම් තරගාවලියේ සුවිශේෂ නව නිර්මාණය වෙනුවෙන් පිරිනැමෙන 'දසිස්' සම්මානය සඳහා නිර්දේශිත නිර්මාණ අතරට පිවිසීමට සමත් වීමට ද මේ නව නිර්මාණය සුවිශේෂ විය.

සූර්ය බල ස්වයංක්‍රීය විදුලි පහන් පද්ධතිය

නව නිර්මාණකරණයට දක්ෂතා දක්වන රුසිරුගේ තවත් නව නිර්මාණයක් වන්නේ සූර්ය බලයෙන් දැල්වෙන ස්වයංක්‍රීය විදුලි පහන් පද්ධතියයි (Solar Powered Home Lighting System at Power Failure). විදුලි බල්බ හයක් පමණ දැල්විය හැකිවමේ පද්ධතිය මඟින් රාත්‍රී කාලයේ විදුලිය විසන්ධි වීමක් සිදු වුව හොත් ස්වයංක්‍රීයව බල්ව දැල්වේ. ඊට අමතරව රාත්‍රී කාලය එළඹෙන විට මෙම ඇති මැනුවල් ස්විචය භාවිත කර අවශ්‍ය නම් විදුලි බල්බ දැල්වා එමගින් ප්‍රධාන විදුලි සැපයුමෙන් නිවෙසකට හෝ ආයතනයකට ගන්නා විදුලි ප්‍රමාණය අවම කරගත හැකිය.

අකුළන පුටුව

රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මඟින් 2018 වසරේ සංවිධානය කළ 'රුහුණු රොබොට්ක්ස් චැලේන්ජ්' (Ruhuna Robotics Challenge - XBOTIX) තරගාවලියටද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) මඟින් 2019 වසරේ සංවිධානය කළ රොබෝෆෙස්ට් (ROBOFEST) තරගාවලියට ද රොබෝ නිර්මාණ ඉදිරිපත් කළ රුසිරු දුම්රිය මගීන්ට අතේ ගෙන යා හැකි පුටුවක් ද නිර්මාණය කර තිබේ. මේ පුටුව කුඩයක් සේ අකුළා අතේ ගෙන යා හැකි අතර දුම්රියේ ආසන පිරී ගොස් තිබෙන විට දුම්රිය පෙට්ටියේ ඇතැළත ඉඩ තිබෙන වෙනත් ස්ථානයක මේ පුටුව දිගහැර හිඳ ගැනීමට හැකිය. ඊට අමතරව රෝහල්වල පෝලිම්වල සිටිමේදී වාඩි වීමට භාවිත කළ හැකි වීම, විනෝද වාරිකා වැනි අවස්ථාවලදී පළිමහන් හෝ ගාඟසර්ට් ස්ථානවල භාවිත කළ හැකි වීම, ආලින්දයේ පිසිතුරු හාණ්ඩ තැන්පත් කිරීමට භාවිත කළ හැකි විම මේ පුටුවේ ඇති තවත් ප්‍රයෝජන වේ.

ඉංජිනේරුවකු වීම අනාගත ඉලක්කය කරගත් රුසිරු අධ්‍යාපන කටයුතුවලට මුල් තැන දෙමින් තව දුරටත් නව නිර්මාණකරණයේ යෙදීමට අදිටන් කරගෙන සිටින අතර තම නව නිර්මාණකරණයට සහය දෙන ඉංජිනේරුවකු වන තම පියා රොහාන් එදිරිසූරිය සහ මව ධම්මිකා කුමාරි මෙන්ම සිය පාසල වන ගාල්ල හපුගල මහා විද්‍යාලයේ නව නිර්මාණ භාර ආචාරිණී රුවනි එම්පිතා ගුරුතුමියත්, විදුහල්පති එම්.ඒ.පී. පුෂ්ප කුමාර මහත්තයි සිහිපත් කරන්නේ මහත් ගෞරවයෙනි.

▶ පී.කේ. බණ්ඩාර

'ද්වාර' යනු විද්‍යා-තාක්ෂණ ලිපි අන්තර්ගත අතිරේකයකි. නව නිපැයුම් පිළිබඳ හඳුන්වා දීම මෙන්ම කාලීන විද්‍යා-තාක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහිදී විශේෂය. 'ද්වාර' අතිරේකයේ විද්‍යා ප්‍රබන්ධයක් ද සතිපතා පළ වේ. මේ අතිරේකයට පාඨක බබටත් ලිපි සහ විද්‍යා ප්‍රබන්ධ ලිවිය හැකිය.

'ද්වාර', දිනමිණ, අංකය: 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක් හවුස්, කොළඹ 10.
dwara@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය කාංචනා අමිලානි

දිනමිණ ද්වාර LOADING

පොසිල ඉන්ධනවලට යන්න කියා ඉලෙක්ට්‍රික් කාර්වලට එන්න කීම

පොසිල ඉන්ධන සම්පත හිඟ වීම සහ පොසිල ඉන්ධන දහනයෙන් විමෝචනය කෙරෙන අව වායූන්ගෙන් ඇති වන අයහපත් බලපෑම සැලකූ විට රථ වාහනවල විශාල වෙනසක් සිදු විය යුතු බව බොහෝ දෙනකුගේ මතයයි. වාහන සඳහා පොසිල ඉන්ධන භාවිතයෙන් ඇති කෙරෙන අයහපත් ප්‍රතිඵල යම් පමණකට හෝ මඟහරවා ගැනීම සඳහා විද්‍යත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ එනිසා හඳුන්වා දී ඇත. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ වෙත ලොව බොහෝ දෙනකුගේ අවධානය ද යොමුව තිබේ.

පොසිල ඉන්ධන බලය

යුරෝපා සංමේලය අයත් රටවල මහා මාර්ග මත වසර 2030 වන විට විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ මිලියන 30ක් පමණ දැකිය හැකි වනු ඇතැයි බර්මින්ග්හැම් විශ්වවිද්‍යාලයේ පෝල් ඇන්ඩර්සන් පවසයි. එහි අරුත, තවත් දස වසරක් ගෙවෙන විට යුරෝපා රටවල මහා මාර්ග මත විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ බහුලව දක්නට ලැබෙන බවකි. එවිට පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ එම කලාපයේ අඩු වනු ඇත. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවලට අවශ්‍ය බලය දෙන්නේ බැටරි මගිනි. එම බැටරි භාවිතයෙන් ඉවත් කළ පසු පරිසරයේ ගොඩගැසෙනු ඇති බව පෝල් ඇන්ඩර්සන් සඳහන් කරයි. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ භාවිතය වැඩි වන විට පරිසරයේ ඒකරාශී වන බැටරි සංඛ්‍යාව ද වැඩි වනු ඇත.

බැටරි ප්‍රතිචක්‍රීකරණය

"... විදුලි බලයෙන් ධාවනය වන මෝටර් රථවලින් ඉවත් කෙරෙන බැටරි විශාල ප්‍රමාණයක ආයු කාලය අවුරුදු දහයක් පහළොවක් වැනි කාලයක් ඇතැළතැදී අවසන් වෙයි. එම බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම ඉතා වැදගත්. ..." යැයි පෝල් ඇන්ඩර්සන් පවසයි.

විද්‍යාඥයන් පෙන්වා දෙන අන්දමට විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල කොටස්, පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල කොටස්වලට බෙහෙවින් සමාන ය. එසේ වුවත් යම් යම් වෙනස්කම් ද තිබේ. පොසිල ඉන්ධනවලින් ධාවනය කෙරෙන වාහනවල දක්නට ලැබෙන්නේ ලෙඩ් අම්ල බැටරි ය. ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ මේ වන විට සංවිධානය වී ඇත. එසේ වුවත් විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල ඇති ලිතියම්-අයන් බැටරි ඒ අන්දමට ප්‍රතිචක්‍රීකරණය කිරීමට පුළුවන්කමක් නැත. ලිතියම්-අයන් බැටරි විශාලය. සාවෙක්ෂව බරෙන් ද වැඩිය. එවැනි බැටරියක ලිතියම්-අයන් කෝෂ සිය ගණනක් දක්නට ලැබෙයි. ඒවායෙහි විෂ සහිත ද්‍රව්‍ය අඩංගු තිබේ. එනිසා ලිතියම්-අයන් බැටරි වැරැදි ආකාරයෙන් පරිසරයේ විසිරුවා හැරිය හොත් පාරිසරික ගැටලු රැසක් මතු වන්න ඉඩ තිබේ.

පරිසර හිතකාමී නිෂ්පාදන

විද්‍යුත් බලයෙන් ධාවනය වන මෝටර් රථ ලොව විවිධ කලාපවල මේ වන විට භාවිතයට ගැනේ. එම මෝටර් රථවලින් බැහැර කෙරෙන බැටරි ප්‍රතිචක්‍රීකරණය කෙරෙන්නේ ද යන්න ගැන පැහැදිලි දත්ත එකතුවක් සිදුව නැත. එසේ වුවත් බොහෝ දෙනකු සඳහන් කරන්නේ ප්‍රතිචක්‍රීකරණය කෙරෙන ලිතියම්-අයන් බැටරි ඉන්ධන සංයෝග 5%ක් පමණ වන බවකි. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල අංගෝපාංගවල ආයු කාලය ඉක්ම ගිය විට ඒවා පරිසරයට බැහැර නොකර වෙනත් ක්‍රියාවලියකට ලක් කිරීමේ වැදගත්කම යුරෝපා සංමේලය වාහන නිෂ්පාදනය කරන සමාගමවලට මේ වන විටත් පෙන්වා දී තිබේ. එවැනි පරිසර හිතකාමී නිෂ්පාදනයන් යුරෝපා සංමේලයට අයත් රටවල් ඉදිරියේදී මිලදී ගැනීමට වැඩි කැඹුරුවක් දක්වනු ඇත. මෙවැනි කාරණා සැලකිල්ලට ගෙන විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙළ සකස් කර ඇත. නිසාත් සමාගම නිෂ්පාදනය කරන ලීෆ් මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීම දැනටමත් ආරම්භ කර ඇත. ලොක්හයන් සමාගම ද ජර්මනියේ සලස්ගිටර්හි බැටරි ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තශාලාවක් ආරම්භ කර තිබේ.

විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි 3600කට ආසන්න සංඛ්‍යාවක් එම කර්මාන්තශාලාවේදී වාර්ෂිකව ප්‍රතිචක්‍රීකරණය කරන බව සඳහන් වේ. රෙනෝල්ට් මෝටර් රථ සමාගම ද විදුත් මෝටර් රථවල සියලුම බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීම මේ වන විට ආරම්භ කර ඇත. වෙනත් මෝටර් රථ සමාගම නිෂ්පාදනය කරන විද්‍යුත් මෝටර් රථවල බැටරි ද රෙනෝල්ට් සමාගමේ බැටරි ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තශාලාවේදී ප්‍රතිචක්‍රීකරණය කෙරේ.

කළු ස්කන්ධය

විද්‍යුත් මෝටර් රථවල බැටරි කර්මාන්තශාලාවලදී ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී ඒවායේ ඇති ද්‍රව්‍ය අඩු වීමක් සිදු වේ. එසේ අඩු වන ද්‍රව්‍ය හැඳින්වෙන්නේ 'කළු ස්කන්ධය' (black mass) යනුවෙනි. එකී 'කළු ස්කන්ධයට' අයත් වන්නේ ලිතියම්, මැන්ගනීස්, කොබෝල්ට් සහ නිකල් මිශ්‍රණයකි. එසේ තිබෙන ලෝහයන් මිලෙන් අධිකය. එසේම ඒවා හිඟය. එනිසා විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී එවැනි කාරණා ගැන සිතන්න ද සිදුව තිබේ. යන්ත්‍ර සූත්‍ර භාවිත නොකර වාහන බැටරි කොටස් කිරීම මඟින් එයට කිසියම් අන්දමක පිළිතුරක් සොයාගත හැකි වේ. එහිදී බැටරිය කොටස් කරන ශ්‍රමිකයාගේ දක්ෂතාව, දැනුම සහ හැකියාව ඉතා වැදගත් වෙයි. පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන වාහනවල බැටරි, කොටස් කිරීමේදී යන්ත්‍ර-සූත්‍ර භාවිතයට නොගැනෙන අවස්ථා ඇත. එහිදී ශ්‍රමිකයාගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ බරපතළ ගැටලු මතු වේ.

"... වීනයේ ඇතැම් වෙළෙඳපොළවල සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ නියාමනයන් ද පරිසරය පිළිබඳ නියාමනයන් ද ඉතාමත් අවිධිමත් ලෙස පාවිච්චියට ගැනෙනවා. එසේ බැටරි කොටස් කරන ස්ථානවල සේවය කිරීමට තිබෙන පරිසරය බටහිර සන්දර්භය කෙසේවත් අනුමත කරන්නේ නැහැ. ..." යැයි ෆැරඩේ ආයතනයේ පර්යේෂක ගාවින් හාර්පර් පවසයි.

විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ඉවත් කර එවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට රොබෝ තාක්ෂණය වැනි ක්‍රමවේදයක් යොදා ගන්නට පුළුවන් බව ගාවින් හාර්පර් වැඩිදුරටත් සඳහන් කරයි.

▶ BBC ඇසුරෙනි
මංජුලා විජයරත්න

ගම්පහ, වැරැල්ලවත්ත ප්‍රදේශයේ වසා දමන ලද කර්මාන්ත ශාලාවක් නාවික හමුදාවේ තාක්ෂණික හා ශ්‍රමදායකත්වයෙන් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස පරිවර්තනය කර ඇති අයුරු

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා

ගුවන් හමුදාපති එයාර් මාෂල් සුදර්ශන පතිරණ

නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න

අපේ හමුදාවේ සෞඛ්‍ය මැදියාන්විතය

වතුපිටිවල මූලික රෝහලේ ඇඳන් 20 කින් සමන්විත වාට්ටුව

ගාල්ල, බූස්ස නාවික හමුදා කඳවුර තුළ ඇඳන් 200 කින් සමන්විත අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය

යුද හමුදාපතිවරයා නිරීක්ෂණ කටයුතුවල යෙදෙමින්

නවීකරණය කරන ලද ඇඳන් 35කින් සමන්විත මිනුවන්ගොඩ මූලික රෝහලේ වාට්ටු සංකීර්ණයක්

නවීකරණය කරන ලද ගම්පහ මහ රෝහලේ වාට්ටු සංකීර්ණයක්

යුද, ගුවන්, නාවික හමුදා ත්‍රිත්වය මෙරට ඉතිහාසය තුළ රටවැසියන්ට කළ අමිල සේවය ලියන්නට කියන්නට අකුරු හෝ වචන සොයා ගැනීමට නොමැති තරම්ය.

තමන්ගේ රාජකාරියට ඔබ්බෙන් යන ත්‍රිවිධ හමුදා විරුවන් හැකි සෑම මොහොතකම ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවය ඉතා ප්‍රශංසනීයය.

වසර තිහකට අධික කාලයක් මෙරට පැවැති යුද්ධය නිමා කිරීමේදී ගිනි අවියට පමණක් සීමා නොවී මානුෂීයව ක්‍රියා කළ ආකාරය දැනට වසර දොළහකට ඉහතදී මුළු ලෝකයම කතා බහ කළ මාතෘකාවක් බවට පත්වූයේ අද්‍යතත් ලෝකය හමුවේ සාඩම්බර ත්‍රිවිධ හමුදාවක් බවට පත් වෙමිනි.

කුරිරු ත්‍රස්තවාදීන් පහර පිට පහර දෙමින් තුවාල සිදු කරමින් ආහාර පාන නොදී දැඩි පීඩනයකින් සිරගත කර සිටි ලක්ෂ සංඛ්‍යාවක් වූ දෙමළ ජනතාව එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගන්නා අවස්ථාවේ මෙරට රණවිරුවන් කරන ලද කැප කිරීම් ද අප කිසිවකුට කිසිදාක අමතක නොවේ.

දින ගණනක් නිරාහාරව ඇවිද යමින් දින ගණනක් සිටි රණවිරුවන් තම ගමන්මල්ලේ තිබුණු ආහාර වේල සමඟ වතුර බෝතලය ද දෙමළ වැසියන්ට දුන්නේ ශ්‍රී ලංකා රණවිරුවන් සැබෑ මානුෂීය මෙහෙයුමක් සිදු කළ බව මනාව ලොවට පෙන්නුම් කරමින්ය.

සෑම දිස්ත්‍රික්කයකටම අතරමැදි රෝහලක්

මහා විනාශයක් සිදු කරමින් 2004 වසරේදී දහස් ගණනින් ජනතාව බිලි ගත් සුනාමි ව්‍යසනයෙන් පසුව මේ රට යළි පෙර තිබූ තත්ත්වයට පත් කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් මහඟු සේවයක් සිදු කරනු ලැබීය.

ගංවතුර තත්ත්වයක්, හෝ ඕනෑම ආපදාවකදී මෙරට ජනතාවගේ ජීවිත බේරා ගනිමින් ජනතාවට පිහිට වන රණවිරුවන්ට වර්තමානයේ සිදුව ඇත්තේ ලෝකයම වෙළාගෙන සිටින කොවිඩ් උවදුරෙන් මෙරට ජනතාව මුදා ගැනීම සඳහා සිය දායකත්වය සෞඛ්‍ය අංශ වෙත සපයා දීමයි.

එය අකුරටම ඉටු කරන රණවිරුවන් කිසිවකුගේ ඇසට නොපෙනෙන කොවිඩ් වයිරසයට ගොදුරු වූ ජනතාව රැක බලා ගැනීම සඳහා නොයෙක් ක්‍රම උපයෝගී කර ගනිමින් සෞඛ්‍ය අංශ වෙත තම උපරිම දායකත්වය ලබා දෙනු දැක ගත හැකිය.

කොවිඩ් ප්‍රථම රැල්ල පැමිණෙනවාත් සමඟ නිරෝධායන මධ්‍යස්ථාන ඉදිකරමින් දස දහස් ගණනින් ජනතාවට නිරෝධායනය වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමට කටයුතු කළහ.

හමුදා කඳවුරු නිරෝධායන මධ්‍යස්ථාන බවට පත්වෙමින් තිබූ අවස්ථාවක රණවිරුවෝ බිම නිදා ගනිමින් සිය ඇඳ නිරෝධායනය වන පුද්ගලයන්ට ලබා දීමට තරම් මානුෂීය වූහ.

එලෙසම විදේශගතව සිට මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින්ට නිරෝධායනය වීම සඳහා අවස්ථාව දෙනු ලැබුවේ සුඛෝපභෝගී පහසුකම් ද සලස්වමිනි. සෞඛ්‍ය අංශවල මෙහෙයවීමෙන් ත්‍රිවිධ හමුදාවේ කැප කිරීම් තුළින් පළමු සහ දෙවන කොරෝනා රැලි ජයගැනීමට හැකි විය.

එහෙත් නොසිතූ අයුරින් කොරෝනා වසංගතය මේ වන විට මෙරට තුළ නැවත දැවැන්ත ලෙස හිස ඔසවමින් තිබේ. රෝගීන් දිනෙන් දින දහසකට වඩා වැඩි වන අවස්ථාවක් උදා වී ඇති අතර ඔවුන්ට අත්‍යවශ්‍යම සේවාවක් බවට පත් වී ඇති රෝහල් සහ ඇඳන් සකස් කිරීම යුද, නාවික, ගුවන් හමුදාව විසින් සිදු කරගෙන යනු ලබයි. ඇඳන් දස දහස් ගණනක් ඉතා කෙටි දින ගණනාවකදී නිර්මාණය කර තාවකාලික රෝහල් ඉදිකිරීම මේ දිනවල රණවිරුවන් විසින් දිවා රාත්‍රී නොබලා සිදු කර ගෙන යන අයුරු දක්නට ලැබෙයි.

ඒ යටතේ යුද හමුදාව විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා සීදුව ප්‍රදේශයේ පිහිටා ඇති 'Brandix Green plant' ආයතනයේ ගොඩනැඟිල්ලක් තුළ යුද හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් සියලුම සෞඛ්‍ය පහසුකම්වලින් සමන්විත ශ්‍රී ලංකාවේ වැඩිම ධාරිතාවකින් යුක්ත නවීනතම රෝහල ඉදි කර අවසන් කර තිබේ.

නවීනතම පහසුකම් රැසකින් යුක්ත මෙම රෝහලේදී කොරෝනා රෝගියකුට අවශ්‍ය සියලු පහසුකම් මෙන්ම වෙනත් සායනික කටයුතු වෙනුවෙන් ද භාවිත කළ හැකි බව යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා 'දිනමිණ'ට පැවසීය.

මෙම රෝහල යුද හමුදාවේ පූර්ණ ශ්‍රම දායකත්වයෙන් පැය විසිහතර පුරාම සේවය කරමින් සති දෙකකට ආසන්න කාලයක් තුළදී ඉදිකිරීම විශේෂත්වයකි.

රෝගීන් දෙදහසකට ආසන්න පිරිසකට නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි මෙම රෝහලෙහි රෝගීන්ට නොයෙක් කාණ්ඩ යටතේ සේවය සපයා දීමට සැලසුම් කර ඇත.

පවුල් පිටින් කොරෝනා රෝගය වැලඳී ඇති රෝගීන්ට වෙනම වෙන් කළ වාට්ටු ඇති අතර එකම පවුලේ සාමාජිකයින්ට එකම තැන ප්‍රතිකාර ගැනීම මෙන්ම තම පවුලේ සාමාජිකයින් නෙත ගැටෙන අයුරින්සිටී මේ අවස්ථාව සපයා දීමට මෙහිදී යුද හමුදාව පියවර ගෙන තිබේ. ඊට අමතරව කුඩා දරුවන් රෝගයට ගොදුරු වී ඇත්නම් එම දරුවන්ට වෙනම වාට්ටුවක් සකස් කර ප්‍රතිකාර ලබා ගැනීමට කටයුතු යොදා තිබේ.

මීට අමතරව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක රාශියක පළාත් කිහිපයකම ශ්‍රී ලංකා යුද හමුදාවෙන් තාවකාලික රෝහල් ඉදිකරන අතර ස්ථිර රෝහල්වල ඇඳන් ධාරිතාව මෙන් අනෙකුත් අවශ්‍යතාවන් ඉටු කරලීම සඳහා පහසුකම් රැසක් සකස් කරමින් සිටිනු ලබයි.

විශේෂයෙන්ම කොරෝනා රෝගීන් බහුලව වාර්තා වන ගාල්ල, ගම්පහ, කුරුණෑගල, කොළඹ ඇතුළු තවත් දිස්ත්‍රික්ක රැසකම රෝහල් රාශියක් ඉදිකර තිබේ. 20000කට අධික ඇඳන් සංඛ්‍යාවක් ඉතා ඉක්මනින් ශ්‍රී ලංකාව පුරා තාවකාලික රෝහල් තුළ සකස් කිරීම දැනටමත් සිදු කරන බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

ත්‍රිවිධ හමුදා විරුවන් 24 පැයේම වැඩ

මෙම කාර්යයට ගුවන් හමුදාව සිය දායකත්වය ලබා දෙමින් ගුවන් හමුදාපති එයාර් මාෂල් සුදර්ශන පතිරණ මහතාගේ මඟ පෙන්වීමෙන් මේ වන විට මුල්ලේරියාව මූලික රෝහලේ නව වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ගුවන් හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශය විසින් ආරම්භ කර තිබේ.

මෙම ඉදිකිරීම් මාර්තු මාසයේ 23 වැනිදා ආරම්භ කළ අතර ජුනි මස අවසන් කර රෝහල් පරිපාලනයට නව රෝහල භාර දීමට සැලසුම් කර ඇත.

මෙහිදී වාට්ටු 05ක් ඉදිකරනු ලබන අතර එම වාට්ටු සියල්ලටම අවශ්‍ය වැසිකිළි, නාන කාමර ඇතුළු අනෙකුත් සේවා සියල්ලම සපයා දීමට සැලසුම් කර තිබේ.

මීට අමතරව ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකාව පුරා පිහිටි සිය කඳවුරුවල සාමාජිකයන් කොවිඩ් මර්දනය කිරීමේ වැඩසටහනට දායකත්වය ලබා දෙන අතර ඒ ඒ ප්‍රදේශවල හදිසි ඉදිකිරීම් සඳහා ශ්‍රම දායකත්වය ද සපයා දී ඇත.

කොවිඩ් 19 ආසාදිත රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ රජයේ වැඩපිළිවෙළට සහාය දෙමින් ගම්පහ වැරැල්ලවත්ත ප්‍රදේශයේ වසා දමන ලද කර්මාන්ත ශාලාවක් නාවික හමුදාවේ ශ්‍රමදායකත්වයෙන් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම මේ වන විට ආරම්භ කර ඇත. එහිදී ඇඳන් 2000ක ප්‍රමාණයක් මෙහි ස්ථාපිත කිරීමට කටයුතු කරන බව නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා 'දිනමිණ'ට පැවසීය.

ගාල්ල බූස්ස නාවික හමුදා කඳවුර, වතුපිටිවල, ගම්පහ, මිනුවන්ගොඩ, ගාල්ල නාවික හමුදා කඳවුරු ඇතුළු තවත් කඳවුරු රැසකම මෙන්ම ප්‍රදේශ රැසකම අතරමැදි රෝහල් සහ තාවකාලික රෝහල් ඉදිකිරීම සඳහා නාවික හමුදාව සිය පූර්ණ ශ්‍රම දායකත්වය ලබා දෙන බව ද නාවික හමුදාපතිවරයා සඳහන් කළේය.

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

කොවිඩ් ජය ගැනීමට නම් ජනතාව නිසි ක්‍රමවේද භාවිත කළ යුතුයි

යුද හමුදාපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා

අපි රටක් ජාතියක් හැටියට කිසිම දාක පැරදුණ ජාතියක් නොවෙයි. අවස්ථා ගණනාවකදීම රටක් ජාතියක් හැටියට අපි එකාවන්ව එක්සිත්ව එක්සත්ව නැඟී සිටියා. එහිදී අපි අභියෝග රැසක්ම ජයග්‍රහණය කළා.

කිසිසේත්ම පරාජය කිරීමට නොහැකි බව කිවූ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය අපි පරාජය කළා. සුනාමියෙන් මේ රට විනාශ වූ අවස්ථාවේ නැවත ගොඩනඟන්නට කටයුතු කළා.

ජාතියක් රටක් හැටියට අපි මේ ආකාරයට නැඟී සිටි අවස්ථා අතීතයේ සෑහෙන්න තිබෙනවා. කොරෝනා පළමු වන රැල්ලට, දෙවන රැල්ලට අපි ඉතා හොඳින් මුහුණ දුන්නා. විශේෂයෙන්ම සෞඛ්‍ය අංශ කියන විදිහට ජනතාව කටයුතු කළා. ඒ නිසා ජීවිත බිලි දෙන්න සිදු වුණේ නැහැ.

දැන් තත්ත්වය ඊට වඩා ගොඩක් වෙනස් වෙලා. තුන්වන රැල්ල මුළු ලෝකයටම වගේම ශ්‍රී ලංකාවටත් විශාල බලපෑමක් ඇති කරලා.

දහස් ගණනින් රෝගීන් වාර්තා වෙනවා. බොහෝ ජනතාව සෞඛ්‍ය නීතිරීති පිළිපදින්න කටයුතු කළත් එහෙම නොකරපු පිරිසක් සිටිනවා. අන්න ඒ නිසා අද රෝගය වේගයෙන් පැතිර යනවා.

අපි මේ සියල්ල පාලනය කර කොවිඩ් වසංගතයෙන් රට බේරා ගත යුතුයි. මේ වන විට රෝගීන්ට අවශ්‍ය ඇඳන් අපි සකස් කරනවා. ඊට අමතරව ත්‍රිවිධ හමුදාවම එක් වෙලා මේ වසංගතය පරාජය කර රටේ ජනතාවට අවශ්‍ය නිදහස් පරිසරය නිර්මාණය කිරීමට කටයුතු කරනවා.

අපි මේ වන විට ඇඳන් දසදහසකට ආසන්න ප්‍රමාණයක් සකස් කර අවසන්. රෝගීන් වැඩි වෙන ප්‍රදේශ අනුව තව තවත් ඇඳන් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු කරනවා. ජනතාව නිසි ක්‍රමවේද භාවිත කරනවා නම් අපිට මෙය ජය ගැනීම පහසුයි.

රටක් හැටියට අපි එක්සත්ව එක්සිත්ව මේ අභියෝගය ජය ගන්නවා කියන එක මට විශ්වාසයි.

එස්. ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

වසා දමා ඇති ජයන්ති විදුහල ප්‍රයෝජනයට නොගෙනම අතහැර දමලා

කටුගස්තොට අධ්‍යාපන කලාපයට අයත් ගොහාගොඩ බාන්වැල්ගොල්ල ජයන්ති ආදර්ශ කනිටු විදුහල වසා දමා මේ වන විට වසර 15ක පමණ කාලයක් ගත වී ඇති බවත් විදුහලේ ගොඩනැඟිලි සියල්ල විනාශයට යමින් පවතිනා බවත් මේ වටිනා සම්පත තවදුරටත් විනාශ වී යෑමට ඉඩ නොදී යම්කිසි ඵලදායි වැඩකට යොදා ගන්නා ලෙසත් ප්‍රදේශවාසීහු අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීමක් කරති.

වසා දමා ඇති විදුහල් පරිශ්‍රය තුළ නොයකුත් අපචාර ක්‍රියා සිදුවෙන බවත් එය ගම්මුන්ට හිරිහැරයක් වී ඇති බවද ඔවුහු පෙන්වා දෙති. කටුගස්තොට සිට මඩපොත, බාන්වැල්ගොල්ල හරහා පල්ලේමුල්ල දක්වා දිවෙන මාර්ගයේ අක්කරයක පමණ ඉඩමක පිහිටා තිබෙන ජයන්ති විදුහල අඩි විස්සක් පමණ පළලින් හා අඩි පනහක් පමණ දිගින් යුත් ගොඩැනැඟිලි දෙකකින් හා ගුරු නිවාසයකින් සමන්විතය. අද වන විට ගුරු නිවාසය සම්පූර්ණයෙන්ම කැඩී බිඳී විනාශ වී ඇති අතර ඉතිරිව ඇති ගොඩනැඟිලි දෙකේ බිත්ති කබඩ්, වහලේ මුදුන් උළු ඇතුළු බොහෝ දේවල් සොරුන් විසින් රැගෙන ගොස් ඇත.

විදුහල් භූමිය මෙන්ම ගොඩනැඟිලි කැලෑවෙන් වැසී ගොස් ඇති අතර ගොඩනැඟිලි තුළ හිස් මත්පැන් බෝතල් හා බියර් ටින් විශාල ප්‍රමාණයක් දමාගොස් ඇති අයුරුද දක්නට ලැබේ. වසර 40කටත් වඩා වැඩි ඉතිහාසයක් ඇති මේ විදුහලේ පළමු වසරේ සිට 10 වසර දක්වා පන්ති පැවැත්වූ බවත් විදුහලේ ඉගෙනුම ලැබූ බොහෝ දෙනෙක් අද සමාජයේ ඉහළ තැන්වල සිටිනා බවත් විදුහල වසා දැමීම මහා අපරාධයක් මෙන්ම මෙවැනි වටිනා ඉඩමක් හා ගොඩනැඟිලි මේ අයුරින් විනාශයට යෑමට ඉඩහැරීමද කනගාටුවට කරුණක් බව ද ප්‍රදේශවාසීහු වැඩිදුරටත් පැවැසූහ.

මේ පිළිබඳ අදහස් පළ කළ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජී. විජේරත්න මහතා,

"ගොහාගොඩ ජයන්ති පාසල වසා දමා වසර 15ක් විතර වෙනවා. අපි එදා පටන්ම මේ ගැන සභාවේදීත් කතා කළා. අද වන විට ජයන්ති පාසලට අත්වෙලා තිබෙන ඉරණම ගැන හරිම කනගාටුයි. පන්ති කාමරවල තිබෙන කබඩ් කඩලා. මේක ඇතුළේ මත්පැන් බොනවා. එවැනි දූෂණ ක්‍රියා තමයි සිදු වෙන්නේ. මේ වන විට අපි දන්නවා කටුගස්තොට නගරයේ තිබෙන ජනප්‍රිය පාසල්වල ඉඩපාඩු මදි. එම නිසා නගරයේ තිබෙන විදුහලක ප්‍රාථමිකයවත් මෙහි ස්ථාපනය කරන්න කියල ඉල්ලා සිටිනවා."

ප්‍රදේශවාසියකු වන උපාලි ආනන්ද කොඩිතුවක්කු මහතා,

"හරිම කනගාටුයි පාසලට වෙලා තිබෙන දේ දැක්කම. වසර 40ක් විතර පාසලේ කටයුතු ඉතාමත්ම හොඳින් කරගෙන ගියා. ඉතා වටිනා ගොඩනැඟිලි තුනක් තිබෙනවා. ඒවා යම්කිසි ඵලදායි වැඩකට යොදා ගන්නවා නම් හොඳයි කියල මම කියනවා. රාත්‍රී කාලයේදී නොයකුත් අපචාර සිදු වෙනවා. මෙය ප්‍රයෝජනවත් දෙයකට යෙදා ගත්තොත් ඒ සියල්ලම නැති වෙනවා. හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම්වරයා කිව්වා මේක මාතෘ සායනයකට යොදා ගැනීමට කටයුතු කරනවා කියලා. නමුත් අධ්‍යාපන කාර්යාලයෙන් කියනවා මේක තවම ලේකම් කාර්යාලයට පවරලා නෑ කියලා."

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

වන අලි දෙදෙනෙක් අනාරක්ෂිත ළිඳකට වැටිලා

මුලතිව් සෙම්මාලෙයි පුලියමුනෙයි ප්‍රදේශයේ ගැඹුරු අනාරක්ෂිත ළිඳකට පසුගියදා (03) රාත්‍රී විශාල වන අලි දෙදෙනකු වැටී ඇති බව ගම්වාසීහු විසින් මුලතිව් වනජීවී කාර්යාලයට දැනුම් දී තිබේ. ගොවීන්ගේ වගාවක් විනාශ කොට ආපසු යමින් සිටි වන අලි රංචුවකින් දෙදෙනකු මේ අනාරක්ෂිත ළිඳට වැටී ඇති බව ද පුලියමුනෙයි ප්‍රදේශයේ වැසියෝ පැවසූහ. වනජීවී නිලධාරීන් මේ වන අලි දෙදෙනා ළිඳෙන් ගොඩ ගැනීම සඳහා කටයුතු කරන බව පැවසූ අතර මේ ළිඳටම මීට මස තුනකට ඉහතදී වන අලියකු වැටී සිට දින දෙකකට පසුව වනජීවී නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගොඩ ගෙන තිබේ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

අනවසරයෙන් මැණික් ගැරෑ 4ක් අත්අඩංගුවට

මොනරාගල පොලිස් කොට්ඨාසයේ දූෂණ මර්දනය ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් පසුගියදා (02) මාලිගාවිල නියදැල්ල ප්‍රදේශයේ අනවසරයෙන් මැණික් ගැරීමේ නිරතව සිටි තරුණයන් සිව් දෙනකු අත්අඩංගුවට ගෙන ඇත. මේ සැකකරුවන් දෙහිඅත්තකණ්ඩිය සහ හුංගම පදිංචි අවුරුදු 23, 28, 33 සහ 37 යන වියෙහි පසුවන අයයි. සැකකරුවන් සහ මැණික් ගැරීමට යොදාගත් උපකරණ වැල්ලවාය අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැකකරුවන් ඇප පිට මුදාහරිනු ලැබූ බව ඔක්කම්පිටිය පොලිස් ස්ථානාධිපති (වැඩබලන) ඒ. එම්. දිසානායක මහතා පැවසීය.

කේ. ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

ගල්ඔය වැවිලි සමාගමේ නව ඇඹරුම් වාරය

නැඟෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඟුරාන ගල්ඔය වැවිලි සමාගමේ 2021 වර්ෂයේ නව ඇඹරුම් වාරය පසුගියදා (03) ගල්ඔය වැවිලි සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සුරත් පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් යෙදී තිබූ සුබ මොහොතින් මහා සංඝරත්නයේ ආශිර්වාදයෙන් උක් දඬු ඇඹරුම් යන්ත්‍රයට මුදා හැරීම සිදු කෙරිණි. ගල්ඔයේ හදවත බඳු ගල්ඔය වැවිලි සමාගමේ සේවක මහත්වරුන්ගේ දුෂ්කර කාලපරිච්ඡේදය අවසන් කර මෙවර ප්‍රසාද දීමනා ලබාදී උක් ගොවියාගේ සහ සේවකයාගේ අනාගතය ගැන සිතමින් වැඩ කරන යුගයක ආරම්භය වශයෙන් හැඳින්විය හැක.

ගල්ඔය වැවිලි සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සුරත් පෙරේරා මහතා සහභාගී වූ සේවකයන් අමතා මෙසේ පැවසීය.

"අම්පාර දිස්ත්‍රික්කයේ විහාරස්ථානවල නායක හිමිවරුන්ගෙන් ලැබෙන අවවාද අනුශාසනා මත මේ ගමන යෑමට අවස්ථාව ලැබී තිබෙනවා. මේ ආයතනය ගමන් කරන්නේ ගමේ නායක හාමුදුරුවන්ගේ මැදිහත් වීමෙන් පන්සලත් සමඟ මැදිහත්වෙලා. මේ ආයතනය ඉදිරියෙන් ඉදිරියටම ගමන් කිරීමටත් ඒ වගේම ඉදිරි ගමන සඳහා සියලුම සේවක මහත්ම මහත්මීන් ගොවි මහත්වරුන්ගේ නායකත්වය ලැබුනහොත් අපට වසර 03ක් ගත වන විට රටේ තිබෙන හොඳම ආයතනයක් බවට පත් කිරීමට හැකි වෙනවා. මේ ආයතනය විශේෂයෙන් කොළඹටත් ආදර්ශයක් දෙන දිගාමඩුල්ලේ නුපන් දරුවාගේ අයිතිය රැක ගන්න දිගාමඩුල්ලේ ආශ්චර්යක් ඇති කරන්න පුළුවන් ආයතනයක් බවට තව වසර 03ක් යන විට පත් කිරීමට පුළුවන්."

මේ අවස්ථාවට කීනවත්ත බෝධිමළු විහාරාධිපති ඇතිමලේ ආනන්ද නායක හිමි, හිඟුරාණ උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමි ඇතුළු මහා සංඝරත්නය ගල්ඔය වැවිලි සමාගමේ මානව සම්පත් කළමනාකරු වරුණ මධුශාන් මහතා, කර්මාන්තශාලා කළමනාකරු සමන්ත මහතා සහ දෙපාර්තමේන්තු හා සියලුම අංශ ප්‍රධානීහු සහභාගි වී සිටියහ.

වජිර පූජිත ගුණවර්ධණ - තෙලිජ්ජවිල සමූහ

බලධාරීන්ගේ නෙත නොගැටුණු මාතර හක්මණ මාර්ගය

කුඩා වැස්සකදී වුව ජලය පිරෙන නගර මධ්‍යයේ පිහිටි රාහුල පාර පිළිබඳව දිනමිණ පුවතින් පෙන්වා දුන්නද තවමත් බලධාරීන්ගේ අවධානය ඊට යොමුවී නැත. මාතර නගරය දෙසින් සහ හක්මණ මාර්ගය ඔස්සේ මාතර නගරයේ ප්‍රධාන පාසල් ත්‍රිත්වය වන රාහුල, සුජාතා සහ මාතර මධ්‍ය විද්‍යාලවලට පිවිසීමට පාසල් සිසු සිසුවියන් ඇතුළු සැම ගමන් කළ යුතු වූ රාහුල පාරේ මාතර මහ විදුහල ඉදිරිපස 2020 සැප්තැම්බර් මස සහ අද තත්ත්වයි මේ. ඉදිරියට එළැඹෙන්නේ අධික වැසි සමයයි. ඊට පෙර රාහුල පාරේ මේ කොටසේ පැති කානු යොදා සකස් නොකළහොත් මාර්ගය භාවිත කරනා පාසල් සිසුසිසුවියන් මාර්ගය දෙපස පදිංචි මාතර නගරවැසියෝ මෙන්ම රථ වාහන තදබද පවතින අවස්ථාවලදී නගරය මඟහැර ගමන් කිරීමට මේ මාර්ගය භාවිත කරන්නන්ටද බරපතළ ගැටලුවක් මතුවනු ඇත. 2020 සැප්තැම්බර් විසිඅට වැනි දින (28) දිනමිණ පුවත්පත විසින් මේ කරුණු වාර්තා කර ඇත. එනමුදු තවමත් බලධාරීන්ගේ අවධානය ඊට යොමුව නැත.

කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

පොලිසියට පෙට්‍රල් බෝම්බ ගැසීමේ සිද්ධිය: 8 වැනි හා 9 වැනි සැකකරුවෝ රක්ෂිතයට

දිගන කුඹුක්කඳුර ප්‍රදේශයේ සැකකටයුතු නිවෙසක් පරීක්ෂා කිරීමට යෑමේදී පොලිසියට පෙට්‍රල් බෝම්බයකින් හා ගල්වලින් පහර දීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන්ට නවාතැන් පහසුකම් දුන් නව වැනි සැකකාරිය හා එම සිද්ධියට සම්බන්ධ අට වැනි සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට තෙල්දෙණිය මහෙස්ත්‍රාත් දිසා විනිසුරු එල්. ජී. වී. ප්‍රනාන්දු මහතා තුන්වන දින නියෝග කළේය. පසුගියදා සැකකටයුතු පිරිසක් අත්අඩංගුවට ගැනීමට යෑමේදී පෙට්‍රල් බෝම්බයකින් හා ගල්වලින් පහර දීම් කළ සැකකරුවන් සැඟවී සිටි සැකකටයුතු නිවෙසක පරීක්ෂා කිරීමට යෑමේදී යළිත් වරක් පොලිස් නිලධාරීන්ට පොරොවකින් පහර දීමට සම්බන්ධ දිවයිනේ විවිධ අපරාධවලට සම්බන්ධ කල්ලියක සැඟවී සිටි අට වන සැකකරු හා ඔවුන්ට රැකවරණය දුන් නිවෙස හිමි මුස්ලිම් කාන්තාවක් තෙල්දෙණිය පොලිසිය මඟින් දෙවන දින අත්අඩංගුවට ගෙන ඇත. එම අට වැනි හා නව වැනි සැකකාරිය තුන් වැනි දින තෙල්දෙණිය අධිකරණයට ඉදිරිපත් කළේය. මේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හත් දෙනකු දැනට රක්ෂිත භාරයේ හා රැඳවුම් භාරයේ පසුවෙති.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක

පවුල් ආරවුලකින් අයෙක් මරුට

රත්තොට කිවුල නිල්දිය දහර ප්‍රදේශයේ නිවෙස් දෙකක ඇතිවූ ආරාවුලක් හේතුවෙන් දෙගොල්ල අතර ඇතිවූ ගුටි බැට හුවමාරුවකදී එක් පුද්ගලයකු මියගොස් තිදෙනකු මාතලේ රෝහලේ ප්‍රතිකාර ලබනා බව රත්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හර්බට් සිල්වා මහතා පැවසීය. මෙලෙස මිය ගිය පුද්ගලයාගේ මළ සිරුර සැකකරුවන් විසින්ම මාතලේ රෝහලට ඇතුළත් කර ඇති බවත් සිද්ධිය වී පැය කිහිපයකදී සැකකරුවන් 5ක් අත්අඩංගුවට ගෙන ඇති බවත් වැඩිදුර විමර්ශන සිදු කරන බව ස්ථානාධිපතිවරයා පැවසීය.

සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදු කළ පොලිසින් නිලධාරීන් සිද්ධිය වූ දින රාත්‍රියේදීම සැකකරුවන් 5ක් සහ තවත් අයකුද එදිනම අලුයම් කාලයේදී අත්අඩංගුවට ගෙන මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමේදී මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ වැඩබලන මහෙස්ත්‍රාත් ඩී. එච්. එස්. සකුන්තලා මහත්මිය විසින් සැකකරුවෝ 13 වැනි දින දක්වා බන්ධනාගාරගත කර ඇත. මේ සිද්ධිය සම්බන්ධව මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බණ්ඩාරනායක මහතාගේ හා මාතලේ i භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අජිත් වංශනාථ යන අයගේ උපදෙස් මත රත්තොට පොලිස් ස්ථානාධිපති හර්බට් සිල්වා මහතා ඇතුළු කණ්ඩායමක් විසින් විශේෂ විමර්ශනයක් සිදු කරන ලදි.

දිනමිණ දස අත ම එක තැන

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

උසස්වීම් ගන්න ගිය කොස්තාපල්වරුන් 4කට කොවිඩ්

සැරයන් තනතුර සඳහා උසස්වීම් ලබා ගැනීමේ අවසන් පරීක්ෂණයක් සඳහා ගිය කිලිනොච්චිය මූලස්ථාන පොලිසියේ පොලිස් කොස්තාපල්වරුන් සිව්දෙනකුට කොවිඩ් - 19 වයිරසය ආසාධනය වී ඇති බව කිලිනොච්චිය සෞඛ්‍ය අංශ තහවුරු කරයි. කන්කසන්තුරය සේවස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පැවති අවසන් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ පොලිස් කොස්තාපල්වරුන් 15 දෙනකුගේ පමණ හදිසියේ සිදු කළ රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂාවකදී පොලිස් කොස්තාපල්වරුන් සිව්දෙනාට කොවිඩ් ආසාදනය වී ඇති බව තහවුරු වී තිබිණි.

සේවස්ථ පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් අවසන් ඇගයීම් පරීක්ෂා කිරීමට නිලධාරීන් පිරිස කැඳවා තිබෙනා අතර එහි සිටි නිලධාරීන් අතර සිටි ආසාදිතයන් සිව්දෙනා හේතුවෙන් පුනරීන් පොලිසියේ සේවයේ නියුතු තවත් කොස්තාපල්වරුන් දෙදෙනකුත් ස්වයං නිරෝධායනයට ලක්කිරීමට සෞඛ්‍ය අංශ කටයුතු කර තිබිණි.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

පොලිස් කැඩෙට් අංශයේ කැඩෙට් වරන්ට් ඔෆිසර් නිලය කාව්‍යාට

ජාතික ශිෂ්‍යභට බළකායේ 21 වැනි බළඇණියේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් අතරින් පොලිස් කැඩෙට් අංශයේ කැඩෙට් වරන්ට් ඔෆිසර් නිලයට ත්‍රිකුණාමලය රාජකීය විද්‍යාලෝක ජාතික පාසලේ 12 වසරේ ඉගෙනුම ලබන එච්. එම්. කාව්‍යා භාෂිණි සිසුවිය උසස්වීම් ලැබීය. එම නිලයේ අත් පලඳනාව පැලඳවීම හා යෂ්ටි ප්‍රදානය ත්‍රිකුණාමලය මිහිදුපුර විද්‍යාලයේදී එම බළකායේ අණ දෙන නිලධාරි ලුතිනන් කර්නල් උපුල් කිත්සිරි මහතා අතින් සිදු කෙරිණි.

පොලිස් සැරයන් හසන්ත අමරසිංහ මහතා යටතේ පුහුණු කටයුතු කළ එච්. එම්. කාව්‍යා භාෂිණි සිසුවියට ලැබුණු මේ උසස් වීම රාජකීය විද්‍යාලෝක ජාතික පාසලේ ඉතිහාසයේ පොලිස් කැඩෙට් අංශය වෙනුවෙන් මෙවැනි තනතුරක් ලැබූ ප්‍රථම අවස්ථාව ද මෙය වේ. මේ උත්සවයට විදුහල්පති කපිතාන් මේනකා සෙව්වන්දි මහත්මිය ද එක් වී සිටියාය.

ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

මහමඟ ඇදවැටී මියගිය අයකුට කොරෝනා

හදිසියේ මහමඟදී රෝගාතුරව ඇදවැටී අසාධ්‍ය තත්ත්වයට පත්වූ පසුව රෝහල්ගත කළ පුද්ගලයකු මිය ගොසේ ඇත්තේ කෝවිඩ් 19 රෝගය වැලඳීමෙන් බවට සිදු කරන ලද වෛද්‍ය පරීක්ෂණ අනුව අනාවරණය වී ඇති බව දන්කොටුව පොලිසිය ප්‍රකාශ කළේය. දංකොටුව ප්‍රදේශයේ පදිංචි 50 වියේ පසු වූ මියගිය පුද්ගලයා පොල් කඩන්නකු වන අතර ඔහු පසුගියදා (02) සවස සිය මල්ලී සමඟ පොල් කඩා කොස්වත්ත ප්‍රදේශයේ හොර අරක්කු විකුණන නිවෙසකින් අරක්කු පානය කර ආපසු තම නිවෙස වෙත යමින් සිටියදී හදිසියේම රෝගාතුරව මහමඟ ඇද වැටී ඇති බවත් පසුව හදිසි ගිලන් රථ සේවාවේ ගිලන් රථයකින් මූලික රෝහලට ඇතුළත් කළ පසු එම පුද්ගලයා මිය ගොස් ඇති බව හෙළි වූ බවත් පොලිසිය ප්‍රකාශ කළේය. පසුව ඔහු සම්බන්ධයෙන් සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණයක වාර්තාව ලද බවත් ඒ අනුව මිය ගිය අය මිය ගොස් ඇත්තේ කොවිඩ් 19 රෝගයට ගොදුරු වී බවත් අනාවරණය විය. ඔහුගේ මරණයෙන් පසු මිය ගිය අයගේ නිවෙසේ සාමාජිකයන් හා මල්ලිගේ නිවෙසේ සාමාජිකයන් ස්වයං නිරෝධායනයකට යොමු කර ඇති අතර ඔවුන් වෙනුවෙන් පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීමට ද නියමිතව තිබිණි.

ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක - මස්කෙළිය සමූහ

මස්කෙලිය ප්‍රා. රෝහලට යන පාර කැලෑ වැදිලා

මස්කෙළිය ප්‍රාදේශීය රෝහල වෙත පිවිසීමට ඇති පඩි පෙළ් සහිත මාර්ගය දෙපස කැලෑ වැදීමෙන් රෝහල වෙත ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගී ජනතාව අපහසුතාවට පත්ව සිටිති. මස්කෙළිය - හැටන් ප්‍රධාන මාර්ගයේ සිට රෝහලට පිවිසීමට ඇති කෙටි මාර්ගයක් වන මේ පඩිපෙළ් සහිත මාර්ගයේ දෙපස තෘණ විශාල වශයෙන් වැවී තිබීම හේතුවෙන් මේ වන විට එම මාර්ගයෙන් ගමන් කිරීම දුෂ්කර වී ඇති බව ප්‍රදේශයේ ජනතාව පවසති. මේ මාර්ගය කඩිනමින් පිළිසකර කර දීමට පියවර ගන්නා ලෙස ප්‍රදේශයේ ජනතාව මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා සිටිති.

බෙලිඅත්ත සමූහ

දම්සෙන් හිමිගේ 29 වැනි නිවාස පරිත්‍යාගය

මාතර බෙලිඅත්ත ශ්‍රී සුධර්මාශ්‍රමාධිපති රාජකීය පණ්ඩිත බුද්ධියාගම ධම්මසේන හිමිපාණන්ගේ මූලිකත්වයෙන් ඉදි කළ 29 වැනි නිවෙස මාතර තලල්ල අසරණ පවුලක් වෙත පසුගියදා පරිත්‍යාග කෙරිණි. මේ සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වා ඇත්තේ මාතර ධර්මරතන මාවතේ පදිංචි සුනිල් - ජයන්ති යුවළ විසිනි.

කුමාරි දිසානායක - ඉබ්බාගමුව සමූහ

කුරුණෑගල තෝරයාය ජල ව්‍යාපෘතිය ජනසතු වෙයි

කුරුණෑගල තෝරයාය ප්‍රදේශයේ රුපියල් ලක්ෂ 600ක වියදමින් ඉදි කරන ලද ජල ව්‍යාපෘතිය පසුගියදා ජලසම්පාදන අමාත්‍යවරයා අතින් විවෘත කෙරිණි. පවුල් එක්දහස් පනහකට පමණ සෙත සැලසිය හැකි මේ ව්‍යාපෘතියෙන් ඉදිරියේදී තෝරයාය, කෝවන පාර, වලස්ගල පන්සල, දඹුලු පාර, කිරිවවුල කෝං ගස්වල විහාරස්ථානය, කිරිවවුල දම්මඩවත්ත, තෝරයාය මුස්ලිම් පල්ලිය හා ඒ අවට ගම්මානවල පානීය ජල පහසුකම් සැපයීමට හැකියාවක් ඇති බව ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා සඳහන් කළේය. මේ අවස්ථාවට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභාපති අචල නිමන්ත, වයඹ පළාත් සභාවේ හිටපු මන්ත්‍රී අශෝක ප්‍රේමදාස, ජලසම්පාදන අමාත්‍යවරයාගේ වයඹ පළාත් සම්බන්ධීකරණ ලේකම් ජනබන්දු සේනානායක යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ සහ සබරගමුව සමූහ

රත්නපුර සහ කෑගල්ලට ඔරු 16ක්

රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි ගංවතුර ආපදාවන්ට ලක්වන ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් ඔරු ප්‍රදානය කිරීම සබරගමු පළාත් ආණ්ඩුකාර විකිරි කොබ්බෑකඩුව මහතාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර පිහිටි පළාත් ආණ්ඩුකාර ශ්‍රවණාගාරයේදී පසුගියදා සිදු කෙරිණි. නිරන්තරයෙන්ම ගංවතුරට ලක්වන රත්නපුර මහ නගර සභාව වෙතද, නිවිතිගල, අයගම, කලවාන, රුවන්වැල්ල, දෙහිඕවිට, දැරණියගල, යටියන්තොට යන ප්‍රාදේශීය සභා සඳහා ද ඔරු 64ක් 2020 වර්ෂයේ ප්‍රතිපාදන මත මේ වන විට බෙදා දී ඇත. මෙදින බෙදා දුන් ඔරු ප්‍රමාණය

16කි. මේ ඔරු 64 සඳහා රජය දුන් මුළු මුදල රුපියල් ලක්ෂ 23ක් පමණ වේ. මේ අවස්ථාවට ප්‍රාදේශීය සභා සභාපතිවරුන් වන ප්‍රේමරත්න මල්කැකුල, කේ. ඩී. වසන්ත, කුලතුංග ලියනගේ, ආණ්ඩුකාර පෞද්ගලික ලේකම් මංජුලා ඉදිගහවෙල, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් එච්. ඩී. සිසිර, සමාජ සේවා කොමසාරිස් ප්‍රසංගි රණසිරි, සහකාර සමාජ සේවා කොමසාරිස් උපේකා දිසානායක යන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

ජගත් මාධ්‍ය දිනයදා යාපනයේ පහන් දල්වයි

ජාත්‍යන්තර මාධ්‍ය නිදහස් දිනය යෙදී තිබුණු පසුගියදා (03) යාපනයේ මාධ්‍යවේදියෝ එක්ව මේ දක්වා ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් සිහිපත් කරමින් පහන් දැල්වන ලදි. යාපනයේ මාධ්‍ය සංගම් විසින් එම පහන් දැල්වීම යාපනයේ මාධ්‍ය සමාජ ශාලාවේදී සංවිධාන කොට තිබිණි.

ජී. ජී. ජී. සුගතදාස - තිහගොඩ සමූහ

බෝක්කුව පිළිසකර කර දෙන්නැයි රියැදුරෝ ඉල්ලති

මාතර, තිහගොඩ, වැල්ලතොට හරහා මාලිම්බඩ බස් මාර්ගයේ කිතලගම, දලුගොඩ ඉදි කර තිබූ කෘෂිකාර්මික වාරි බෝක්කුව දිගු කලකින් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන්ව කඩා වැටෙමින් පවතින බව රියැදුරෝ ඇතුළු මේ මාර්ගය පාවිච්චි කරනා ජනතාව පවසති. මේ අබලන් බෝක්කුව හරහා මගී ප්‍රවාහන බස් රථ ඇතුළු බර වාහන ධාවනය කෙරේ. එබැවින් මේ ස්ථානයේ දී සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීම පිණිස දලුගොඩ කෘෂිකාර්මික වාරි බෝක්කුව කඩිනමින් අලුත්වැඩියා කර දෙන ලෙස ජනතාව අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක

තුන්කොන් පෙම් හබය තලංගම නුවණ වළලු 2ම ලඹුවැලු

රත්තොට පොලිස් වසමේ රත්වත්ත වත්තේ දොඹගොඩ ප්‍රදේශයේ කානුවක පිළිස්සුණු මළ සිරුරක් සම්බන්ධව රත්තොට පොලිසියට ලද තොරතුරක් මත පරීක්ෂණයක් සිදු කළ මාතලේ පොලිසියේ අපරාධ අංශයේ නිලධාරීන් අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. සිද්ධිය පිළිබඳ මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බණ්ඩාරනායක මහතා විසින් මාතලේ පොලිසියේ අපරාධ අංශයේ පොලිස් පරීක්ෂක එස්. පී. එම්. තිලකවර්ධන හා උප පොලිස් පරීක්ෂක ඩබ්ලිව්. ජී. ඒකනායක යන මහත්වරු ඇතුළු විමර්ශන කණ්ඩායමකට භාර කිරීමට කටයුතු කළේය. මේ සිද්ධිය සම්බන්ධයෙන් තලංගම පොලිසිය මඟින්ද පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇති අතර ප්‍රධාන සැකකරු පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගෙන මාතලේ දෙහිදෙණියේදී සැකකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළේය. මොහු යුද හමුදාවේ කලක් සේවය කළ අයෙක් බවට ද අනාවරණය වී ඇත.

තලංගම කන්ට්‍රක්ෂන් ආයතනයක අයිතිකරුවකු වූ චන්දන තිලක් රාජපක්ෂ තලංගම දාබුගහවත්ත පාරේ පවත්වාගෙන ගිය ජලනළ එළන ආයතනය තුළ ඇතිවූ ආරවුලක් පිළිබඳ පැවැති ප්‍රශ්නයක් මත ජීවිතයකින් සමුදෙන්නට තරම් අම්හිරි පුවතක් මේ මරණයට ප්‍රධාන හේතුවක් විය. මරණයට පත් රාජපක්ෂ මහතා ජලනළ එළන කොන්ත්‍රාත් සමාගමක අයිතිකරුවකු ලෙස සේවකයන් දෙදෙනකු හා කාන්තාවක්ද සේවයට ගෙන තිබිණි. මේ කාලය තුළදී මරණකරු සහ විත්තිකරු සමඟ මේ කාන්තාවගේ පෙම් සබඳතාවක් තිබී ඇත. එසේ වුවත් කාන්තාවට සවස ප්‍රවාහන පහසුකම් පවා සලසා දීමට අයිතිකරු විසින් පහසුකම් සලසා ඇත්තේ ඔහුගේ මෝටර් රථයෙනි. නමුත් මේ කාන්තාව නුවන් නවරත්නට (ප්‍රධාන සැකකරුට) නිතර පවසා තිබෙන්නේ බොස්ගෙන් කරදරයි කියාය. ඒ සියල්ලම දරාගත් නුවන් තීරණයක් ගෙන තිබිණි. අප්‍රෙල් මස 17 වැනි දින තලංගම සිට කුරුණෑගල පොතුහැර මැටිකුඹුර නව කාර්යාලය ආරම්භ කරන්න සියලු කටයුතු සිදුවෙමින් තිබියදී නුවන් තිලක් රාජපක්ෂට පවසන්නේ අදාළ කාන්තාව ඔහුට ගැළපෙන්නේ නැති බවත් ඇය තමන් විවාහ කර ගන්නට බලාපොරොත්තුවෙන් සිටිනා බවත්ය. මෙහිදී තිලක් පිහියක් අමෝරාගෙන නුවන්ගේ ඇඟට පනිනවාත් සමගම පිහිය උදුරාගෙන ඒ පිහියෙන් තිලක්ගේ ජීවිතය නැති කරන්නට තරම් නුවන්ගේ වයිරය උත්සන්න විය. මේ වන විට නුවන්ගේ මිත්‍රයාද අසල සිට ඇත. සිද්ධියෙන් පසුව දෙදෙනාම එකතුව මළ සිරුර නාන කාමරයට දමා පිරිසුදු කර ආයතනයද පිරිසුදු කර මෙට්ට කවරයක මළ සිරුර දමා මරණකරුගේ කාරයෙන් මාතලේට පැමිණ උකුවෙල නගරයේ නතර කර උකුවෙල ඉන්ධන හලෙන් පෙට්‍රල් රැගෙන හවස් වන විට රත්වත්ත දෙසට සැකයක් නොසිතන විදිහට ගොස් මළ සිරුරට ගිනි තබා මොවුන් අනුරාධපුර බස් නැවැතුමේ 19 වැනි දින කාරය නතර කර පලාගොස් ඇත. පසුව කාන්තාවක් විසින් මේ පිළිස්සුණු මෘත දේහයේ කකුලක කොටසක් දැක බියට පත්ව රත්තොට පොලිසියට දන්වා ඇත. රත්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හර්බට් සිල්වා මහතා වහා ක්‍රියාත්මක වී ස්ථානය පරීක්ෂා කර මාතලේ අංක 01 බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අජිත් වංශනාථ මහතා විසින් අධිකරණ කටයුතු සඳහා රත්තොට පොලිසියට උපදෙස් ලබා දීමට කටයුතු කර තිබේ.

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

උතුරේ ගොවීන්ට යල කන්නයට පොහොර බෙදා දී අවසන්

මෙවර යල කන්නයේ කුඹුරු වගා කළ ගොවීන්ට සහනාධාර ක්‍රමය යටතේ රසායනික පොහොර බෙදා දීමේ අවසන් අදියර මේ දිනවල එම ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සිදුවෙමින් පවතී. මින් ඉදිරියට රසායනික පොහොර ආනයනය කිරීම, බෙදා හැරීම හා අලෙවිය තහනම් කිරීම හේතුවෙන් ගොවීන්ට රසායනික පොහොර සහනාධාර ක්‍රමය යටතේ නොලැබෙනු ඇතැයි පවසන ගොවිජන සේවා නිලධාරීහු මේ අවසන් අවස්ථාව විය හැකි බවද පවසති. සහනාධාර ක්‍රමය යටතේ අවසන් වතාවට රසායනික පොහොර ගැනීමට උතුරේ ගොවීන් තුළ දැඩි උනන්දුවක් මෙවර දක්නට ලැබිණි.

ඒ. සුමනසේන - කොළොන්නාව සමූහ සහ නන්ද ඒකනායක - කෝට්ටේ මධ්‍යම සමූහ

බත්තරමුල්ල අලෙවි නියෝජිත අභාවප්‍රාප්ත වෙයි

බත්තරමුල්ල ලේක්හවුස් අලෙවි නියෝජිතවරයා වශයෙන් වසර ගණනාවක් පුරා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පාර්ලිමේන්තුව ඇතුළු එම බල ප්‍රදේශයේ සියලු රාජ්‍ය ආයතනවලට පුවත්පත් බෙදා හරිමින් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරමින් සිටියදී වියෝවූ ඇනස්ලි රූපසිංහ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු පසුගියදා (03) කොළඹ බොරැල්ල කනත්ත ආදාහනාගාරයේදී සිදු කෙරිණි. එහිදී පවුලේ ඥාතීන් ඇතුළු විශාල පිරිසක් අවසන් ගෞරව දැක්වීමට එක්ව සිටි අයුරුයි මේ.

ගඟ ඉහල කෝරලේ සමූහ

කොරෝනා අස්සේ කළුවරෙත් ඉන්න වෙයිද?

2019 වසරේ දෙසැම්බර් මස චීනයේ වූහාන් නගරයේ සුළු ව්‍යසන තත්ත්වයක් ලෙස ආරම්භ වූ කොවිඩ් - 19 වසංගතය මේ වන විට මිලියන 154කට අධික සංඛ්‍යාවක් රෝගී කර ලක්ෂ 32කට අධික සංඛ්‍යාවකට ජීවිත අහිමි කරමින් රටවල්හි ආර්ථිකයන් කඩාවැටී මුළු ලෝකයම සිය අඳුරු ආධිපත්‍යයට නතු කර ගැනීමට සමත්ව ඇත. ශ්‍රී ලංකාව තුළ පළමු කොවිඩ් - 19 රෝගියා වාර්තා වූයේ 2020 වසරේ මාර්තු මාසයේය. එතැන් පටන් මේ මොහොත වන විට වසරකට අධික කාලයක් ගෙවී ගොස් අවසන් අතර ලක්ෂයකට අධික රෝගීන් සංඛ්‍යාවක් සහ මරණ 786කට වැඩි ප්‍රමාණයක් මේ මොහොත වන විට වාර්තා වී තිබේ.

පළමු රෝගියා වාර්තා වී වැඩි දවසක් යන්නටත් පෙර මුළු රටම වසා දමන ලදි. මිනිසුන් ගෙවල්වල ව්‍යංගාර්ථයෙන් සිරකරුවන් වූ අතර ඇති හැකි උදවිය කෑම බීම ගේ තුළ පුරවාගෙන සුවෙන් සැපෙන් එම කාලය රූපවාහිනිය ඉදිරියේ හෝ වතු සංග්‍රාමයේ නියැළෙමින් ගත කළ අතර එදිනෙදා ජීවනෝපාය සරිකරගත් බොහොමයක් මිනිසුන් එක් වේලකට හෝ කෑමක් නැතිව හාමත් වෙමින් පණ ගසමින් සිටින්නට විය. හෝටල්, ආපනශාලා, සාප්පු ආදි සිය ගණනින් වෙළෙඳසල් වැසී යද්දී කඩා වැටුණු ආර්ථිකය හා ජන ජීවිතය හේතුවෙන් දහස් ගණනකගේ ව්‍යාපාර හා රැකියාවන් අහිමි වූ අතර එහි අතුරුඵල අදටත් ඔබත් මමත් හමුවේ ඇත.

ඕනෑම රටක ජීවනාලිය වන්නේ එම රටේ බලශක්තියයි. මෙරටෙහි එම ජීවනාලිය භාරව ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයටය. වසර ගණනාවක් නියාමන කොමිෂන් සභා සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර තිබූ කඹ ඇදීම හේතුවෙන් බලාගාර ගණනාවක් අහිමි වූ තත්ත්වයක අස්ථාවර විදුලිබල පද්ධතියක් සහ සුවිශාල පාඩුවක් පමණක් මේ වන විට රටට උරුම වී ඇත. එවන් තත්ත්වයක් තුළ පැමිණි වත්මන් රජය මේ ගැටලුව විසඳීමට ගත් යම් සාධනීය පියවරයන්හි ප්‍රතිඵල හේතුවෙන් මන්නාරම සුළං විදුලිබලාගාරය යථාර්ථයක් කර ගැනීමට මෙන්ම තවත් අඩු වියදම් බලාගාර ගණනාවක් සෑදීමට මුලපිරීමට ද හැකියාව ලැබී ඇත. නමුත් මේ මොහොත වනතුරුත් රජයට හා ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරියට අමතක වූ දෙයක් ඇත. එනම් බලාගාර කොපමණ තිබුණත් යන්ත්‍රසූත්‍ර, ගොඩනැඟිලි හා වෙනත් භෞතික සම්පත්වලින් කෙතරම් ආඪ්‍ය වුවත් එක සම්පතක් නැතිව නම් ඔය ඔක්කොම සම්පත් හබක් බවය. ඒ මානව සම්පතය. මේ වන විට වසංගත තත්ත්වය තුළ පවා අඛණ්ඩව වසරක කාලයක් මුළුල්ලේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සිය රාජකාරිය හැකි උපරිමයෙන් ඉටු කරමින් රටෙහි ජීවනාලිය බඳු විදුලිබල පද්ධතිය පවත්වාගෙන යෑමට කටයුතු කරමින් සිටී. එහෙත් එම සේවකයන් එනම් ලංකා විදුලිබල මණ්ඩලයේ මානව සම්පත කොවිඩ් - 19 වසංගතයෙන් ආරක්ෂා කර ගැනීමට රටෙහි හෝ එම ආයතනයේ පාලනාධිකාරියෙන් නිසි පියවර ගෙන තිබේද යන්න ගැටලුවකි. විදුලිබලය යනු අත්‍යවශ්‍ය සේවාවකි. විදුලිය නැති වෙනවා යනු රෝහලේ ශ්වසනාධාර යන්ත්‍රයෙන් පණනල රැක ගන්නා රෝගියාගේ සිට මුළු රටෙහිම අවසානයට අත වැනීමකි. එම අනතුර වළක්වා ගැනීමට රටක් වශයෙන් ආයතනයක් වශයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විමසා බැලීමේදී අනාවරණය වූ කරුණු අතිශය බරපතළය. 26,000කට අධික සේවකයන් සංඛ්‍යාවක් සිටින ලංකා විදුලිබල මණ්ඩලය තුළ මේ වන විට සියයට 5කටවත් කොවිඩ් - 19 වසංගතයෙන් ආරක්ෂා වීමට මෙරට ගෙන්වා අත්‍යවශ්‍ය සේවාවන්හි නිරත වූ කාර්ය මණ්ඩලවලට දුන් ප්‍රතිජීවක එන්නත් දී නැත. කොවිඩ් - 19 රෝගය බෝ වී ඇති බවට හඳුනාගත් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් නිසි නිරෝධායන පහසුකම් කිසිවක් හඳුන්වාදී නැති අතර මේ ලිපිය ලියන මොහොත වන විටත් විදුලි ඉංජිනේරුවන් ඇතුළු සියයකට අධික සේවකයන් ප්‍රමාණයක් සිය නිවෙස්වල නිරෝධායනය වෙමින් සිටී. සිය ආරක්ෂාව සිය වගකීම පමණක් බවට පවත්නා තත්ත්වය තුළ පාරිභෝගිකයන් සමඟ සම්බන්ධ වෙන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම කාර්යාලවලට පිටස්තර පුද්ගලයන් ඇතුළු වීම නවත්වා ඇති බවත් බිඳවැටුම් ප්‍රතිස්ථාපනය හැර අනෙකුත් නව සේවා සැපයීම් වැනි රාජකාරි තාවකාලිකව නවතා රාජකාරියට ගෙන්වන සේවකයන් අවම කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකක ප්‍රධානින් පියවර ගනිමින් සිටිනා බවට මේ වන විට වාර්තා වී ඇත.

අප සියල්ලෝම මනුෂ්‍යයෝය. රෝගයන්ට මරණයට බිය ඇත්තෝය. ත්‍රිවිධ හමුදාව හා පොලිසිය හැරුණුකොට රාජකාරි කරන අතරතුර වැඩිම දිවි පිදීම් සංඛ්‍යාවක් සිදු වී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලය තුළය. එලෙසින් අඩි සිය ගණන් උඩ නැඟගෙන අවිවැසි, සුළි සුළං, අකුණු සැර නොතකමින් දිවා රෑ දුෂ්කර රාජකාරීන්හි නිරත වන ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් හට කොවිඩ් - 19 වසංගතය හමුවේ මරුවාට අතවනන තත්ත්වයකට පත් වීමට ඉඩ හැර වගකිවයුත්තන් න්‍යායාත්මක විසඳුම්වලට එළැඹී කාලය ගත කිරීම කිසිසේත් පිළිගත නොහැකිය. රෝ බිය හෝ මරබිය හේතුවෙන් හෝ සේවකයන් අසනීප වීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වැසී ඇති මොහොතක කුණාටුවකින් දහස් ගණනකට විදුලිය නැති වුවහොත් ඒ වෙනුවෙන් සේවයේ යොදවන්නේ කවුරුන් ද? විදුලි බලාගාරයක එසේත් නැත්නම් පද්ධති පාලන මධ්‍යස්ථානයක සේවකයන් අතරේ කොවිඩ් පොකුරක් ඇති වී බලාගාරය වසා දැමීමට සිදුවුවහොත් එහිදී එන බලශක්ති හිඟය පාලනය කිරීමට රටෙහි කොටසක විදුලි සැපයුම විසන්ධි කිරීමට සිදුවුවහොත් එහි වගකීම ගන්නේ කවුරුන් ද? විදුලිය නැතිකමින් රෝහල්වල නිරෝධායන මධ්‍යස්ථානවල කටයුතු ඇණහිටීමෙන් අනතුරේ වැටෙනා රෝගී ජීවිතවල වගකීම ගන්නේ කවුරුන් ද? ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් යනු හිතුමනාපයේ ප්‍රතිස්ථාපනය කළ නොහැකි විශේෂ සේවා ප්‍රාගුණ්‍යයක් සහ නිපුණතාවක් සහිත කොට්ඨාසයකි. ඔවුන්ගේ සේවයේ වැදගත්කම හඳුනාගෙන නිසි තීරණ නිසි කලට නොගැනුණොත් එහි ප්‍රතිවිපාක ඉදිරියේදී පොලියත් සමඟ පැමිණෙන බවට සියල්ලෝම අවධාරණය කරගත යුතුය. එසේ වුවහොත් කොරෝනා අස්සේ කළුවරේ ඉන්න වෙනවා පමණක් නොව මරුවා සමඟ ද කරට අත දාගෙන ඉන්න වෙන බවත් මතක් කළ යුතුව ඇත. එහෙයින් එම සේවකයන් කොවිඩ් - 19 වසංගතයෙන් ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට වගකිවයුත්තන් නොවලහා පියවර ගත යුතු බවත් අවධාරණය කළ යුතුය.

මහත්මා දේශපාලනයේ ආදර්ශවත් චරිතය

හිටපු කථානායක මොහොමඩ් අබ්දුල් බාකීර් මාකාර්

හිටපු කථානායක මොහොමඩ් අබ්දුල් බාකීර් මාකාර් මහතාගේ 104 වැනි ජන්ම දිනය මැයි මස 12 වෙනි දිනට යෙදෙයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

දේශපාලනඥයකු පිළිබඳ සුබවාදී සටහනක් මෙකල ලිවීමේදී ඉතා පරිස්සමින් කළ යුත්තකි. ඒ තරමටම දේශපාලනය හා ඇතැම් දේශපාලනඥයන් ගැන රටේ ජනතාව තුළ පවතින්නේ පුදුම පිළිකුලකි. කලකිරීමකි. නමුත් දශක කිහිපයකට ඉහත අපේ රටේ සිටි දේශපාලනඥයන් හා ඔවුන් කළ දේශපාලනය ගැන ලිවීමට කිසිම චකිතයක් ඇති නොවේ. ඒ තරමටම මහත්මා දේශපාලනයක් මෙරට එකල පැවතිණි.

නාගරික මන්ත්‍රීවරයකු, නගරාධිපතිවරයකු, පාර්ලිමේන්තු මහජන මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය කථානායකවරයකු, ඇමැතිවරයකු, පාර්ලිමේන්තුවේ කථානායකවරයකු, ආණ්ඩුකාරවරයකු, ආදී වශයෙන් විවිධ ක්ෂේත්‍රවල අඩසියවසක කාල පරාසයක දේශපාලනයේ නියැළුනත් සිය දේශපාලන ජීවිතයේ කැත නමක් ඇති නොකර ගත්, දේශපාලනඥයකු හා අදත් සුවඳ හමන ඔහුගේ දේශපාලනය ගැනත් ලිවීමට ලැබීමත් භාග්‍යයක් කොට සලකමි.

ඒ දේශපාලනඥයා මොහොමඩ් අබ්දුල් බාකීර් මාකාර් මහතාය.

වර්ෂ 1917 මැයි මස 12 වෙනිදා බේරුවල, මරදානෙදි ඔහු ජන්මලාභය ලැබීය. අදට ඔහුගේ 104 වෙනි ජන්ම දිනය යෙදේ. බේරුවල නගර සභාවෙන් දේශපාලනයට පිවිසි බාකීර් මාකාර් 1960 දී මහජන මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවට ගියේය. 1965, 1977 සියලු මැතිවරණ ජයගත් ඔහු පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයා ලෙස වසරක් ක්‍රියා කොට 1978 දී පාර්ලිමේන්තුවේ කථානායකවරයා විය. කොළඹ කොටුවේ ගාලු මුවදොර පිහිටි පරණ පාර්ලිමේන්තුවේ අවසන් කථානායකවරයා වූ අතර ශ්‍රී ජයවර්ධනපුර නව පාර්ලිමේන්තුවේ ප්‍රථම කථානායකවරයා ද විය. 1983 දී අමාත්‍යවරයකු ලෙසත් 1988 දී දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා ලෙසත් රටට සේවය කළේය.

තමන් ගෙන ගිය වැඩපිළිවෙළ මහජන සේවය තමන් කළාටත් වඩා ඉහළින්ම සිදුකිරීමට උගත්, බුද්ධිමත්, අත්දැකීම් ඇති, තරුණ නායකයකු බේරුවලට පමණක් නොව මුළු රටටම දුන්නේය. ඒ එතුමන්ගේ ජ්‍යෙෂ්ඨ පුත් නීතිඥ ඉමිතියාස් බාකීර් මාකාර් මහතාය. සේවය සිය දහස් ගුණයකින් ඉහළ ගියේය. ජනතාවට ඉමිතියාස් ශක්තියක්, බලයක් විය. පිය පුතු සුසංයෝගයෙන් බේරුවලට, කළුතර දිසාවට පමණක් නොව මුළු මහත් රටටම, ජනතාවටම සිදුවූ යහපත සැලසුන සෙත අපිරිමිත. අමිලය.

විශේෂයෙන්ම බේරුවල මැතිවරණ කොට්ඨාස සිංහල, මුස්ලිම්, දෙමළ ජාතිකයින් මෙන්ම බෞද්ධ, කතෝලික, ඉස්ලාම්, හින්දු ආදී බහුජාතික, බහු ආගමික ජනතාව ජීවත් වන ප්‍රදේශයකි. මේ ජාතීන් හා ආගමිකයින් අතර කිසිම භේදයක් ඇති නොවන අන්දමින් සුහදශීලි සහජීවනයෙන් කල් යවන ජනතාවක් වෙසෙන සාමකාමී ප්‍රදේශයක් බවට පත් වූයේ මෙතුමන්ගේ ධූර දර්ශී මඟ පෙන්වීමෙන්ය. නිරන්තරයෙන් මෙතුමන් භේද ඇති නොවන සමඟිය තහවුරු වන ක්‍රියාදාමයක් මුළු කොට්ඨාසය පුරාම ක්‍රියාත්මක කරවූයේය. ජනතාව ප්‍රකෝප කරවන භේද කරවන කිසිවකට ඉඩ නොතැබූ අතර සමඟිය තහවුර කළේය. සාමකාමීව කල්යවන ජනතාව අදත් එය අගය කරති.

වෘත්තියෙන් නීතිඥවරයකු වූවද අහිංසකයන්ගේ මුදල්වලින් සාක්කු පුරවන "කළු කබා"කාරයකු නොවූයේය. දුප්පතුන් වෙනුවෙන් නොමිලයේම උසාවියේ පෙනී සිටියේය.

මැතිවරණවලට පොහොසතුන් දෙන පඬුරු, පාක්කුඩම් ප්‍රතික්ෂේප කළේ ඒ අයගේ අතකොළු බවට තමන් පත්වන නිසාය. ඔහු පසුපස සිටියේ ඔහුගෙන්ම කිසියම් මෙහෙයක් ගත් අය හා ඔහුගේ දර්ශනය අගය කළ අයයි. සෑම මැතිවරණයකදී ජය ගන්නට ඒ සහාය ඔහුට හොඳටම ප්‍රමාණවත් විය. වර්තමාන දේශපාලනඥයින්ට ඔහුගේ මේ දර්ශනයෙන් ගත හැකි පාඩම් එමටය.

ජනතා සේවය තරම් සතුටක් ඔහුට තවත් නැත. තමන් නිසා කෙනෙකු රැකියාවක් ලබතොත් ගමට පාලමක්, ගෙයක්, පාරක්, විදුලිය, පාසලක් ලැබුණොත් එයයි ඔහුගේ සතුට. මහජන සේවය පැතුවා මිස මහජනයා ගසා කන ව්‍යාපාරවලට කිසිදා හවුල් නොවූයේය. මෙයට හොඳම නිදසුනක් දක්වතොත් මෙතරම් කාලයක දේශපාලනය කරමින් විවිධ තනතුරු දැරුවත් අවසන් කාලයේ ගමන් බිමන්වලට ඔහුටම කියා වාහනයක්වත් නොතිබුනේය. එය මා සටහන් කරන්නේ අගෞරවයකට නොව එතුමන්ට ගෞරවයක් ලෙසිනි.

වර්තමානයේ පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතදීත් ඇතැම් මහජන නියෝජිතයින් හැසිරෙන අන්දම පිළිකුල් සහගතය. විනයක් සංවරයක්, යහපත් පැවැත්මක් නොමැතිව මේ අය ගෙන යන ක්‍රියා කලාපය මහජනතාව හෙළා දකිති. මැතිවරණ සමයේදී තමන් කැමැත්ත ප්‍රකාශ කර මැතිසබයට මේ අය තෝරා යැවූයේ කොතරම් විශ්වාසයකින් යුතුවද? කොතරම් බලාපොරොත්තු ඇතිවද? මෙවන් යුගයක බාකීර් මාකාර් වැනි පරිණත මහත්මා දේශපාලන කළ දේශපාලනඥයන්ගෙන් උගත හැකි පාඩම් එමටය.

එදා ඔහු තමන්ව පාර්ලිමේන්තු යැවූ ඡන්ද දායකයන්ගේ ගෞරවය ආරක්ෂා කළේය. සෑම කල්හිම සුහදශීලීව තමන්ගේ මත ඉදිරිපත් කරමින් විවිධාකාර වාද විවාද සිදු කළේය. තමන්ගේ මෙන්ම ප්‍රතිවාදියාගේ ද මතයන්ට නිහඬව ගරු කළේය. සවනු දුන්නේය. ඒ අදහස් ද අගය කළේය. එමෙන්ම විවේචනය කෙරුණි. අශ්ලීල වචන, පාව්ච්චි නොකළේය. ගුටිබැට නොදුන්හ. තමන් පත්කර එවූ ජනතාවගේත් තනතුරේත් උත්තරිතර පාර්ලිමේන්තුවේත් ගෞරවය ආරක්ෂා කළේය.

කුමන මතිමතාන්තර දැරුවත් කුමන පක්ෂයක වුවත් මැතිසබය තුළත් පිටතදීත් සහෝදරත්වයෙන් යුතුව කටයුතු කළේය. හැසිරුණේය. මහත්මා දේශපාලනය කළ බාකීර් මාකාර් වැනි දේශපාලනඥයින්ගෙන් අපේ වත්මන් කලහකාරී අසංවර දේශපාලනඥයින්ට උගත හැකි පාඩම් එමටය.

බාකීර් මාකාර් මහතා කුමන දර්ශනයක් අනුව ක්‍රියා කළා දැයි ඔහුගේම ප්‍රකාශ තුළින් ප්‍රත්‍යක්ෂ කරගත හැක.

"අසීමිත මුදල් උපයන ව්‍යාපාරවලට මම ඇලුම් නොකරමි. උත්තරිතර මනුෂ්‍යත්වය තුළින් මතුවන මානව දයාවත්, ආගමික භක්තියත් ඉන් ඈත් වෙතැයි මා තුළ බියක් ඇත්තේ නිසයි"

"වැඩි ආර්ථික අංශයේ පොහොසත්කම මනුෂ්‍යත්වය පලවා හරිති. මනුෂ්‍යත්වය පලා ගිය ජීවිතයක කිසිදු හරයක් නොමැත" මේ එතුමාගේ දර්ශනයයි. සමාජවාදී බෝඩ්ලැල්ල කරේ එල්ලාගෙන ගිරිය පැළෙන්න මොර දෙන ඇතැම් අපේ රටේ සමාජවාදීන් තුළවත් ප්‍රායෝගිකව මෙවැනි දර්ශනයක් දක්නට ලැබේ දැයි සැකයකි.

"ජාති බෙරය, ආගම් බෙරය, කුල බෙරය, වැයීමෙන් රටක ජනතාව සමෘද්ධිමත් කළ නොහැක. සියලු ජාතික, සියලු සාමාජික එක්වීමකින් රට සමෘද්ධිමත් කළ හැකි" කී ඔහු වරක් මෙසේ ද පැවසීය.

"මා සුළු ජාතිකයකු වූවත් මට රටේ තුන්වන පුරවැසියා ලෙස සලකන කථානායක තනතුරට යාමට හැකි වූයේ මහ ජාතිය සමඟ මා ඉදිරියට ගිය නිසාය. මේ පණිවිඩය අන් සියලු සුළු ජාතිකකුටම මම දෙනවා. සිංහලයන් සමඟ ඉදිරියට ගොස් මේ රට නංවමු. ප්‍රශ්න විසඳා ගනිමු."

දේශපාලනඥයන් තුළ නිරන්තරයෙන් තිබිය යුතු මනුෂ්‍යත්වයත් අවංකත්වයත් ඔහු අගය කළේය. දිවි හිමියෙන් එය ආරක්ෂා කළේය. ජනතා නියෝජිතවරයකු හැටියට ජනතාවට ගෞරවයක් ලෙසට හැසිරුණේය. ක්‍රියා කළේය. මන්ත්‍රීකම තමන් හා තම පවුලේ අයගේ සුඛ විහරණය උදෙසා මෙහෙයන් කර ගන්නට නොයොදවා ගත්තේය. ජනතාවගෙන් ඈත්වී සිටීම නොව අගය කළේ දවසේ පැය 24 පුරාම ජනතාව සමඟ විසීමය. නිවසත්, නිල නිවසත්, පාර්ලිමේන්තුවත් ජනතාව වෙනුවෙන් විවෘතව තිබුණේය. අදත් ඔහුගේ සේවය අගය කරන්නේ සිහිපත් කරන්නේ ඒ නිසාය. වත්මන් දේශපාලනඥයන්ට බාකීර් මාකාර් මහතාගෙන් උගත හැකි පාඩම් එමටය.

හේරස් ප්‍රනාන්දු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
සෞඛ්‍ය අමාත්‍යාංශය
ලංසු සඳහා ආරාධනයයි

දිනය	2021-05-10
ණය/ ප්‍රදාන අංකය සහ ශීර්ෂය	ණය 3727/G0618-SRI : සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය	HSEP/PIU/NCP/W16/01/2020 වැඩ ප්‍රසම්පාදනය - 2 වන වටය - අදියර 1 (4 PMCU & 1 DHC) අනුරාධපුර දිස්ත්‍රික්කය
ලොට්	(W 16) ලොට් 'ඒ' ඇතාකඩ PMCU 1 (W 16) ලොට් 'බී' කටියාව PMCU 2 (W 16) ලොට් 'සී' ලබුතෝරුව PMCU 3 (W 16) ලොට් 'ඩී' ආඩියාගල DHC 1 (W 16) ලොට් 'ඉ' මහසෙන්පුර PMCU 4
ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය	2021-06-04

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු සංවර්ධන බැංකුව වෙතින් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අරහයා ණය මුදලක් ලැබී ඇත. මෙම මුදලින් කොටසක් ඉහත දැක්වෙන කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රභවයන් සහිත රටවල ලංසුකරුවන්ට ලංසුකරණය විවෘතය.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යාලය යටතේ කොළඹ - 08, කිංසි පාරේ, නො.3/19, සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ ("සේව්‍යයා") විසින් පහත විස්තර කොට ඇති පරිදි පවත්නා ගොඩනැගිලි හා පහසුකම් නවීකරණය කිරීම සහ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන හතර නව ඉදිකිරීම ඇතුළු කාර්යයන් ඉදිකොට සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම	අලුත්වැඩියාව/ OPD - ප්‍රදේශය වර්ග අඩි	නව ඉදිකිරීම්/ OPD ප්‍රදේශය වර්ග අඩි	සම්පූර්ණ ප්‍රදේශය වර්ග අඩි
(W 16) ලොට් 'A' ඇතාකඩ PMCU 1	1670	4810	6480
(W 16) ලොට් 'B' කටියාව PMCU 2	1720	2150	3870
(W 16) ලොට් 'C' ලබුතෝරුව PMCU 3	-	4809	4809
(W 16) ලොට් 'D' ආඩියාගල DHC 1	1870	2460	4330
(W 16) ලොට් 'E' මහසෙන්පුර PMCU 4	5225	1870	7095

03. ආ.සං.බැංකුවේ තනි පියවර : තනි කවරය ක්‍රියාපටිපාටියට අනුකූලව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු ලබන අතර, ලංසුකරණ ලිපිලේඛනවල විස්තර කර ඇති පරිදි යෝග්‍යතාපූර්ණ රටවල ලංසුකරුවන්ට විවෘතය.

04. පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් සහිත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් පමණක් මෙම ලංසුකරණයට සහභාගි විය යුතුය.

අ. මූල්‍ය

(i) **ඓතිහාසික මූල්‍යමය කාර්ය සාධනය :**

ලංසුකරුගේ වර්තමාන මූල්‍යමය තත්ත්වයේ ස්ථාවරත්වය ඔප්පු කර දැක්වීම පිණිස පසුගිය වසර තුන සඳහා (2017/2018, 2018/2019 සහ 2019/2020) විගණිත මූල්‍ය නිවේදන ඉදිරිපත් කිරීම.

(ii) **වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය :**

ලංසුකරුට (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව) පසුගිය වසර 3 තුළ ක්‍රියාත්මක වන හෝ සම්පූර්ණ කළ කොන්ත්‍රාත් සඳහා ලැබූ සහතික කළ ගෙවීම් එකතුව ලෙස ගණනය කළ (පහත වගුව බලන්න) වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් අවම සාමාන්‍යයක් සතුවිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ.)

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම	ශ්‍රී ලං. රු. මිලියන
(W 16) ලොට් 'A' ඇතකඩ PMCU 1	62.67
(W 16) ලොට් 'B' කටියාව PMCU 2	47.65
(W 16) ලොට් 'C' ලබුතෝරුව PMCU 3	59.77
(W 16) ලොට් 'D' ආඩියාගල DHC 1	37.15
(W 16) ලොට් 'E' මහසෙන්පුර PMCU 4	44.53

(iii) **මූල්‍ය සම්පත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර හා හවුල්කාරිත්ව ඇතුළුව - අදාළ වේ නම්) තමන්ගේ වර්තමාන කොන්ත්‍රාත් බැඳීම් සඳහා වන අවශ්‍යයෙන් කළ යුතු මුදල් ගෙවීම් අඩු කොට, තම මූල්‍ය සම්පත් පහත දැක්වෙන කොන්ත්‍රාත් විෂයයන් සඳහා වන සම්පූර්ණ අවශ්‍යතාවයන් සපුරාලන බව හෝ ඉක්මවා යන බව හෝ පැහැදිලි කර පෙන්වා දිය යුතුය. (පහත දක්වා ඇති අවශ්‍යතාවයන් එක් එක් සමූහය (ලොට්) සඳහා වෙන් වෙන්ව අදාළ වේ)

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම	(ලොට් අංක)	ශ්‍රීලං.රු. මිලියන
(W 16) ලොට් 'A' ඇතකඩ	PMCU 1	10.15
(W 16) ලොට් 'B' ඇතකඩ	PMCU 2	7.72
(W 16) ලොට් 'C' ලබුතෝරුව	PMCU 3	9.68
(W 16) ලොට් 'D' ආඩියාගල	DHC 1	6.02
(W 16) ලොට් 'E' මහසෙන්පුර	PMCU 4	7.21

ආ. පළපුරුද්ද :

(i) **සමාන ස්වභාවයේ හා ප්‍රමාණයේ කොන්ත්‍රාත් :**

ලංසුකරු (හවුල් ව්‍යාපාර සහ හවුල්කාරිත්ව ඇතුළුව - අදාළ වේ නම්) යෝජිත කාර්යයන්ට සමාන වන, එක් එක් කොන්ත්‍රාත්තුවෙහි තම සහභාගිත්වයේ අගය පහත දැක්වෙන අගයන් ඉක්මවා යන, පසුගිය වසර පහ තුළ සාර්ථකව හෝ විදූමානව කොන්ත්‍රාත්කරුවකු, හවුල් ව්‍යාපාර සහකරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු ලෙස අඩුතරමින් එක් කොන්ත්‍රාත්තුවකට හෝ සහභාගි වී තිබිය යුතුය.

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම	(ලොට් අංක)	ශ්‍රීලං.රු. මිලියන
(W 16) ලොට් 'A' ඇතාකඩ	PMCU 1	25.07
(W 16) ලොට් 'B' කටියාව	PMCU 2	19.06
(W 16) ලොට් 'C' ලබුතෝරුව	PMCU 3	23.91
(W 16) ලොට් 'D' ආඩියාගල	DHC 1	14.86
(W 16) ලොට් 'E' මහසෙන්පුර	PMCU 4	17.81

(ii) එක් ලංසුකරුවකු සාර්ථක ලංසු (අඩුම මිල නියම කළ ප්‍රතිචාරාත්මක) කීපයක් ඉදිරිපත් කරයි නම් ලංසු ඇගයීමේදී පහත දැක්වෙන, ලංසුවෙහි ඉදිරිපත් කර ඇති පරිදි, එකතු කළ අවශ්‍යතාවයන් සපුරාලීමට ඔහු සතු ධාරිතාවය ද වත්කමක් ලෙස ඇතුළත් කෙරෙනු ඇත.

- වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුම් සාමාන්‍යය
- මූල්‍ය සම්පත්
- වෙන්කළ හැකි උපකරණ සහ
- ක්ෂේත්‍රගත කරන පිරිස්

සුදුසුකම් නිර්ණායකයන් ලංසුකරණ ලියැවිල්ලේ වඩාත් මැනවින් විස්තර කොට ඇත.

05. වැඩිමනත් විස්තර ලබා ගැනීමටත්, ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් වැඩකරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළ (08.30 පැය සිට 16.15 පැය දක්වා) පහත සඳහන් අය අමතන්න.

ව්‍යාපෘති ඉංජිනේරු,
සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කාර්යාලය,
පැරණි MOH ගොඩනැගිල්ල,
බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල : hsep.piu.ncp@gmail.com
දුරකථන : 077-7467814
ෆැක්ස් : 025-2227308

06. ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන ලබාගැනීමට යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්;

* අනුරාධපුර දිස්ත්‍රික්කය (4PMCU&1DHC) - අදියර 1 වටය 2 වැඩ ප්‍රසම්පාදනය W16 සඳහා ලංසුකරණ ලිපිලේඛන ඉල්ලා ඉහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම.
* වගුවේ අයිතම අංක 08 යටතේ සඳහන් කර ඇති පරිදි ආපසු නොගෙවන (ශ්‍රී ලංකා රුපියල්) ගාස්තුවක් 2021-06-08 දින 15.00 පැයට හෝ ඊට පෙර ගෙවීම.
* ගෙවීම් කළ යුත්තේ **"සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ගිණුම් අංක 84149856"** නමින් බැංකු අණකරයක් මගින් හෝ කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය දක්වා මුදලින් හෝ ලංකා බැංකුවේ ගිණුම් අංක 84149856 වෙත සෘජුව තැන්පත් කිරීම මගිනි.

07. සේව්‍යයා විසින්, **5 වන ජේදයේ සඳහන් ලිපිනයේදී 2021.05.31 19 දින 1030 පැයට පූර්ව - ලංසු රැස්වීමක්** මෙහෙයවනු ඇත.

08. **නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය කාර්යාලය,
පැරණි ගොඩනැගිල්ල, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය, ශ්‍රී ලංකාව.

යන ලිපිනයට ඔබේ ලංසු ලංසුකරණ ලියැවිල්ලේ විස්තර කොට ඇති පරිදි ලංසු සුරක්ෂණය සමග **2021-06-09 දින 1030 පැයට** හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක ආකෘතියෙන් ඉදිරිපත් කරන්නේ නම්, එය ලංසු ලිපිලේඛනවල 4 වන කොටසේ සඳහන් ආකෘතිය යොදගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් **"සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ"** නමට නිකුත් කළ බැංකු ඇපකරයක් විය යුතුය.

සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම (ලොට්)	ලංසු සුරක්ෂණ (ශ්‍රී ලං. රු.)	ආපසු නොගෙවන ගාස්තුව/ ශ්‍රී ලං. රු.
(W 16) ලොට් 'A' ඇතාකඩ PMCU 1	627,000.00	5,000.00
(W 16) ලොට් 'B' කටියාව PMCU 2	476,000.00	5,000.00
(W 16) ලොට් 'C' ලබුතෝරුව PMCU 3	598,000.00	5,000.00
(W 16) ලොට් 'D' ආඩියාගල DHC 1	371,000.00	5,000.00
(W 16) ලොට් 'E' මහසෙන්පුර PMCU 4	445,000.00	5,000.00

09. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කොට විවෘත නොකරම ආපසු එවනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී සිදු කෙරේ.

10. ලංසු, විවෘත කිරීමේ දින සිට දින 90 ක් සඳහා වලංගු විය යුතුය. ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට දින 118 ක් සඳහා වලංගු විය යුතුය.

11. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හෝ උතුරු මැද පළාත් සභාවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හෝ ලංසුකරු විසින් ලංසු පිළියෙළ කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී දරනු ලබන කිසිදු පිරිවැයක් සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.

සභාපති/ ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
නො.3/19, කිංසි පාර, කොළඹ - 09, ශ්‍රී ලංකාව.
දිනය : 2021-05-10

ලුහුඬු දැන්වීම්

රථවාහන



101

සුඛෝපභෝගී රථ වාහන

විකිණීම

NCNA-2087 TATA 1510 BUS ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034484

106

මෝටර් කාර් රථ

විකිණීම

WPKR - 7335 TATA NANO CAR ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034509

108

නිසාන් කාර් රථ

විකිණීම

64-2004 **Nissan** Sunny Car ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034417



117

වෑන් රථ

විකිණීම

53-1510 **Toyota** Hiace Van ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034539

54-5969 **Nissan** vanette Van ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034544

119

බස් හා ලොරි රථ

විකිණීම

WPPS-2965 Mahindra Maximo Truck ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034513

122

යතුරු පැදි හා ත්‍රීරෝද රථ

විකිණීම

CPBIU-9698 Honda Hornet APDDS-3 ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034420

EPBIT-6925 Hero HF-Deluxe ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034423

EPBIZ-1593 Honda CB 160X APDS ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034425

NCBIW-3498 Hero HF Deluxe Motor Bike ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034456

WPAAU-7199 Bajaj Three Wheeler ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034505

WPBIW - 6478 Yamaha FZ S V3 Bike ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034507

124

ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ

විකිණීම

CPRC - 4804 John Deerer Tractor ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 077-0107270, 077-4789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 034422

රැකී රක්ෂා

301

රැකීරක්ෂා

සේවා

රැකියා අවස්ථා - ඔබත් වයස අවුරුදු 18 ත් 45 ත් අතර අයෙක්ද. ලංකාවේ ප්‍රමුඛ පෙලේ කඩදාසි බෑග් නිෂ්පාදන සමාගමට රැකියා අවස්ථා සඳහා අයදුම්පත් බාර ගැනේ. 35,000 කට වැඩි වැටුපක්. * දිරි දීමනා, * ETF / EPF දීමනා, * නවාතැන් පහසුකම්, * ආහාර දීමනා, * වැටුප් වැඩිවීම්, * ප්‍රවාහන පහසුකම්. ඔබ සිහින මවන ජීවිතය ජය ගන්න අප සමග එක්වන්න ..... දු. අං. 0773476515 / 0112520450. 034910

ලංසු ආරාධනය සඳහා සංශෝධනයයි (IFB)

උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය (SDCN) සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සැළසුම් කිරීම, සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ලංසු සඳහා ආරාධනය අංක : MOD/SDCN/01/2021

1. මෙම දැන්වීම, 2021 මාර්තු 14 වන දින සිළුමිණ පුවත්පතෙහි පළකරන ලද ඉහත කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු ආරාධනය හා බැඳේ.
2. ඉහතින් යොමු කරන ලද ලංසු ආරාධනය සඳහා පහත සඳහන් සංශෝධන සිදු කොට ඇත. ඒ අනුව .
   - ලංසු භාර ගැනීම අවසන් කිරීමේ හා ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව, 2021-05-25 වන දින 1100 පැය දක්වා දීර්ඝ කොට ඇත.
   - ලංසු, 2021 සැප්තැම්බර් 21 වන දින දක්වා වලංගු විය යුතුය.
   - අදාළ ලංසු ඇපකරය, 2021 ඔක්තෝබර් 18 වන දින දක්වා වලංගු විය යුතුය.
3. පෙර පළකරන ලද ලංසු ආරාධනා දැන්වීමෙහි සඳහන් අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතී.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, හෝමාගම, පිටිපන, මොරගහහේන පාරේ, මාහේනවත්තේ, ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ, මූලස්ථානයේ, උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් (දුරකථන (+94) 112421357 / ෆැක්ස් : (+94) 112437923 / ඊමේල් : dg@crd.lk), 2021-05-24 වන දින දක්වා, රාජකාරි දිනවල, පෙරවරු 8.30 හා පස්වරු 4.30 අතර කාලය තුළ ලබාගත හැක.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර, පැලවත්ත, බත්තරමුල්ල.
ශ්‍රී ලංකාව.

දුරකථන : 0094-11-2390719
ෆැක්ස් : 0094-11-2390720
ඊමේල් : procurement@defence.lk

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

රුපියල් මිලියන 20,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව

2021 මැයි මස 12 වැනි දින 09.00% 2025 "A" කාණ්ඩය යටතේ රුපියල් මිලියන 10,000 ක සහ 09.00% 2028 "B" කාණ්ඩය යටතේ රුපියල් මිලියන 10,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කෙරේ.

මෙම නිකුතුවට අදාළ විස්තර පහත දැක්වේ

කාණ්ඩය	09.00%2025'A'	09.00%2028'B'
සු.හ.ජා. අංකය (ISIN)*	LKB01225E019	LKB01528E016
වෙන්දේසියට ඉදිරිපත් කරන ප්‍රමාණය	රුපියල් මිලියන 10,000	රුපියල් මිලියන 10,000
පිළිගනු ලබන උපරිම එලදෑ අනුපාතිකය (%)**	7.07	7.98
පොලී අනුපාතිකය	වර්ෂයකට සියයට 09.00	වර්ෂයකට සියයට 09.00
නිකුතුවේ දිනය	2013 මැයි 01 වැනි දින	2013 මැයි 01 වැනි දින
කල් පිරෙන දිනය	2025 මැයි 01වැනි දින	2028 මැයි 01 වැනි දින
පොලී ගෙවන දිනයන්	මැයි 01 සහ නොවැම්බර් 01 වැනි දින	මැයි 01 සහ නොවැම්බර් 01 වැනි දින
උපචිත පොලිය	රුපියල් 100 ක් සඳහා රු. 0.3913	රුපියල් 100 ක් සඳහා රු.0.3913
වෙන්දේසි කරන දිනය	2021 මැයි මස 12 වැනි බදාදා දින	
වෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව	2021 මැයි මස 12 වැනි බදාදා පෙ.ව. 11.00 ට	
ගෙවීම් කළ යුතු දිනය	2021 මැයි මස 17 වැනි දින	
වෙන්ඩර් සඳහා අවම මුදල	රුපියල් මිලියන පහක් (5,000,000) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (1,000,000) ගුණිතයන්ගෙනි.	

ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. පොලිය ගෙවූ අවසාන දිනයේ සිට පියවීම කරනු ලබන දිනට උපචිත පොලිය රහිත මිල පදනම් කර බැඳුම්කර සඳහා ලංසු කැඳවනු ලැබේ. වෙළඳපොළ තත්ත්වයන් මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් කාණ්ඩය යටතේ වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණයට නොවැඩි ඕනෑම ප්‍රමාණයක් පිළිගනු ලැබිය හැකිය.

පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් සහ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගන්නා ලෙස මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

ඇක්සියුට් සෙකියුරිටිස් ලිමිටඩ්	2206297	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරිස් පීඑල්සී	2639883
ලංකා බැංකුව	2541938	මහජන බැංකුව	2206783
කැපිටල් එලයන්ස් ලිමිටඩ්	2317777	සම්පත් බැන්ක් පී.එල්. සී	2305842
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	2332319	සෙලාන් බැන්ක් පීඑල්සී	2456340
එන්. එස්. බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්	2425010	වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටිස් ලිමිටඩ්	2675096

* **සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය**
** **මෙම අනුපාතිකයන්, ප්‍රතිපත්ති තීරණයන්ට අනුකූලව වෙනස් විය හැකි අතර, එම වෙනස්වීම් ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවි දැන්වීමේ නිවේදනය කරනු ලැබේ.**

ශ්‍රී ලංකා මහ බැංකුව,
30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : ෆැක්ස් 2477011 : 2477687
http://www.cbsl.gov.lk

එම්. ඉසෙඩ්. එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරී/
ලේඛකාධිකාරී.

ටෙන්ඩර් දැන්වීමයි

වවුනියා නගර සභාව, වවුනියාව

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - (PSDG - 2021) - 2021

වවුනියාව, වවුනියා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් සැපයුම්කරුවන් වෙතින් මුද්‍ර, තබන ලද ටෙන්ඩර් පහත වගුවේ සඳහන් ප්‍රසම්පාදනය සඳහා කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	වැඩ විස්තරය	ඇස්තමේන්තු ගත වටිනාකම	අවශ්‍ය ටෙන්ඩර් ඇපකරය	
			ඇපකරයේ වටිනාකම	වලංගු කාලය
NP/14/43(02)/PO/ PSDG/2021	Purchasing of Plastic mini Shredder machine	1.5 Million	30,000.00	10.08.2021

01. ටෙන්ඩර් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, මෙම ක්ෂේත්‍රයේ සහ ඉදිරිපත් කරන වර්ගයේ සන්තාමය ඇති යන්ත්‍ර දිවයින පුරා අලෙවි කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳව අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. වැඩිදුර තොරතුරු ටෙන්ඩර් ලිපිලේඛනයේ සඳහන් කර ඇත.
02. මේ සඳහා උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් වැඩිදුර තොරතුරු වවුනියාව, වවුනියා නගර සභාවේ සභාපති වෙතින් **(දුරකථන අංකය: 024-2222564, ෆැක්ස් අංකය : 024-2222736)** ලබාගත හැකිය. තවද, ඉහත සඳහන් ස්ථානයේදී 2021.05.24 වෙනි දින දක්වා රාජකාරී දිනයන් හි **09.00 පැය හා 14.00 පැය** අතර, ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
03. ආපසු ගෙවනු නොලබන **රු. 1,500.00 ක** ගාස්තුවක් (බදු හැර) ගෙවීමෙන් අනතුරුව **2021.05.10 වෙනි දින සිට 2021.05.24 වෙනි දින දක්වා 09.00 පැය හා 14.00 පැය අතර,** වවුනියාව නගර සභාවේ සභාපති වෙතින් මේ සඳහා උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ටෙන්ඩර් ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබාගත හැකිය. මෙම ගාස්තුව මුදලින් ගෙවිය යුතුය.
04. ටෙන්ඩරය, පිටපත් දෙකකින් සකස් කර **2021.05.25 වෙනි දින පෙ.ව. 10.30** ට පෙර ලැබෙන පරිදි, **"සභාපති, වවුනියා නගර සභාව, වවුනියාව"** යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.
05. ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අවසාන දිනයේ සිට **දින 49 ක්** (හතළිස් නවයක් - 2021.07.13 වෙනි දින දක්වා) ලංසු වලංගු විය යුතුය.
06. ටෙන්ඩර් ඇපකරයේ වටිනාකම ඉහත වගුවේ සඳහන් පරිදි වේ.
07. ටෙන්ඩර් කැඳවීම පිළිබඳ පූර්ව රැස්වීම 2021.05.18 වෙනි දින 14.30 පැයේදී වවුනියා නගර සභා කාර්යාලයේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන ලංසුකරුවන් මෙම රැස්වීමට සහභාගි විය හැකිය. මේ සඳහා කිසිදු ගෙවීමක් සිදු නොකෙරේ.

සභාපති, වවුනියාව නගර සභාව,
වවුනියාව.
2021.05.10

ලංසු සඳහා ආරාධනය

සෞඛ්‍ය අමාත්‍යාංශය

පළාත් මහ රෝහල - බදුල්ල

බදුල්ල පළාත් මහ රෝහල් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සැපයුම් ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ලංසුපත් කැඳවනු ලැබේ.

අනු අංකය	ලංසු අංකය	සැපයුම	ප්‍රමාණය	ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු (රු.)	ආපසු ගෙවන ලංසු ඇපකරය (රු.)
Laboratory Equipment					
01	PGHB/ FV/02/21	Supply & installation of Immunohistochemistry Machine	01	3,500.00	200,000.00
02	PGHB/ FV/03/21	Supply & installation of Grossing Station with Fully Automated Neutralization Device	01	2,400.00	130,000.00
03	PGHB/ FV/04/21	Supply & installation of Binocular Microscope	01	1,000.00	10,000.00
04	PGHB/ FV/05/21	Supply & installation of Laboratory Centrifuge	01	1,000.00	20,000.00
05	PGHB/ FV/06/21	Supply & installation of Micro Centrifuge	01	1,000.00	14,000.00
06	PGHB/ FV/07/21	Supply & installation of Fully Automated HPLC Analyzer for HBA1C	01	2,200.00	120,000.00
07	PGHB/ FV/08/21	Supply & installation of Water Purification System	01	1,300.00	60,000.00
08	PGHB/ FV/09/21	Supply & installation of Reagent Storage Refrigerator	01	1,300.00	60,000.00
09	PGHB/ FV/10/21	Supply & installation of Refrigerated Centrifuge	01	1,000.00	40,000.00
10	PGHB/ FV/11/21	Supply & installation of Serology & Immunology Analyzer	01	1,600.00	90,000.00
12	PGHB/ FV/12/21	Supply & installation of Biosafety Cabinet	01	1,000.00	40,000.00
13	PGHB/ FV/13/21	Supply & installation of - 80 C Freezer	02	1,600.00	80,000.00
14	PGHB/ FV/14/21	Supply & installation of - 20 C Freezer	01	1,000.00	30,000.00
Other Equipment					
16	PGHB/ FC/01/21	Supply & installation of Digital Duplicator	01	1,000.00	10,000.00
17	PGHB/ FC/02/21	Supply & installation of Humidifier for ICU Ventilators	05	1,000.00	40,000.00
Works					
17	PGHB/AF/05/ 2021	Central Air conditioner Maintenance and Repair Services for the Year 2021/2022 at Provincial General Hospital, Badulla	12	1,000.00	20,000.00
18	GHB/AC/NCB/ 2020/08	Supply and Established Two 40 x 9.5 feet and Two 20 x 8 x 9.5 feet Converted Shipping Containers for Biomedical Engineering Unit (Workshop and Office)	04	1,500.00	180,000.00

02. ජාතික තරගකාරී ලංසුක්‍රමය (NCB) අනුව ලංසු කැඳවනු ලැබේ.
03. මේ පිළිබඳ වැඩිදුර විස්තර සතියේ වැඩකරන දිනවල කාර්යාල වේලාවන්හිදී ගණකාධිකාරී ඇමතීමෙන් (දිගුව 1103) හෝ පහත සඳහන් රෝහල් වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.
04. සුදුසුකම්ලත් ලංසුකරුවන්ට එක් ලංසුවක් සඳහා ආපසු නොගෙවන ඉහත සඳහන් ලංසු ලියවිලි ගාස්තු සතියේ වැඩකරන දිනවල පෙරවරු 09.00 සිට පස්වරු 03.00 දක්වා රෝහලේ සරප් අංශය වෙත ගෙවීමෙන් පසු 2021-05-10 දින සිට 2021-05-28 දින දක්වා අවශ්‍ය ලංසුපත් ලබාගත හැක.
05. ලංසුපත් ලබා ගැනීමට, ඉල්ලුම්කිරීමේ ලිපියක් සමග එක් එක් උපකරණය සඳහා වෙන වෙනම **වලංගු** NMRA (CDDA) **ලියාපදිංචි සහතිකයේ පිටපතක් හා සමාගම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් අනිවාර්යයෙන්** ඉදිරිපත් කළ යුතු වේ.
06. සම්පූර්ණ කර මුද්‍ර තබන ලද ලංසුපත් 2021-05-31 දින පෙ.ව. 10.00 ට පෙර බදුල්ල පළාත් මහ රෝහල වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැක. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදිනම පෙ.ව. 10.30 ට ලංසුපත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ අවසරලත් නියෝජිතයෙකුට සහභාගිවිය හැක.
07. ලංසු පිළිබඳව අවසන් තීරණ ගැනීමේ අයිතිය බදුල්ල පළාත් මහ රෝහල් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
පළාත් මහ රෝහල, බදුල්ල.
දුරකථන අංකය : 055-2222261 **ෆැක්ස් : 055-2231205**
ඊමේල් : info@badullapgh.org **වෙබ් අඩවිය : www.badullapgh.org**

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

AVAILABLE AT



Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

LAKE HOUSE

වැරැල්ලවත්ත කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය සති 2කින් ජනතාවට

මහින්ද අලුත්ගෙදර

ගම්පහ, වැරැල්ලවත්ත කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවසන් කර සති 2 ක් තුළ සෞඛ්‍ය අංශ වෙත භාරදීමට අපේක්ෂා කරන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

මෙම ඉදිකිරීම් බාරව නාවික හමුදාව කටයුතු කරන අතර, නාවික සෙබළුන් 70ක් පමණ මේ වන විට අදාළ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා යොදවා තිබේ.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතාගේ ඉල්ලීම පරිදි බස්නාහිර පළාත් සභාව මෙහි මුලික ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 10ක් වෙන්කර ඇත.

දින 10 ක් තුළ ඇඳන් 10,000ක් මෙරට සෞඛ්‍ය පද්ධතියට ලබාදීමේ ව්‍යාපෘති යටතේ මෙම අතරමැදි රෝහලට අවශ්‍ය ඇඳන් 2000 ලබාදීමට ආර්ථික පුනර්ජීවන කමිටු සභාපති බැසිල් රාජපක්ෂ මහතා එකඟ වී තිබේ.

මෙම අතරමැදි රෝහල් ඉදිකිරීම් කටයුතු පසුගිය 7 දා ඇමැති නාමල් රාජපක්ෂ හා ප්‍රසන්න රණතුංග යන ඇමැතිවරු නිරීක්ෂණය කළහ.

වැරදි රැසකට සම්බන්ධ හිටපු කොමාන්ඩෝ සෙබළා අත්අඩංගුවට

කොටදෙනියාව සමූහ - එම්. පී කුමාර

යුද හමුදාවේ හිටපු කොමාන්ඩෝ සෙබළකු යුද හමුදා කැලෑ ඇඳුම් තුනක්, මුදල් පසුම්බි පහක්, හැඳුනුම්පත් සහ හෙරොයින් ළඟ තබාගෙන සිටියදී පෙරේදා (08) ගනේගොඩ දුම්රිය ස්ථානය අසලදී අත්අඩංගුවට ගත් බව පල්ලෙවෙල පොලිසිය කියයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ 31 හැවිරිදි පුද්ගලයෙකි.

බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ පොලිස් සැරයන් 46492 ප්‍රදීප් සහ පොලිස් කොස්තාපල් 78983 දංගල්ල නිලධාරීන්ට ලැබුණු තොරතුරක් අනුව, උප පොලිස් පරීක්ෂක ප්‍රසන්න කුමාර කරුණාතිලක මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් සිදු කළ මෙහෙයුමකදී සැකකරු අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත.

අවිවාහකයකු වන සැකකරු අනියම් බිරියක් ඇසුරු කරමින් ගනේගොඩ නිවෙසේ ඔහුගේ මව සමඟ පදිංචිව සිට ඇතැයි ද, වේයන්ගොඩ සහ මිරිගම අතරදී දුම්රියේ ගමන් කරන මගීන්ගේ රන්මාල සහ මුදල් පසුම්බි සිය ගණනක් පැහැරගැනීමට සම්බන්ධවූවකු බව ද මූලික පරීක්ෂණවලදී හෙළිවී ඇත.

ඔහු සොරා ගත් දේපළවල වටිනාකම රුපියල් ලක්ෂ 50කටත් වඩා වැඩි බවට පොලිසිය සැක කරයි. දේපොළ සොරා ගෙන විකිණීමෙන් ලැබෙන මුදල් ඔහු මත්කුඩු පානයට යොදාගෙන ඇති බව ද හෙළිවී තිබේ.

ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පුෂ්පකුමාර මහත්වරුන්ගේ උපදෙස් මත, පල්ලෙවෙල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත රත්නායක, උප පොලිස් පරීක්ෂක ප්‍රසන්න කුමාර කරුණාතිලක, පොලිස් සැරයන්වරුන් වන 46492 ප්‍රදීප්, 64917 උඩගෙදර සහ පොලිස් කොස්තාපල්වරුන් වන 78983 දංගල්ල, 81769 ජූඩ් නිලධාරීහු මේ වැටලීමට එක් වූහ.

සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.

1979 සංස්ථාපනය කළ ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමැතිය ලත් මූල්‍ය සමාගමකි. විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා 2020 මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා (ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිර්දේශ කළ 2006 අංක 2 දරණ නිර්දේශයන්ට අනුකූලව)

සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.
මූල්‍ය තත්ව ප්‍රකාශය

මාර්තු 31 දිනට	2020 රු.	2019 රු.
වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	44,556,383	38,729,613
මහ බැංකුවේ ශේෂයන් - පරිනතිය තෙක් දරාසිටින	209,611,431	437,160,580
බලපත්‍ර ලාභී වාණිජ බැංකුවල තැන්පතු	834,858,702	219,040,701
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා තබා ගැනීම	9,060,915	21,567,643
ණය හා අත්තිකාරම්	3,910,283,212	4,824,770,904
මූල්‍ය වත්කම් - විකිණීමට පවත්නා	449,293	3,876,029
මූල්‍ය වත්කම් - පරිනතිය තෙක් දරාසිටින	1,037,625	6,183,319
ඉදිරියට කළ බදු	13,670,246	9,418,005
අනෙකුත් ලැබිය යුතු දෑ	46,190,465	27,939,368
අනෙකුත් වත්කම්	33,006,840	24,542,573
දේපල වෙළඳාම් තොගය	215,371,002	217,736,262
දේපල පිරියත හා උපකරණ	951,283,698	967,185,437
භාවිත කිරීමේ අයිතිය සඳහා වූ වත්කම්	10,755,891	-
අස්පෘශ්‍ය වත්කම්	11,979,808	14,989,717
මුළු වත්කම්	**6,292,115,511**	**6,813,140,151**
වගකීම		
ගණුදෙනුකරුවන්ගේ තැන්පතු	3,884,374,878	5,200,880,599
අනෙකුත් ණය ගැනුම්	115,158,886	89,666,666
මූල්‍ය කල්බදු වගකීම	8,270,317	-
විලම්භිත බදු වත්කම්	127,564,680	146,153,156
විශ්‍රාම පාරිතෝෂික	57,097,566	56,171,314
කොටස් විභජනය සඳහා ලද දායකත්වය	600,000,000	-
අනෙකුත් වගකීම්	613,265,915	513,195,331
මුළු වගකීම්	**5,405,732,242**	**6,006,067,066**
ස්කන්ධය		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	80,379,055	80,379,055
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	279,620,029	246,312,101
ප්‍රත්‍යාගණන සංචිතය	543,827,345	534,254,017
පොදු සංචිතය	129,013,127	129,013,127
මූල්‍ය වත්කම් වල සාධාරණ අගය මත සංචිතය	-	326,302
රඳවාගත් ඉපැයුම්	(146,456,287)	(183,211,517)
මුළු ස්කන්ධය	886,383,269	807,073,085
මුළු වගකීම සහ ස්කන්ධය	**6,292,115,511**	**6,813,140,151**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

අත්සන් කලේ,
එච්.ඒ.අයි.එම්. පෙරේරා මෙනවිය
ප්‍රධාන මූල්‍යය නිලධාරිනී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ පූර්ණ වගකීම් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් දරනු ලැබේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබමු.

අත්සන් කලේ,
කේ.පී.ඩී.එස්.ජේ. ද අල්විස් මයා
අධ්‍යක්ෂක
මහනුවර දී - 2021 මාර්තු 26

අත්සන් කලේ,
එස්.ඒ. වික්‍රමසිංහ මිය
අධ්‍යක්ෂක / සභාපති - විගණන කමිටුව

සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.
ලාභාලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා	2020 රු.	2019 රු.
දළ ආදායම	1,102,024,421	1,179,835,465
පොළී ආදායම	1,017,671,066	1,114,423,689
පොළී වියදම	(655,263,870)	(754,412,767)
ශුද්ධ පොළී ආදායම	362,407,196	360,010,922
ගාස්තු හා කොමිස් ආදායම	19,030,479	27,652,364
ගාස්තු හා කොමිස් වියදම්	(1,563,131)	(1,782,059)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	17,467,348	25,870,305
ශුද්ධ හුවමාරු ලාභය		
ලාභ/(අලාභ) ගිණුම හරහා ගැලපූ මූල්‍ය වත්කම්වල	(1,109,770)	(5,168,936)
සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම	65,322,876	37,759,412
අනෙකුත් මෙහෙයුම් ආදායම්	444,087,650	418,471,703
මුළු මෙහෙයුම් ආදායම්	(20,801,984)	67,683,332
ණය හා හානිකරනය වෙනුවෙන් ප්‍රතිපාදන	423,285,666	486,155,035
ශුද්ධ මෙහෙයුම් ආදායම		
අඩු කිරීම්:	(190,784,264)	(197,649,120)
සේවක මණ්ඩල වියදම්	(121,209,569)	(148,077,615)
අනෙකුත් වියදම්	111,291,833	140,428,299
මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත බද්දට පෙර ලාභ	(42,512,541)	(45,537,605)
මූල්‍ය සේවා සඳහා එකතු කල අගයමත බදු ආදායම් බද්දට පෙර ලාභය	68,779,292	94,890,694
ආදායම් බදු වියදම	(2,163,435)	(63,839,854)
කාලපරිච්ඡේදය සඳහා ලාභය	66,615,857	31,050,840
කාලපරිච්ඡේදය සඳහා ලාභය		
වෙනත් විස්තීරණ ආදායම්		
ලාභය හෝ අලාභය සඳහා නැවත වර්ගීකරණය කල හැකි අයිතම		
විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් වල සාධාරණ අගයෙහි ශුද්ධ වෙනස	(326,302)	139,815
	(326,302)	139,815
ලාභය හෝ අලාභය සඳහා නැවත වර්ගීකරණය නොකරන අයිතම		
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයු ගණන අලාභය	(4,941,817)	(12,399,007)
ආයු ගණන අලාභය මත විලම්භිත බදු	1,186,036	3,471,722
වෙනත් විස්තීරණ ආදායම්, බදු පසු	(4,082,083)	(8,787,470)
කාලපරිච්ඡේදය සඳහා මුලු විස්තීරණ ආදායම බදු පසු	62,533,774	22,263,370
කොටසක මූලික ඉපැයුම්	1.06	0.49

bakertilly

Edirisinghe & Co.
Chartered Accountants
11, Rajakarita Street
Colombo 03
Sri Lanka

T: +94 11 2435800
F: +94 11 2446581
E: info@bakertilly.lk
W: www.bakertilly.lk

INDEPENDENT AUDITORS' REPORT

TO THE SHAREHOLDERS OF SINHAPUTHRA FINANCE PLC

Report on the Audit of the Financial Statements

Opinion
We have audited the financial statements of Sinhaputhra Finance PLC (the "Company"), which comprise the statement of financial position as at 31 March 2020, and the statement of profit or loss and other comprehensive income, statement of changes in equity and statement of cash flows for the year then ended, and notes to the financial statements, including a summary of significant accounting policies and other explanatory information as set out on pages 96 to 65.

In our opinion, the accompanying financial statements give a true and fair view of the financial position of the Company as at 31 March 2020, and of its financial performance and its cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

Basis for Opinion
We conducted our audit in accordance with Sri Lanka Auditing Standards (SLAuSs). Our responsibilities under those standards are further described in the Auditor's Responsibilities for the Audit of the Financial Statements section of our report. We are independent of the Company in accordance with the Code of Ethics issued by CA Sri Lanka (Code of Ethics) and we have fulfilled our other ethical responsibilities in accordance with the Code of Ethics. We believe that the audit evidence we have obtained is sufficient and appropriate to provide a basis for our opinion.

MATERIAL UNCERTAINTY IN RELATION TO GOING CONCERN

We draw attention to Note 2.9.1 of the financial statements which indicates that the Company has not complied with the minimum regulatory core capital of 1,500mn as required by the Minimum Core Capital Direction No 02 of 2017. Additionally, the Central Bank of Sri Lanka has imposed restrictions on the Company's business activities until the regulatory requirements pertaining to the minimum core capital requirements are complied with. In order to apply the going concern basis of accounting the Company has to satisfy the regulatory requirements with the concurrence of the Central Bank of Sri Lanka and generate positive cashflows and profits to reduce the erosion of capital.

Therefore, the material uncertainty impacting the Company's ability to continue as a going concern depends on addressing the conditions set out by the regulatory requirements. Our opinion is not modified in respect of this matter.

Key Audit Matters
Key audit matters are those matters that, in our professional judgment, were of most significance in our audit of the financial statements of the current period. These matters were addressed in the context of our audit of the financial statements, and in forming our opinion thereon, and we do not provide a separate opinion on these matters. For each matter below, we have provided a description of how our audit procedures addressed the matter in that context.

Key audit matter	How our audit procedures addressed the key audit matter
Impairment under SLFRS 9 for loans and advances The accounting policy relating to provisioning of impairment for loan and advances is described in note 4.4.3, the detail relating to impairment charges for the year ended 31 March 2020 is included in note 15 and details of provisions carried at 31 March 2020 are included in note 23, 25 and 26. The assessment of impairment of loans requires significant judgement by the Company and may have a significant impact on the financial statements. Given the subjectivity and reliance on estimates and judgements inherent in the determination of the provision for impairment and historical losses in relation to classifying of loans as non-performing advances (NPAs) and insufficient provisioning, we determined this to be a matter of most significance to our audit. Impairment allowances represent management's best estimate of the losses incurred within the loan portfolios at the reporting date. They are calculated on a collective basis for portfolios of loans of a similar nature (the collective impairment model) and on an individual basis for significant loans (individual impairment model). Both models used by the company utilise stages as the primary impairment trigger; however, there is a risk that other impairment triggers are not identified on a timely basis. For the collective impairment model, impairment is calculated on a modelled basis for portfolios of loans and advances. This is because loans and advances considered under this model comprise of large numbers of accounts with relatively small individual balances. The key assumptions and judgements made by the Company underlie the calculation of impairment. Key assumptions and judgements include the calculation of the average loss percentage once a loan is identified as default.	Our procedures included the following: **Impairment of loans and advances** • We obtained an understanding of management's process and tested controls over credit origination, credit monitoring and credit remediation. • We assessed the appropriateness of the accounting policies and loan impairment methodologies applied by comparing these to the requirements of SLFRS 9 Financial Instruments. Where credit losses were calculated on a modelled basis, we performed the following audit procedures: • Critically assessed the ECL models developed by management. This included our assessment of key judgements and assumptions applied in the calculation of individual and portfolio provisions. We re-performed model calculations to confirm the risk parameter inputs. • Assessed the reasonableness of forward looking information incorporated into the credit loss calculations considering multiple economic scenarios selected and the weighting applied to each scenario. • We assessed whether the models and methodologies comply with SLFRS 9, whether inputs, calculations, assumptions and judgements used in these models are accurate and reasonable. For this purpose, we test-checked the underlying calculations and data.

Other information
Directors are responsible for the other information. The other information comprises the information included in the annual report but does not include the financial statements and our auditor's report thereon.

Our opinion on the financial statements does not cover the other information and we do not express any form of assurance conclusion thereon.

In connection with our audit of the financial statements, our responsibility is to read the other information and, in doing so, consider whether the other information is materially inconsistent with the financial statements or our knowledge obtained in the audit or otherwise appears to be materially misstated.

If, based on the work we have performed, we conclude that there is a material misstatement of this other information, we are required to report that fact. We have nothing to report in this regard.

Responsibilities of the Directors and Those Charged with Governance for the Financial Statements
The Directors are responsible for the preparation of financial statements that give a true and fair view in accordance with Sri Lanka Accounting Standards, and for such internal control as the Directors determine is necessary to enable the preparation of financial statements that are free from material misstatement, whether due to fraud or error.

Responsibilities of the Directors and Those Charged with Governance for the Financial Statements(continued)
In preparing the financial statements, the Directors are responsible for assessing the Company's ability to continue as a going concern, disclosing, as applicable, matters related to going concern and using the going concern basis of accounting unless the Directors either intends to liquidate the Company or to cease operations, or has no realistic alternative but to do so.

The Directors and those charged with governance are responsible for overseeing the Company's financial reporting process.

Auditor's Responsibility for the Audit of the Financial Statements
Our objectives are to obtain reasonable assurance about whether the financial statements as a whole are free from material misstatement, whether due to fraud or error, and to issue an auditor's report that includes our opinion. Reasonable assurance is a high level of assurance but is not a guarantee that an audit conducted in accordance with SLAuSs will always detect a material misstatement when it exists.

Misstatements can arise from fraud or error and are considered material if, individually or in the aggregate, they could reasonably be expected to influence the economic decisions of users taken on the basis of these financial statements.

As part of an audit in accordance with SLAuSs, we exercise professional judgement and maintain professional skepticism throughout the audit. We also:

- Identify and assess the risks of material misstatement of the financial statements, whether due to fraud or error, design and perform audit procedures responsive to those risks, and obtain audit evidence that is sufficient and appropriate to provide a basis for our opinion. The risk of not detecting a material misstatement resulting from fraud is higher than for one resulting from error, as fraud may involve collusion, forgery, intentional omissions, misrepresentations, or the override of internal control.
- Obtain an understanding of internal control relevant to the audit in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the Company's internal control.
- Evaluate the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates and related disclosures made by the Directors.
- Conclude on the appropriateness of the Directors' use of the going concern basis of accounting and, based on the audit evidence obtained, whether a material uncertainty exists related to events or conditions that may cast significant doubt on the Company's ability to continue as a going concern. If we conclude that a material uncertainty exists, we are required to draw attention in our auditor's report to the related disclosures in the financial statements or, if such disclosures are inadequate, to modify our opinion. Our conclusions are based on the audit evidence obtained up to the date of our auditor's report. However, future events or conditions may cause the Company to cease to continue as a going concern.
- Evaluate the overall presentation, structure and content of the financial statements, including the disclosures, and whether the financial statements represent the underlying transactions and events in a manner that achieves fair presentation.

Auditor's Responsibility for the Audit of the Financial Statements (Continued)
We communicate with those charged with governance regarding, among other matters, the planned scope and timing of the audit and significant audit findings, including any significant deficiencies in internal control that we identify during our audit.

We also provide those charged with governance with a statement that we have complied with ethical requirements in accordance with the Code of Ethics regarding independence, and to communicate with them all relationships and other matters that may reasonably be thought to bear on our independence, and where applicable, related safeguards.

From the matters communicated with those charged with governance, we determine those matters that were of most significance in the audit of the financial statements of the current period and are therefore the key audit matters. We describe these matters in our auditor's report unless law or regulation precludes public disclosure about the matter or when, in extremely rare circumstances, we determine that a matter should not be communicated in our report because the adverse consequences of doing so would reasonably be expected to outweigh the public interest benefits of such communication.

Report on Other Legal and Regulatory Requirements
As required by section 163 (2) of the Companies Act No 07 of 2007, we have obtained all the information and explanations that were required for the audit and, as far as appears from our examination, proper accounting records have been kept by the Company. However, the Company does not fulfill the requirements of the minimum core capital direction No.02 of 2017 as at 31 March 2020 issued by the Central bank of Sri Lanka.

CA Sri Lanka membership number of the engagement partner responsible for signing this independent auditor's report is 1328.

Edirisinghe & Co.,
Chartered Accountants
Colombo
26th March 2021

තෝරා ගත් කාර්යය සාධක දර්ශක	මාර්තු 2020 රු.'000 විගණනය කල	මාර්තු 2019 රු.'000 විගණනය කල
වත්කම්වල ගුණාත්මක භාවය		
මුළු ණය හා අත්තිකාරම්	4,531,507	5,435,761
ශුද්ධ මුළු ණය හා අත්තිකාරම්		
(හානිකරන ප්‍රතිපාදනයෙන් පසු)	3,910,283	4,824,771
අක්‍රිය ණය හා අත්තිකාරම්	1,459,626	1,155,536
ද්‍රවශීලතාවය		
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්	238,231	527,948
ද්‍රවශීල වත්කම්	912,658	637,004
ව්‍යවස්ථාපිත රාජ්‍ය සුරැකුම්පත්	269,928	415,200
රාජ්‍ය සුරැකුම්පත්	209,611	437,161
ප්‍රාග්ධන ප්‍රමාණාත්මක භාවය		
මූලික ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය (අවම 6.5%)	3.22	1.76
මුළු ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය (අවම 10.5%)	3.18	5.88
ප්‍රාග්ධන අරමුදලට, ගණුදෙනුකරුවන්ගේ තැන්පතු අනුපාතය (අවම 10%)	22.82	17.98
ලාභදායිත්වය		
වත්කම් මත ඉපැයුම් අනුපාතය (%)	1.06	0.46
හිමිකම් මත ඉපැයුම් අනුපාතය (%)	7.52	3.85

සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.
ලියාපදිංචි කාර්යාලය
නො. 11, කන්දේ විදිය, මහනුවර.
දුර: 081 555 5555 / **ෆැක්ස්:** 081 220 3403
E-mail: info@sinhaputhra.com / **Web:** www.sinhaputhra.lk

සුබසෙත
ජ්‍යෙෂ්ඨ කර්තෘ
ප්‍රවීණ
ජ්‍යොතිෂවේදී
අජිත්
ධර්මසිරි

දවසේ රාහු කාලය

උදේ 7.28 - 9.01 දක්වා රාත්‍රී 7.45 - 9. 13 දක්වා

දින තත්ත්වය

මේෂ රවි 27 භාග බක් අව තුදුස්වක තිථිය ලත් සඳු දින ඉර උදාව 05.55ට ඉර බැසීම 06.19ට අස්විද නැකත රාත්‍රී 08.27න් ගෙවී බෙරණ නැකත උදා වේ. බක් අව තුදුස්වක තිථිය රාත්‍රී 09.58න් ගෙවී අමාවක තිථිය ලබා පවතී. ආයුෂ්මත් යෝගය රාත්‍රී 09.40න් ගෙවී සෞභාග්‍ය යෝගය ලබයි. විෂ්ටිකරණය උදේ 08.44න් ගෙවී ශකුණ කරණය ලබා එය රාත්‍රී 09.58න් ගෙවී චතුෂ්පාද කරණය උදා වේ.

විෂ කලාව - ලිංග - යෝනි / අමෘත කලාව - පතුල

මරු සිටින දිසාව - වයඹ / යෝගිනි - බටහිර / සුබ දිසාව - නැගෙනහිර

හෝරාව ලබා ගෙවී යන අයුරු

උදේ
05. 55 සිට 06. 55 දක්වා - සඳු හෝරාව
06. 55 සිට 07. 55 දක්වා - සෙනසුරු හෝරාව
07. 55 සිට 08. 55 දක්වා - ගුරු හෝරාව
08. 55 සිට 09. 55 දක්වා - කුජ හෝරාව
09. 55 සිට 10. 55 දක්වා - රවි හෝරාව
10. 55 සිට 11. 55 දක්වා - සිකුරු හෝරාව

සවස
11. 55 සිට 12. 55 දක්වා - බුධ හෝරාව
12. 55 සිට 01. 55 දක්වා - සඳු හෝරාව
01. 55 සිට 02. 55 දක්වා - සෙනසුරු හෝරාව
02. 55 සිට 03. 55 දක්වා - ගුරු හෝරාව
03. 55 සිට 04. 55 දක්වා - කුජ හෝරාව
04. 55 සිට 05. 55 දක්වා - රවි හෝරාව

රාත්‍රී
05. 55 සිට 06. 55 දක්වා - සිකුරු හෝරාව
06. 55 සිට 07. 55 දක්වා - බුධ හෝරාව
07. 55 සිට 08. 55 දක්වා - සඳු හෝරාව
08. 55 සිට 09. 55 දක්වා - සෙනසුරු හෝරාව
09. 55 සිට 10. 55 දක්වා - ගුරු හෝරාව
10. 55 සිට 11. 55 දක්වා - කුජ හෝරාව

අලුයම
11. 55 සිට 12. 55 දක්වා - රවි හෝරාව
12. 55 සිට 01. 55 දක්වා - සිකුරු හෝරාව
01. 55 සිට 02. 55 දක්වා - බුධ හෝරාව
02. 55 සිට 03. 55 දක්වා - සඳු හෝරාව
03. 55 සිට 04. 55 දක්වා - සෙනසුරු හෝරාව
04. 55 සිට 05. 55 දක්වා - ගුරු හෝරාව

බබාට නමක්

මෙදින රාත්‍රී 08.27 දක්වා අස්විද නැකත උදා වී තිබෙන නිසා එතෙක් උපදින දරුවන් චු.වෙ.චො.ල අකුරු ද ඉන්පසු බෙරණ නැකත උදා වන නිසා එතැන් පටන් උපදින දරුවන්ට ලි. ලු. ලෙ. ලො අකුරු ද දිනට අදාළව ය.ර.ල.ව.ශ.ෂ.ස.හ අකුරුදු මුල්කොට දරුවාට නමක් දැමීම සුබ වන්නේය.

දවසේ ලග්න පලාපල

මේෂ ලග්නය - ආත්ම විශ්වාසය ගොඩ නැගේ

මේෂ ලග්නයට අනුව අද ඔබට නිවසේ සතුටුදායක ස්වභාවයක් ගනු ලබයි. නව නිවසක පදිංචිය හා යුග දිවියේ සොඳුරුබර සැමරුමකට හේතු වෙයි. ආත්ම විශ්වාසය ඇතිව කටයුතු කරගෙන යාමට ශක්තිය ලැබෙන දිනකි. ආර්ථික ප්‍රතිලාභ හදිසි ධනය ද පෙන්වනු ඇත. තුනටිය ආශ්‍රිත අපල පවතින නිසා ප්‍රවේශම් වන්න. ලොතරැයි ජයග්‍රහණ හිමි වේ. නොසිතූ මාර්ගවලින් ජයග්‍රහණ අත්වනු ඇත.

වෘෂභ ලග්නය - සමීපතමයින් සමග අමනාපකම්

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සිතේ කණස්සලු බව මතු කළ ද දිරියෙන් ඉදිරියට යා හැකි දිනකි. තම සමීපතමයින් තමා සමග අමනාපකම් ඇති විය හැක. විශේෂයෙන් ඔබ සහ ඔබේ සහකරු හෝ සහකාරිය අතරට තුන් වැන්නකුගේ බලපෑමක් නිසා සිතට ආවේගකාරී සිතුවිලි ඒමට පුළුවන. ඉවසීම සමානාත්මතාව ප්‍රගුණ කරන්න. නැතහොත් එදිනෙදා ආර්ථික පාඩු එළඹෙන තත්ත්ව උද්ගත වේ.

මිථුන ලග්නය - රාජකාරිය වෙනුවෙන් දුර බැහැරට

මිථුන ලග්නයට අනුව අද ඔබට තම රාජකාරි සඳහා දුරකට යාමට සිදුවේ. ඒ අනුව වියදම් තත්ත්වය අධික වන අතර සිතට කළකිරීම් පැමිණීමට පුළුවන. තුනටිය ආශ්‍රිත අගුණ පළවන අතර බර ඉසිලීම් උඩ නැගීම් සුබ නැත. ලේ ධාතුව කිපීම නිසා මතුවන රෝග සහිත දිනකි. ආයුධවලින් කටයුතු කිරීමේදී ප්‍රවේශම් වන්න. රාත්‍රී කාලයේ ගමන් බිමන්වලදී සුපරීක්ෂාකාරී වන්න. සුනඛ හපා කෑම් සහ සර්ප දෂ්ටනය වීමට ඉඩ ඇත.

කටක ලග්නය - ආදායම් ඉහළ යයි

කටක ලග්නයට අනුව අද ඔබට ඉතා වාසනාවන්ත දිනකි. ආර්ථික ලැබීම් හා රැකියා උසස්වීම් මෙන්ම තම ආදායම් මට්ටම ඉහළයාම් පෙන්වයි. තම යුග දිවියේ ගැටලු මතුවිය හැකිය. ඒ තමා සිය ආර්ථික ප්‍රවර්ධනය පිළිබඳව පමණක් සිත යොමු කිරීම නිසා වන්නට ද පුළුවන. කොයි දේත් සමබරව කරගෙන යාමට උනන්දු වන්න. පාදයේ වළලුකර ආශ්‍රිත අගුණ පළ වේ.

සිංහ ලග්නය - බොහෝ පැසසුම්

සිංහ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබවාදී දිනකි. තම වෘත්තිය දෙස බලද්දී බොහෝ ප්‍රසාදමුඛයෙන් කතා කරන දිනකි. තම ආයතන ප්‍රධානීන්ගේ පැසසුමට ලක්වේ. යුග දිවිය ගෘහ ජීවිතය ඉතා සතුටුදායක දිනකි. වාහන ලාභ නිවාස ලාභ ද සහිතයි. පැවතුණ ආර්ථික අපහසුතා මග හරවා ගැනීමට කටයුතු සැලසේ. පපුවේ වියළිගති මතු කෙරේ. සැර උෂ්ණ ආහාරපාන අවම කරන්න.

කන්‍යා ලග්නය - දුරස්ථ සිටි අයකු හමු වේ

කන්‍යා ලග්නයට අනුව අද ඔබට තම රැකියා ස්ථානගත සතුරු කරදර එළ ඹේ. පරණ තරහ මරහ යළි හිස එසවීම් නිසා වෘත්තීය මට්ටමේ බාධා කිරීම් ඇතිවේ. තමාට කලකට පෙර සිටි මිතුරකු යළි මුණගැසීම නිසා ඔහු හෝ ඇය වෙතින් බොහෝ විසඳුම් ලැබෙනු ඇත. තම එදිනෙදා කටයුතු සැලසුමකට අනුව කරගෙන යාම සුබයි. නැතහොත් මනස ව්‍යාකූලවන කරුණු එළඹෙනු ඇත.

තුලා ලග්නය - ඥාතියකු පිළිබඳ සතුටුදායක ආරංචි

තුලා ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. ගෘහ ජීවිතය සඵල වේ. ආර්ථික ප්‍රතිලාභ ලැබේ. කලක් රෝගයකින් පෙළෙන තම ළඟම ඥාතියකු පිළිබඳ සතුටුදායක ආරංචි ලැබෙනු ඇත. කාර්මික අංශ නියෝජනය කරමින් රැකියාව කරන අයට සුබ දිනකි. ඔබගේ සේවය බොහෝ දෙනෙකුට අවැසි වීම නිසා ඒ අයව ඔබව සොයා එයි. එහෙත් කල්පනාවෙන් කටයුතු කරන්න. සැඟවුණු සතුරන් මගතොටදී සතුරුකම් කිරීමට මාන බලන නිසාය.

වෘශ්චික ලග්නය - තරුණ තරුණියන් අතර යහපත් සබඳතා

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට තම එදිනෙදා කටයුතු සතුටින් කරගෙන යෑමට අවස්ථාව උදා වේ. යුග දිවිය සාර්ථක වේ. අවිවාහක අයට මංගල යෝග හා යහපත් ආදර සබඳතා ගොඩනැගේ. තම කටයුතු ශක්තිමත් පසුබිමක් මත කරගෙන යාමට හැකිවනු ඇත. යම් යම් බාහිර බලපෑම් නිසා සිතේ කළකිරීම් හා උදාසීන ගති පළවන නිසා ඉවසීම ප්‍රගුණ කරන්න. යම් යම් අය තමා ඉදිරියේ කරන බාධා කිරීම් නිසා ආවේගකාරී විය හැකිය.

ධනු ලග්නය - තරග විභාග ජය

ධනු ලග්නයට අනුව අද ඔබට ඔබගේ ආර්ථික සම්පත් පිළිබඳ ප්‍රවර්ධනයක් පෙන්වයි. දරුසම්පත් අපේක්ෂාවෙන් සිටි අයට වාසනාව උදාවේ. දැනට ඉගෙන ගන්නා වයසේ සිටින අයගේ අධ්‍යාපන කුසලතා නිසා සිතට නව බලාපොරොත්තු මතු වන්නේය. විභාගවලට හා රැකියා සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටි අයගේ බලාපොරොත්තු සපල වේ. එසේම පිටරටකට යාමට බලාපොරොත්තුව සිටි අයගේ අදහස් සිතින් ඈත්වන ලකුණු පෙනේ.

මකර ලග්නය - වාහන ලාභ

මකර ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ යහපත් බලාපොරොත්තු රැසක් ඉටුවනු ඇත. විවාහ දිවිය සාර්ථක වේ. අරමුණුකර තිබූ සැලසුම් කීපයක් සාර්ථකව ක්‍රියාවට නැංවෙන දිනකි. වාහනයක් මිලදී ගැනීමට සිටි අයකු නම් එය සපල වේ. නව නිවසක පදිංචියට යාම, තමා වාසය කරන නිවස අලුත්වැඩියා කර ගැනීමට උනන්දුවීම අද දින ඔබගේ කටයුතු අතර වෙයි.

කුම්භ ලග්නය - රාජකාරි නිසා අවිවේකය

කුම්භ ලග්නයට අනුව අද ඔබට අපහසුතා මධ්‍යයේ වුවද කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේ. තම එදිනෙදා රාජකාරි නිසා අවිවේකය දැඩිව දැනෙන නමුත් ආර්ථික මට්ටමින් උසස් වනු ඇත. එදිනෙදා හමුවන පිටස්තරයින් අතර හොඳ හිත ඇති අයකුගේ හමුවීමක් නිසා තමාට ඉදිරි සාර්ථක ආර්ථික කටයුත්තකට හවුල් වීමට හැකිවේ. තම මවු පාර්ශ්වයේ අයගෙන් මූල්‍යමය ප්‍රතිලාභ ඉඩම් ලාභ මෙන්ම නිවාස ලාභ ද පෙන්වයි.

මීන ලග්නය - දේපළ හිමිකමක්

මීන ලග්නයට අනුව අද ඔබට තමාගේ අත්හැර දමා තිබූ කටයුතු යළි පණගන්වා ගැනීමට අවස්ථාව උදා වේ. වල්බිහිවී තිබූ ඉඩමක් සුද්ධ පවිත්‍ර කොට වැටමායිම් ගසා වෙන් කර ගැනීමට සිතන දිනකි. ඒ සඳහා තම හිත මිතුරු කැළකගෙන් සහාය කැපවීම නොඅඩුව ලැබෙයි. පැවති තිබූ නීති ගැටලුවක් සමථයකට පත් කර ගැනීමට හැකි වේ. පපුවේ ආසාදන මතු වේ. කරන වෙහෙසකාරී කටයුතු නිසා ශාරීරික අපහසුතා දැඩිව දැනෙනු ඇත.

ශ්‍රී මහා බෝධි මළුවෙහි වැලි ඇතිරීමේ මංගල්‍යයෙන්

චිත්‍රාරත්න කළුආරච්චි හිඳෝගම සමූහ

වෙසක් පුන් පොහොය නිමිති කොටගෙන ශ්‍රී මහා බෝධි මළුවෙහි වැලි ඇතිරීමේ මංගල්‍යය පසුගියදා (8) 42 වැනි වතාවටත් මහා සංඝ රත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මැද සිදු කෙරිණි

ලංකා බැංකුවෙහි අනුග්‍රහයෙන් මෙම මහා පින්කම සිදු කෙරුණු අතර, අටමස්ථානාධිපති ආචාර්ය පල්ලේගම සිරි නිවාස නාහිමියන්ගේ අනුශාසකත්වයෙන්, අටමස්ථානවල නා හිමිවරුන්, උතුරු හා උතුරු මැද දෙපළාතේ ප්‍රධාන සංඝ නායක නුගේතැන්නේ පඤ්ඤාණන්ද නාහිමි ප්‍රමුඛ මහා සංඝ රත්නය, ලංකා බැංකුවේ නියෝජ්‍ය මහා කළමනාකරු පියාල් සිල්වා, උතුරු මැද පළාත් සහකාර මහා කළමනාකරු මහින්ද බණ්ඩාර මහත්වරුන් ඇතුළු ලංකා බැංකුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවලට මුල්තැන දෙමින් ඉතා ආරක්ෂාකාරීව මෙම කටයුත්ත සිදු කෙරිණි.

රට සහ මුළු ලෝකයම වෙළා ගත් කොවිඩ් වයිරසය තුරන් වී ජනාධිපතිතුමා ඇතුළු රට වැසියන්ට සහ සෞඛ්‍ය අංශවල සියලු දෙනාට, ආරක්ෂක අංශවලට, ලෝක වාසී සියලු ජනතාවට ආශීර්වාද කරමින් අනුරාධපුර මිරිසවැටිය රාජ මහා විහාරස්ථානයේදී පෙරේදා (8) රාත්‍රී ආශීර්වාද පින්කමක් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් පැවැත්විණි.

මිරිසවැටිය රාජ මහා විහාරාධිපති හා රජරට විශ්වවිද්‍යාලයේ කුලපති ඊතලවැටුණු වැවේ ඤාණතිලක නායක හිමිපාණන්ගේ අනුශාසනා පරිදි පැවැත්වූ මෙම ආශීර්වාද පින්කමට මහා සංඝ රත්නය සමග අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් කුමාරසිරි මහතා ඇතුළු සීමිත පිරිසක් සහභාගි වූහ.

ඡායාරූපය චිත්‍රාරත්න කළුආරච්චි හිඳෝගම සමූහ

දහමෙන් කොරෝනා දුරු කරමු

කොවිඩ්-19 වසංගතය නැතහොත් කොරෝනාව අද මුළු ලෝකයටම බරපතළ ප්‍රශ්නයක් වී ඇත. කොරෝනා වයිරසය මේ ලෝකයට පැමිණියේ ඇයි? කොරෝනාව සම්බන්ධයෙන් අප ක්‍රියා කළ යුත්තේ කෙසේද? කොරෝනාව දුරු කර අපේ රට යළි යථා තත්ත්වයට පත් කර ගැනීමට අප කළ යුත්තේ කුමක්ද? බුදුදහම අනුව බලනවිට මේ ප්‍රශ්නවලට පිළිතුරු පහසුවෙන් ගත හැකිය.

බුදුදහම අනුව කොවිඩ්-19 වසංගතය නැතහොත් කොරෝනාව මේ ලෝකයට පැමිණියේ සත්ත්වයන් කයෙන්, වචනයෙන්, සිතෙන් යහපත් ක්‍රියා නොකිරීම නිසාය. නැතහොත් ලෝකය වඩ වඩාත් පාපයට නැඹුරු වීම නිසාය. එම නිසා අප කළ යුත්තේ පාපයෙන් ඈත් වී පිනට යොමු වීමය. කොරෝනාව දුරු කර අපේ රට යළි යථා තත්ත්වයට පත් කර ගැනීමට අප කළ යුත්තේ කයෙන් වචනයෙන්, සිතෙන් වඩ වඩාත් යහපත් ක්‍රියා කිරීමය.

කොරෝනා යනු දේවදූතයෙකි. කෙරෝනා දේවදූතයා මේ ලෝකයට පැමිණියේ අපට එම පණිවුඩය දීම සඳහාය. ත්‍රිපිටකයෙහි මජ්ඣිමනිකායෙහි උපරිපණ්ණාසපාළි 3. සුඤ්ඤත වර්ගයෙහි 10. දේවදූත සූත්‍රයෙන් එය පැහැදිලි වේ.

ත්‍රිපිටකයෙහි මජ්ඣිමනිකාය උපරිපණ්ණාසපාළි 3. සුඤ්ඤත වර්ගයෙහි එන 10. දේවදූත සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි දී භික්ෂූන් වහන්සේලට වදාළ සේක.

මරණින් මතු නිරයෙහි උපන් එක් එක් සත්ත්වයාගෙන් යම රජ තෙම මෙසේ අසන්නේය.

"එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතරෙහි පහළ වූ තුන්වැනි දේවදූතයා නුදුටුවෙහි ද?"

හෙතෙම "ස්වාමීනි, නුදුටිමි" යි කියයි.

ඔහුගෙන් යම රජ තෙම "එම්බා පුරුෂය, තෝ මනුෂ්‍යයන් අතරෙහි රෝග ඇත්තා වූ දුකට පත් වූ දැඩි ගිලන් ඇත්තා වූ ස්වකීය මල මූත්‍ර මතුයෙහි සයනය කරන, අනුන් විසින් නැඟිටුවනු ලබන්නා වූ අනුන් විසින් හොවනු ලබන්නා වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ නුදුටුවෙහි දැ"යි අසන්නේය.

හෙතෙම "ස්වාමීනි, දුටුවෙමි" යි කියයි.

ඔහුගෙන් යම රජ තෙම එම්බා පුරුෂය, නුවණැත්තා වූ වැඩි වයසට පැමිණියා වූ නුඹට, 'මමත් ලෙඩ වීම ස්වභාව කොට ඇත්තේ වෙමි, ලෙඩ වීම නොඉක්ම වූයේ වෙමි, එබැවින් මම කයෙන්, වචනයෙන්, සිතෙන් යහපත් ක්‍රියා කරමි' යි කියා අදහස් නොවූයෙහිදැ"යි අසන්නේය.

හෙතෙම "නැත, ස්වාමීනි, පමා වීමි, ස්වාමීනි" යි කියයි.

කොවිඩ්-19 වසංගතය ලෝකය පුරා පැතිරීම ඇරඹි මේ වනවිට වසරකට වැඩි කාලයක් ගත වී ඇත. එහෙත් කීදෙනෙකු නම් කොවිඩ්-19 වසංගතය නැතහොත් කොරෝනාව දෙන පණිවුඩය තේරුම් ගත්තේ දැයි ප්‍රශ්නයකි. 'මමත් ලෙඩ වීම ස්වභාව කොට ඇත්තේ වෙමි, ලෙඩ වීම නොඉක්මවූයේ වෙමි, එබැවින් මම කයෙන්, වචනයෙන්, සිතෙන් යහපත් ක්‍රියා කරමි'යි කියා අදහස් නොවීමේ හෙවත් පමා වීමේ ප්‍රතිඵලය මේ වනවිට කීදෙනෙකු විසින් භුක්ති විඳින ලද්දේ ද,

ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිවකුට වත් චෝදනා කළ නොහැකි බව යම රජු පමා වූ පුරුෂයනට පවසන දෙයින් පැහැදිලි වේ.

යම රජ තෙම- "එම්බා පුරුෂය, තගේ ඒ මේ පාපකර්මය මව විසින් කරන ලද්දක් නොවෙයි, පියා විසින් කරන ලද්දක් නොවෙයි, සහෝදරයා විසින් කරන ලද්දක් නොවෙයි. සහෝදරිය කරන ලද්දක් නොවෙයි, යහළු මිත්‍රයන් විසින් කරන ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරන ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරන ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරන ලද්දක් නොවෙයි, තා විසින් ඒ පාප කර්මය කරන ලදී. ඒ පාප කර්මයාගේ විපාකය තෝම විඳිනෙහි"ය.

එම නිසා කොරෝනා නමැති දේවදූතයා විසින් දෙනු ලබන පණිවුඩය තේරුම් ගෙන, රජයේ නියමයන් සහ සෞඛ්‍ය අංශවලින් දෙනු ලබන උපදෙස් පිළිපදින අතරම, පාපයෙන් ඈත් වී පිනට යොමු වී කයෙන්, වචනයෙන්, සිතෙන් යහපත් ක්‍රියා කරනු ලබන්නේ නම් සිය පණිවුඩය අප තේරුම් ගත් බව වටහාගෙන කොරෝනා දේවදූතයා අප අතරෙන් ඉවත්ව යනු ඇත.

විශ්‍රාමික අධ්‍යාපනඥ සහ භාවනා උපදේශක
රෝහිත විජයතිලක

ආර්ථික මධ්‍යස්ථාන සේවකයන්ටත් කොවිඩ් මර්දන එන්නත දෙන්න

● මැනිං වෙළෙඳ සංගමයේ ජාතික සංවිධායක එච්.එම්. උපසේන

අනුර ප්‍රේමලාල්

කොවිඩ් 19 වයිරසය මර්දනය සඳහා සිදු කරන එන්නත්කරණ වැඩපිළිවෙළට ආර්ථික මධ්‍යස්ථානවල සේවය කරන අයවද ඇතුළත් කරගනිමින් එය ප්‍රමුඛ කාර්යක් සේ සළකා කටයුතු කරන්නැයි සීමාසහිත ඒකාබද්ධ ආර්ථික මධ්‍යස්ථාන හා මැනිං වෙළෙඳ සංගමයේ ජාතික සංවිධායක එච්.එම්. උපසේන මහතා රජයෙන් ඉල්ලීමක් කරයි. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් මාධ්‍ය වෙත අදහස් දැක්වූ ඒ මහතා කියා සිටියේ රටේ ඇති වන ඕනෑම තත්ත්තවයකදී ආර්ථික මධ්‍යස්ථාන වැසීමෙන් ගොවියාත්, පාරිභෝගිකයාත් අවසානයේ රජයත් අපහසුතාවට පත්වෙන නිසා මෙම ස්ථාන විවෘත කර තැබීමෙන් ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම හා මිලදී ගැනීම සිදුවීම ගොවියාට හා පාරිභෝගිකයාට සහනයක් සිදුවෙන බැවින් මේ ගැන සැලකිල්ලට ගෙන ආර්ථික මධ්‍යස්ථානවල සේවය කරන අයට මෙම කොවිඩ් එන්නත ලබාදීමේදී යම් ප්‍රමුඛතාවක් දෙන්නැයි බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවයි.

ලංසු කැඳවීමයි

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ලංසු අංකය : 194/T/2019

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි ආරක්ෂක කාර්ය මණ්ඩලයට වසර දෙකක් (02) සඳහා ශාරීරික අභ්‍යාස ඇඳුම් රෙදි සැපයීම හා මැසීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි ආරක්ෂක කාර්ය මණ්ඩලයට වසර දෙකක් (02) සඳහා ශාරීරික අභ්‍යාස ඇඳුම් රෙදි සැපයීම හා මැසීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපිලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් දෙදහස් පන්සීයක (රු. 2,500.00 ක)** මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 11.05.2021 වන දින සිට 07.06.2021 වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපිලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපිලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ මුද්‍ර, තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකව ද ගෙනවිත් භාරදිය හැකිය.

ලංසු තැබීම 2021 **ජූනි මස 08 වන අඟහරුවාද දින ප.ව. 2.00** ට අවසන් වන අතර, අදළ ලංසු විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැකිය.

ලංසු සුරැකුම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් **සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම** වෙත ඉල්ලුම මත ගෙවන සේ නිකුත් කරන ලද **රුපියල් එකසිය පනස් පන් දහසක (රු. 155,000.00)** වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දම කළමනාකරණ අංශයේ **දුරකථන අංක** 011-2264103 / 011-2264102 ඇමතීමෙන් **head.scm@airport.lk** විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ **www.airport.lk** යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,
කටුනායක.

NSB
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

මිල ගණන් කැඳවීම

(ජාතික තරගකාරී ලංසු කැඳවීම - NCB)

ප්‍රසම්පාදන දැන්වීම් අංක

එන්. එස්. බී/ පී. ටී/අයි.ටී.ඊ./2021/08

මෙහි දැක්වෙන ටෙන්ඩරයට අදළ භාණ්ඩ සැපයීම, බෙදාහැරීම, සවිකිරීම, ක්‍රියාකරවීම සහ නඩත්තුව සඳහා පිළිගත නිෂ්පාදකයින්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් දේශීය නියෝජිතයන්ගෙන් මුද්‍ර තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

Description of the Procurement	3 Nos. SERVERS FOR PRIVILEGED ACCESS MANAGEMENT (PAM) SOLUTION
Method of Procurement	National Competitive Bidding (NCB)
Applicable Non - refundable Tender Fee	Rs. 3,000.00
Value of the Bid Bond to be submitted	Rs. 85,000/=
Last Date & Time of Issuing Bid Documents	01.06.2021 at 3.00 p.m.
Data & Time of Closinge Tender	02.06.2021 at 10.00 a.m.

01. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු වෙනුවෙන් නියෝජිතයෙකු හෝ උප නියෝජිතයෙකු හෝ නාමිකයෙකු ලෙස කටයුතු කරන ඕනෑම පුද්ගලයෙකු ටෙන්ඩරය සඳහා අයදුම් කිරීමට පෙර ලියාපදිංචි වීම අනිවාර්ය වන අතර, ඔහු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
02. 2021-05-10 දින සිට 2021-06-01 දින දක්වා වැඩකරන දිනයන්හි **පෙරවරු 8.30 සිට පස්වරු 3.00 දක්වා** අදළ ටෙන්ඩර් පත්‍රිකා කොළඹ 03, ගාලු පාර, අංක 255 හි පිහිටි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සැපයුම් අංශයේ සැපයුම් කළමනාකරු වෙතින් ලිඛිත ඉල්ලීමක් මගින් ලබාගත හැකිය.
03. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා සමග ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලබන දින සිට **දින 105 ක්** සඳහා වලංගු වන වාණිජ බැංකුවකින් නිකුත් කළ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පිළිගත හැකි බැංකු ඇපකරයක්/ ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.
04. අදළ දිනයේදී ටෙන්ඩර් අයදුම්පත් භාරගැනීම **පෙරවරු 10.00** ට අවසන් වූ වහාම ටෙන්ඩර් අයදුම්පත් විවෘත කෙරෙන අතර, **පෙරවරු 10.00 න්** පසුව ලැබෙන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
05. සියලුම ලංසු හෝ එක් ලංසුවක් හෝ එයින් කොටසක් පිළිගැනීම හෝ හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුවේ.

මේ පිළිබඳ වැඩි විස්තර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කළමනාකරු - (සැපයුම්) වෙතින් ලබා ගත හැකිය.

සභාපති,
ආයතනික ප්‍රසම්පාදන කමිටුව - සුළු පරිමාණ,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

අනුරපුර පෞද්ගලික බැංකුවකින් මුදල් කොල්ලකෑමට පැමිණි සැකකරුවන් සොයා පරීක්ෂණ

අනුරාධපුර මධ්‍යම විශේෂ - බී. එම්. විජේසූරිය

අනුරාධපුර පිහිටි පෞද්ගලික බැංකුවක ඒ. ටී. එම්. යන්ත්‍රයට බහාලීමට රැගෙන ආ රුපියල් ලක්ෂ 120ක් කොල්ලකෑමට උත්සාහ කළ සැකකරුවන් දෙදෙනා සොයා පොලිස් කණ්ඩායම් තුනක් පරීක්ෂණ සිදු කළත් කොල්ලය සම්බන්ධයෙන් වැදගත් හෝඩුවාක් එළි කර ගැනීමට නොහැකිව ඇති බව පොලිසිය පවසයි.

පසුගියදා (06) අනුරාධපුර නව නගරයේ සිවු වන පටුමගේ පිහිටි බැංකුවට ගනුදෙනුකරුවකුගේ වෙස්ගෙන පැමිණි සිව් කොල්ලකරු රුපියල් ලක්ෂ 120ක් අඩංගු මුදල් මල්ල කොල්ලකෑමට උත්සාහ කළත් මුදල් ප්‍රවාහනය කළ සර්විස් ලංකා පෞද්ගලික සමාගමේ නිලධාරියාගේ දක්ෂතාව නිසා කොල්ලකරු විනාඩි තුනකට ආසන්න කාලයක් මුදල් මල්ල පැහැර ගැනීමට සේවකයා සමඟ පොර බැදුවත් එම උත්සාහය අසාර්ථක විය.

කොල්ලකරුන්ගේ දැඩි ප්‍රහාරයට ලක්වන සේවකයා මුදල් සහිත මල්ල පැහැර ගෙන යෑමට අවස්ථාව නොදෙමින් එය ඔහු ග්‍රහණයේම තබාගැනීමට දැඩි වෙහෙසක නිරත වන අයුරු පොලිසිය සිදු කළ ආරක්ෂිත කැමරා පරීක්ෂාවේදී ආනවරණය වී තිබුණි.

සැකකරුවන් සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීමට අනුරාධපුර නගරයේ ස්ථාන කිහිපය ඇති ආරක්ෂිත කැමරා පොලිසිය නිරීක්ෂණය කළත් ඔවුන් ගමන් කළ යතුරු පැදියේ ලියාපදිංචි අංක තහඩුවත් ව්‍යාජ ලෙස සැකසුවක් බව පොලිස් කණ්ඩායම් තහවුරු කරගෙන තිබුණි. එමෙන්ම කිසිදු ස්ථානයකදී සැකකරුවන්ගේ මුහුණු නිරාවරණය නොවන නිසා ඔවුන් දෙදෙනාම හඳුනාගැනීම අපහසුව ඇති බව පොලිසිය පවසයි. ඔවුන් ආරක්ෂිත හිස් වැසුම් අව් කණ්ණාඩි හා මුව ආවරණ පැලඳ ඉතා සූක්ෂමව කොල්ලය මෙහෙයවා ඇති බව පොලිසිය පවසයි.

ලක්ෂ 6ක අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෝ 6ක් අත්අඩංගුවට

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

පසුගිය 06 සහ 07 දෙදින සිදු කළ වැටලීම්වලින් රුපියල් ලක්ෂ 06ක් පමණ වටිනා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 120ක්, හෙරොයින් මත්කුඩු ග්‍රෑම් 02ක් සහ මිලි ග්‍රෑම් 200ක් සහ ගංජා සමඟ සැකකරුවන් 06 දෙනකු අත්අඩංගුවට ගත් බව අක්මීමණ පොලිසිය පවසයි.

අයිස් සමඟ අත්අඩංගුවට ගත් පුද්ගලයා ඇටඹගස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඔහු ගුවන් හමුදාවෙන් ඉවත් කළ සෙබළෙකු වන අතර, මොහු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය විකුණා උපයා ගත් බව කියන රුපියල් 109,000ක් ද පොලිසියෙන් සොයාගෙන ඇත. එමෙන්ම මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදා ගත් ත්‍රීරෝද රථයක්, යතුරු පැදි 03ක්, ගංජා පැකට් 40ක් පොලිසියෙන් සොයගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් ඇටඹගස්මුල්ල, හියාරේ, අමල්ගම, කුරුඳුවත්ත, මානවිල ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

සැකකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අක්මීමණ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පී. මදුරංග අරුම්පේරුම, පොලිස් පරීක්ෂක ජනක් ශ්‍රී, උප පොලිස් පරීක්ෂක සුදේව, පො. සැ. 13048 සුදේශ්, පො. සැ. 13796 හෙට්ටිආරච්චි, පො. සැ. 64241 නලින්, පො. කො.17095 චාමර, පො. කො. 1547 චන්ද්‍රසිරි, පො. කො. 67102 රණසිංහ නිලධාරීන් මේ වැටලීම කරනු ලැබිය.

මාතලේ දිසාවේ කොරෝනා ආසාදිතයන් ගණන 2299 දක්වා ඉහළට; මරණ 17ක්

මාතලේ දිස්ත්‍රික් සමූහ

මාතලේ දිස්ත්‍රික්කයේ මේ වන විට කොරෝනා ආසාදනයවුවන් 17 දෙනකු මිය ගොස් ඇති බවත්, දැනට හඳුනාගෙන ඇති මේ ආසාදිතයන්ගේ සංඛ්‍යාව ද 2299 දක්වා ඉහළ ගොස් ඇති බවත් මාතලේ දිස්ත්‍රික් කොවිඩ් මර්දන පාලන ඒකකයේ වාර්තා සඳහන් කරයි.

මේ අතර සීගිරිය, පොතාන ප්‍රදේශයේ 48 හැවිරිදි පිරිමි පුද්ගලයකු සහ සීගිරිය, බෙල්ලන්නේඔය පදිංචි 73 හැවිරිදි කාන්තාවක් කොරෝනා ආසාදනයවී වැලිකන්ද විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබමින් සිටියදී පසුගිය 06 වැනි දින මිය ගොස් ඇති බව දඹුල්ල සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය තහවුරු කළේය.

එමෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ මේ වන විට පවුල් 687ක පුද්ගලයන් 1940ක් නිරෝධායනය වෙමින් සිටින බව ද අදාළ වාර්තා තවදුරටත් සඳහන් කරයි.

ගිංතොට මෝය කට ප්‍රතිසංස්කරණයට

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

ගිං ගඟේ ගින්තොට ස්වාභාවික මෝය කට ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු රුපියල් ලක්ෂ 10කට අධික වියදමකින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සෘජු දායකත්වය යටතේ සිදු කෙරෙමින් පවතී.

ගිං ගඟ ද්‍රෝණිය නැවත සකස් කිරීමෙන් පසුව ගිංතොට සහ බූස්ස ප්‍රදේශවල සංචාරක කර්මාන්තය දියුණු වන අතර, ගිංතොට, උක්වත්ත ඇතුළු ප්‍රදේශ ගං වතුර තත්ත්වවලදී යටවීමේ ප්‍රවණතාව ද මඟ හැරෙනු ඇත. මෝය කටේ ප්‍රතිසංස්කරණ කටයුතු වැවිලි ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පෙරේදා(08) නිරීක්ෂණය කරන ලදි.

පම්පමඩුව වැවේදී අතුරුදන් ධීවරයාගේ මළ සිරුර සොයා ගැනේ

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

වවුනියාවේ පම්පමඩුව වැවේ මසුන් මරමින් සිටියදී අතුරුදන් වූ ධීවරයාගේ මළ සිරුර පෙරේදා (08) පළාතේ ධීවරයන් විසින් සොයා ගෙන තිබේ.

මොහු සමඟ තවත් ධීවරයන් පස් දෙනකු මසුන් මැරීමට ගොස් ඇති අතර, හදිසියේම ඔරුවෙන් වතුරට වැටුණු මේ ධීවරයා අතුරුදන් වී ඇත. එස්. රවිකරන් නැමති 50 හැවිරිදි ධීවරයාගේ මළ සිරුර දිනකට පසුව පළාතේ ධීවරයන් විසින් දැඩි පරිශ්‍රමයක් දරා සොයාගෙන තිබේ.

වවුනියාවේ පූවරසන්කුලම පොලිසිය සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වයි.

ලංසු කැඳවීමයි

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ලංසු අංකය - 121/T/2020

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා තණකොළ කැපීමේ යන්ත්‍ර 02 ක් (02 Nos Tractor Mounted Disc Movers [4 Discs]) සහ මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා තණකොළ කැපීමේ යන්ත්‍ර 01 ක් (01 No Tractor Mounted Disc Movers [6 Discs]) සැපයීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා **තණකොළ කැපීමේ යන්ත්‍ර 02 ක්** (02 Nos Tractor Mounted Disc Movers [4 Discs]) **සහ මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා තණකොළ කැපීමේ යන්ත්‍ර 01 ක්** (01 No Tractor Mounted Disc Movers [6 Discs]) සැපයීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් තුන් දහස් පන්සීයක (රු. 3,500.00 ක)** මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 11.05.2021 වන දින සිට 07.06.2021 **වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ මුද්‍ර, තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකවද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම 2021 **ජූනි මස 08 වන අඟහරුවාද දින ප.ව. 2.00** ට අවසන් වන අතර අදළ ලංසු විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංකාවේ ක්‍රියාත්මක, මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ඉල්ලුම මත ගෙවන සේ නිකුත් කරන ලද **රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00 ක)** වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264102 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,
කටුනායක.

ලංසු කැඳවීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ලංසු අංකය - 045/T/2020

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි ඉදිරිපෙළ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සාරි සැපයීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් **සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි ඉදිරිපෙළ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සාරි සැපයීම** සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් තුන් දහස් හත්සීයක (රු. 3,700.00 ක)** මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශය වෙතින් 11.05.2021 වන දින සිට 14.06.2021 **වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** ලංසු ලිපි ලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපි ලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ මුද්‍ර, තබන ලද ලංසු ඉහත ලිපිනයට පෞද්ගලිකව ද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම 2021 **ජූනි මස 15 වන අඟහරුවාද දින ප.ව. 2.00** ට අවසන් වන අතර, අදළ ලංසු විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේදී එයට සහභාගි විය හැක.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංකාවේ ක්‍රියාත්මක, මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ඉල්ලුම මත ගෙවන සේ නිකුත් කරන ලද රුපියල් දෙලක්ෂ දහඅටදහස් එකසියයක **(රු. 218,100.00 ක)** වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම් දම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264102 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක.

පෘථිවියටත් සූර්යයන් දෙදෙනකු සිටියා නම්?

ප්‍රකට 'ස්ටාර් වෝස්' චිත්‍රපට මාලාවේ රසිකයකුට නම් සූර්යයන් දෙදෙනකු සිටින, 'පරිසුග්ම ග්‍රහලෝක' (circumbinary planet) ගැන අමුතුවෙන් විස්තර කිරීමක් අවශ්‍ය නොවනු ඇත. චිත්‍රපටයේ ප්‍රධානම චරිතය වන ලුක් ස්කයිවෝකර්ගේ මව් ග්‍රහලොව වන 'ටැටූයීන්' වූ බලි සූර්යයන් දෙදෙනකු කේන්ද්‍ර කොටගත් කක්ෂයකින් යුතු පරිසුග්ම ග්‍රහලොවකි. සැබවින්ම ටැටූයීන් වැනි මේවැනි ග්‍රහලෝක පිහිටිය හැකි ද යන්න තව දුරටත් විද්‍යා ප්‍රබන්ධයන්ට සීමා වූ උපකල්පනයක් නොවන්නේ එවැනි ග්‍රහලෝක දුසිමක් පමණ සපුගිය දශකයක පමණ කාලයේදී තාරකා විද්‍යාඥයන් විසින් අනාවරණය කරගත් නිසාය. කෙප්ලර්-1647b යනු එලෙස සොයාගත් පළමු පරිසුග්ම ග්‍රහලොවයි. පෘථිවියටත් එවැනි සූර්යයන් දෙදෙනකු සිටියා නම් එය අපට කුමනාකාරයේ අත්දැකීමක් වනු ඇති ද? කිෂිතිජයෙන් එකවර බැස යන සූර්යයන් දෙදෙනකු දකින්නට ලුක් ස්කයිවෝකර්ට මෙන් අපටත් හැකි වනු ඇති ද? එවන් තත්ත්වයකදී රාත්‍රියක් කියා දෙයක් අපට ලැබේවි ද? ඒ සියල්ලටත් වඩා සූර්යයන් දෙදෙනකු සහිත සෞරග්‍රහ මණ්ඩලයක් තුළ පිහිටි පෘථිවියකට ජීවය පවත්වා ගැනීමට හැකියාව පවතී ද?

අඟුවුමිටි තාරකාව

ඇතැම් විද්‍යාඥයන් දරන මතයක් වන්නේ කලකට ඉහතදී අප සෞරග්‍රහ මණ්ඩලයේ ද සූර්යයන් දෙදෙනකු සිටි බවයි. එක්මම් සූර්යයා සතුව ද 'නෙමෙසිස්' යනුවෙන් හැඳින්වෙන සහායකය, අඟුවුමිටි තාරකාව තිබූ බවත්, එය සූර්යයාගේ ගුරුත්වාකර්ෂණයෙන් මීදී ගොස්, මීට වසර බිලියන ගණනකට ඉහතදී කිෂිරපථය තුළ දිය වී ගිය බවත් ඔවුහු උපකල්පනය කරන්නෝය. මෙබඳු 'පරිසුග්ම ග්‍රහලෝක' සොයා පෘථිවියේ හිඳ, විශ්වය පුරා කරක්ගඟසූ විද්‍යාඥයන්ට සිය උපකල්පනය සත්‍ය විය හැකි බව ඔප්පු කරන පරිසුග්ම ග්‍රහලෝක පමණක් නොව, පුසුමයකට මෙන් ජීවය පැවතීමට තරම් සුදුසු තත්ත්ව සහිත පරිසුග්ම ග්‍රහලෝක පවා සොයා ගැනීමට ලැබී තිබෙන බැවින් වැටූයීන් වැනි ග්‍රහලෝක තව දුරටත් හුදු විද්‍යා ප්‍රබන්ධයක් පමණක් වන්නේ නැත. පෘථිවිය සතුව ද යම් හෙයකින් සූර්යයන් දෙදෙනකු සිටියා නම් අද පවතින ආකාරයේ ජීවයක් එහි පැවතීමට නම් යම් යම් සාධක සම්පූර්ණ කිරීමට අවශ්‍ය වනු ඇත. නිදසුනක් ලෙස: එකී තාරකාවන්ගේ ස්කන්ධයේ සිට පෘථිවියට සාපේක්ෂව එක් එක් තාරකාවට ඇති දුර හා ඒවා අතර පිහිටි දුර ගණාදි සියලු සාධක පෘථිවියේ ජීවය තෙරෙහි බලපෑම් කරනු ඇත.

සූර්ය කුණාටු

යම් හෙයකින් එක් තාරකාවක් අනෙක් තාරකාවට වඩා විශාලත්වයෙන් සේම දීප්තියෙන්ද වැඩි වුව හොත්, එහි ප්‍රබල ගුරුත්වාකර්ෂණය මඟින් පෘථිවිය ඒ දෙසට වඩාත් සමීප වන අන්දමින් ආකර්ෂණය කරගැනීම නිසා පෘථිවිය දැවී, ඇළුව යෑමට වුව බැරි නැත. අනෙක් අතට සූර්යයන් දෙදෙනාගෙන් එක් අයකු සතුව හෝ සැලකිය යුතු ප්‍රබල ගුරුත්ව බලයක් නොතිබුණ හොත්, පෘථිවිය එහි කක්ෂයෙන් මිදී විශ්වය තුළ අතරමං වී, අයාලේ යන තවත් එක් අජව ග්‍රහලොවක් පමණක් වනු ඇත. මේ නිසා පෘථිවියේ කක්ෂය ස්ථාවර වුවත් එහිම නම් එය සූර්යයන් දෙදෙනාගෙන් එක් අයකු වටා පමණක් භ්‍රමණය විය යුතුය. එහෙත් පෘථිවියේ පවතින සංකීර්ණ ජීවය සඳහා එවැනි වාතාවරණයක් වුව සුදුසු නොවන්නේ යම් අවස්ථාවකදී තාරකා ද්විත්වයම එකවර පෘථිවියේ දෙපසටම මුහුණලා පිහිටී හැකි බැවිනි. ඉන් පෘථිවිවාසීන්ට රාත්‍රිය අහිමි වනවා පමණක් නොව අහිතකර තාපප්‍රමිතිය කිරණ හා සූර්ය කුණාටුවල බලපෑම දෙතුණයකින් අත්විඳීමට සිදු වනවා ඇත. එක්වර සූර්යයන් දෙදෙනකුගෙන් නිකුත් වන තාප විකිරණවලින් නොදැවී සිටීමට තරම් පෘථිවිවාසීන් වාසනාවන්ත නොවනු ඇත.

විකිරණ ප්‍රමාණය

එහෙත් සූර්යයන් දෙදෙනාම එටා භ්‍රමණය වෙමින් ස්ථාවර කක්ෂයක් පවත්වා ගැනීමට වුව ද පෘථිවියට බැරිකමක් නැත. එසේත් ඒ සඳහා සූර්යයන් දෙදෙනාම එකිනෙකාට සමීපව පිහිටා තිබීම වැදගත්ය. එහෙත් එවිට පෘථිවියේ කක්ෂය විෂ්කම්භයෙන් වැඩි වන බැවින්, ජීවය පවත්වා ගැනීමට ප්‍රමාණවත් අයුර්න්, එනම්: ජලය දුව තත්ත්වයෙන් පවත්වා ගැනීමට සමත් අයුර්න් හිරු එළිය නොලැබෙන නිසා පෘථිවිය හිමෙන් මිදුණු, අජීවී ග්‍රහලොවක තත්ත්වයට පත් වනු ඇත. යම් හෙයකින් සූර්යයන් දෙදෙනාගේ දීප්තියන්ගේ එකතුව, දැනට අප සතුව ඇති සූර්යයාගෙන් නිකුම්මන සමස්ත දීප්තියකට සමාන වන්නේ නම්, පෘථිවියට ලැබෙන විකිරණ ප්‍රමාණයේ දැනට වඩා වෙනසක් සිදු වන්නේ නැති බැවින්, ජීවය පවත්වා ගැනීමේ ගැටලුවක් පැන නොනඟිනු ඇත. ඒ සඳහා එක් එක් සූර්යයාගේ ස්කන්ධය වත්මන් සූර්යයාගේ ස්කන්ධයෙන් 85%ක් පමණ විය යුතුය. මන්දඃ දීප්තිය (L-Luminosity) හා ස්කන්ධය (M-Mass) අතර පවත්නා සම්බන්ධයට අනුව (L= M4) අනුව ස්කන්ධයෙන් 15%ක් වැනි සුළු අඩු වීමක් පවා දීප්තිය අඩකින් අඩු වීමට හේතුවන බැවිනි. ඒ අනුව සූර්යයන් දෙදෙනාගේ ස්කන්ධවල එකතුව, වත්මන් සූර්යයාගේ ස්කන්ධය මෙන් 1.7ක් ගුණයකින් වන බැවින් ඉන් පෘථිවිය කෙරෙහි ඇති කරන ගුරුත්ව බලපෑමේදු ඉහළ යනු ඇත. එය පෘථිවිය මත ගෙවෙන වසරක කාලය දැනට වඩා මඳක් අඩු වීමට, එනම් දින දෙසිය අසූවක් දක්වා කෙටි වීමට හේතු වනවා ඇත. සූර්යයන් දෙදෙනාගේ සිට පෘථිවියට වන දුර, සූර්යයන් දෙදෙනා අතර වන තරහරය මෙන්, සිවි ගුණයක් වන තෙක් පෘථිවියට සූර්යයන් දෙදෙනා කේන්ද්‍ර කරගනිමින් ස්ථාවර කක්ෂයක ගමන් කිරීමට කිසිදු බාධාවක් එල්ල නොවන බව කිව හැකිය.

සූර්යග්‍රහණ

මෙවැනි තත්ත්වයක් යටතේ තවත් අපූර්ව සංසිද්ධියක පංගුකාරයන් වීමට ද අපට හැකි වනු ඇත. සූර්යයන් දෙදෙනා ද එකිනෙකාට ඇති දුර ප්‍රමාණය අනුව දින දහයක් වැනි කාලයකට වරක් බැගින් එකිනෙකා වටා පරිභ්‍රමණයක් සම්පූර්ණ කරන්දී සූර්යග්‍රහණ ද සෑම දින පහකට වරක් අපට දැකගත හැකි වනු ඇත. චන්ද්‍රයාගෙන් ආවරණය වීමත් නොව, එක් සූර්යයකු තවත් සූර්යයකුගෙන් ආවරණය වීමේන් හටගන්නා මෙබඳු සූර්යග්‍රහණ වරකදී පැය හයක පමණ කාලයක් පවතිනවා ඇත. එවැනි කාලාන්තර පෘථිවිය යම් තාක් දුරට සිසිල් කළ ඳ, වත්මන් කාලගුණික තත්ත්වය මුළුමනින්ම අවුලා කිරීමට තරම් බලපෑමක් ඒවායින් සිදු නොවන බව අපේක්ෂා කළ හැකිය. මේ සියල්ල සලකා බැලීමේදී ලුක් ස්කයිවොවර්ගේ මව් ග්‍රහලා වන ටැටූයීන් වැනි ග්‍රහලොවක ජීවත් වීම සැබවින්ම කළ නොහැක්කක් නොවෙනවා ඇත.

එහෙත් ගැටලුව වන්නේ සූර්යයන් දෙදෙනකු සහිත සෞරග්‍රහ මණ්ඩලයක් තුළ පෘථිවිය වැනි ජීවයට සුදුසු ග්‍රහයකුගේ බිහි වීම සිදු විය හැකි ද යන්නය. මන්දඃ දැනට අප හඳුනාගෙන තිබෙන එවැනි තත්ත්වයක සපු වන කුඩාම ග්‍රහලොව වන කෙප්ලර්-1647b පවා සම්පූර්ණයෙන්ම වායුන්ගෙන් පමණක් සමන්විත, අධි බර ග්‍රහලොවක් වන නිසාය. එහෙත් යම් දිනෙක ප්ලේටෝ වැනි අඟහසොශය දූරදර්ශී හා ගෝධ මැගලන් දූරේක්ෂ වැනි දැවැන්ත බිම් මට්ටමේ හිරිත්ෂණාගාර මඟින් ස්ටාර් වෝස්ගේ ටැටූයීන් වැනි සජීවී, පරිසුග්ම ග්‍රහලෝක අනාවරණය කරගන්නා දිනයද වැඩි ඈතක නොවනු ඇත.

▶ රුක්ලන්ති පෙරේරා

හදවත සුව කරන අලුත්ම සොයාගැනීම වැදෑමහෙන්

හෘදයාබාධයකට ලක් වීම යනු මාරාන්තික අත්දැකීමක් බව අමුතුවෙන් කිව යුතු නැත. ඇතැම් විට ක්ෂණික මරණයෙන් කෙළවර නොවුණත් එලෙස හෘදයාබාධයකට ලක් වන පුද්ගලයන්ගෙන් අඩකට වඩා වැඩි දෙනකු වසර පහකට වඩා වැඩි කාලයක් ජීවත් වීමට වරම් ලබන්නේ නැත. ඊට හේතුව හෘදයාබාධයකදී මිය යන හෘත් සෛල සිරුරේ වෙනත් සෛල මෙන් නව සෛලවලින් ප්‍රතිස්ථාපනය වීමක් සිදු නොවීමයි. අපේ සිරුරේ වන බහුතරයක් සෛල අඛණ්ඩව අලුතින් වර්ධනය වීම සිදු වුණත් හෘත් සෛල එලෙස වර්ධනය වන්නේ වසරකදී 0.5%ක් වැනි නොගිණිය හැකි සුළු ප්‍රතිශතයකිනි. හෘදයාබාධයකින් මිය යන සෛල පුනර්වර්ධනය වීමට මේ වේගය කිසි සේත්ම ප්‍රමාණවත් වන්නේ නැත. හෘදයාබාධයකින් වූ හානිය නිවැරදි කිරීම වෙනුවට වන එකම දෙය නම් මිය ගිය සෛල පිහිටි ස්ථාන ඝනකමැති කැළල් සහිත පටකයාගෙන් වැසීයෑමය. හෘදයේ ක්‍රියාකාරී සෛල ප්‍රමාණය මෙලෙස මිය යෑම නිසා ප්‍රමාණවත් රුධිර සැපයුමක් සිරුර පුරා පවත්වාගෙන යෑමට අපොහොසත් වීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ රෝගියා අකාලයේ මරණයට පත් වීමයි.

සදාචාරාත්මක ගැටලු

හෘදයාබාධයකදී මිය යන සෛල ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රාථමික සෛල (ඇටමිදුලු සෛල) යොදාගැනීම පිළිබඳ පර්යේෂණ ඇරඹුණේ මීට කලකට ඉහතදී වුවද ඉන් බලාපොරොත්තු වූ ආකාරයේ සාර්ථක ප්‍රතිඵල ලැබී තිබුණේ නැත. සිරුරේ ඕනෑම ස්ථානයක පිහිටි ඕනෑම සෛල වර්ගයක් බවට පරිවර්තනය වීමේ අපූර්ව හැකියාවෙන් යුතු ප්‍රාථමික සෛල ඇසුරෙන් කෙරෙන චිකිත්සාවේදී ප්‍රාථමික සෛල ලබා ගැනුණේ කලලවලිනි. එහෙත් එලෙස කලලවලින් ප්‍රාථමික සෛල ගැනීමේ ක්‍රියාවලියේදී කලල මරණයට පත් වීම නිසා සදාචාරාත්මක වශයෙන් එම ක්‍රමවේදය යොදා ගැනීම අතිශය ගැටලු සහගත විය. ඒ හැරත් මෙලෙස කලලවලින් ගත් ප්‍රාථමික සෛල, ප්‍රතිග්‍රාහක රුධිරයට එන්නත් කළ විට ඒවා ඉලක්කගත අවයවය (හෘදය) සොයාගෙන ඒ වෙත ගමන් කිරීමේ හැකියාවෙන්ද තොර විය, මේ නිසා හදවත් සෛල නැවත වර්ධනය කිරීමේ ක්‍රියාවලිය සාර්ථක වන බවට ලකුණු පහළව තිබුණේ නැත.

විප්ලවීය නව සොයා ගැනීම

නිව්යෝක් නුවර මවුන්ට් සීනායි රෝහලේ හෘදය පුනර්වර්ධන විද්‍යාව සම්බන්ධ අධ්‍යක්ෂවරයා වන වෛද්‍ය හීනා චෞද්‍රි ප්‍රමුඛ වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් ප්‍රාථමික සෛල සම්බන්ධයෙන් කළ නවතම සොයාගැනීම නිසා රෝගී හදවත් වෙනුවට නිරෝගී හදවත් විද්‍යාගාර තුළ නිර්මාණය වන දිනය වැඩි ඈතක නොවනු ඇත. මේ නිසාම ප්‍රාථමික සෛල චිකිත්සාවට අනුගාමිව සිදු කර තිබෙන මේ විප්ලවීය නව සොයා ගැනීම කිරුළ පැලඳ සිටින්නේ හදවත් වෛද්‍ය විද්‍යාවේ එතෙක් මෙතෙක් කළ සුවිශේෂ සොයාගැනීම ලෙසයි. වැදෑමහෙන් ගන්නා Cdx2 සෛල හැඳින්වෙන ප්‍රාථමික සෛල විශේෂයක් විද්‍යාගාර තුළදී මියන්ට එන්නත් කොට වෛද්‍ය චෞද්‍රි ප්‍රමුඛ වෛද්‍ය කණ්ඩායම මේ සොයාගැනීම සිදු කළහ.

කලල අවධියේදී කලලයට අවශ්‍ය සියලු පෝෂණය මවගෙන් නොඅඩුව සපයා දෙන, මවත් නුපන් දරුවාත් අතර වන සංකීර්ණ පටලයක් වන වැදෑමහ යනු ප්‍රාථමික සෛලවලින් අනුන ප්‍රභවයකි. ඉන් ගත් Cdx2 ලෙස හැඳින්වෙන ප්‍රාථමික සෛල විශේෂය, කලල ප්‍රාථමික සෛලවලට වඩා සුවිශේෂ වූයේ ඒවාට වෙනත් ඕනෑම සෛල විශේෂයකට පරිවර්තනය වීමට තිබෙන හැකියාව නිසාම පමණක් නොවේ. රුධිර සංසරණ පද්ධතියට එන්නත් කළ විට හානිය සිදුව ඇති ස්ථානය වෙත සෘජුවම ගමන් හානිය ප්‍රතිපූරණය කරනවාට අමතරව ප්‍රතිග්‍රාහකයාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ලක් නොවී සිටින්න ද එය සමත්ය.

නව මානයක්

"අනාදිමත් කාලයක ඉඳන් අපි හිතාගෙන හිටියේ Cdx2 සෛලවලට පුළුවන්කම තියෙන්නේ කලල වර්ධනයේ ප්‍රාරම්භක අවධියේදී වැදෑමහ නිර්මාණය කරන්න විතරයි කියලයි. ඊට අමතරව වෙනත් අවයව වුණත් නිර්මාණය කරන්න ඒවාට පුළුවන්කම තියෙනවා කියලා පෙන්නුම් කරලා තිබ්බේ නැහැ. අන්න ඒ හින්දයි මේ සොයාගැනීම විස්මිත වෙන්නේ, ළඟදීම අපිට හෘත් සෛල විතරක් නෙවෙයි වෙනත් අවයව වුණත් පුනර්වර්ධනය කරන්න මේ සොයාගැනීම ඉවහල් වේවි."

හෘදය වෛද්‍ය විද්‍යාව නව මානයක් කරා රැගෙන යනු ඇති බවට අනාවැකි පළ කරන මේ නව සොයාගැනීම ගැන වෛද්‍ය චෞද්‍රි බලාපොරොත්තු පළ කරන්නේ එලෙසය.

වැදෑමහේ සෛල ප්‍රතිශක්තියෙන් 40%ක් වන Cdx2 සෛල සතු මේ අද්විතීය හැකියාව ගැන වෛද්‍ය චෞද්‍රිගේ කණ්ඩායමට මුලින්ම අනාවරණය වුණේ මියන් යොදාගෙන මීට කලකට පෙර කළ පර්යේෂණයකදීය. එහිදී මවගේ හදවතට හානි වූ විට වැදෑමහේ පිහිටි සෛල කිසිදු බාහිර බලපෑමකින් තොරවම හදවත වෙත ගමන්කොට 'කාඩියෝමයෝසයිට්' ලෙස හැඳින්වෙන හෘත් සෛල බවට පරිවර්තනය වී, හදවතට වූ හානිය ප්‍රතිසංස්කරණය කිරීමට පෙලඹෙන බව අනාවරණය විය. වැදෑමහේ සෛල වෙනත් ආහාන්තුක සිරුරු තුළ ද මෙලෙසම හැසිරෙන්නේ ද කියා තහවුරු කරගැනීම වෛද්‍ය චෞද්‍රිගේ කණ්ඩායම කාෂ්මීර හෘදයාබාධයන්ට ලක් කළ මියන්ගේ පිරිමි සතුන් කණ්ඩායම් තුනක් යොදා ගනිමින් තවත් පරීක්ෂණයක් සිදු කළෝය. 'Proceedings of the National Academy of Sciences' සඟරාවේ පළ කර තිබූ එම අධ්‍යයනයට අනුව එක් මියන් කණ්ඩායමක් වැදෑමහෙන් ගත් Cdx2 ප්‍රාථමික සෛල චිකිත්සාවකට ද, තවත් කණ්ඩායමක් Cdx2 සෛල ඇඩංගු නොවන ප්‍රාථමික සෛල චිකිත්සාවකට ද ලක් කෙරිණි. පාලක පරීක්ෂණය ලෙස යොදාගත් තුන් වැනි කණ්ඩායමට දුන්නේ සේලයින් ද්‍රාවණයක් පමණි. හෘදයාබාධයන්ට ලක් කළ සැණින් හා ප්‍රාථමික සෛල චිකිත්සාවට ලක් කර මාස තුනකට පසු සිදු කළ එම්ආර්ඇයි ස්කෑන් පරීක්ෂණයන්ගෙන් පෙන්නුම් කළේ Cdx2 සෛල චිකිත්සාව ලැබූ මියන්ගේ හානි වූ හෘත් සෛල නිරෝගී සෛලවලින් ප්‍රතිස්ථාපනය වී තිබුණත් සෙසු මියන් කාණ්ඩ දෙකම හෘදය අක්‍රීය වීමේ අවදානමට ලක්ව සිටි බවයි.

සුභවාදී බලාපොරොත්තු

අවයව පුනර්ජනනය සඳහා මීට පෙර අත්හදා බැලූ කිසිදු සෛල විශේෂයක් විද්‍යාගාර තත්ත්ව යටතේ වෙනත් අවයවවලට පරිවර්තනය වීමේ හැකියාවක් පෙන්නුම් කර තිබුණේ නැත. විශේෂයෙන්ම හදවත් සෛල වැනි පුනර්වර්ධනය වීමේ හැකියාවෙන් තොර අවයවවලට හානි වීම් වූ රෝගීන්ට ඇති එකම විකල්පය වන්නේ අවයව බැදිය කිරීමකට ලක් වීමය. එහෙත් සුදුසු දායක අවයව ගැනීමේ දක්ෂතාවට නිසා එවැනි රෝගීන්ගේ ඉරණම තීන්දු වන්නේ මරණයෙනි. ඒත් වැදෑමහෙන් උකහාගත හැකි මේ ප්‍රාථමික සෛල විශේෂය නිසා හදවත් හා වෙනත් අවයව බැදිය කිරීමේ පොරොත්තු ලේඛනවල කල් මරමින් දිනෙන් දින මරණයට ළඟා වන රෝගීන්ගේ ජීවිතවලට සුභවාදී බලාපොරොත්තු දැල්වීමට හැකි වනු ඇත. වඩාත්ම සුභදායක කාරණය වන්නේ කලල සෛල මෙන් නොව වැදෑමහ යනු කිසිදු අගහිඟයකින් හෝ ආධාරකින් තොරව අවශ්‍ය ප්‍රමාණයෙන් ගත හැකි අඛණ්ඩ සැපයුමක් ඇති ජෛවීය ප්‍රභවයක් වීමයි. එසේම කලල සෛල ගැනීමේදී මෙන් සදාචාරාත්මක වශයෙන් ගැටලු මතු වන්නේද නැත. ඒ අනුව අවයව බැදිය කිරීම තවදුරටත් අභියෝගයක් නොවන දිනය වැඩි ඈතක නොවනු ඇත.

▶ රුක්ලන්ති පෙරේරා



ජීවිත රැක දෙන ජලජ ඩ්‍රෝන

ඩ්‍රෝන යානයක් කියූ සැණින් ඕනෑම කෙනකුගේ මතකයට නැඟෙන්නේ ඉහළ අහසේ ගමන් කරවිය හැකි යානා ගැනය. ඩ්‍රෝන යානා නිපදවීමෙන් මිනිසාගේ එදිනෙදා වැඩකටයුතුවලට මනා පහසුවක් ගෙන දුන් අතර, අද වන විට පහසු හා ලාභදායි සේවා සඳහා ඩ්‍රෝන යානා වැඩි වශයෙන් භාවිතයට ගැනේ.

ජලයේ ඩ්‍රෝන යානයක් ගමන් කරනවා යැයි ඔබට කෙනකු කිව්හොත් ඒ ගැන ඔබ දෙවරක් සිතා බැලීමට පසුබට නොවේ. දැන් ජලයේ ගමන් කරන ඩ්‍රෝන යානා ද නිෂ්පාදනය කර ඇති අතර ඉන් තවමත් වෙළෙඳපොළට පැමිණ ඇත්තේ සුළු ප්‍රමාණයක් පමණි. Chasing M2 Pro යනු එලෙස ජලයේ විස්කම් පානා මිනිසාට බෙහෙවින් ප්‍රයෝජනවත් වන එක් ඩ්‍රෝන යානාවකි.

ආරක්ෂක අංශ මෙන්ම ජීවිතාරක්ෂක අංශද මෙතෙක් ජලයේ යම් දෙයක් සෙවීමට අවශ්‍ය වූ විටක කිමිදුම්කරුවන් යෙදවීම සිදු කළ ද එවැනි අවස්ථාවලදී ඔවුන්ගේ ජීවිත පවා අනතුරුවලට භාජන වූ අවස්ථා බොහෝය. එලෙස කිමිදුම්කරුවන් යොදා ගනිමින් ජලය යට සෙවීම් කළ යුතු නැති අතර, Chasing M2 Pro මඟින් දැන් පහසුවෙන් ජලය යට පැහැදිලි රූප ගොඩබිම සිටින ඔබට පහසුවෙන් සපයා දෙනු ලබයි.

Chasing M2 Pro ජලය යට ගමන් කිරීමේදී විශාල මාළුන්ගෙන්ද, බාධකවලින් ද බේරී ගමන් කරන අතර, අධිබල මෝටර් යොදා තිබීමෙන් සුළු වේලාවකදී ජලය යට කිමිදී අවශ්‍ය තොරතුරු සොයාදීමට උපකාරී වන අතර, කාර්මිකයන්ට වර්තමානයේ තම සේවා සිදු කිරීමට මනා පහසුවක් ගෙන දෙයි. නැව් වැනි විශාල යාත්‍රාවල කාර්මික දෝෂ පරීක්ෂා කිරීමට ද ඉංජිනේරුවන් මේ දිය යට ඩ්‍රෝන යානය භාවිත කරන අතර, ඉදිරියේදී තව තවත් මුහුදු පතුලේ පෙරළියක් සිදු කිරීමට සමත් වන බවට මව් සමාගම පවසා සිටී.

බෝතල් මූඩි අරින්න දක්ෂයා මෙන්න

නිවෙසේ එදිනෙදා වැඩකටයුතුවලදී විවිධ කුඩා උපකරණ භාවිතයට ගැනීමට සිදු වන අතර, එවැනි උපකරණවලින් අපට මනා පහසුවක් ගෙනදෙන අවස්ථා ද බොහෝය.

උදාහරණයක් ලෙස බීම බෝතලයක් විවෘත කර ගැනීමට opener එකක් (මූඩි අරිනයක්) භාවිතයට ගන්නා අතර, එමඟින් ඉතා පහසුවෙන් මූඩි විවර කර ගත හැකිය.

Cap Launcher bottle opener මඟින් ශරීරයේ අමතර ශක්තියක් වැය කර ගැනීමකින් තොරව බෝතල් මූඩියක් විවෘත කර ගැනීමට දැන් හැකිය. මෙහි ඇති විශේෂත්වය නම් විවෘත වන බෝතලයේ මූඩිය Cap Launcher bottle opener උපකරණයේ රැඳීමක් සිදු වන අතර, එහිම ඇති බොත්තමක් මඟින් ඉන්නා ස්ථානයේ සිට කුණු කූඩයට දැමීමට හැකි වීමයි. වෙනත් උපකරණ මඟින් විවෘත වන මූඩිය විසි වී සැම තැන සෙවීමට අවශ්‍ය නොවන අතර, පහසුවෙන් සහ ඉක්මනින් බෝතල් විවෘත කර ගැනීමට සේම ඉවත දමන මූඩිය තැන තැන නොදමමින් කුණු කූඩයට විසි කිරීමටද හැකිය.

ගුවනේ ඉන්න බුහුටි ඩ්‍රෝන සුරතලා

ඩ්‍රෝන භාවිතය අද සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති අතර ඩ්‍රෝන මඟින් එදිනෙදා කටයුතු පහසු කර ගැනීමට ද හැකිය. තාක්ෂණයේ දියුණුවත් සමඟ දිනෙන් දින ඩ්‍රෝන යානා වැඩිදියුණු වෙමින්, ප්‍රමාණයෙන් ද කුඩා වෙමින් පවතී.

Ryze tech tello යනු ඉතා සැහැල්ලු කුඩා ඩ්‍රෝන යානයක් වන අතර, මෙය තමන්ට කැමැති අයුරින් විවිධ කටයුතු සඳහා භාවිත කළ හැකිය. Ryze tech tello ඉහළ සිට පහළට අත්හළ විට පණ ගැන්වී ස්මාට් දුරකතනයකින් හෝ දුරස්ථ පාලකයකින් පාලනය කළ හැකිය. සැහැල්ලු හා කුඩා බවින් වැඩි වීම වේගවත් ගමනකට පහසුවක් වන අතර, විනාඩි 13ක කාලයක් ඉවනේ සැරි සැරීමට ryze tech tello හට හැකිය. තව ද අංශක 360ක වපසරියක් පහසුවෙන් වීඩියෝගත කර ගැනීමට හැකි අතර, ඔබගේ වලන ඡායාරූප ගැනීමට මෙන්ම ඔබ යම් ක්‍රියාවක නිරත වෙමින් සිටින අවස්ථාවක ඡායාරූපගත කර ගැනීමට ද මෙමඟින් හැකියාව ලැබේ. කැමරා සහ අභි පවතින සෙන්සර් මඟින් මනා ලෙස ඔබ ලුහුබඳිමින් ඔබගේ විනෝද කාලය ඡායාරූප හා වීඩියෝගත කර දීමට ryze tech tello බෙහෙවින් උපකාරී වනු ඇත.

අතේ ගෙන යා හැකි ශීතකරණය

පසුගිය ද්වාර කලාප මඟින් විවිධ චර්ගයේ ශීතකරණ පිළිබඳ විස්තර ඔබ වෙත ගෙන ආ අතර මේ කියන්නට යන ශීතකරණය ප්‍රමාණයෙන් කුඩා එකකි. Chefman mini fridge ශීතකරණයක් සේම ඔබට තේ එකක්, කෝපි එකක් ආදිය උණුසුම්ව රස බැලීමට ද අවස්ථාව ද සලසාගත හැකි අතර එහි ධාරිතාව ලීටර 4කි.

ඔබ රැකියාවට යන විට පහසුවෙන් අතේ රැගෙන යා හැකි පරිදි මේ chefman mini fridge නිර්මාණය කර ඇති අතර ඔබගේ වාහනයේ විදුලි පද්ධතියට මෙන්ම ගෘහස්ථ විදුලි පරිපථවලින් ද විදුලිය ගැනීමට හැකිය. එසේම ඔබ කාර්යබහුල රැකියාවක නිරත පුද්ගලයකු නම් ඔබට අවශ්‍ය පණිවුඩ මේ ශීතකරණයේ දොරටුවෙහි ලියා තබා ගත හැකි වන අතර පහසුවෙන් මකා දැමීමේ හැකියාව ද ඇත. ඔබට මේ කුඩා ප්‍රයෝජනවත් ශීතකරණය ඩොලර් 39 සිට මිල දී ගත හැකිය.

ඕනෑම දෙයක් ගලවන-කපන ගැජට්

කාඩ්බෝඩ් පෙට්ටියකට ගසා ඇති සෙලෝටේප් එකක් ගලවා ගැනීමට කතුරක්, එසේත් නැති නම් පිහි කූඩක් භාවිත කිරීමට අප පෙලඹී සිටිනවා. එසේම ටික් එකක් විවෘත කර ගැනීමට අප විවිධ ක්‍රම අනුගමනය කරන අතර, යම් දෙයක් කපා ගැනීමට මෙන්ම ස්ටිකරයක් ගලවා ගැනීමට යම් තුඩක් සහිත තලයක් භාවිත කිරීමට අප නිරන්තරයෙන් පුරුදුව සිටිනවා.

මේ වැඩ සියල්ලක්ම එක් උපකරණයකින් සිදු කර ගැනීමට හැකි නම් ඉන් සැලසෙන්නේ වඩාත් පහසුවකි. Microblade pill ti යනු ඒ සියල්ලට සරිලන පරිදි ටයිටේනියම් ලෝහයෙන් නිපදවූ කැප්සියුලයක හැඩැති උපකරණයකි. පහසුවෙන් ඕනෑම තැනකට රැගෙන යා හැකි මෙය කීටැග් එකක් ලෙස ද ඔබ ළඟ තබා ගැනීමට හැකිය. එදිනෙදා නිවෙසේ මෙන්ම කාර්යාලයේ වැඩවලදී ඔබට microblade pill ti ඉතා ප්‍රයෝජනවත් වනවාට සැක නැත.

තනි පුද්ගලයාට අවනත මැජික් ස්පීකර්

Speakers භාවිතයෙන් සෑම කෙනකුම සින්දු අසා ඇතිවාට සැකයක් නැත. තාක්ෂණයේ දියුණුවත් සමඟ අද වන විට Bluetooth speakersවලට මිනිසුන් වැඩි ප්‍රියතාවක් දක්වන අතර, එය ද ඇතැම් විටක තවත් කෙනකුට ඝෝෂාකාරී ශබ්දයක් ගෙන දෙන උපකරණයක් ලෙස හැඟිය හැකිය. මේ හේතුවෙන් Handfree භාවිතයට ඇතැම් පුද්ගලයන් හුරු වී සිටින්නේ තවෙකකුට බාධාවක් නැතිව සින්දු රස විඳීමටය.

Sray speaker යනු ඒ සියල්ලකගෙන්ම වෙනස් විශේෂ speaker එකක් ලෙස හැඳින්විය හැකි අතර, මෙමඟින් පිරිසක් සිටින ස්ථානයක අදාළ පුද්ගලයාට පමණක් ශබ්දය ඇසීමට සැලැස්විය හැකිය. මින් වාහනයක ගමන් කරද්දී ඉදිරිපස ගමන් ගන්නා දෙදෙනාගෙන් එක් අයකුට පමණක් සින්දු ඇසීමට අවශ්‍ය විටදී අනෙක් පුද්ගලයාට නොඇසෙන පරිදි sray speaker පහසුවෙන් ක්‍රියා කරයි.

▸ ගයාන් සංජය

අණුවට තනි යතුර

නිවෙසේ දොරට එක් යතුරක් හෝ යතුරු දෙකක් තිබේ නම් ඉන් පවුලේ අනෙක් සාමාජිකයන් අපහසුතාවට පත් වනු නිරනුමානය. අනෙක් අතට යතුරු කිහිපයක් භාවිතය නිවෙසේ ආරක්ෂාවට ගැටලුවකි. මේ අනුව එක් යතුරකින් පවුලේ සෑම කෙනකුටම නිවෙසෙට ඇතුළු වීමට හැකි නම් එය වඩාත් ප්‍රයෝජනවත්ය. තාක්ෂණයේ දියුණුවත් සමඟ එය අද keymitt මඟින් පහසුවක් කර දී අවසන්ය.

Keymitt යනු තනි යතුරකින් හෝ නිවෙසේ ගෘහ මූලිකයාගේ අණ පරිදි ඕනෑම කෙනකුට නිවෙසේ දොර විවෘත කර දීමට නිර්මාණය කළ උපකරණයකි. මේය ස්මාට් දුරකතනයේ ස්ථාපනය කළ මෘදුකාංගයක් මඟින් පහසුවෙන් ක්‍රියා කරවිය හැකි අතර, ඔබට අවශ්‍ය පරිදි දොර විවෘත කර තැබීමට වේලාවක් ද සපයා දිය හැකිය. නිවෙසෙ සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ද keymitt මඟින් හැකියාව ලැබෙන අතර '' බ්ලූටූත් මඟින් ද ක්‍රියා කරවිය හැකිය.

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

ටෙන්ඩර් නිවේදනය

මහනගර සභාව, මඩකලපුව

1. මඩකලපුව මහ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම් සපුරා ඇති යෝග්‍ය කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් කර ඇති වැඩ සඳහා මුදු, තබන ලද ලංසුපත් කැඳවයි.
2. ලංසු කිරීම දේශීය තරගකාරීත්ව ලංසු පටිපාටියට අනුව සිදු කරනු ලබයි.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත (Black List) නොවී සිටිය යුතු අතර, පහත සඳහන් පරිදි ඉදිකිරීම කර්මාන්ත සංවර්ධනය අධිකාරියෙහි (CIDA) ලියාපදිංචි කර තිබිය යුතුය.
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍යතා 04 වන කොටසේ සුදුසුකම් තොරතුරුවල සහ ලංසු ලිපිලේඛනයේ 05 වන කොටස වන උපලේඛනයේ (SCHEDULE) ඇතුළත්කොට ඇත.
5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මඩකලපුව කාර්යාලයෙන් **(දුරකතන අංකය** 065-2222275, **ෆැක්ස් අංකය** 065-2224783 **ඊ-මේල්** - battimc@gmail.com) වැඩිදුර තොරතුරු ලබාගත හැකිය. එසේම ඉහත සඳහන් ලිපිනයේදී සතියේ රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 15.00 පැය දක්වා වැඩකරන දිනවල ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
6. උනන්දුවක් දක්වන ලංසුකරුවන් නාගරික කොමසාරිස්, මහනගර සභාව මඩකලපුව කාර්යාලය වෙතින් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් 2021.05.10 **දින සිට** 2021.05.31 **දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 15.00 පැය අතර,** ආපසු ගෙවනු නොලබන **රු. 3,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.
7. සම්පූර්ණ කළ ලංසු පිටපත සහිතව **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මහ නගර සභාව, මඩකලපුව** යන ලිපිනයට 2021.06.01 **වැනි දින ප.ව. 15.00 ට පෙර ලැබිය යුතුය.** ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු භාරදුන් දින සිට **දින 77 (හැත්තෑ හතක්)** 2021.08.17 වන දින දක්වා වලංගු විය යුතුය.
9. ලංසු ඇපකරය පහත වගුවේ ලබාදී ඇති තොරතුරු පරිදි වේ.
10. ලංසුවට පෙරවූ රැස්වීමක් 2021.05.20 **වන දින පෙ.ව. 10.00 ට** මහනගර සභාව, මඩකලපුව යන ලිපිනයේ පැවැත්වේ. එම රැස්වීම පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් තමන්ගේ වියදමින් සහභාගි විය හැකිය.

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	ඇස්තමේන්තු කරන ලද මුදල් (රු. මිලියන)	කොන්ත්‍රාත් කාල සීමාව	ක්ෂේත්‍රය	අවශ්‍ය ශ්‍රේණිය	අවශ්‍ය ශ්‍රේණිය	
						ලංසු ඇපකරයේ වටිනාකම	වලංගු කාලය
BMC/ENG/ MCF/2021/03	ආදාහනාගාරය ඉදිකිරීම මඩකලපුව	21.55mn	මාස 06	ගොඩනැගිලි	C6/C5	215,000.00	2021.09.14 දක්වා

මා. තයාපරන්
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව, මඩකලපුව.

ප්‍රසම්පාදන දැන්වීමයි

ලංසු සඳහා ආරාධනයයි

ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

1. CBO ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා PVC/GI පයිප්ප හා වෑද්දුම් සැපයීම

ප්‍රසම්පාදන කමිටුව විසින් පහත විස්තර කොට ඇති භාණ්ඩ සඳහා PVC/GI පයිප්ප නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත්තුවේ නම	සුදුසුකම්	ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.)	අවශ්‍ය ලංසු ඇපකරය (බැංකු ඇපකරය හෝ මුදල් තැන්පතුව)		ලංසු ලිපි ලේඛන නිකුත් කරන ස්ථානය, සම්බන්ධ විය යුතු අයවලුන් සහ ලංසු භාර ගැනීමේ අවසාන දිනය
			බැංකු අණකරය		
1. PVC පයිප්ප සහ වැද්දුවී සැපයීම. කොන්ත්‍රාත් අංකය: DNCWS/ PRO/2021/PVC/01	PVC පයිප්ප නිෂ්පාදකයන්	3,000/=	60,000/=		**ලංසු ලිපිලේඛන නිකුත් කරනු ස්ථානය හා සම්බන්ධ විය යුතු නිලධාරියා;** අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ. **දුරකථනය** : 0112774927, 0714457115 **ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව** : 2021 ජූනි 01 වෙනි දින පෙ.ව. 10.00 ට
2. PVC පයිප්ප සහ වැද්දුවී සැපයීම. කොන්ත්‍රාත් අංකය: DNCWS/ PRO/2021/GI/01	GI පයිප්ප නිෂ්පාදකයන්	3,500/=	80,000/=		

1. අයදුම්කරුගේ ලිපි ශීර්ෂයක ලිඛිත අයදුම්පතක් සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත **(ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන 0007040440 ගිණුම් අංකයට)** ගෙවන ලද ආපසු ගෙවනු නොලබන ගාස්තුව සඳහා ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීම මත ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ.
2. ලංසු ලිපිලේඛන 2021 **මැයි 31 වෙනි දින 14.00 පැය** දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන් හි ලබාගත හැකිය. (ලිපිලේඛන ලබා ගැනීම සඳහා දුරකථනයෙන් අමතා වේලාවක් වෙන් කරවා ගන්න)
3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ලිපිලේඛන නිකුත් කරන ස්ථානයේදී සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී නොමිලේ ලංසු ලිපලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
4. තිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු 2021 **ජූනි 01 වෙනි දින** පෙ.ව 10.00 ට හෝ ඉන් පෙර ලැබෙන පරිදි දෙපාර්තමේන්තුවේ 2 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් හෝ සීඝ්‍ර දූත සේවා මගින් පහත සඳහන් ලිපිනය වෙත යොමු කළ යුතුය.
5. සියලුම ලංසු, 2021 **ජූනි 01 වෙනි දින** පෙ.ව. 10.15 ට එම ලිපිනයේදී එම අවස්ථාවට පැමිණ සිටිමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකොට ආපසු හරවා එවනු ලැබේ.
6. ලංසු වලංගු කාල සීමාව **දින 91 කි.**
7. ලංසු ඇපකරය 2021.10.01 වැනි දින දක්වා වලංගු විය යුතු අතර, "**අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,** අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ" යන නමින් විය යුතුය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ.
2021.05.07.

ප්‍රසම්පාදන දැන්වීම

දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

දකුණු පළාත් සභාව

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් වැඩ යෝජනා සඳහා 2021.05.10 දින සිට 2021.06.02 **දින පෙ.ව. 10.00 දක්වා** සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසුපත් කැඳවනු ලැබේ.

අනු අංකය	ව්‍යාපෘති අංකය	පාසල	වැඩ විස්තරය	අවශ්‍ය CIDA ලියාපදිංචිය	ආපසු නොගෙවනු ලබන ඇප තැන්පත් (රු.)	ලංසු ඇපකර වටිනාකම (රු.)
01	G/C/21/02	ගා/ මාගෙදර ප්‍රා. වි.	90'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C6 and C5	3,500.00	105.000.00
02	G/C/21/03	ගා/අම්පෙගම ක.වි.	තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (අවසන් අදියර)	C7 and C6	1,500.00	70.000.00
03	G/C/21/04	ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (ඉතිරි වැඩ)	C7 and C6	2,000.00	80.000.00
04	G/C/21/05	ගා/ අමුගොඩ සුධාරක ප්‍රා. වි.	තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C6 and C5	3,800.00	140.000.00
05	G/C/21/06	ගා/ කොබෙයිදූව ප්‍රා.වි.	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C6 and C5	3,800.00	130.000.00
06	G/C/21/07	ගා/ ඕල්සන්ට්ස් විද්‍යාලය	60'X70' පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම	C7 and C6	2,500.00	85.000.00
07	M/C/21/05	මාර/ සීවලි ආදර්ශ විද්‍යාලය	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C7 and C6	2,000.00	80.000.00
08	M/C/21/06	මාර/ ඕවිටිගමුව ප්‍රා. වි.	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C6 and C5	3,800.00	124.000.00
09	M/C/21/07	මාර/ පැතැටියන සද්ධාතිස්ස ක. වි.	60'X30' තනි මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (2 අදියර)	C8 and C7	1,000.00	42,000.00
10	M/C/21/08	මාර/ පෝරඹක වි.	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (II අදියර)	C7 and C6	2,500.00	85,000.00
11	M/C/21/09	මාර/ මෙදේරිපිටිය ක.වි	දෙමහල් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම	C8 and C7	1,000.00	26,000.00
12	M/C/21/10	මාතර කලාප අධ්‍යාපන කාර්යාලය	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (iv අදියර)	C7 and C6	2,500.00	100,000.00
13	M/C/21/11	මාර/ මලිදූව ක. වි.	90'X25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (සම්පූර්ණ කිරීම)	C6 and C5	4,000.00	161,000.00
14	H/C/21/04	හ/ රත්න වාඩියගොඩ ක.වි.	58'X20' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	C7 and C6	2,000.00	80,000.00
15	H/C/21/05	හ/ කිවුල ක. වි.	90'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (II අදියර)	C7 and C6	2,500.00	90,000.00

1. ඉහත දක්වා ඇති කර්මාන්ත සඳහා ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ, ලියාපදිංචි වී ඇති නියමිත ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන් හට ලංසු ඉදිරිපත් කළ හැකිය.
2. මේ සම්බන්ධව අවශ්‍ය වැඩි විස්තර ලබුදූව, දක්ෂිණපාය, බිම් මහල, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් හෝ **දුරකථන අංක** 091-2242776 ට ඇමතීමෙන් හෝ ලබාගත හැකිය. මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශයෙන් කාර්යාල වේලාවන් තුළ ලංසු ලිපි ලේඛන ද පරීක්ෂා කර බැලිය හැකිය.
3. ඉහත සඳහන් ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදල, මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත ගෙවා ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් හෝ මෙම අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුම වන ලංකා බැංකුව, කොටුව, ගාල්ල ශාඛාවේ අංක 0001587423 දරන බැංකු ගිණුමට බැර වන සේ මුදල් තැන්පත් කර ලබාගන්නා කුවිතාන්සිය හෝ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලේඛන ලබාගත හැකිය. 2021.05.10 **දින සිට** 2021.06.01 **දින ප.ව. 3.00 දක්වා** කාර්යාල වේලාව තුළ ලංසු ලේඛන නිකුත් කරනු ලැබේ.
4. ලංසු ලේඛන සමග ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති පිළිගත් ඕනෑම වාණිජ බැංකුවකින් නියමිත වටිනාකමින් යුතුව ලබාගත් ලංසු සුරක්ෂණයක්, ලංසුපත් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය 2021.06.02 **දින සිට** 2021.08.31 **දින** දක්වා වලංගු විය යුතුය. ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ලෙසද ලංසු සුරක්ෂණය ලබාදිය හැකි අතර, ඒ සඳහා ඉල්ලුම් කරන කර්මාන්තය වෙනුවෙන් ඉහතින් දක්වා ඇති ලංසු ඇපකර වටිනාකම මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත 2021.06.01 **දින ප.ව. 3.00 ට** පෙර මුදලින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත ලංසුපත් සමග ඉදිරිපත් කළ යුතුය. 2021.08.03 දින දක්වා ලංසුපත් වලංගු විය යුතුය.
5. 2021.06.02 **දින පෙ.ව 10.00 දක්වා** ලංසුපත් භාරගනු ලබන අතර, එදින **පෙ.ව. 10.30 ට** ලංසුපත් විවෘත කරනු ලැබේ. **ලංසුපත් එදින 10.00 ට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ටෙන්ඩර් පෙට්ටියට බහාලන්නේ නම් ඒ සඳහා තබා ඇති ලේඛනයේ සටහන් කර අදාළ නිලධාරියා දැනුවත් කර ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කෙරෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. ලංසුපත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයන්හි ඉහළ වම් කෙළවරේ, අදාළ කර්මාන්තය සහ ඊට අදාළ අංකය සඳහන් කර තිබිය යුතුය. ලංසුපත්, මුල් පිටපත හා අනු පිටපත ලෙස මුදු, තබා පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව ලිපි කවරයන්හි පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. එම ලිපි කවර දෙකම එක් ලිපි කවරයක බහා මුදු, තබා ඉදිරිපත් කළ යුතුය.
7. සියලු කර්මාන්ත සඳහා වන පූර්ව ලංසු රැස්වීම 2021.05.24 **දින පෙ.ව.** 10.30 ට ගාල්ල, ලබුදූව, දක්ෂිණපාය, පළමු මහලේ පිහිටි දකුණු පළාත් අධ්‍යාපන අමත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබේ.
8. ලංසුපත් ඉදිරිපත් කිරීමට පෙර අදාළ වැඩ බිම් පරීක්ෂා කර තිබීම වැදගත් වන බැවින් වැඩබිම පරීක්ෂා කොට ලංසුපත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
9. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකරනු ලබන කර්මාන්තයන්හි ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රු. මිලියන 50 ට අඩු බැවින් ප්‍රාදේශීය ප්‍රමුඛතාවය හා CIDA ප්‍රමුඛතාවය මත රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 4/2016(iii) අදාළ කරගෙන ලංසු ඇගයීම සිදු කරනු ලැබේ.

රංජිත් යාපා,
ප්‍රසම්පාදන කමිටු සභාපති,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
පළමු මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.
2021.05.10


Sunday Observer ADZ it's what you want

ඔබගේ ලුහුඬු දැන්වීම් ලඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු... (වචන 15ක් සඳහා)

සිනෑම එක් පුවත්පතක් සඳහා	සිනෑම පුවත්පත් දෙකක් සඳහා	පුවත්පත් තුනම සඳහා
රු. 300/- * සිනකරන් වාරමන්පරි හැර	රු. 500/- * සිනකරන් වාරමන්පරි හැර	රු. 650/-

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910
කතරගම - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදාන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335
මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / නුගේගොඩ - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පැලවත්ත, බත්තරමුල්ල

අරමුදල් සම්පාදනය - ශ්‍රී ලංකා රජය හයිඩෙල්බර්ග් (SM74-1-620777) මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හා නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය

4/2/8/2018

ශ්‍රී ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් හයිඩෙල්බර්ග් (SM-74-1-620777) මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම හා නඩත්තුව සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

1. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය තුළින් පවත්වනු ලැබේ.
2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධුලේඛනගත නොවී සිටිය යුතු වන අතර. ශ්‍රී ලංකාවේ ඉහත සඳහන් යන්ත්‍රෝපකරණ එනම් මුද්‍රණ යන්ත්‍ර සේවා කිරීම් පිළිබඳව **වසර 3 ක** පළපුරුද්දක් ද සතුව තිබිය යුතුය.
3. ලංසුකරු 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත්තු පනත ප්‍රකාරව, ලියාපදිංචි වී සිටිය යුතුය.
4. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 03 වන මහලේ සැපයුම් අංශයේ සහකාර කොමසාරිස් **(සැපයුම්) වෙතින් (දුරකථන / ෆැක්ස් : 0112784393 හෝ 011-2785219)** මගින් විමසා ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන 2021.05.28 වන දින දක්වා රාජකාරී දිනවලදී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** අතරතුර නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.
5. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් වන අංගසම්පූර්ණ ලංසු ලියවිලි කට්ටලයක් එක් කට්ටලයක් සඳහා, ආපසු ගෙවනු නොලබන **ශ්‍රී ලංකා රුපියල් 2000.00 ක** ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හා බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2021.05.10 වන දින සිට 2021.05.28 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** අතරතුර මිලදී ගත හැකිය. (ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත)
6. ලංසු **දින 77 ක්** දක්වා වලංගු විය යුතුය.
7. සියලුම ලංසු සමග ලංසු භාරගන්නා අවසාන දින සිට **දින 107 ක්** දක්වා **(එනම් 2021.09.15 වන දින දක්වා)** වලංගු ලංසු ලිපිලේඛනවලට යාකර ඇති ආකෘතියට අනුව වන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ආකාරයෙන් වන රුපියල් පනස් දහසක් **(ශ්‍රීලංරු. 50,000.00)** ක් වන වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක් ද ඉදිරිපත් කළ යුතුය.
8. ලංසු 2021.05.31 **වන දින ප.ව.** 2.30 හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ 03 වන මහලේ සැපයුම් අංශය වෙත භාරදිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත නොකරම ආපසු යවනු ලැබේ. ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්ම වූ වහාම, ඉහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටීමට / පුද්ගලිකව සහභාගි වීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.
9. තිසි පරිදි සම්පූර්ණ කළ මුද්‍රා තබන ලද ලංසු ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"හයිඩෙල්බර්ග් මුද්‍රණ යන්ත්‍රය ඇලුත්වැඩියා කිරීම හා නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය කොන්ත්‍රාත්තු අංකය : 4/2/8/2018"** යනුවෙන් සටහන් කර ඉදිරිපත් කළ යුතුය.
10. ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ අගතියට පත් වන ලංසුකරුට හෝ ලංසුකරුවන්ට කිසිදු වගකීමකින් නිදහස්ව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ ක්‍රියාවට හේතු පාදක වන කරුණු අගතියට පත් ලංසුකරුට හෝ ලංසුකරුවන්ට දැනුම් දීමේ වගකීමෙන්ද නිදහස්ව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.
11. පූර්ව ලංසු රැස්වීමක් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේදී 2021.05.18 වන දින පෙ.ව. 10.00 ට පවත්වනු ලැබේ.

විභාග කොමසාරිස ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2021.05.10

ප්‍රසම්පාදන දැන්වීම

ප්‍රධාන ලේකම් කාර්යාලය

උතුරු මැද පළාත

01. උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා පත් කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති හා ප්‍රධාන ලේකම් වන මා විසින් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	විස්තරය ව්‍යාපෘතිය	ඇස්තමේන්තු මුදල රු. මිලියන	කොන්ත්‍රාත් කාලය	ලංසු ඇපකරයේ වටිනාකම	ආපසු නොගෙවන ලංසු ගාස්තුව රු.	CIDA ලියාපදිංචි සීමාව	ලංසු ඇපකරය වලංගු විය යුතු කාලය
01.	Construction of boundary Wall Around the Provincial Ayurwedic Hospital	16.1	දින 210	160,000.00	8,000.00	C 6 හා C 5 (ගොඩනැගිලි සඳහා)	දින 105 (2021.09.13)
	Construction of Quarters Complex - (A) for the Department of Ayurweda - NCP (Above Second Floor Level)	22.6	දින 280	227,000.00	10,000.00	C 5 හා C 4 (ගොඩනැගිලි සඳහා)	දින 119 (2021.09.27)
	Construction of Quarters Complex - (B) for the Department of Ayurweda - NCP (Above Second Floor Level)	22.6	දින 280	227,000.00	10,000.00	C 5 හා C 4 (ගොඩනැගිලි සඳහා)	දින 119 (2021.09.27)

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමයට සිදු කරනු ලබයි. මෙම ප්‍රසම්පාදනවල මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 50 ට වඩා අඩු වන විට, ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය පළාත් භාණ්ඩාගාරයේ චක්‍රලේඛ අංක 2016/13(i) අනුව අදාළ කරගනු ලැබේ.

03. සුදුසුකම් සපුරාලන අසාධු ලේඛන ගත නොවූ ලංසුකරුවන් ආපසු නොගෙවන ලංසු ගාස්තු මුදල, උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත මුදල් ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අවශ්‍ය ලංසු ආකෘතිපත් උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාලයෙන් 2021.05.10 දින සිට 2021.05.31 දින දක්වා කාර්යාල දිනයන්හි පෙරවරු 09.00 සිට පස්වරු 03.00 දක්වා ලබාගත හැකිය.

04. ලංසු කොන්දේසිවලට අනුකූලව සම්පූර්ණ කරන ලද ලංසුපත් 2021.06.01 දින පෙරවරු 10.00 ට පෙර ලැබෙන සේ **"ප්‍රධාන ලේකම් / සභාපති, ගරු ආණ්ඩුකාරතුමා පත් කළ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, හතරවන මහල, පළාත් සභා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට ගෙනැවිත් බහාලීම සිදු කළ හැකිය.

05. සෑම ලංසුවක් සමගම ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල මගින් (Construction Guarantee Fund) ලබාගත් වගුවේ සඳහන් වටිනාකමක් හා වලංගු කාලයක් ඇති කොන්දේසි විරහිත උතුරු මැද පළාත් ආයුර්වේද කොමසාරිස් නමින් ලබාගත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

06. ලංසු ඉදිරිපත් කිරීමේ දී මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තබා එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ව්‍යාපෘතියේ නම සඳහන් කළ යුතුය.

07. 2021.05.01 දින පෙරවරු 10.00 ට ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔහුගේ ලිඛිත බලය පවරන ලද නියෝජිතයෙකුට මෙම අවස්ථාවට සහභාගි විය හැකිය.

08. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

ප්‍රධාන ලේකම් / සභාපති,
ගරු ආණ්ඩුකාරතුමා පත් කළ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2021.05.10

2021 වර්ෂයේ

මිහින්තලා පුදබිම

ආලෝකකරණය හා ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය සඳහා මිල ගණන් කැඳවීමයි

ටෙන්ඩර් අංක : LPA/04/2021

2021 ජූනි මස පැවැත්වෙන පොසොන් උත්සවය නිමිත්තෙන් ලේක්හවුස් ආයතනය මිහින්තලා පුදබිම අලෝකකරණය හා ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

- ❊ ආලෝකකරණය ජූනි 15 සිට 25 දක්වා
- ❊ ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය ජූනි 15 සිට ජූනි 25 දක්වා ද සැපයිය යුතුවේ.

අදාළ පිරිවිතරයන් 2021 මැයි 10 දින සිට 2021 මැයි 17 දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව.3.00 ත් අතර කාලසීමාව තුළ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

අදාළ මිල ගණන් බහා මුද්‍රා තබන ලද කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"2021 වර්ෂයේ මිහින්තලා ආලෝක පූජාව සහ ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා මිල ගණන්"** යනුවෙන් පැහැදිලිව සටහන් කර 2021 මැයි 18 වෙනි දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි, **ප්‍රධානී ප්‍රසම්පාදන, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10** යන ලිපිනය වෙත යොමු කළ යුතු අතර, එම කාලය ඉක්මගිය වහාම ලැබී ඇති මිල ගණන් විවෘත කරනු ලැබේ.

එම මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අදාළ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමැතියලත් නියෝජිතයන්ට අවසර ලැබේ. කෙසේ වෙතත්, කිසිදු හේතු දැක්වීමකින් තොරව ලැබී ඇති මිල ගණන් හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුය.

LAKE HOUSE

ප්‍රධානී ප්‍රසම්පාදන,
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
විස්තර සඳහා : 2429422, 2429454, 2429451

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව

ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා කළුසම් පාවහන් ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, බන්ධනාගාර නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, ක්‍රීඩා පාවහන් සහ සපත්තු පොලිෂ් ටින් සැපයීම - 2021

01. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා කළුසම් පාවහන්, ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, බන්ධනාගාර නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, ක්‍රීඩා පාවහන් සහ සපත්තු පොලිෂ් ටින් සැපයීම - 2021 සඳහා 2021.06.02 වෙනි දින 10.30 පැය දක්වා ලංසු භාරගනු ලැබේ.

	විස්තරය	ප්‍රමාණය
අ	ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා කළු සම් පාවහන් ජෝඩු	102
ආ	ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන් ජෝඩු	1,002
ඇ	කාන්තා ජේලර්වරුන් සඳහා කළු සම්පාවහන් ජෝඩු	35
ඈ	බන්ධනාගාර නියාමකවරුන් සඳහා කළුසම් පාවහන් ජෝඩු	8,637
ඉ	කාන්තා නියාමකවරුන් සඳහා කළුසම් පාවහන් ජෝඩු	983
ඊ	ක්‍රීඩා පාවහන් ජෝඩු	8,144
උ	සපත්තු පොලිෂ්ටින් (ග්‍රෑ. 36)	43,080

02. **2021.06.01 වෙනි දින 15.00 පැය** දක්වා කොළඹ 09, බේස්ලයින් පාරේ අංක 150 පිහිටි බන්ධනාගාර මූලස්ථානයේ සැපයුම් හා සේවා අංශයේ බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) වෙතින් ලංසු ලිපිලේඛන හා පිරිවිතර ලබාගත හැකිය. ආපසු ගෙවනු නොලබන **රු. 5,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලංසුකරුවන් විසින් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. ලංසුකරුවන් තමන්ගේ සමාගම් ලිපි ශීර්ෂයක ආවරණ ලිපියක් මගින් ලංසු ලිපිලේඛන සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

04. ලංසුකරුවන්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතුය.

05. බන්ධනාගාර මූලස්ථානයේ සැපයුම් හා සේවා අංශයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, එම අංශය වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

06. ලංසු ලිපිලේඛනයේ සඳහන් පරිදි ලංසුකරුවන් තත්ත්ව පරීක්ෂණ ගාස්තු බන්ධනාගාර මූලස්ථාන සරප් වෙත ගෙවිය යුතු අතර, ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී ගෙවීම් සිදුකිරීම වෙනුවෙන් ලබාගත් ලදුපත සහ තිසි ලෙස මුද්‍රා තබන ලද අවශ්‍ය කරන සාම්පල ප්‍රමාණය භාරදිය යුතුය.

07. ලංසු, අදාළ ලිපිලේඛන හා සාම්පල, **2021.06.02 වෙනි දින 10.30** පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි **කොළඹ 09, බේස්ලයින් පාරේ අංක 150 පිහිටි බන්ධනාගාර මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ සැපයුම් හා සේවා ශාඛාවේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමට හැකිය. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා කළුසම් පාවහන්, ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා ජේලර්වරුන් සඳහා කළුසම් පාවහන්, බන්ධනාගාර නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, කාන්තා නියාමකවරුන් සඳහා කළුසම් පාවහන්, ක්‍රීඩා පාවහන් සහ සපත්තු පොලිෂ් ටින් සැපයීම - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08. ලංසු භාරගැනීම 2021.06.02 වෙනි දින 10.30 පැයේදී අවසන් කරන අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම බන්ධනාගාර මූලස්ථානයේ ශ්‍රවණාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට (වලංගු බලය පවරන ලද ලිපියක් සමග ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කළ යුතුය.) අවසර දෙනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, අපැහැදිලි හා සාම්පල නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර බන්ධනාගාර මූලස්ථානයේ සැපයුම් ශාඛාව අමතන්න. **දුරකථන අංක** 0114677148/011- 4677178/ 011-4677516

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
සභාපති, බන්ධනාගාර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09.
2021.05.10

ප්‍රසම්පාදන දැන්වීමයි

ලංසු සඳහා ආරාධනය

ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

අංකය	විස්තරය	අවම ICTAD ලියා පදිංචිය සහ පළපුරුද්ද	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.)	ආපසු නොගෙවන ගාස්තුව (රු.)	ලංසු වලංගු කාලය (දින)	ලියකියවිලි නිකුත් කරන ස්ථානය හා විමසිය යුතු අය සහ ලංසු භාරගන්නා අවසාන දිනය
කුරුණෑගල දිස්ත්‍රික්කය						
01	කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල, යෝගමුව කන්ද මී. 6 විෂ්. X මී. 8 . ගැඹුරු පොම්ප කරන ළිඳ (RRM බිත්තිය) ඝන මී 40 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය, මී 3Xමී3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/04	C7 හා ඉහළ	70,000	3,500	91	ලිපිලේඛන නිකුත් කරන ස්ථානය හා විමසිය යුතු අය : අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, නො. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ. දුරකථනය : 0112774927 ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව : 2021 ජූනි 03 වැනිදා පෙ.ව. 10.00
02	කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම පොතුවිල 350, මී6 විෂ් මී. 8 ගැඹුරු කොන්ක්‍රීට් හැරු ළිඳ ඝන මී 80 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය 60 මී 3 ධාරිතාවයේ මී. 12 ක් උස යකඩ/ සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී 3Xමී3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/05	C6 හා ඉහළ	130,000	5,000		
03	කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර නැගෙනහිර, නල්ලූර් හි ඝන මී. 80 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය, ඝන මී 60 ධාරිතාවයේ මී 12 ක් උස යකඩ සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී 3 X මී. 3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/06	C7 හා ඉහළ	100,000	3,500		
04	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව, නිතෝගම 116 හි මී. 6 විෂ්. මී. 8 ගැඹුරු කොන්ක්‍රීට් හැරු ළිඳ ඝන මී. 40 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය, 50 අඩි මී. 3 ධාරිතාවයේ මී. 12 ක් උස යකඩ සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී. 3Xමී.3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/07	C6 හා ඉහළ	110,000	3,500		
05	කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම, කන්දෙගෙදර / රන්තැටි කන්ද, හි මී. 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ ඝන මී. 80 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය, මී 3X මී3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/08	C7 හා ඉහළ	65,000	3,500		
06	කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැල්ලවපිටිය, කහටපිටිය 731හි ඝන මී. 40 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය, 40මී3 ධාරිතාවයේ මී. 12 ක් උස යකඩ සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී. 3Xමී 3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/09	C7 හා ඉහළ	75,000	3,500		
07	කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර දිය දෙර, මී. 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ, මී. 3X මී.3 පොම්පාගාරය මී. 2.5Xමී. 2.5 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/10	C8 හා ඉහළ	50,000	2,500		
08	කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාස්පොත, දහිගමුව, මී. 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ, මී. 3Xමී.3 පොම්පාගාරය, මී. 2.5Xමී. 2.5 පොම්පාගාරය, 60 මී. 3 ධාරිතාවයේ මී. 10 ක් උස යකඩ සිමෙන්ති ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/11	C6 හා ඉහළ	110,000	3,500		
09	කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්ලවපිටිය, මැද්දෙගම, මී. 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ, මී. 3Xමී.3 පොම්පාගාරය,මී. 2.5 X මී. 2.5 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/12	C7 හා ඉහළ	55,000	3,500		
10	කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිහල්පොල, කුලියාපිටිය නැගෙනහිර, ඝන මී 30 යකඩ, සිමෙන්ති බිම් ටැංකිය, මී. 2.5Xමී. 2.5 පොම්පාගාරය මී. 3Xමී.3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/13	C7 හා ඉහළ	35,000	2,500		
11	කුරුණෑගල දිස්ත්‍රික්කයේ හේනේගෙදර, බමුණාකොටුව, මී. 8 ගැඹුරු මී 6 විෂ්. හැරු ළිඳ, මී 2.5X2.5 පොම්පාගාරය, මී 3X3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/14	C8 හා ඉහළ	50,000	2,500		
12	කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොස්හේනාගාර, බිංගිරිය, මී 2.5X2.5 පොම්පාගාරය, මී 3X3 පොම්පාගාරය ඝන මී60 මී. 12 ක් උස යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KN/15	C7 හා ඉහළ	80,000	3,500		
පොළොන්නරුව දිස්ත්‍රික්කය						
13	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ සිංහගම, මී. 3X3 පොම්පාගාරය, ඝන මී ධාරිතාවයේ යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය ඝන මී. 60 ධාරිතාවයේ යකඩ සිමෙන්ති බිම් ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/PO/01	C7 හා ඉහළ	100,000	3,500		
14	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ, හතරැස්කොටුව, මී. 3Xමී 3 පොම්පාගාරය ඝන මී. 50 ධාරිතාවයේ මී. 12 ක් උස යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/PO/02	C7 හා ඉහළ	65,000	3,500		
15	පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර කැගලුගම, මී. 3Xමී 3 පොම්පාගාරය, මී. 2.5X මී 2.5 පොම්පාගාරය, 60 මී 3 ධාරිතාවයේ යකඩ - සිමෙන්ති බිම් ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/PO/03	C7 හා ඉහළ	100,000	3,500		
අනුරාධපුර දිස්ත්‍රික්කය						
16	අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම, රජපත්තාවගම, මී 5 විෂ්. මී. 8 ගැඹුරු සක්කගල් හැරු ළිඳ මී. 2.5Xමී 2.5 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AN/01	C8 හා ඉහළ	35,000	2,500		
17	අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව, කිරියගස්වැව 607 හි මී. 3Xමී.3 පොම්පාගාරය, ඝන මී 40 ධාරිතාවයේ යකඩ සිමෙන්ති බිම් ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AN/02	C8 හා ඉහළ	25,000	2,500		
18	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිදුණුවැව, හුරුලුනිකවැව මී. 6 විෂ්. මී. 8 ගැඹුරු සක්කගල්හැරු ළිඳ මී. 3Xමී. 3 පොම්පාගාරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AN/03	C8 හා ඉහළ	45,000	2,500		
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය						
19	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල, කිවුලුකඩවල මී 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/TR/01	C8 හා ඉහළ	30,000	2,500		
20	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල, කන්දමලව, ඝන මී. 60 ධාරිතාවයේ අඩි 12 ක් උස යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය , මී. 3Xමී.3 පොම්පාගාරය, වැල්ව් කාමරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/TR/02	C7 හා ඉහළ	75,000	3,500		
මඩකලපුව දිස්ත්‍රික්කය						
21	මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයිපත්තු උතුර, කායන්කර්නි 211A හි මී. 6 විෂ්. මී. 8 ගැඹුරු සක්කගල්හැරු ළිඳ ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/BT/01	C8 හා ඉහළ	35,000	2,500		
22	මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයිපත්තු දකුණ, වාකනේරි - 210 හි 30 මී.3 ධාරිතාවයේ අඩි 12 ක් උස යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී. 3Xමී.3 පොම්පාගාරය, වැල්ව් කාමරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/BT/02	C7 හා ඉහළ	55,000	3,500		
23	මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු වෙප්පවෙඩුවන් 186A හි 60 මී 3 ධාරිතාවයේ අඩි 12 ක් උස යකඩ - සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී. 3Xමී. 3 පොම්පාගාරය, වැල්ව් කාමරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/BT/03	C7 හා ඉහළ	75,000	3,500		
24	මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු පෙරියපුල්ලුමලෙහි 50මී. 3 ධාරිතාවයේ අඩි 12 ක් උස යකඩ සිමෙන්ති ඔසවා තබන ටැංකිය, මී. 3Xමී. 3 පොම්පාගාරය, වැල්ව් කාමරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/BT/04	C7 හා ඉහළ	70,000	3,500		
පුත්තලම දිස්ත්‍රික්කය						
25	පුත්තලම දිස්ත්‍රික්කයේ දන්කොටුව, කලුවච්චිමුල්ල 60 මී 3 ධාරිතාවයේ අඩි 12 ක් උස ටැංකිය යන්ත්‍රාගාර කාමරය සමග ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/PU/14	C7 හා ඉහළ	70,000	3,500		
බදුල්ල දිස්ත්‍රික්කය						
26	බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල, සීලතැන්න ජලය ඇතුළු වන මාර්ගය (intake) ඝන මී. 20 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය මී. 2.1 ක් උස රැඳවුම් බැම්ම, කටුකම්බි වැට සහ ගේට්ටුව සවිකිරීම, ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/BA/01	C8 හා ඉහළ	45,000	2,500		
27	බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල, මුරුතහිත්ත ජලය ඇතුළුවන මාර්ගය, ඝන මී 20 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය මී. 2.1 ක් උස රැඳවුම් බැම්ම, කටුකම්බි වැට ඉදිකිරීම, ගේට්ටුව සවිකිරීම. DNCWS/PRO/2021/CV/02/BA/02	C8 හා ඉහළ	40,000	2,500		
28	බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල, නිකපොත බටහිර, ජලය ඇතුළු වන මාර්ගය, ඝන මී 20 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය මී. 2.1 ක් උස රැඳවුම් බැම්ම, කටුකම්බි වැට ඉදිකිරීම, ගේට්ටුව සවිකිරීම. DNCWS/PRO/2021/CV/02/BA/03	C8 හා ඉහළ	40,000	2,500		
අම්පාර දිස්ත්‍රික්කය						
29	අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, තලපිටිඔය දකුණ, ඝන මී 40 යකඩ - සිමෙන්ති මී. 12 ක් උස ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AM/01	C7 හා ඉහළ	55,000	3,500		
30	අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, මාරංගල, ඝන මී 60 යකඩ - සිමෙන්ති අඩි 12 ක් උස ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AM/02	C7 හා ඉහළ	65,000	3,500		
31	අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, තෝරතුම්බර ඝන මී. 40 යකඩ - සිමෙන්ති මී. 12 ක් උස ඔසවා තබන ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/AM/03	C7 හා ඉහළ	55,000	3,500		
මොණරාගල දිස්ත්‍රික්කය						
32	මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල, ගුරුහෙල මී 3X3 පොම්පාගාරය, ඝන මී 100 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය මී 2.1 ක් උස රැඳවුම් බැම්ම, කටුකම්බි වැට ඉදිකිරීම හා ගේට්ටුව සවිකිරීම. DNCWS/PRO/2021/CV/02/MO/01	C8 හා ඉහළ	40,000	2,500		
ගාලු දිස්ත්‍රික්කය						
33	ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ, උඩුගම දකුණ මී. 6 විෂ්. මී. 8 ගැඹුරු හැරු ළිඳ මී. 2.5Xමී2 පොම්පාගාරය, 20 මී 3 යකඩ සිමෙන්ති බිම් ටැංකිය, ආරක්ෂක වැට, ඉදිකිරීම සහ ගේට්ටුව සාද සවිකොට අවශ්‍ය දෑ ලබාදීම. DNCWS/PRO/2021/CV/02/GA/01	C7 හා ඉහළ	80,000	3,500		
මහනුවර දිස්ත්‍රික්කය						
34	මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර බඹරබැද්ද නැගෙනහිර ඝන මී. 30 යකඩ - සිමෙන්ති බිම් ටැංකිය ඉදිකිරීම හා නල ඇතිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/01	C6 හා ඉහළ	100,000	3,500		
35	මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර බඹරබැද්ද බටහිර රෆින් ෆිල්ටරය (Roughing Filter) ($4m^3/h$) ඉදිකිරීම, නළ ඇති කිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/02	C8 හා ඉහළ	40,000	2,500		
36	මහනුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ල හා උඩහේන්තැන්න නළ ඇතිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/03	C5 හා ඉහළ	300,000	10,000		
37	මහනුවර දිස්ත්‍රික්කයේ තවන්ගල පාසලේ මී. 5 ක් උස වේදිකාව, අමුණ සඳහා කොන්ක්‍රීට් ව්‍යුහය ඉදිකිරීම, නළ ඇතිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/04	C7 හා ඉහළ	80,000	3,500		
38	මහනුවර දිස්ත්‍රික්කයේ කුකුල්පෙන්ද හි නළ ඇතිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/05	C8 හා ඉහළ	30,000	2,500		
39	මහනුවර දිස්ත්‍රික්කයේ කයිකාවල ඝන මී. 40 ධාරිතාවයේ යකඩ - සිමෙන්ති බිම් ජලාශය ඉදිකිරීම, නළ ඇතිරීමේ වැඩ. DNCWS/PRO/2021/CV/02/KA/06	C6 හා ඉහළ	100,000	3,500		
කළුතර දිස්ත්‍රික්කය						
40	කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර කෙලින්කන්දේ ජලය ඇතුළු වන මාර්ගය 6 මී. 2 රෆින් ෆිල්ටරය, 12.5 මී 2 ස්ලො සැන්ඩ් ෆිල්ටරය, ක්ලෝරිනේටරය, මෙහෙයුම් කාමරය, 15 මී 3 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/01	C8 හා ඉහළ	40,000	2,500		
41	කලුතර දිස්ත්‍රික්කයේ අද්දරගොඩ ජලය, ඇතුළු වන මාර්ගය i හා ii 6 මී 2 රෆින් ෆිල්ටරය, 12.5 මී. 2 ස්ලෝ සැන්ඩ් ෆිල්ටරය, ක්ලෝරිනේටරය මෙහෙයුම් කාමරය, ඝන මී. 15 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/02	C8 හා ඉහළ	40,000	2,500		
42	කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර හැඩිගල්ලේ, ජලය ඇතුළුවන මාර්ගය, 6 මී. 2 රෆින් ෆිල්ටරය, ඝන මී 15 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/03	C8 හා ඉහළ	45,000	2,500		
43	කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට රනේපුරගොඩ, ජලය ඇතුලු වන මාර්ගය, 6 මී 2 රෆින් ෆිල්ටරය 12.5 මී 2 ස්ලෝ සැන්ඩ් ෆිල්ටරය, ක්ලෝරිනේටරය, පාලක කාමරය, ඝන මී 15 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/04	C8 හා ඉහළ	40,000	2,500		
44	කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට මන්ඩාගල, ජලය ඇතුළුවීමේ මාර්ගය, 6 මී.2 රෆින් ෆිල්ටරය, 12.5 මී 2 ස්ලෝ සැන්ඩ් ෆිල්ටරය, ක්ලෝරිනේටරය, පාලක කාමරය, ඝන මී 15 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/05	C8 හා ඉහළ	40,000	2,500		
45	කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර, කෙලින් කන්ද ජනපදයේ ජලය ඇතුළුවන මාර්ගය, 6 මී. 2 රෆින් ෆිල්ටරය, පොම්පාගාරය, ඝන මී. 20 ගබඩා ටැංකිය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/KL/06	C7 හා ඉහළ	60,000	3,500		
මන්නාරම දිස්ත්‍රික්කය						
46	මන්නාරම දිස්ත්‍රික්කයේ නානට්ටාන්, අච්හන්කුලම් ශාන්ත ජෝශප් ග්‍රාමීය ජල සම්පාදන සමිති CBO හි 60 මී 3 - 12 මී උස ඔසවා තබන ටැංකිය, 1 වර්ගයේ වැල්ව් කාමරය ඉදිකිරීම. DNCWS/PRO/2021/CV/02/Mn/01	C7 හා ඉහළ	70,000	3,500		

ඉහත විෂයය සඳහා පොදු උපදෙස් හා කොන්දේසි :

1. අයදුම්කරුගේ ලිපි ශීර්ෂයක ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ගාස්තුව (ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අංක 0007040440 දරන ලංකා බැංකු (ගිණුමට) තැන්පත් කොට ලබාගන්නා තැන්පතු තුණ්ඩුව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසුකරණ ලිපිලේඛන නිකුත් කෙරෙනු ඇත.
2. ලංසුකරණ ලිපිලේඛන 2021 මැයි 31 දින තෙක් සාමාන්‍ය වැඩකරන දිනයන්හි 0900 පැයත් 1500 පැයත් අතර, ලබාගත හැකිය. (ඒ සඳහා දුරකථන මගින් කලින් වේලාවක් වෙන් කරවා ගන්න)
3. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ ලංසු ලිපිලේඛන නිකුත් කරන ස්ථානයේදී ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.
4. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු 2021 ජූනි 03 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර පහත දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හේ කුරියර් සේවාවක් මගින් ලැබෙන්නට සැලැස්විය හැකිය. නැතහොත් දෙපාර්තමේන්තුවේ 2 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.
5. පූර්ව ලංසු රැස්වීම 2021.05.28 දින පෙ.ව. 10.00 ට දෙපාර්මේන්තුවේදී පැවැත්වේ.
6. සියලුම ලංසු 2021 ජූනි 03 වන දින පෙ.ව. 10.15 ට එම අවස්ථාවට සහභාගි වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී විවෘත කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු එවනු ලැබේ.
7. ලංසු සුරක්ෂණය, තලවතුගොඩ, පන්නිපිටිය පාරේ, නො. 1114, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමට යොමු කළ යුතුය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
නො. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ, බත්තරමුල්ල.
2021.05.06

බණ්ඩාරවෙල මහා නගර සභාව

ප්‍රසම්පාදන දැන්වීමයි

දේපළ බදුදීම

බණ්ඩාරවෙල මහා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් පහත උපලේඛනයේ සඳහන් දේපළ 2021.06.01 දින සිට 2022.12.31 දක්වා වසර එකහමාරක (අවු. 1 1/2) කාලයකට බදු දීම පිණිස ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් හා ලියාපදිංචි සමාගම් ඇතුළු ආයතනයන්ගෙන් ලංසු මෙයින් කැඳවනු ලැබේ.

- සියලුම ටෙන්ඩර් "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිළිනොච්චිය" යන ලිපිනයට 2021-05-31 වෙනි දින ප.ව. 2.00 ට පෙර ලැබෙන පරිදි අතින් ගෙනැවිත් භාරදීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමට හැකිය. අතින් ගෙනැවිත් භාරදෙන ලංසු පරිපාලන ශාඛාවේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමට හැකිය. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ටෙන්ඩර් අංකය සඳහන් කළ යුතුය. (KN/EB/.....) ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ටෙන්ඩර් පිළිබඳ පූර්ව ලංසු රැස්වීම 2021-05-21 වෙනි දින පෙ.ව. 11.00 ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ.

අංකය	ටෙන්ඩර් අංකය	විස්තරය	කොන්ත්‍රාත් කාලය	ටෙන්ඩර් ඇපකරයේ වටිනාකම සහ වලංගු කාලය	ආපසු ගෙවනු නොලබන ගාස්තුව
1	KN/EB/09/Cl.ser/606	පවිත්‍රතා සේවය	වසරක් (01)	රු. 40,000.00 2021-08-30 දක්වා	1,000.00
2	KN/EB/09/Se.ser/605	ආරක්ෂක සේවය	වසරක් (01)	රු. 40,000.00 2021-08-30 දක්වා	1,000.00

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
කිළිනොච්චි දිස්ත්‍රික්කය.

ශික්ෂණ රෝහල - රත්නපුර

ලංසු සඳහා ආරාධනයයි

රත්නපුර, ශික්ෂණ රෝහලේ, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ප්‍රසම්පාදනයන් සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින්, මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ලංසු අංකය	අයිතමය / විස්තරය	ප්‍රමාණය	ආපසු ගෙවනු නොලබන ලිපි ලේඛන ගාස්තුව (එකකට)
Laboratory EQuipment			
THR / E15 / 06 / 2021	Purchasing 01 No. of Refrigerated Centrifuge	01	2,000.00
Orthopaedic Implant			
THR / E15 / 11 / 2021	Purchasing Left Knee Tumor Prosthesis	01	2,000.00

ටෙන්ඩර් ලිපිලේඛන (එක් ලිපි ලේඛනයක් සඳහා) ආපසු ගෙවනු නොලබන රුපියල් 2,000/- ක් වන ගාස්තුවක් ගෙවීමෙන් 2021 මැයි මස 29 වන දින දක්වා සඳුද සිට සිකුරාද දක්වා ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හැර, රාජකාරි දිනයන්හිදී, පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා අතරතුර ලබාගත හැකිය.

ලංසුකරුට ඕනෑම ලංසු සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි වන නමුත්, එක් එක් මිල ගණන් සමග වෙන වෙනම ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මුද්‍ර, තබන ලද ටෙන්ඩර් පහත ලිපිනයට, ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අධ්‍යක්ෂක කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

ටෙන්ඩර් භාරගැනීම 2021 මැයි මස 31 වන දින පෙ.ව. 10.30 ට අවසන් වන අතර, ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් අවලංගු කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවට, ලංසුකරුට හෝ වෙනයම් බලයලත් අයෙකුහට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. **(ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී, ජංගම දුරකථන ක්‍රියාකරවීම සපුරා තහනම් වනු ඇත).**

ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, පහත දැක්වෙන පරිදි සටහන් කළ යුතුය.

"(ටෙන්ඩරයේ නම) සඳහා ටෙන්ඩර් - (ලංසු අංකය)" උදාහරණ : Refrigerated Centrifuge 01 ක් සඳහා ටෙන්ඩර් - THR/E15/06/2021"

"Left Knee Tumor Prosthesis 01 ක් සඳහා ටෙන්ඩර් - THR/E15/11/2021"

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුය. අනවශ්‍ය ප්‍රමාද වීම් වළක්වා ගැනීමට ලංසු ලිපි ලේඛන ලබාගැනීමට පෙරාතුව ගණකාධිකාරී වෙතින් විමසනු මැනවි. (045-2222261)

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල,
රත්නපුර.

ලංසු සඳහා ආරාධනයයි

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ග්‍රාමීය රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වෛද්‍ය උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම

2021 වර්ෂය

වෛද්‍ය උපකරණ සැපයීම , ස්ථාපනය හා තඩත්තු කිරීම සඳහා 2021 මැයි මස 10 වෙනි දින පෙ.ව. 9.00 සිට 2021ජූනි මස 04දින පෙ.ව 10.00 දක්වා පහත වෛද්‍ය උපකරණ සැපයීමට අදාළ මුද්‍ර, තැබූ ලංසු අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

02. කුරුණෑගල, මිගමු පාර, වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් අයකැමි වෙත 2021 මැයි මස 10 වන දින සිට 2021 ජූනි මස 03 වන දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පහත සඳහන් ලංසු ගාස්තුවක් ගෙවා ලංසු ලියවිලි ලබාගත හැකි අතර, ලංසු ලියවිලි රජයේ වැඩ කරන ඉහත දින හා වේලාවන් තුළ නොමිලේ පරීක්ෂා කළ හැක.

ගොනු විස්තරය	වෛද්‍ය උපකරණ විස්තරය	ප්‍රමාණය	ලංසු ඇපකරය (රු)	ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු (රු)
NWP/PDHS/FN08/ME/01/2021/1	Suction Apparatus	15	37,500.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/2	Endovenous Laser Ablation System	3	165,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/3	OT Table	3	120,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/4	Rigid Cystoscopy Unit	1	15,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/5	OT Lamp	1	25,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/6	High pressure sterilizer	2	405,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/7	High End Laparoscopic System	2	500,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/8	High End ultrasound scan Machine	1	40,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/9	X- Ray Illuminators	6	720.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/10	Flat Panel Detector	2	60,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/11	High flow oxygen machine (Pediatric)	2	24,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/12	High flow oxygen machine (Adult)	10	120,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/13	Infant warmer	3	25,200.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/14	Incubator	2	100,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/15	Transport Incubator	1	50,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/16	Phototherapy Unit (Single)	1	2,500.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/17	Neonatal Transport Ventilator	1	45,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/18	Neonatal Ventilator	1	55,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/19	BP Apparatus (Android)	200	40,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/20	BP Apparatus (Digital)	80	16,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/21	Nebulizer (Heavy Duty)	80	32,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/22	ECG Recorder (Single channel)	50	87,500.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/23	Mini Autoclave	10	35,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/24	5Part Hematology Analyzer	4	100,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/25	Fluid warmer	3	9,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/26	Incubator	2	30,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/27	Centrifuge	8	32,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/28	Microbiological Autoclave	2	16,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/29	Fully Automated Bio Chemistry Analyzer	12	600,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/30	Hysteroscope	1	30,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/31	Delivery Bed	4	20,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/32	Fetal Doppler	3	3,600.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/33	Dressing Trolley	20	4,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/34	Drug Trolley	20	4,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/35	Injection Trolley	20	4,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/36	Patient Trolley	20	6,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/37	Instrument Trolley	2	240.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/38	Spinal Board	2	1,600.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/39	Adjustable stools	2	220.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/40	Emergency Trolley	3	600.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/41	Medicine Trolley	4	800.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/42	Dental Unit	7	45,500.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/43	Ultra Sonic Scalar Machine	16	6,400.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/44	Dialysis Machine	6	210,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/45	RO Plant	1	60,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/46	CRRT machine	1	40,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/47	Infusion pumps	9	18,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/48	Defibrillator	15	60,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/49	Pulse Oxymeter	50	60,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/50	Syringe pump	15	22,500.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/51	ICU Ventilator	2	90,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/52	Transport Ventilator	3	105,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/53	Video Laryngoscope	2	20,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/54	Multi Para Monitor	60	240,000.00	3,500.00
NWP/PDHS/FN08/ME/01/2021/55	ENT Operating Laryngoscope	1	80,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/56	ENT Work Station	1	50,000.00	1,000.00
NWP/PDHS/FN08/ME/01/2021/57	Infant Weighing Scales	5	500.00	1,000.00

03. මුද්‍ර, තබන ලංසු අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "Supply of Medical Equipment 2021 "හා ගොනු විස්තරය සටහන්කර 2021 ජූනි මස 04 වන දින පෙ.ව 10.00 පෙර ප්‍රධාන ගණකාධිකාරී, වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මිගමු පාර, පුවක්ගස් හංදිය, කුරුණෑගල, යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ උක්ත ලිපිනයෙහි ප්‍රධාන ගණකාධිකාරී කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ හැකිය.

04. 2021 ජූනි මස 04 වන දින පෙ.ව 10.15 ට වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

05. මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩි විස්තර පැහැදිලි කර ගැනීම සඳහා 037-2223231, 037-2223479, 037-7393390 යන දුරකථන අංක අමතා වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගෙන් විමසිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
වයඹ පළාත, කුරුණෑගල.

2021 මැයි 10 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

ඩිජිටල් ලෝඩිං

ඩිනමික්

කාලතුයේ ඩිජිටල් දොරටුව

පිටුව 02 වසංගතයට නව නිපැයුම්වලින් පිළිතුරු

පිටුව 03 හදවත සුව කරන අලුත්ම සොයා ගැනීම

පිටුව 06 පෘථිවියටත් සූර්යයෝ දෙදෙනෙක්

පිටුව 07 ඉලෙක්ට්‍රික් කාර්වලට එන්න කීම

2021 මැයි 10

කවරයේ ග්‍රාෆික සිතුවම - තිසන් නයනක

දිනමිණ ද්වාර

වසංගතයට නව නිපැයුම්වලින් පිළිතුරු දෙන රුසිරු ප්‍රභාමත්

එකිනෙකා ගැටෙමින් සමීපව සිටි අපට මේ වන විට මීටරයක් දුරින් සිට සියලු සබඳකම් පවත්වන්න සිදුව තිබේ. ඒ කොරෝනා වසංගතය හේතුවෙනි. නන්නාඳුනන වයිරසයක් හිටි හැටියේම ලොවට කඩාපාත් වූයේ ලොව පුරා සියලු සෞඛ්‍ය අංශ අන්දමන්ද කරවමිනි. කොරෝනා වයිරසයෙන් ගැලවීමට ක්ෂණික පියවර කිසිවක් නොවුණු තැන වහ වහා ලොව පුරා වෛද්‍ය අංශ ඒ පිළිබඳ පර්යේෂණවල නියැළෙන්න වූහ. ක්ෂණික පියවර ලෙස ඔවුන් ඉදිරිපත් කළේ වයිරසය ශරීරගත වීම වළක්වා ගැනීමට කටයුතු කිරීම මෙම වයිරසයෙන් ගැලවීමට ඇති මූලිකම ක්‍රියාමාර්ගය බවයි. ඒ අනුව වහ වහා සෞඛ්‍ය මාර්ගෝපදේශ එළිදැක්විණි. එහිදී ප්‍රධාන වශයෙන් ඉදිරිපත් වූයේ අවමව මීටරයක් දුරින් සිට ශ්වසන මාර්ගය ඔස්සේ වයිරසය ශරීරගත වීම වළක්වා ගැනීමයි. එසේම නිවෙසින් පිටතට යන සෑම අවස්ථාවකදීම පිරිසුදුකාරක යොදා දෑත් පිරිසුදු කර ගැනීමට ද නියම කෙරිණි. වෙනදා නොවූ ගැටලුවක් පැමිණියේ මේ අවස්ථාවේය. එනම්: සෑම රාජකාරි ආයතනයකම, වෙළෙඳ හා සේවා ආයතනයකම අත් සෝදා ගැනීමට ජල පහසුකම් සැපයීමට සිදු වීමය. සාමාන්‍යයෙන් භාවිත කරන ජල කරාම මේ සඳහා සුදුසු නොවුණේ සෑම කෙනකුටම අතින් ක්‍රියාත්මක කර ජලය ගැනීමට සිදු වීම නිසා අතිනත තැවරී වයිරසය පැතිර යෑමට එයම මහත් රුකුලක් විය හැකි බැවිනි.

ජල කරාම ගැටලුව

මේ ගැටලුකාරි අවස්ථාවේ සහායට පැමිණියේ නව නිර්මාණකරුවන්ය. ජල කරාම ගැටලුවට පමණක් නොව, කොරෝනා වසංගත අභියෝගය ජය ගැනීමට අවැසි බොහෝ සහාය නව නිර්මාණ ලෙස වහ වහා බිහි වන්න විය. බොහෝ ස්ථානවල අත් සේදීම සඳහා පාදයෙන් ක්‍රියා කරවිය හැකි ජල කරාම ඉදි විණි. ඒ ක්‍රමය එතරම් සාර්ථක නොවුණේ විවිධාකාර ගැටලු හේතුවෙනි. නිසි පරිදි ජලය නොලැබීම, පාගන පැඩලයේ ආයු කාලය අඩු වීම වැනි කාරණා මේ ක්‍රමයේ අසාර්ථක ලක්ෂණ විණි. එමෙන්ම මෙහිදී ද යම් ස්පර්ශයක් සිදු වන නිසා එමගින් කොරෝනා වයිරසය පැතිරීමේ අවදානමක් ශේෂ විය. එසේම ජල කරාමයට දෑත සමීප කළ විට ජලය ගත හැකි, ස්පර්ශයක් රහිත ජල කරාම පැවතිය ද ඒවා විශාල ප්‍රමාණයක් එක් ආයතනයක සවි කිරීම ප්‍රායෝගික ගැටලුවක් විණි. මේ සියලු ගැටලු දෙස විමර්ශනශීලීව අවධානය යොමු කළ, නව නිර්මාණ කිහිපයක්ම බිහි කළ පාසල් සිසුවකු සිය සිතේ පැලපදියම් වූ අදහසක් ක්‍රියාත්මක කරමින් සිටියේය. ඔහුගේ ඉලක්කය වූයේ වයිරසය පැතිර යන සමයේ විවිධ තැන්වලට යන පිරිසගේ දෑත් පිරිසුදු කර ගැනීමේ අවශ්‍යතා කිහිපයක් එකවර කර ගත හැකි ස්පර්ශයක් රහිත (Contactless) දෑත් පිරිසුදු කර ගැනීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමයි.

අත් පිරිසුදු කරන දියර නිකුත්කරණය (Hand SanitizerDispenser), ජල කරාමය (Water Tap), සේදුම් දියර නිකුත්කරණය (Hand Wash Dispenser), දෑත් වේළා ගැනීමේ උපකරණය (Hand Dryer) යන පහසුකම් එකම පද්ධතියක් මගින් සැපයීම ඔහුගේ අභිලාෂය විය.

ස්පර්ශයක් රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය

ගාල්ල හපුගල මහා විද්‍යාලයේ 09 ශ්‍රේණියේ සිසුවකු වන රුසිරු ප්‍රභාමත් එදිරිසූරිය සිය ඉලක්කය සාක්ෂාත් කර ගත්තේ ස්පර්ශය රහිත ජල කරාම 15ක් සහ අත් පිරිසුදු කර ගැනීමට අවශ්‍ය සෙසු පහසුකම් සපයන උපකරණ ද පාලනය කළ හැකි පාලක පද්ධතියක් (Fully Automated Contactless Hand Washing Unit) නව නිර්මාණයක් ලෙස එළි දක්වමිනි.

"ස්පර්ශය රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය (Fully Automated Contactless Hand Washing Unit) මම නිර්මාණය කළේ ඒ සඳහා පහසුකම් කිහිපයක් එක් කරමින්. අත් සේදුම් සබන් දියර නිකුත්කරණය සහ ජල කරාමය මෙහි මූලික අංග ලෙස සකසනු ලැබුවා. ඊට අමතරව අවශ්‍ය නම් විෂබීජහරණ දියර නිකුත්කරණය, දෑත් වේළනය ඇතුළු උපකරණත් පද්ධතියට එක් කළ හැකියි. අවශ්‍යතාව අනුව තවත් උපකරණ මෙයට සම්බන්ධ කරන්න පුළුවන්. මා සකස් කළ පද්ධතියට එකවර උපකරණ කිහිපයක් (ජල කරාම, අත් සේදුම් සබන් දියර නිකුත් කරනය, අත් විෂබීජහරණය කිරීමේ දියර නිකුත්කරණය සහ අත් වේළනය) පාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව තියෙනවා. වර්තමානයේ භාවිත වෙමින් තියෙන ස්පර්ශ රහිත ජල කරාම සහ අත් වේළන එකිනෙකට හෝ එකම පාලක පද්ධතියකට සම්බන්ධ නොමැතිව වෙන වෙනම සේවා සපයන ඒවායි. එහෙත් මා නිර්මාණය කළ පද්ධතියේ දී ආයතනයක තිබෙන සියලු ජල කරාම, අත් සේදුම් සබන් දියර නිකුත්කරණ, විෂබීජහරණ දියර නිකුත්කරණ සහ අත්වේළන එකිනෙකට සම්බන්ධවයි ක්‍රියාත්මක වන්නේ. සාම්ප්‍රදායික ස්පර්ශ රහිත ජල කරාම සඳහා භාවිත කරන තාක්ෂණයෙන් ඔබ්බට ගොස් මා මේ සඳහා මයික්‍රො කන්ට්‍රෝලර්ස් (Micro Controllers) භාවිත කළා. ඒ නිසා මෙම පාලක පද්ධතිය කුඩා පද්ධතියක් ලෙස නිර්මාණය කිරීමට මට හැකි වුණා. එසේම මේ පද්ධතිය මගින් එක් ස්ථානයක ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කළ හැකි බැවින් ද, මෙවැනි ක්‍රියාකාරකම් එකම වේලාවක ස්ථාන කිහිපයකම සිදු කළ හැකි බැවින් ද, ඒ ක්‍රියාකාරකම් මනාව කළමනාකරණය කරගනිමින් උපකරණය එකිනෙක අතර සංඥා (signal) හුවමාරු වීම නිසා ඇති විය හැකි දෝෂ මඟහරවා ගනිමින් ඉතා කාර්යක්ෂමව මහජනතාවට සේවා සැපයීමට මේ පද්ධතියට මනා හැකියාවක් තියෙනවා.

රුසිරු ප්‍රභාමත් එදිරිසූරිය

ඒ වගේම මේ පද්ධතියට ස්පර්ශයක් රහිත ජල කරාම 15ක් එකම ආයතනයක ස්ථාන කිහිපයකදී එක්වර ක්‍රියාත්මක කිරීමේ හැකියාව තියෙනවා. කොරෝනා වැනි භයානක වසංගතයක් පවතින සමයක කුඩා සහ මහා පරිමාණ ආයතනයන්ට මෙවැනි පද්ධතියක් සවි කර ගැනීම මගින් අඛණ්ඩව පහසුකම් කිහිපයක්ම එකවර සැපයීමට හැකි වනවා පමණක් නොව, වියදමද අඩු කර ගැනීමට හැකි වනවා. මොකද: මේ පද්ධතිය ස්පර්ශයක් රහිතව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන නිසා ජලය, අත් සේදුම් දියර, අත් පිරිසුදු කරන දියර ඉතිරි කර ගැනීමට හැකි වනවා. එපමණක් නොව, මේ පද්ධතිය ක්‍රියාත්මක වෙන්නේ වෝල්ට් 12 සරල ධාරා සැපයුමකින් නිසා විදුලිය පරිභෝජනයත් ඉතා අඩුයි. ඊට අමතරව මේ පද්ධතිය සූර්ය ශක්තියෙන් වුවත් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඉහත හැම වාසියක්ම මේ පද්ධතියට ලැබී තියෙන්නේ මෙය මයික්‍රො කන්ට්‍රෝලර් පදනම් කරගෙන නිර්මාණය කර ඇති නිසායි. මගේ මේ පද්ධතිය මේ වන විටත් මාතර යුනිවර්සිටි කොලීජියේ (University College of Matara) ප්‍රායෝගිකව භාවිත කෙරෙනවා. ඊට අමතරව කරාපිටිය ශික්ෂණ රෝහලේ දන්ත ශල්‍ය ඒකකය සඳහාත් මෙම පද්ධතියක් සවි කිරීමට කටයුතු කරගෙන යනවා. ඒ වගේම මෙම පද්ධතිය අවශ්‍ය ආයතනයකට දීමටත් මම කැමැතියි," යැයි මේ සුවිශේෂ නව නිර්මාණය සිදු කළ රුසිරු ප්‍රභාමත් පවසයි.

රුසිරුගේ මේ ස්පර්ශයක් රහිත අත් පිරිසුදු කිරීමේ ස්වයංක්‍රීය පද්ධතිය 2020 වසරේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පැවැත්වූ 'සහසක් නිමැවුම් 2020' ජාතික නව නිර්මාණ තරගාවලියට ද ඉදිරිපත් කෙරිණි. එහිදී මේ නව නිර්මාණය පාසල් අංශයේ 'මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව' යන තරග කාණ්ඩය යටතේ රන් පදක්කම දිනා ගැනීමට සමත් විණි. ඊට අමතරව සහසක් නිමැවුම් තරගාවලියේ සුවිශේෂ නව නිර්මාණය වෙනුවෙන් පිරිනැමෙන 'දසිස්' සම්මානය සඳහා නිර්දේශිත නිර්මාණ අතරට පිවිසීමට සමත් වීමට ද මේ නව නිර්මාණය සුවිශේෂ විය.

සූර්ය බල ස්වයංක්‍රීය විදුලි පහන් පද්ධතිය

නව නිර්මාණකරණයට දක්ෂතා දක්වන රුසිරුගේ තවත් නව නිර්මාණයක් වන්නේ සූර්ය බලයෙන් දැල්වෙන ස්වයංක්‍රීය විදුලි පහන් පද්ධතියයි (Solar Powered Home Lighting System at Power Failure). විදුලි බල්බ හයක් පමණ දැල්විය හැකිජමේ පද්ධතිය මගින් රාත්‍රී කාලයේ විදුලිය විසන්ධි වීමක් සිදු වුව හොත් ස්වයංක්‍රීයව බල්ව දැල්වේ. ඊට අමතරව රාත්‍රී කාලය එළඹෙන විට මෙහි ඇති මැනුවල් ස්විචය භාවිත කර අවශ්‍ය නම් විදුලි බල්බ දල්වා එමගින් ප්‍රධාන විදුලි සැපයුමෙන් නිවෙසකට හෝ ආයතනයකට ගන්නා විදුලි ප්‍රමාණය අවම කරගත හැකිය.

අකුළන පුටුව

රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මගින් 2018 වසරේ සංවිධානය කළ 'රුහුණු රොබෝටික්ස් චැලේන්ජ්' (Ruhuna Robotics Challenge - XBOTIX) තරගාවලියටද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) මගින් 2019 වසරේ සංවිධානය කළ රොබෝෆෙස්ට් (ROBOFEST) තරගාවලියට ද රොබෝ නිර්මාණ ඉදිරිපත් කළ රුසිරු දුම්රිය මගීන්ට අතේ ගෙන යා හැකි පුටුවක් ද නිර්මාණය කර තිබේ. මේ පුටුව කුඩයක් සේ අකුලා අතේ ගෙන යා හැකි අතර දුම්රියේ ආසන පිරී ගොස් තිබෙන විට දුම්රිය පෙට්ටියේ ඇතුළත ඉඩ තිබෙන වෙනත් ස්ථානයක මේ පුටුව දිගහැර හිඳ ගැනීමට හැකිය. ඊට අමතරව රෝහල්වල පෝලිම්වල සිටීමේදී වාඩි වීමට භාවිත කළ හැකි වීම, විනෝද චාරිකා වැනි අවස්ථාවලදී එළිමහන් හෝ ගෘහස්ථ ස්ථානවල භාවිත කළ හැකි වීම, ආලින්දයේ විසිතුරු භාණ්ඩ තැන්පත් කිරීමට භාවිත කළ හැකි වීම මේ පුටුවේ ඇති තවත් ප්‍රයෝජන වේ.

ඉංජිනේරුවකු වීම අනාගත ඉලක්කය කරගත් රුසිරු අධ්‍යාපන කටයුතුවලට මුල් තැන දෙමින් තව දුරටත් නව නිර්මාණකරණයේ යෙදීමට අදිටන් කරගෙන සිටින අතර තම නව නිර්මාණකරණයට සහය දෙන ඉංජිනේරුවකු වන තම පියා රොහාන් එදිරිසූරිය සහ මව ධම්මිකා කුමාරි මෙන්ම සිය පාසල වන ගාල්ල හපුගල මහා විද්‍යාලයේ නව නිර්මාණ භාර ආචාරිණී රුවනි චම්පිකා ගුරුතුමියත්, විදුහල්පති එම්.ඒ.පී. පුෂ්ප කුමාර මහතාත් සිහිපත් කරන්නේ මහත් ගෞරවයෙනි.

▶ පී.කේ. බණ්ඩාර

'ද්වාර' යනු විද්‍යා-තාක්ෂණ ලිපි අන්තර්ගත අතිරේකයකි. නව නිපැයුම් පිළිබඳ හඳුන්වා දීම මෙන්ම කාලීන විද්‍යා-තාක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහිදී විශේෂය. 'ද්වාර' අතිරේකයේ විද්‍යා ප්‍රබන්ධයක් ද සතිපතා පළ වේ. මේ අතිරේකයට පාඨක ඔබටත් ලිපි සහ විද්‍යා ප්‍රබන්ධ ලිවිය හැකිය.

'ද්වාර', දිනමිණ, අංකඃ 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක් හවුස්, කොළඹ 10.
dwara@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
කාංචනා අමිලානි

හදවත සුව කරන අලුත්ම සොයාගැනීම වැදෑමහෙන්

හෘදයාබාධයකට ලක් වීම යනු මාරාන්තික අත්දැකීමක් බව අමුතුවෙන් කිව යුතු නැත. ඇතැම් විට ක්ෂණික මරණයෙන් කෙළවර නොවුණත් එලෙස හෘදයාබාධයකට ලක් වන පුද්ගලයන්ගෙන් අඩකට වඩා වැඩි දෙනකු වසර පහකට වඩා වැඩි කාලයක් ජීවත් වීමට වරම් ලබන්නේ නැත. ඊට හේතුව හෘදයාබාධයකදී මිය යන හෘත් සෛල සිරුරේ වෙනත් සෛල මෙන් නව සෛලවලින් ප්‍රතිස්ථාපනය විමක් සිදු නොවීමයි. අපේ සිරුරේ වන බහුතරයක් සෛල අඛණ්ඩව අලුතින් වර්ධනය වීම සිදු වුණත් හෘත් සෛල එලෙස වර්ධනය වන්නේ වසරකදී 0.5%ක් වැනි නොගිණිය හැකි සුළු ප්‍රතිශතයකිනි. හෘදයාබාධයකින් මිය යන සෛල පුනර්වර්ධනය වීමට මේ වේගය කිසි සේත්ම ප්‍රමාණවත් වන්නේ නැත. හෘදයාබාධයකින් වූ හානිය නිවැරදි කිරීම වෙනුවට වන එකම දෙය නම් මිය ගිය සෛල පිහිටි ස්ථාන ඝනකමැති කැළල් සහිත පටකවලින් වැසීයැමය. හෘදයේ ක්‍රියාකාරි සෛල ප්‍රමාණය මෙලෙස මිය යැම නිසා ප්‍රමාණවත් රුධිර සැපයුමක් සිරුර පුරා පවත්වාගෙන යැමට අපොහොසත් වීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ රෝගියා අකාලයේ මරණයට පත් වීමයි.

සදාචාරාත්මක ගැටලු

හෘදයාබාධයකදී මිය යන සෛල ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රාථමික සෛල (ඇටමිදුලු සෛල) යොදාගැනීම පිළිබඳ පර්යේෂණ ඇරඹුණේ මීට කලකට ඉහතදී වුවද ඉන් බලාපොරොත්තු වූ ආකාරයේ සාර්ථක ප්‍රතිඵල ලැබී තිබුණේ නැත. සිරුරේ ඕනෑම ස්ථානයක පිහිටි ඕනෑම සෛල වර්ගයක් බවට පරිවර්තනය වීමේ අපූර්ව හැකියාවෙන් යුතු ප්‍රාථමික සෛල ඇසුරෙන් කෙරෙන චිකිත්සාවේදී ප්‍රාථමික සෛල ලබා ගැනුණේ කලලවලිනි. එහෙත් එලෙස කලලවලින් ප්‍රාථමික සෛල ගැනීමේ ක්‍රියාවලියේදී කලල මරණයට පත් වීම නිසා සදාචාරාත්මක වශයෙන් එම ක්‍රමවේදය යොදා ගැනීම අතිශය ගැටලු සහගත විය. ඒ හැරත් මෙලෙස කලලවලින් ගත් ප්‍රාථමික සෛල, ප්‍රතිග්‍රාහක රුධිරයට එන්නත් කළ විට ඒවා ඉලක්කගත අවයවය (හෘදය) සොයාගෙන ඒ වෙත ගමන් කිරීමේ හැකියාවෙන්ද තොර විය. මේ නිසා හදවත් සෛල නැවත වර්ධනය කිරීමේ ක්‍රියාවලිය සාර්ථක වන බවට ලකුණු පහළව තිබුණේ නැත.

විප්ලවීය නව සොයා ගැනීම

නිව්යෝක් නුවර මවුන්ට් සීනායි රෝහලේ හෘදය පුනර්වර්ධන විද්‍යාව සම්බන්ධ අධ්‍යක්ෂවරයා වන වෛද්‍ය හීනා චෞද්‍රී ප්‍රමුඛ වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් ප්‍රාථමික සෛල සම්බන්ධයෙන් කළ නවතම සොයාගැනීම නිසා රෝගි හදවත් වෙනුවට නීරෝගි හදවත් විද්‍යාගාර තුළ නිර්මාණය වන දිනය වැඩි ඈතක නොවනු ඇත. මේ නිසාම ප්‍රාථමික සෛල චිකිත්සාවට අනුගාමිව සිදු කර තිබෙන මේ විප්ලවීය නව සොයා ගැනීම කිරුළු පැලඳ සිටින්නේ හදවත් වෛද්‍ය විද්‍යාවේ එතෙක් මෙතෙක් කළ සුවිශේෂ සොයාගැනීම ලෙසයි. වැදෑමහෙන් ගන්නා Cdx2 ලෙස හැඳින්වෙන ප්‍රාථමික සෛල විශේෂයක් විද්‍යාගාර තුළදී මීයන්ට එන්නත් කොට වෛද්‍ය චෞද්‍රී ප්‍රමුඛ වෛද්‍ය කණ්ඩායම මේ සොයාගැනීම සිදු කළහ.

කලල අවධියේදී කලලයට අවශ්‍ය සියලු පෝෂණය මවගෙන් නොඅඩුව සපයා දෙන, මවත් නූපන් දරුවාත් අතර වන සංකීර්ණ පටලයක් වන වැදෑමහ යනු ප්‍රාථමික සෛලවලින් අනූන ප්‍රභවයකි. ඉන් ගත් Cdx2 ලෙස හැඳින්වෙන ප්‍රාථමික සෛල විශේෂය, කලල ප්‍රාථමික සෛලවලට වඩා සුවිශේෂ වූයේ ඒවාට වෙනත් ඕනෑම සෛල විශේෂයකට පරිවර්තනය වීමට තිබෙන හැකියාව නිසාම පමණක් නොවේ. රුධිර සංසරණ පද්ධතියට එන්නත් කළ විට හානිය සිදුව ඇති ස්ථානය වෙත ඍජුවම ගමන් හානිය ප්‍රතිපූරණය කරනවාට අමතරව ප්‍රතිග්‍රාහකයාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ලක් නොවී සිටින්න ද එය සමත්ය.

නව මානයක්

"අනාදිමත් කාලයක ඉඳන් අපි හිතාගෙන හිටියේ Cdx2 සෛලවලට පුළුවන්කම තියෙන්නේ කලල වර්ධනයේ ප්‍රාරම්භක අවධියේදී වැදෑමහ නිර්මාණය කරන්න විතරයි කියලයි. ඊට අමතරව වෙනත් අවයව වුණත් නිර්මාණය කරන්න ඒවාට පුළුවන්කම තියෙනවා කියලා පෙන්නුම් කරලා තිබ්බේ නැහැ. අන්න ඒ හින්දයි මේ සොයාගැනීම විස්මිත වෙන්නේ. ළඟදීම අපිට හෘත් සෛල විතරක් නෙවෙයි වෙනත් අවයව වුණත් පුනර්වර්ධනය කරන්න මේ සොයාගැනීම ඉවහල් වේවි."

හෘදය වෛද්‍ය විද්‍යාව නව මානයක් කරා රැගෙන යනු ඇති බවට අනාවැකි පළ කරන මේ නව සොයාගැනීම ගැන වෛද්‍ය චෞද්‍රී බලාපොරොත්තු පළ කරන්නේ එලෙසය.

වැදෑමහේ සෛල ප්‍රතිශතයෙන් 40%ක් වන Cdx2 සෛල සතු මේ අද්විතීය හැකියාව ගැන වෛද්‍ය චෞද්‍රීගේ කණ්ඩායමට මුලින්ම අනාවරණය වුණේ මීයන් යොදාගෙන මීට කලකට පෙර කළ පර්යේෂණයකදීය. එහිදී මවගේ හදවතට හානි වූ විට වැදෑමහේ පිහිටි සෛල කිසිදු බාහිර බලපෑමකින් තොරවම හදවත වෙත ගමන්කොට 'කාඩියෝමයෝසයිට්' ලෙස හැඳින්වෙන හෘත් සෛල බවට පරිවර්තනය වී, හදවතට වූ හානිය ප්‍රතිසංස්කරණය කිරීමට පෙලඹෙන බව අනාවරණය විය. වැදෑමහේ සෛල වෙනත් ආගන්තුක සිරුරු තුළ ද මෙලෙසම හැසිරෙන්නේ ද කියා තහවුරු කරගැනීමට වෛද්‍ය චෞද්‍රීගේ කණ්ඩායම කෘත්‍රිමව හෘදයාබාධයන්ට ලක් කළ මීයන්ගේ පිරිමි සතුන් කණ්ඩායම් තුනක් යොදා ගනිමින් තවත් පරීක්ෂණයක් සිදු කළෝය. 'Proceedings of the National Academy of Sciences' සඟරාවේ පළ කර තිබූ එම අධ්‍යයනයට අනුව එක් මීයන් කණ්ඩායමක් වැදෑමහෙන් ගත් Cdx2 ප්‍රාථමික සෛල චිකිත්සාවකට ද, තවත් කණ්ඩායමක් Cdx2 සෛල අඩංගු නොවන ප්‍රාථමික සෛල චිකිත්සාවකට ද ලක් කෙරිණි. පාලක පරීක්ෂණය ලෙස යොදාගත් තුන් වැනි කණ්ඩායමට දුන්නේ සේලයින් ද්‍රාවණයක් පමණි. හෘදයාබාධයන්ට ලක් කළ සැණින් හා ප්‍රාථමික සෛල චිකිත්සාවට ලක් කර මාස තුනකට පසු සිදු කළ එම්ආර්අයි ස්කෑන් පරීක්ෂණයන්ගෙන් පෙන්නුම් කළේ Cdx2 සෛල චිකිත්සාව ලැබූ මීයන්ගේ හානි වූ හෘත් සෛල නීරෝගි සෛලවලින් ප්‍රතිස්ථාපනය වී තිබුණත් සෙසු මීයන් කාණ්ඩ දෙකම හෘදය අක්‍රීය වීමේ අවදානමට ලක්ව සිටි බවයි.

සුභවාදි බලාපොරොත්තු

අවයව පුනර්ජනනය සඳහා මීට පෙර අත්හදා බැලූ කිසිදු සෛල විශේෂයක් විද්‍යාගාර තත්ත්ව යටතේ වෙනත් අවයවවලට පරිවර්තනය වීමේ හැකියාවක් පෙන්නුම් කර තිබුණේ නැත. විශේෂයෙන්ම හදවත් සෛල වැනි පුනර්වර්ධනය වීමේ හැකියාවෙන් තොර අවයවවලට හානි වීම් වූ රෝගීන්ට ඇති එකම විකල්පය වන්නේ අවයව බද්ධ කිරීමකට ලක් වීමය. එහෙත් සුදුසු දායක අවයව ගැනීමේ දුෂ්කරතාව නිසා එවැනි රෝගීන්ගේ ඉරණම තීන්දු වන්නේ මරණයෙනි. ඒත් වැදෑමහෙන් උකහාගත හැකි මේ ප්‍රාථමික සෛල විශේෂය නිසා හදවත් හා වෙනත් අවයව බද්ධ කිරීමේ පොරොත්තු ලේඛනවල කල් මරමින් දිනෙන් දින මරණයට ළඟා වන රෝගීන්ගේ ජීවිතවලට සුභවාදි බලාපොරොත්තු දැල්වීමට හැකි වනු ඇත. වඩාත්ම සුභදායක කාරණය වන්නේ කලල සෛල මෙන් නොව වැදෑමහ යනු කිසිදු අගහිඟයකින් හෝ බාධාවකින් තොරව අවශ්‍ය ප්‍රමාණයෙන් ගත හැකි අඛණ්ඩ සැපයුමක් ඇති ජෛවීය ප්‍රභවයක් වීමයි. එසේම කලල සෛල ගැනීමේදී මෙන් සදාචාරාත්මක වශයෙන් ගැටලු මතු වන්නේද නැත. ඒ අනුව අවයව බද්ධ කිරීම තවදුරටත් අභියෝගයක් නොවන දිනය වැඩි ඈතක නොවනු ඇත.

රුක්ලන්ති පෙරේරා



ජීවිත රැක දෙන ජලජ ඩ්‍රෝන

ඩ්‍රෝන යානයක් කියූ සැණින් ඕනෑම කෙනකුගේ මතකයට නැඟෙන්නේ ඉතළ අහසේ ගමන් කරවිය හැකි යානා ගැනය. ඩ්‍රෝන යානා නිපදවීමෙන් මිනිසාගේ එදිනෙදා වැඩකටයුතුවලට මනා පහසුවක් ගෙන දුන් අතර, අද වන විට පහසු හා ලාභදායි සේවා සඳහා ඩ්‍රෝන යානා වැඩි වශයෙන් භාවිතයට ගැනේ.

ජලයේ ඩ්‍රෝන යානයක් ගමන් කරනවා යැයි ඔබට කෙනකු කිවහොත් ඒ ගැන ඔබ දෙවරක් සිතා බැලීමට පසුබට නොවේ. දැන් ජලයේ ගමන් කරන ඩ්‍රෝන යානා ද නිෂ්පාදනය කර ඇති අතර ඉන් තවමත් වෙළෙඳපොළට පැමිණ ඇත්තේ සුළු ප්‍රමාණයක් පමණි. Chasing M2 Pro යනු එලෙස ජලයේ විස්කම් පානා මිනිසාට බෙහෙවින් ප්‍රයෝජනවත් වන එක් ඩ්‍රෝන යානාවකි.

ආරක්ෂක අංශ මෙන්ම ජීවිතාරක්ෂක අංශද මෙතෙක් ජලයේ යම් දෙයක් සෙවීමට අවශ්‍ය වූ විටක කිමිදුම්කරුවන් යෙදවීම සිදු කළ ද එවැනි අවස්ථාවලදී ඔවුන්ගේ ජීවිත පවා අනතුරුවලට භාජන වූ අවස්ථා බොහෝය. එලෙස කිමිදුම්කරුවන් යොදා ගනිමින් ජලය යට සෙවීම් කළ යුතු නැති අතර, Chasing M2 Pro මගින් දැන් පහසුවෙන් ජලය යට පැහැදිලි රූප ගොඩබිම සිටින ඔබට පහසුවෙන් සපයා දෙනු ලබයි.

Chasing M2 Pro ජලය යට ගමන් කිරීමේදී විශාල මාළුන්ගෙන්ද, බාධකවලින් ද බේරී ගමන් කරන අතර, අධිබල මෝටර යොදා තිබීමෙන් සුළු වේලාවකදී ජලය යට කිමිදී අවශ්‍ය තොරතුරු සොයාදීමට උපකාරී වන අතර, කාර්මිකයන්ට වර්තමානයේ තම සේවා සිදු කිරීමට මනා පහසුවක් ගෙන දෙයි. නැව් වැනි විශාල යාත්‍රාවල කාර්මික දෝෂ පරීක්ෂා කිරීමට ද ඉංජිනේරුවන් මේ දිය යට ඩ්‍රෝන යානය භාවිත කරනා අතර, ඉදිරියේදී තව තවත් මුහුදු පතුලේ පෙරළියක් සිදු කිරීමට සමත් වන බවට මව් සමාගම පවසා සිටී.

බෝතල් මූඩි අරින්න දක්ෂයා මෙන්න

නිවෙසේ එදිනෙදා වැඩකටයුතුවලදී විවිධ කුඩා උපකරණ භාවිතයට ගැනීමට සිදු වන අතර, එවැනි උපකරණවලින් අපට මනා පහසුවක් ගෙනදෙන අවස්ථා ද බොහෝය.

උදාහරණයක් ලෙස බීම බෝතලයක් විවෘත කර ගැනීමට opener එකක් (මූඩි අරිනයක්) භාවිතයට ගන්නා අතර, එමගින් ඉතා පහසුවෙන් මූඩි විවර කර ගත හැකිය.

Cap Launcher bottle opener මගින් ශරීරයේ අමතර ශක්තියක් වැය කර ගැනීමකින් තොරව බෝතල් මූඩියක් විවෘත කර ගැනීමට දැන් හැකිය. මෙහි ඇති විශේෂත්වය නම් විවෘත වන බෝතලයේ මූඩිය Cap Launcher bottle opener උපකරණයේ රැඳීමක් සිදු වන අතර, එහිම ඇති බොත්තමක් මගින් ඉන්නා ස්ථානයේ සිට කුණු කූඩයට දැමීමට හැකි වීමයි. වෙනත් උපකරණ මගින් විවෘත වන මූඩිය විසි වී සැම තැන සෙවීමට අවශ්‍ය නොවන අතර, පහසුවෙන් සහ ඉක්මනින් බෝතල් විවෘත කර ගැනීමට සේම ඉවත දමන මූඩිය තැන තැන නොදමමින් කුණු කූඩයට විසි කිරීමටද හැකිය.

ගුවනේ ඉන්න බුහුටි ඩ්‍රෝන සුරතලා

ඩ්‍රෝන භාවිතය අද සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති අතර ඩ්‍රෝන මගින් එදිනෙදා කටයුතු පහසු කර ගැනීමට ද හැකිය. තාක්ෂණයේ දියුණුවත් සමඟ දිනෙන් දින ඩ්‍රෝන යානා වැඩිදියුණු වෙමින්, ප්‍රමාණයෙන් ද කුඩා වෙමින් පවතී.

Ryze tech tello යනු ඉතා සැහැල්ලු කුඩා ඩ්‍රෝන යානයක් වන අතර, මෙය තමන්ට කැමැති අයුරින් විවිධ කටයුතු සඳහා භාවිත කළ හැකිය. Ryze tech tello ඉතළ සිට පහළට අත්හළ විට පණ ගැන්වී ස්මාට් දුරකතනයකින් හෝ දුරස්ථ පාලකයකින් පාලනය කළ හැකිය. සැහැල්ලු හා කුඩා බවින් වැඩි වීම වේගවත් ගමනකට පහසුවක් වන අතර, විනාඩි 13ක කාලයක් ඉවනේ සැරි සැරීමට ryze tech tello තව හැකිය. තව ද අංශක 360ක වපසරියක් පහසුවෙන් වීඩියෝගත කර ගැනීමට හැකි අතර, ඔබගේ චලන ඡායාරූප ගැනීමට මෙන්ම ඔබ යම් ක්‍රියාවක නිරත වෙමින් සිටින අවස්ථාවක ඡායාරූපගත කර ගැනීමට ද මෙමඟින් හැකියාව ලැබේ. කැමරා සහ එහි පවතින සෙන්සර් මගින් මනා ලෙස ඔබ ලුහුබඳිමින් ඔබගේ විනෝද කාලය ඡායාරූප හා වීඩියෝගත කර දීමට ryze tech tello බෙහෙවින් උපකාරී වනු ඇත.

අනේ ගෙන යන ශීතකරණය

සුඹය ද්වාර කලාප මඟින් විවිධ වර්ගයේ ශීතකරණ පිළිබඳ විස්තර ඔබ වෙත ගෙන ආ අතර මේ කියන්නට යන ශීතකරණය ප්‍රමාණයෙන් කුඩා එකකි. Chefman mini fridge ශීතකරණයක් සේම ඔබට තේ එකක්, කෝපි එකක් ආදිය උණුසුම්ව රස බැලීමට ද අවස්ථාව ද සලසාගත හැකි අතර එහි ධාරිතාව ලීටර 4කි.

ඔබ රැකියාවට යන විට පහසුවෙන් අතේ රැගෙන යා හැකි පරිදි මේ chefman mini fridge නිර්මාණය කර ඇති අතර ඔබගේ වාහනයේ විදුලි පද්ධතියට මෙන්ම ගෘහස්ථ විදුලි පරිපථවලින් ද විදුලිය ගැනීමට හැකිය. එසේම ඔබ කාර්යබහුල රැකියාවක නිරත පුද්ගලයකු නම් ඔබට අවශ්‍ය පණිවුඩ මේ ශීතකරණයේ දොරටුවෙහි ලියා තබා ගත හැකි වන අතර පහසුවෙන් මකා දැමීමේ හැකියාව ද ඇත. ඔබට මේ කුඩා ප්‍රයෝජනවත් ශීතකරණය ඩොලර් 39 සිට මිල දී ගත හැකිය.

ඕනෑම දෙයක් ගලවන-කපන ගැජට්

කාඩ්බෝඩ් පෙට්ටියකට ගසා ඇති සෙලෝටේප් එකක් ගලවා ගැනීමට කතුරක්, එසේත් නැති නම් පිහි කූඩක් භාවිත කිරීමට අප පෙලඹී සිටිනවා. එසේම ටික් එකක් විවෘත කර ගැනීමට අප විවිධ ක්‍රම අනුගමනය කරන අතර, යම් දෙයක් කපා ගැනීමට මෙන්ම ස්විකරයක් ගලවා ගැනීමට යම් කූඩක් සහිත තලයක් භාවිත කිරීමට අප නිරන්තරයෙන් පුරුදුව සිටිනවා.

මේ වැඩ සියල්ලක්ම එක් උපකරණයකින් සිදු කර ගැනීමට හැකි නම් ඉන් සැලසෙන්නේ වඩාත් පහසුවකි. Microblade pill ti යනු ඒ සියල්ලට සම්ලන පරිදි ටයිටේනියම් ලෝහයෙන් නිපදවූ කැප්සියුලයක හැඩැති උපකරණයකි. පහසුවෙන් ඕනෑම තැනකට රැගෙන යා හැකි මෙය කීටැග් එකක් ලෙස ද ඔබ ළඟ තබා ගැනීමට හැකිය. එදිනෙදා නිවෙසේ මෙන්ම කාර්යාලයේ වැඩවලදී ඔබට microblade pill ti ඉතා ප්‍රයෝජනවත් වනවාට සැක නැත.

තනි පුද්ගලයාට අවනත මැජික් ස්පීකර්

Speakers භාවිතයෙන් සෑම කෙනකුම සින්දු අසා ඇතිවාට සැකයක් නැත. තාක්ෂණයේ දියුණුවත් සමඟ අද වන විට Bluetooth speakersවලට මිනිසුන් වැඩි ප්‍රියතාවක් දක්වන අතර, එය ද ඇතැම් විටක තවත් කෙනකුට සෝෂාකාරී ශබ්දයක් ගෙන දෙන උපකරණයක් ලෙස හැඟිය හැකිය. මේ හේතුවෙන් Handfree භාවිතයට ඇතැම් පුද්ගලයන් හුරු වී සිටින්නේ තවෙකකුට බාධාවක් නැතිව සින්දු රස විඳීමටය.

Sray speaker යනු ඒ සියල්ලකගෙන්ම වෙනස් විශේෂ speaker එකක් ලෙස හැඳින්විය හැකි අතර, මෙමඟින් පිරිසක් සිටින ස්ථානයක අදාළ පුද්ගලයාට පමණක් ශබ්දය ඇසීමට සැලැස්විය හැකිය. මින් වාහනයක ගමන් කරද්දී ඉදිරිපස ගමන් ගන්නා දෙදෙනාගෙන් එක් අයකුට පමණක් සින්දු ඇසීමට අවශ්‍ය විටදී අනෙක් පුද්ගලයාට නොඇසෙන පරිදි sray speaker පහසුවෙන් ක්‍රියා කරයි.

▸ ගයාන් සංජය

අණුව නිකුරු යතුර

නිවෙසේ දොරට එක් යතුරක් හෝ යතුරු දෙකක් තිබේ නම් ඉන් පවුලේ අනෙක් සාමාජිකයන් අපහසුතාවට පත් වනු නිරනුමානය. අනෙක් අතට යතුරු කිහිපයක් භාවිතය නිවෙසේ ආරක්ෂාවට ගැටලුවකි. මේ අනුව එක් යතුරකින් පවුලේ සෑම කෙනකුටම නිවෙසෙට ඇතුළු වීමට හැකි නම් එය වඩාත් ප්‍රයෝජනවත්ය. තාක්ෂණයේ දියුණුවත් සමඟ එය අද keymitt මගින් පහසුවක් කර දී අවසන්ය.

Keymitt යනු තනි යතුරකින් හෝ නිවෙසේ ගෘහ මූලිකයාගේ අණ පරිදි ඕනෑම කෙනකුට නිවෙසේ දොර විවෘත කර දීමට නිර්මාණය කළ උපකරණයකි. මෙය ස්මාට් දුරකතනයේ ස්ථාපනය කළ මෘදුකාංගයක් මගින් පහසුවෙන් ක්‍රියා කරවිය හැකි අතර, ඔබට අවශ්‍ය පරිදි දොර විවෘත කර තැබීමට වේලාවක් ද සපයා දිය හැකිය. නිවෙසෙ සොර සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ද keymitt මගින් හැකියාව ලැබෙන අතර" බ්ලූටූත් මගින් ද ක්‍රියා කරවිය හැකිය.

දැනුම්දෙ LOADING



IF

පෘථිවියටත් සූර්යයන් දෙදෙනකු සිටියා නම්?

සුප්‍රකට 'ස්ටාර් වෝස්' චිත්‍රපට මාලාවේ රසිකයකුට නම් සූර්යයන් දෙදෙනකු සිටින, 'පරියුග්ම ග්‍රහලෝක' (circumbinary planet) ගැන අමුතුවෙන් විස්තර කිරීමක් අවශ්‍ය නොවනු ඇත. චිත්‍රපටයේ ප්‍රධානම චරිතය වන ලූක් ස්කයිවෝකර්ගේ මව් ග්‍රහලොව වන 'ටැටූයින්' වූ කලි සූර්යයන් දෙදෙනකු කේන්ද්‍ර කොටගත් කක්ෂයකින් යුතු පරියුග්ම ග්‍රහලොවකි. සැබවින්ම ටැටූයින් වැනි මෙවැනි ග්‍රහලෝක පිහිටිය හැකි ද යන්න තව දුරටත් විද්‍යා ප්‍රබන්ධයන්ට සීමා වූ උපකල්පනයක් නොවන්නේ එවැනි ග්‍රහලෝක දුසිමක් පමණ පසුගිය දශකයක පමණ කාලයේදී තාරකා විද්‍යාඥයන් විසින් අනාවරණය කරගත් නිසාය. කෙප්ලර්-1647b යනු එලෙස සොයාගත් පළමු පරියුග්ම ග්‍රහලොවයි. පෘථිවියටත් එවැනි සූර්යයන් දෙදෙනකු සිටියා නම් එය අපට කුමනාකාරයේ අත්දැකීමක් වනු ඇති ද? ක්ෂිතිජයෙන් එකවර බැස යන සූර්යයන් දෙදෙනකු දකින්නට ලූක් ස්කයිවෝකර්ට මෙන් අපටත් හැකි වනු ඇති ද? එවන් තත්ත්වයකදී රාත්‍රියක් කියා දෙයක් අපට ලැබේවි ද? ඒ සියල්ලටත් වඩා සූර්යයන් දෙදෙනකු සහිත සෞරග්‍රහ මණ්ඩලයක් තුළ පිහිටි පෘථිවියකට ජීවය පවත්වා ගැනීමට හැකියාව පවතී ද?

අඟුටුමිටි තාරකාව

ඇතැම් විද්‍යාඥයන් දරන මතයක් වන්නේ කලකට ඉහතදී අප සෞරග්‍රහ මණ්ඩලයේ ද සූර්යයන් දෙදෙනකු සිටි බවයි. වත්මන් සූර්යයා සතුව ද 'නෙමෙසිස්' යනුවෙන් හැඳින්වෙන සහායක, අඟුටුමිටි තාරකාවක් තිබූ බවත්, එය සූර්යයාගේ ගුරුත්වාකර්ෂණයෙන් මිදී ගොස්, මීට වසර බිලියන ගණනකට ඉහතදී ක්ෂිරපථය තුළ දිය වී ගිය බවටත් ඔවුහු උපකල්පනය කරන්නෝය. මෙබඳු 'පරියුග්ම ග්‍රහලෝක' සොයා පෘථිවියේ හිඳ, විශ්වය පුරා කරක්ගැසූ විද්‍යාඥයන්ට සිය උපකල්පනය සත්‍ය විය හැකි බව ඔප්පු කරන පරියුග්ම ග්‍රහලෝක පමණක් නොව, පුදුමයකට මෙන් ජීවය පැවතීමට තරම් සුදුසු තත්ත්ව සහිත පරියුග්ම ග්‍රහලෝක පවා සොයා ගැනීමට ලැබී තිබෙන බැවින් ටැටූයින් වැනි ග්‍රහලෝක තව දුරටත් හුදු විද්‍යා ප්‍රබන්ධයක් පමණක් වන්නේ නැත. පෘථිවිය සතුව ද යම් හෙයකින් සූර්යයන් දෙදෙනකු සිටියා නම් අද පවතින ආකාරයේ ජීවයක් එහි පැවතීමට නම් යම් යම් සාධක සම්පූර්ණ කිරීමට අවශ්‍ය වනු ඇත. නිදසුනක් ලෙස: එකී තාරකාවන්ගේ ස්කන්ධයේ සිට පෘථිවියට සාපේක්ෂව එක් එක් තාරකාවට ඇති දුර හා ඒවා අතර පිහිටි දුර යනාදි සියලු සාධක පෘථිවියේ ජීවය කෙරෙහි බලපෑම් කරනු ඇත.

සූර්ය කුණාටු

යම් හෙයකින් එක් තාරකාවක් අනෙක් තාරකාවට වඩා විශාලත්වයෙන් සේම දීප්තියෙන්ද වැඩි වුව හොත්, එහි ප්‍රබල ගුරුත්වාකර්ෂණය මඟින් පෘථිවිය ඒ දෙසට වඩාත් සමීප වන අන්දමින් ආකර්ෂණය කරගැනීම නිසා පෘථිවිය දැවී, අළුව යෑමට වුව බැරි නැත. අනෙක් අතට සූර්යයන් දෙදෙනාගෙන් එක් අයකු සතුව හෝ සැලකිය යුතු ප්‍රබල ගුරුත්ව බලයක් නොතිබුණ හොත්, පෘථිවිය එහි කක්ෂයෙන් මිදී විශ්වය තුළ අතරමං වී, අයාලේ යන තවත් එක් අජීව ග්‍රහලොවක් පමණක් වනු ඇත. මේ නිසා පෘථිවියේ කක්ෂය ස්ථාවර වූවක් වීමට නම් එය සූර්යයන් දෙදෙනාගෙන් එක් අයකු වටා පමණක් භ්‍රමණය විය යුතුය. එහෙත් පෘථිවියේ පවතින සංකීර්ණ ජීවය සඳහා එවැනි වාතාවරණයක් වුව සුදුසු නොවන්නේ යම් අවස්ථාවකදී තාරකා ද්විත්වයම එකවර පෘථිවියේ දෙපසටම මුහුණලා පිහිටි හැකි බැවිනි. ඉන් පෘථිවිවාසීන්ට රාත්‍රිය අහිමි වනවා පමණක් නොව අහිතකර පාරජම්බුල කිරණ හා සූර්ය කුණාටුවල බලපෑම දෙගුණයකින් අත්විඳීමට සිදු වනවා ඇත. එක්වර සූර්යයන් දෙදෙනකුගෙන් නිකුත් වන තාප විකිරණවලින් නොදැවී සිටීමට තරම් පෘථිවිවාසීන් වාසනාවන්ත නොවනු ඇත.

විකිරණ ප්‍රමාණය

එහෙත් සූර්යයන් දෙදෙනාම වටා භ්‍රමණය වෙමින් ස්ථාවර කක්ෂයක් පවත්වා ගැනීමට වුව ද පෘථිවියට බැරිකමක් නැත. එහෙත් ඒ සඳහා සූර්යයන් දෙදෙනාම එකිනෙකාට සමීපව පිහිටා තිබීම වැදගත්ය. එහෙත් එවිට පෘථිවියේ කක්ෂය විෂ්කම්භයෙන් වැඩි වන බැවින්, ජීවය පවත්වා ගැනීමට ප්‍රමාණවත් අයුරින්, එනම්: ජලය ද්‍රව තත්ත්වයෙන් පවත්වා ගැනීමට සමත් අයුරින් හිරු එළිය නොලැබෙන නිසා පෘථිවිය හිමෙන් මිදුණු, අජීවී ග්‍රහලොවක තත්ත්වයට පත් වනු ඇත. යම් හෙයකින් සූර්යයන් දෙදෙනාගේ දීප්තියන්ගේ එකතුව, දැනට අප සතුව ඇති සූර්යයාගෙන් නික්මෙන සමස්ත දීප්තියට සමාන වන්නේ නම්, පෘථිවියට ලැබෙන විකිරණ ප්‍රමාණයේ දැනට වඩා වෙනසක් සිදු වන්නේ නැති බැවින්, ජීවය පවත්වා ගැනීමේ ගැටලුවක් පැන නොනඟිනු ඇත. ඒ සඳහා එක් එක් සූර්යයාගේ ස්කන්ධය වත්මන් සූර්යයාගේ ස්කන්ධයෙන් 85%ක් පමණ විය යුතුය. මන්ද: දීප්තිය (L-Luminosity) හා ස්කන්ධය (M-Mass) අතර පවත්නා සම්බන්ධයට අනුව (L= M4) අනුව ස්කන්ධයෙන් 15%ක් වැනි සුළු අඩු වීමක් පවා දීප්තිය අඩකින් අඩු වීමට හේතුවන බැවිනි. ඒ අනුව සූර්යයන් දෙදෙනාගේ ස්කන්ධවල එකතුව, වත්මන් සූර්යයාගේ ස්කන්ධය මෙන් 1.7ක් ගුණයක් වන බැවින් ඉන් පෘථිවිය කෙරෙහි ඇති කරන ගුරුව බලපෑමද ඉහළ යනු ඇත. එය පෘථිවිය මත ගෙවෙන වසරක කාලය දැනට වඩා මඳක් අඩු වීමට, එනම් දින දෙසිය අසූවක් දක්වා කෙටි වීමට හේතු වනවා ඇත. සූර්යයන් දෙදෙනාගේ සිට පෘථිවියට වන දුර, සූර්යයන් දෙදෙනා අතර වන පරතරය මෙන්, සිව් ගුණයක් වන තෙක් පෘථිවියට සූර්යයන් දෙදෙනා කේන්ද්‍ර කරගනිමින් ස්ථාවර කක්ෂයක ගමන් කිරීමට කිසිදු බාධාවක් එල්ල නොවන බව කිව හැකිය.

සූර්යග්‍රහණ

මෙවැනි තත්ත්වයක් යටතේ තවත් අපූර්ව සංසිද්ධියක පංගුකාරයන් වීමට ද අපට හැකි වනු ඇත. සූර්යයන් දෙදෙනා ද එකිනෙකාට ඇති දුර ප්‍රමාණය අනුව දින දහයක් වැනි කාලයකට වරක් බැගින් එකිනෙකා වටා පරිභ්‍රමණයක් සම්පූර්ණ කරත්දී සූර්යග්‍රහණ ද සෑම දින පහකට වරක් අපට දැකගත හැකි වනු ඇත. චන්ද්‍රයාගෙන් ආවරණය වීමක් නොව, එක් සූර්යයකු තවත් සූර්යයකුගෙන් ආවරණය වීමෙන් හටගන්නා මෙබඳු සූර්යග්‍රහණ වරකදී පැය හයක පමණ කාලයක් පවතිනවා ඇත. එවැනි කාලාන්තර පෘථිවිය යම් තාක් දුරට සිසිල් කළ ද, වත්මන් කාලගුණික තත්ත්වය මුළුමනින්ම අවුල් කිරීමට තරම් බලපෑමක් ඒවායින් සිදු නොවන බව අපේක්ෂා කළ හැකිය. මේ සියල්ල සලකා බැලීමේදී ලූක් ස්කයිවොටර්ගේ මව් ග්‍රහයා වන ටැටූයින් වැනි ග්‍රහලොවක ජීවත් වීම සැබවින්ම කළ නොහැක්කක් නොවනවා ඇත.

එහෙත් ගැටලුව වන්නේ සූර්යයන් දෙදෙනකු සහිත සෞරග්‍රහ මණ්ඩලයක් තුළ පෘථිවිය වැනි ජීවයට සුදුසු ග්‍රහයකුගේ බිහි වීම සිදු විය හැකි ද යන්නය. මන්ද: දැනට අප හඳුනාගෙන තිබෙන එවැනි තත්ත්වයක පසු වන කුඩාම ග්‍රහලොව වන කෙප්ලර්-1647b පවා සම්පූර්ණයෙන්ම වායුන්ගෙන් පමණක් සමන්විත, අධි බර ග්‍රහලොවක් වන නිසාය. එහෙත් යම් දිනෙක ප්ලේටෝ වැනි අභ්‍යවකාශ දූරේක්ෂ හා යෝධ මැගලන් දූරේක්ෂ වැනි දැවැන්ත බිම් මට්ටමේ නිරීක්ෂණාගාර මඟින් ස්ටාර් වෝස්හි ටැටූයින් වැනි සජීවී, පරියුග්ම ග්‍රහලෝක අනාවරණය කරගන්නා දිනයද වැඩි ඈතක නොවනු ඇත.

රුක්ලන්ති පෙරේරා

පොසිල ඉන්ධනවලට යන්න කියා ඉලෙක්ට්‍රික් කාර්වලට එන්න කීම

පොසිල ඉන්ධන සම්පත හිඟ වීම සහ පොසිල ඉන්ධන දහනයෙන් විමෝචනය කෙරෙන අප වායුන්ගෙන් ඇති වන අයහපත් බලපෑම සැලකූ විට රථ වාහනවල විශාල වෙනසක් සිදු විය යුතු බව බොහෝ දෙනකුගේ මතයයි. වාහන සඳහා පොසිල ඉන්ධන භාවිතයෙන් ඇති කෙරෙන අයහපත් ප්‍රතිඵල යම් පමණකට හෝ මඟහරවා ගැනීම සඳහා විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ එනිසා හඳුන්වා දී ඇත. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ වෙත ලොව බොහෝ දෙනකුගේ අවධානය ද යොමුව තිබේ.

පොසිල ඉන්ධන බලය

යුරෝපා සංගමයට අයත් රටවල මහා මාර්ග මත වසර 2030 වන විට විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ මිලියන 30ක් පමණ දැකිය හැකි වනු ඇතැයි බර්මින්ග්හැම් විශ්වවිද්‍යාලයේ පෝල් ඇන්ඩර්සන් පවසයි. එහි අරුත, තවත් දස වසරක් ගෙවෙන විට යුරෝපා රටවල මහා මාර්ග මත විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ බහුලව දක්නට ලැබෙන බවකි. එවිට පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ එම කලාපයේ අඩු වනු ඇත. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවලට අවශ්‍ය බලය දෙන්නේ බැටරි මඟිනි. එම බැටරි භාවිතයෙන් ඉවත් කළ පසු පරිසරයේ ගොඩගැසෙනු ඇති බව පෝල් ඇන්ඩර්සන් සඳහන් කරයි. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථ භාවිතය වැඩි වන විට පරිසරයේ ඒකරාශී වන බැටරි සංඛ්‍යාව ද වැඩි වනු ඇත.

බැටරි ප්‍රතිචක්‍රීකරණය

"... විදුලි බලයෙන් ධාවනය වන මෝටර් රථවලින් ඉවත් කෙරෙන බැටරි විශාල ප්‍රමාණයක ආයු කාලය අවුරුදු දහයක් පහළොවක් වැනි කාලයක් ඇතුළතදී අවසන් වෙයි. එම බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම ඉතා වැදගත්. ..." යැයි පෝල් ඇන්ඩර්සන් පවසයි.

විද්‍යාඥයන් පෙන්වා දෙන අන්දමට විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල කොටස්, පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල කොටස්වලට බෙහෙවින් සමාන ය. එසේ වුවත් යම් යම් වෙනස්කම් ද තිබේ. පොසිල ඉන්ධනවලින් ධාවනය කෙරෙන වාහනවල දක්නට ලැබෙන්නේ ලෙඩ් අම්ල බැටරි ය. ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ මේ වන විට සංවිධානය වී ඇත. එසේ වුවත් විදුලි බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල ඇති ලිතියම්-අයන් බැටරි ඒ අන්දමට ප්‍රතිචක්‍රීකරණය කිරීමට පුළුවන්කමක් නැත. ලිතියම්-අයන් බැටරි විශාලය. සාපේක්ෂව බරෙන් ද වැඩිය. එවැනි බැටරියක ලිතියම්-අයන් කෝෂ සිය ගණනක් දක්නට ලැබෙයි. ඒවායෙහි විෂ සහිත ද්‍රව්‍ය අඩංගුව තිබේ. එනිසා ලිතියම්-අයන් බැටරි වැරැදි ආකාරයෙන් පරිසරයේ විසිරුවා හැරිය හොත් පාරිසරික ගැටලු රැසක් මතු වන්න ඉඩ තිබේ.

පරිසර හිතකාමී නිෂ්පාදන

විද්‍යුත් බලයෙන් ධාවනය වන මෝටර් රථ ලොව විවිධ කලාපවල මේ වන විට භාවිතයට ගැනේ. එම මෝටර් රථවලින් බැහැර කෙරෙන බැටරි ප්‍රතිචක්‍රීකරණය කෙරෙන්නේ ද යන්න ගැන පැහැදිලි දත්ත එකතුවක් සිදුව නැත. එසේ වුවත් බොහෝ දෙනකු සඳහන් කරන්නේ ප්‍රතිචක්‍රීකරණය කෙරෙන ලිතියම්-අයන් බැටරි ප්‍රමාණය 5%ක් පමණ වන බවකි. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල අංගෝපාංගවල ආයු කාලය ඉක්ම ගිය විට ඒවා පරිසරයට බැහැර නොකර වෙනත් ක්‍රියාවලියකට ලක් කිරීමේ වැදගත්කම යුරෝපා සංගමය වාහන නිෂ්පාදනය කරන සමාගම්වලට මේ වන විටත් පෙන්වා දී තිබේ. එවැනි පරිසර හිතකාමී නිෂ්පාදිතයන් යුරෝපා සංගමයට අයත් රටවල් ඉදිරියේදී මිලදී ගැනීමට වැඩි නැඹුරුවක් දක්වනු ඇත. මෙවැනි කාරණා සැලකිල්ලට ගෙන විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙළ සකස් කර ඇත. නිසාන් සමාගම නිෂ්පාදනය කරන ලීෆ් මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීම දැනටමත් ආරම්භ කර ඇත. වොක්සගන් සමාගම ද ජර්මනියේ සලස්ගිටර්හි බැටරි ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තශාලාවක් ආරම්භ කර තිබේ. විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි 3600කට ආසන්න සංඛ්‍යාවක් එම කර්මාන්තශාලාවේදී වාර්ෂිකව ප්‍රතිචක්‍රීකරණය කරන බව සඳහන් වේ. රෙනෝල්ට් මෝටර් රථ සමාගම ද විද්‍යුත් මෝටර් රථවල සියලුම බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීම මේ වන විට ආරම්භ කර ඇත. වෙනත් මෝටර් රථ සමාගම් නිෂ්පාදනය කරන විද්‍යුත් මෝටර් රථවල බැටරි ද රෙනෝල්ට් සමාගමේ බැටරි ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තශාලාවේදී ප්‍රතිචක්‍රීකරණය කෙරේ.



කළු ස්කන්ධය

විද්‍යුත් මෝටර් රථවල බැටරි කර්මාන්තශාලාවලදී ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී ඒවායේ ඇති ද්‍රව්‍ය අඩු වීමක් සිදු වේ. එසේ අඩු වන ද්‍රව්‍ය හැඳින්වෙන්නේ 'කළු ස්කන්ධය' (black mass) යනුවෙනි. එකී 'කළු ස්කන්ධයට' අයත් වන්නේ ලිතියම්, මැන්ගනීස්, කොබෝල්ට් සහ නිකල් මිශ්‍රණයකි. එසේ ක්ෂය වන ඇතැම් ලෝහයන් මිලෙන් අධිකය. එසේම ඒවා හිඟය. එනිසා විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී එවැනි කාරණා ගැන සිතන්න ද සිදුව තිබේ. යන්ත්‍ර සූත්‍ර භාවිත නොකර වාහන බැටරි කොටස් කිරීම මඟින් එයට කිසියම් අන්දමක පිළිතුරක් සොයාගත හැකි වේ. එහිදී බැටරිය කොටස් කරන ශ්‍රමිකයාගේ දක්ෂතාව, දැනුම සහ හැකියාව ඉතා වැදගත් වෙයි. පොසිල ඉන්ධන බලයෙන් ධාවනය කෙරෙන වාහනවල බැටරි, කොටස් කිරීමේදී යන්ත්‍ර-සූත්‍ර භාවිතයට නොගැනෙන අවස්ථා ඇත. එහිදී ශ්‍රමිකයාගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ බරපතළ ගැටලු මතු වේ.

"... චීනයේ ඇතැම් වෙළෙඳපොළවල සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ නියාමනයන් ද පරිසරය පිළිබඳ නියාමනයන් ද ඉතාමත් අවිධිමත් ලෙස පාවිච්චියට ගැනෙනවා. එසේ බැටරි කොටස් කරන ස්ථානවල සේවය කිරීමට තිබෙන පරිසරය බටහිර සන්දර්භය කෙසේවත් අනුමත කරන්නේ නැහැ. ..." යැයි ෆැරඩේ ආයතනයේ පර්යේෂක ගාවින් හාර්පර් පවසයි.

විද්‍යුත් බලයෙන් ධාවනය කෙරෙන මෝටර් රථවල බැටරි ඉවත් කර ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට රොබෝ තාක්ෂණය වැනි ක්‍රමවේදයක් යොදා ගන්නට පුළුවන් බව ගාවින් හාර්පර් වැඩිදුරටත් සඳහන් කරයි.

BBC ඇසුරෙනි
මංජුලා විජයරත්න

Sati 99%

ඔසිමැන්ඩියස්



විද්‍යා ප්‍රබන්ධය

මම බිම ඉඳගෙන සිතිවිලිමය මලපුඩුවක සිර වී දොඹ ගස්වලට පැමිණෙන වවුලන්ගේ හඬත් ඔවුන්ගේ කලබලය හේතුවෙන් පහළ මුකලානට වැටෙන දොඹ මල් සරසරයත් අසා සිටියෙමි. ඉහළ තුරු වියනේ හිඳැස් අතුරින් තාරකා ගොන්නක් දැල්වෙයි.

තවත් ජීවීන් සහිත ග්‍රහලෝක කොතරම් නම් ඒ තරු අතර ඇති ද? මම කල්පනා කළෙමි.

"මචං, අපට පේන, ගණන් කරන්න බැරි තරම් තාරුකා මැද කොච්චර ග්‍රහලෝක ඇති ද? ඒවායින් කීපයක් හරි තියෙන්න ඕනෑ බොහොම බුද්ධිමත් ජීවීන් ඉන්න ග්‍රහලෝක; බොහොම සාමකාමී ලෝක. මේ වගේ ග්‍රහලෝකයක් තරම් විශාල හිරගෙයක් හදල ඒක නඩත්තු කරන්න හදන්නේ නැති තැන්."

පිළිතුරක් නොදී ඉවත බලාගෙන උන් විරාන් අවසානයේ මා සමීපයට පැමිණ, මගේ පසෙකින් පොළොව මත ඉඳගත්තේ ය.

"අපට නිරීක්ෂණය කරන්න පුළුවන් විශ්වයේ ප්‍රමාණය ආලෝක වර්ෂ බිලියන අනූවක් විතර. මේ ඇතුළේ අඩුම ගානේ බිලියන සියකට වඩා චක්‍රාවාට තියෙනවා, එක චක්‍රාවාටයක බිලියන පන්සීයක් විතර තාරකා තියනවා, මේ තාරකා මණ්ඩලවල කොච්චර ග්‍රහලෝක ඇත් ද? ඒවායේ ජීවීන් ඉන්න ග්‍රහලෝක කීයක් තියෙන්න පුළුවන් ද? ඒත් ඇයි තවමත් අපට කිසිම පිටසක්වළයෙක් හම්බ නොවුණේ?"

"ඔව්, ෆර්මි පැරඩොක්ස් එක නේද මේ?" මම ඇසීමි.

"හරියටම හරි මචං. දැන් ඒකට අපට අලුත් උත්තරයක් තියනව. කිසිම ග්‍රහලෝකෙක අසීමිත සම්පත් නෑ. ඉතින් සීමිත සම්පත් බෙදාගන්න පිටසක්වළයන්ටත් මුදල් කියන සම්මතය හොයාගන්න වෙනවා. මුදල් සංකල්පය හොයාගත්තට පස්සේ ඉක්මනින් හරි පරක්කු වෙලා හරි පෘථිවියේ වගේම ඒ තැන්වලත් මූල්‍ය පද්ධතියක් නිර්මාණය වෙනවාමයි. ඒකෙ හැඩේ වෙනස් වෙයි, ඒත් මූලික සංකල්පය එකමයි. ඉතින් පිටසක්වලයන්ටත් අන්න ඒ මූල්‍ය පද්ධතියෙන් නිර්මාණය කරන අලුත් සොබාදහමේ නීතිවලට අනුව ජීවත් වෙන්න බල කෙරෙනවා. එතන ඉඳල මෙටාපැටර්න්වලට තියෙන්නේ කෙස් ගහක දුර."

මම පුදුමයෙන් විරාන් දෙස බැලුවෙමි. හෙතෙම පශ්චත්තාපය හඟවන ආකරයේ ශබ්දයක් පිට කොට ඈත අඳුර දෙස නෙත් යොමා ගත් වනම සිටියේය.

"හරි වෙලාවෙ අපි කාටවත් මෙටාපැටර්න්වලින් කැඩෙන්න බැරි වුණොත් ඕනෑම ශිෂ්ටාචාරයක් ඊළඟ අදියරට යන්න කලින් තමන්ගෙ සම්පත් ඔක්කොම ඉවර කරල දාල අන්තිමට වඳ වෙලා යනව. තාරුකා කාන්තාර මැද නටබුන් වූ ඔසිමැන්ඩියස් පිළිම විතරක් ඉතුරු කරල සදහටම නිවිල යනව..! බුද්ධිමත් ජීවීන් ඉන්න ඕනම ග්‍රහලෝකයක පොදු ඉරණම මේක!" විරාන් පැවසීය.

"ඔසිමැන්ඩියස්" මම මටම මුමුණා ගතිමි. අප කුඩා කල පාසල් පෙළ පොතක තිබූ කවිය මගේ සිහියට නැගිණි. වාලුකා කතරක් මැද නටබුන් ඉතිරි කොට මැකී ගිය, රජුන් ගේ රජුන් තැනූ මහා ශිෂ්ටාචාරයක්. මෙවේලේ විරාන් ඒ පැදියට විශ්වීය අරුතක් සපයමින් එය මතකයට නංවයි.

අපි සෑහෙන වේලාවක් බිම හිඳගෙන අහස දෙස නෙත් යොමා සිටියෙමු.

"මචං, ගණකවල වයිබ්‍රේෂන් එක නැවතිලා දැන් ගොඩක් වෙලා. අපි යන්න ඕනෑ..." අවසානයේ විරාන් පැවසීය.

කිසිත් නොකී මම නැගී සිටියෙමි; දෙපා හිරි වැටී තිබූ බැවින් වෙරිකාරයකු ලෙස දෙපා අද්දවමින් කැබ් රිය වෙත ගියෙමි.

කැබ් රියට ඇතුළු වීමට මොහොතකට කලින් මගේ දුරකතනය නාද වීමට පටන් ගත්තේය. ඒ නොදන්නා නොම්මරයකි. මේ අවේලාවේ කතා කරන්නේ කවුදැයි සිතමින් මම ඇමතුම ගත්තෙමි.

"ලෙක්චර් නෝට් එකක් ගැන අහගන්න ඕනෑ, පුළුවන් ද දැන්?" මඳක් ගැඹුරු කාන්තා කටහඬක් මගෙන් විමසීය. මම පුදුම වුණෙමි. ඒ සංඥාවකි. එහි තේරුම කිසිවකුට නෑසෙන ලෙස කතා කළ හැකිද යන්නය. සංඥාව මෙන්ම කටහඬ ද අතීතයට අයිති ඒවා විය. කටහඬේ අයිතිකාරිය නන්දිතාය. ජංගම දුරකතන සුලබ නොවූ අතීතයක පෙම්වතුන්ව සිටි අප නිවෙසේ වූ ස්ථාවර දුරකතනයෙන් පෙම්බස් දෙඩීමට හැකි දැයි දැන ගැනීම උදෙසා අපි මෙවන් ප්‍රශ්න භාවිත කළෙමු.

"ඔව්, පුළුවන්."

"කිසිම වෙනසක් පෙන්නන්න එපා. අපට කතා කරන්න තියෙනවා..." නන්දිතා පැවසුවාය. දැනටමත් රියැදුරු අසුනේ හිඳගෙන සිටි විරාන්ට අතින් සංඥාවක් දුන් මම කැබ් රිය වෙතින් ඉවතට ගියෙමි.

"මමත් රංජන් කියල කතා කරන්නද?" නන්දිතා සිනා සෙමින් ඇසුවාය. එහි නිසැක තේරුම නන්දිතා බොහෝ දේ දන්නා බවය. එයට කෙසේ පිළිතුරු දුන්නා දැයි මතකයේ නැතත් නන්දිතා ද දිගටම රංජන් නමින් මා ඇමතුවාය.

"මේ අහන්න, ඔක්කොම පැහැදිලි කරන්න වෙලාවක් නෑ, දැන් ඔයා ඉන්නෙ කාත් එක්කද?"

"යාළුවෙක් එක්ක. ඇයි ඔයා අහන්නෙ?" නන්දිතා විරාන් දනී. එබැවින් මම හිතාමතාම විරාන්ගේ නම හෙළි කිරීමෙන් වැළකීමට උත්සාහ ගතිමි.

"කවුරු වුණත් එයාගෙන් අයින් වෙන්න දැන්ම. ඔයා ඉන්නෙ ලොකු අනතුරක, ඒ වගේම මුළාවක."

"එහෙම කොහොම ද කරන්නෙ නන්දිතා? ඔයා හරියටම කියන්නෙ මොනව ද කියලවත් මට තේරෙන්නෙ නෑ!" මම පැවසීමි.

ඇය දිගින් දිගටම ඉල්ලා සිටියේත් අවසානයේ එසේ නොහැකි වූ තැන බැගෑපත් වූයේත් මේ සියල්ල අතහැර ආපසු යන ලෙසයි.

එයට එකඟ නොවූ මම නැවත ඇයට අමතන පොරොන්දුව පිට දුරකතනය විසන්ධි කළෙමි.

මේ කිසිවක් විරාන්ට නොකීමට පරිස්සම් වූ මම ඇමතුම බිරියගෙන් බැව් පැවසීමි.

අප දෙදෙනාම නිශ්ශබ්දව ගමන් කළ අතර විරාන් අසාමාන්‍ය කලබලයකින් සිටින බැව් මට හැඟිණි. හෙතෙම නිතරම කැබ්රියේ පැති කන්නාඩිවලින් පසුපස බැලුවේය; එහෙත් කිසිවක් නොපැවසීය.

පීඩාකාරි නිහඬ බව පලවා හරිමින් මම හඬ අවදි කළෙමි: "විරාන්, සංකීර්ණ ගණකය කොහොම ද මෙටාපැටර්න් එකට බාධා වෙන එක ඩිටෙක්ට් කරන්නෙ?"

එහි පූර්ණ ක්‍රියාකාරිත්වය ඔහු නොදන්නා බව ඒ මොහොතේ පැවසුවත් මම දැන් ඒ ගැන සැක කරමි.

කෙසේ වෙතත් ඒ වෙනුවට ඉතා සරල පැහැදිලි කිරීමක් ඔහුගෙන් ලැබිණි. මෙටාපැටර්න්වලට අනුව යම් මොහොතක කිසියම් ස්ථානයක අන්තර් සබඳතා පැවැත්විය හැකි මිනිසුන් ඇතුළු සියලු වස්තූන්ගේ හෝ වඩා සරලව කියන්නේ නම් සිදු විය හැකි සිදුවීම් ගණනේ උපරිම සහ අවම අගයක් තිබිණි. ඉතින් යම් හෙයකින් එම අගයට වඩා වැඩි හෝ අඩු වන දේවල් සිදු වන්නේ නම් සංකීර්ණ ගණකය එය හසු කර ගැනීමට සමත් විය. ඒ ප්‍රධාන ලෙසම අවට ඇති සියලු වස්තූන්ගෙන් පිට වූ ශබ්ද තරංග ග්‍රහණය කර ගැනීමෙනි. මෝටර් රථ එන්ජිමක ශබ්දයේ සිට මිනිස් හදවතක 'ලබ් ඩබ්' නාදය දක්වා පරාසයක ශබ්ද ග්‍රහණය කොට ගත හැකි තරම් සියුම්ව සංකීර්ණ ගණකය තනා තිබිණි.

කෙටි කතාබහකින් අනතුරුව නැවතත් අප නිශ්ශබ්දව ගමන් කළ අතර, ඒ අලුයමේ තවත් මොහොතකින් මගේ සහ විරාන්ගේ අනාගත ඉරණම් තීරණය වීමට නියමිත බව මම නොදැන සිටියෙමි.

මා ඔහුගෙන් ඇසූ ප්‍රශ්නයක් සහ එයට ලැබුණු පුදුම සහගත පිළිතුර විරාන් සහ මා අතර ඇති වුණු අවසාන සංවාදය විය.

"මචං උඹ කොහොම ද මේ සංවිධානයට එකතු වුණේ? කොහොම ද උඹ මේක ගැන දැන ගත්තේ?" මම ඇසීමි.

"මම සංවිධානය ගැන දැනගත්තේ නෑ මචං, සංවිධානය මාව හොයාගෙන ආව," විරාන් පැවසීය.

"ආහ් එහෙමද! ඇයි උඹව විශේෂයෙන් එහෙම හොයාගෙන ආවේ?" මම ඇසීමි.

"මම උඹේ යාළුවෙක් නිසා..." හෙතෙම උරහිස් හකුළුවමින් සැහැල්ලු ස්වරයකින් පැවසීය.

"මොකක්!?" මම අදහාගත නොහැකිව විරාන් දෙස බැලුවෙමි. එහෙත් එයට විරාන් දුන් පිළිතුර මා අපේක්ෂා කළ විස්තරාත්මක එක නොවේ.

"ඒක වැදගත් නෑ..." හේ කෙටියෙන් කියාදැමීය.

ඒ සංවාදය එතැනින් ඔබ්බට ගෙනයෑමට නොහැකි වූයේ එක්වරම අපේ සංකීර්ණ ගණක කම්පනය වීමට ගත් බැවිනි. එය මීට පෙර නොදැනුණු අන්දමේ ප්‍රබල කම්පනයකි. මට ආසන පටි පැලඳගන්නා ලෙස උපදෙස් දුන් විරාන් කැබ් රිය වේගයෙන් ධාවනය කරන්න වීය. එහෙත් වැඩි දුර යෑමට පෙර අප පසුපසින් ඈත තුරු වියනට ඉහළින් නිල් සහ රන්වන් පැහැ එළි දිස් විය. ඒවා විසින් අප ලුහුබදිමින් තිබිණි. විරාන් කැබ් රියේ වේගය තවත් වැඩි කළේය. එහෙත් එක්වරම මගේ වම් පසින් පෙනුණු දීප්තිමත් සුදු ආලෝකයක් සමඟ මහා ශබ්දයක් ඇසුණු අතර දැඩි ශාරීරික වේදනාවක් මැද සියල්ල අන්ධකාරයෙන් වැසී ගියේය.

මතු සම්බන්ධයි

▶ **රංගන ප්‍රසාද් ආරියදාස**

වර්ෂ 2021ක් වූ මැයි මස 10 වැනිදා සඳුදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.